25. ව්‍යාපෘතිය නිසා සැලකිය යුතු පාරිසරික හෝ සාගර හෝ භෞමික බලපෑම් කිසිවක් ඇති නොවන බව ප්‍රාරම්භක පාරිසරික පරීක්ෂණ වාර්තාව නිගමනය කර ඇත. ඇති විය හැකි සියලුම බලපෑම් පරිශ්‍රයට සීමා වන එමෙන්ම ආපසු හැරවිය හැකි හා නිසි පියවර මගින් අවම කළ හැකි ඒවාය යැයි පාරිසරික ඇගයීම් වාර්තාවන නිගමනය කරයි. දියකඩන දෙක ඉදිකිරීම, උප ස්තර ප්‍රතිසංස්කරණය සඳහා වන උප උදම් වැලි කැණීම සහ යාබද උප ස්තරය කැණීම (ධීවර ධීවර වරාය ගැඹුරු කර එම ද්‍රව්‍ය පිරවීමට යොදා ගනු ඇත) සහ යන්ත්‍රෝපකරණ ක්‍රියාත්මක කිරීම නිසා ඇති වන බලපෑම් සුළු , පෙදෙසට සීමා වූ හා පිළි ගත හැකි ඒවා වන අතර පරිසර කළමනාකරණ සැලැස්මෙහි නිර්දේශිත පියවර කොන්ත්‍රාත්කරු අවධාරණය කර ක්‍රියාත්මක කර අධීක්ෂණය කරන්නේ නම් අවම කර ගත හැකි ඒවාය.

26. ව්‍යාපෘතිය නිසා ඉදිකිරීමට පෙර පසු හා මෙහෙයුම් අදියරවල විභව බලපෑම් ඇති විය හැකි බව පාරිසරික කළමනාකරණ සැලැස්ම හඳුනා ඇති අතර සමගාමී කාලසටහන් හා අවම් කිරීමේ පියවර අධීක්ෂණය කිරීම මගින් බලපෑම් සාමාන්‍ය මට්ටම්වල රඳවා ගත හැකි බව පෙනී ගියේය. තවද ඵලදායීතාවය තහවුරු කරනුවස් පාරිසරික කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම සඳහා වන ආයතනික සංවිධානයද ඇතුලත් කර ඇත.

# පළමු පරිච්ඡේදය.

## 1. හැඳින්වීම.

### 1.1 පසුබිම

27. ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ පිහිටි වර්ග කිමී 66,000 ක භූමි ප්‍රදේශයකින් යුත් දූපත් රාජ්‍යයක් වන අතර මෙය ඉන්දීය අර්ධද්වීපයේ ගිනිකොණ අන්තයේ සිට කිමී 100 ක් පමණ ඈතින් අක්ෂාංශ 6-10° N හා දේශාංශ 80-82° E අතර පිහිටා ඇත. උතුරු මුදුනේ සිට දකුණු අන්තය දක්වා දිවයිනේ දිග කි,මී 440 ක් වන අතර උපරිම පළල කි,මී 220 කි. වර්ග කිමී 27,800 ක් ආවරණය කරන කිමී 1170 ක් දිග පටු වෙරළ තීරයක් දිවයිනට හිමි අතර (සාමාන්‍යය කි,මී 22 කි) වර්ගකි,මී 517,000 ක සුවිශේෂී ආර්ථික කලාපයකටද ශ්‍රී ලංකාව හිමිකම් දරයි.

**රූපසටහන 1-1 ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම.**




28. ශ්‍රී ලංකාව පළාත් 9 කට බෙදා ඇති අතර පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය පිහිටනු ඇත්තේ ඉන් එක් පළාතක් වන උතුරු පළාතෙහිය. **(රූපසටහන 1.1)**මෙම පළාතට මන්නාරම, කිළිනොච්චිය, මුලතිව්, යාපනය හා වවුනියාව නමින්

දිස්ත්‍රික්ක 5 ක් තිබේ. ඉන් 4 ක් වෙරළබඩ වන අතර වවුනියාව පමණක් භූමියෙන් වට කර ඇත **(රූපසටහන 1.2)**උතුරු පළාතේ භූමි ප්‍රදේශය වර්ග කිමී 8884 කි. එය බටහිරෙන් මන්නාරම් ද්‍රෝණිය සහ පෝක් සමුද්‍ර සන්ධියෙන් වට වී ඇති අතර පළාතේ වයඹ සීමා ලෙසින් පෝක් සමුද්‍ර සන්ධියද උතුරු හා ඊසාන දිගින් බෙංගාල බොක්කද පිහිටා ඇත. උතුරු පළාතේ නැගෙනහිර හා දකුණු මායිම් ලෙසින් පිහිටා ඇත්තේ පිළිවෙලින් උතුරු මැද පළාත සහ වයඹ පළාතයි **(රූපසටහන 1.2)**

29. ජනගහණය 650,720 සහිත උතුරු පළාතේ අගනුවර වන්නේ යාපනය දිස්ත්‍රික්කය වන අතර පළාතෙහි ප්‍රාදේශීය සභා 13 ක් නගර සභා 3 ක් සහ මහ නගර සභාවක් ඇත. දශක තුනක කාලයක් පැවති ගැටුම් නිසා වැඩියෙන්ම හානියට පත් පළාත මෙය වන හෙයින් දිවයිනේ වැඩිම ආර්ථික පසු බෑමට ලක් වු පෙදෙසද මෙයයි. යුද්ධයෙන් පසු වර්තමානයෙහි සීඝ්‍ර සංවර්ධනයක් පළාතට සිදු කරමින් තිබෙන අතර ඇදී එන ජන සංඛ්‍යාවද ඒ අනුව ඉහළ යමින් තිබේ.

**රූපසටහන 1-2 උතුරු පළාතේ දිස්ත්‍රික්ක**




මුලාශ්‍රය: මධ්‍යම පරිසර අධිකාරිය, DMC, 2014

## 1.2 ව්‍යාපෘතිය

### 1.2.1 යෝජිත ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු

30. උතුරු පළාතේ තිරසාර ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය (NPSFDP) පහත කරුණු හා බැදෙයි,(i) ධීවර ක්ෂේත්‍රයට සිදු කරන ආයෝජන වැඩි කිරීම සහ (ii) උතුරු පළාතේ රැකියා සහ ජීවනෝපා අවස්ථා ඉහළ නැංවීම[1] මේ අනුව උතුරු පළාතේ ධීවර නිෂ්පාදනය තිරසාර ලෙසින් වර්ධනය කිරීම. මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිදාන තුනක් ඇත. ප්‍රතිදානය (i) **ප්‍රතිදානය 1: කාලගුණ නම්‍යශීලී යටිතල පහසුකම් ප්‍රවර්ධනය.** යාපනය දිස්ත්‍රික්කයේ පේදුරුතුඩුවෙහි සහ මන්නාරම් දිස්ත්‍රික්කයේ පේසාලයෙහි අළුත් ධීවර ධීවර වරාය දෙකක් ඉදි කිරීම. යාපනය දිස්ත්‍රික්කයේ මන්ඩතිවුහි එක් නැංගුරම්පළක් සහ යාත්‍රා තටාක 23 ක්. (යාපනයේ

[1] ශ්‍රී ලංකා රජය 2017 *දැක්ම 2025 පෝෂිතවූ දේශයක්* කොළඹ

8 ක් මන්නාරමේ 6 ක් මුලතිව්වල 6 ක් සහ කිළිනොච්චියේ 3 ක් ආදි ලෙසින්) පුනරුත්ථාපනය කරනු ඇත. මෙම ප්‍රාරම්භක පාරිසරික පරීක්ෂාව පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධනය කිරීම සඳහාය.

ධීවර වරාය සංවර්ධනයේ අනෙකුත් අරමුණු:

- රටවැසියන්ගේ ප්‍රෝටීන් ආදානය ජාතික මට්ටමින් ඉහළ නැංවීම
- ජාත්‍යන්තර ප්‍රමිතියෙන් හා ගුණත්වයෙන් යුත් මත්ස්‍ය පැසිරුම් පහසුකම් සහිත නවීන ධීවර ධීවර වරාය ඉදිකිරීම මගින් මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නංවා එමගින් අපනයන අවස්ථා වැඩි කර ගැනීම
- කුඩා සහ විශාල බහුදින යාත්‍රා සඳහා තොටුපළ පහසුකම් ලබා දීම
- රැකියා අවස්ථා ඇතුලත්ව ඍජු හා වක්‍ර භාණ්ඩ / සේවා ලබා දීමේ අවස්ථා ඇති කිරීම මගින් පෙදෙසේ වාසීන්ගේ ආදායම වැඩි කිරීම
- ගැඹුරු මුහුදේ ධීවර ක්‍රියාකාරකම් උනන්දු කිරීම හරහා වරළාසන්නව ඇති විය හැකි බලපෑම් අවම කිරීම

### 1.2.2 ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම

31. ශ්‍රී ලංකාවේ කරදිය මෙන්ම මිරිදිය මත්ස්‍ය සම්පත උතුරු පළාතේ සමුහයාට ආහාර සුරක්ෂිතතාවය (විශ්වාසනීය ප්‍රෝටීන්) ලබා දෙන අතරම ආදායමද උපයා දෙයි. දශක තුනක කාලයක් පැවති යුධමය තත්වය නිසා ප්‍රදේශයේ කුඩා සහ විශාල පරිමාණයේ තිරසාර ධීවර ක්‍රියාකාරකම්වල දියුණුවට දැඩි පසුබෑමක් ඇති විය. එම තත්වය සමනය වු පසු සීඝ්‍ර ප්‍රගතියක් පෙදෙසෙහි ඇති වෙමින් පවතින අතර සමාජ හා ආර්ථික ඉසව්වල සැලකිය යුතු වර්ධනයක දක්නට ඇත. මෙම තත්වය නිසා ධීවර කෙෂ්ත්‍රයේද අදාල කර්මාන්තවලද දියුණුවක් දැකිය හැකිය. ධීවර අංශය පළාතට රැකියා අවස්ථා 40,000 ක් පමණ ලබා දෙන අතර ගැටුමට පෙර 1983 වකවානුවෙහි දිවයිනේ වෙරළ තීරයෙන් 40% ක් අයත් වන උතුරු පළාත එයට සමගාමීව ධීවර අස්වැන්නෙන්ද 40% ක් දැයට ලබා දෙමින් සිටියේය. පසුව ගැටුම් සමයෙහි එය හීන වී පෙදෙසේ මෙම කෙෂ්ත්‍රයට සිදු කරන ලද ආයෝජනද ඇණ හිටියේය. උතුරෙහි ස්වාභාවික ධීවර වරායවල් නොමැති හෙයින්ද තිබුනු ධීවර වරාය කිහිපය ගැටුම්වල විපාක ලෙසින් මෙන්ම සුනාමි, කුණාටු වැනි ස්වාභාවික ආපදා නිසා දැඩි හානියට ලක් වු හෙයින්ද දැනට පෙදෙසේ ධීවරයන්ට ඇත්තේ යටිතල පහසුකම් ඌන කුඩා ධීවර වරායවල් කිහිපයක් පමණි.

32. උතුරු පළාතේ ධීවර ක්‍රියාකාරකම්වල තිරසාර සංවර්ධනයක් ඇති කිරීමට සහයක් ලෙසින් ශ්‍රී ලංකා රජය විසින් උතුරු පළාතේ තිරසාර ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය (NPSFDP) යටතේ ආසියා සංවර්ධන බැංකුවෙන් මුල්‍ය සහයක් ඉල්ලා සිටින ලදී. ගැටුම නිසා හානියට පත් යාපනය මන්නාරම මුලතිව් සහ කිළිනොච්චි යන වෙරළබඩ දිස්ත්‍රික්ක හතරෙහි ධීවර කෙෂ්ත්‍රය නැවතත් නගා සිටුවීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය සඳහා වන ව්‍යාපෘති සංවර්ධන ණය පහසුකම (PDA) මෙයට පෙර 2017 මාර්තු මස සම්පුර්ණ කරන ලද නිසි සම්ප්‍රජන්‍යතාව ව්‍යාපෘති සැකසුම් තාක්ෂණික සහයෝග ලේඛනයකින් ප්‍රවර්ධනය කරන ලදී.

මෙම උපදේශන පැවරුම හෙවත් ව්‍යාපෘති සංවර්ධන ණය පහසුකමෙහි (PDA) අරමුණ වනුයේ ව්‍යාපෘති සැකසුම් තාක්ෂණික සහයෝග ලේඛනයෙහි හඳුනා ගත් ප්‍රතිදාන 1: කාලගුණ නම්‍යශීලී යටිතලපහසුකම්: ධීවර යටිතලපහසුකමකට නිර්දේශිත විස්තරාත්මක ඉංජිනේරු සැලැස්ම සහ එය හා බැඳි පාරිසරික හා සමාජීය ආරක්ෂණයයි.

33. ව්‍යාපෘතියට පේදුරු තුඩුවේ සහ පේසාලයිහි ධීවර ධීවර වරාය දෙකක් නිර්මාණය කිරීම, එක් නැංගුරම් පළක් සහ උතුරු පළාතේ දිස්ත්‍රික්කවල යාත්‍රාංගන 23 ක් ප්‍රතිසංස්කරණය කිරීම ඇතුලත් වෙයි.

34. අභිනව ධීවර ධීවර වරාය යටිතල පහසුකම් සංවර්ධනය මගින් සාගරය මුල් කර ගත් ධීවර කටයුතුවලට නව අයෝජන උනන්දු කිරීම අපේක්ෂිත අතර මෙය පමණ ඉක්මවු වෙරළාසන්න සම්පත් අපයෝජනයද පාලනය කරනු ඇත. එමෙන්ම වෙරළබඩ යටිතල පහසුකම් ලබා දීම මගින් නැංගුරම්පළවල මෙන්ම තොටුපළවල ක්‍රියාකාරකම් කාර්‍යක්ෂම කිරීම හරහා ධීවරයන්ට මෙන්ම ඔවුන්ගේ යාත්‍රාවලට වැඩි ආරක්ෂාව සහ රැකවරණය ලබා දිය හැකි වනු ඇති අතර අස්වැන්නේ ගුණත්වයද සංරක්ෂණය කළ හැකිය හෙයින් ආදායම් අවස්ථාද වැඩි වනු ඇත. (මෙම ආයෝජන සඳහා වෙනම පාරිසරික ඇගයීම් සකසා ඇත). මෙම මැදිහත්වීම් මගින් දිගු කාලීනව මත්ස්‍ය සම්පතෙහි තිරසාර බව තහවුරු කරනු ඇති අතර ප්‍රදේශයේ සමුහයාට ආදායම් උත්පාදන අවස්ථා පවත්වා

ගෙන යනු ඇත. උතුරු පළාතේ ධීවර ක්ෂේත්‍රයට සිදු කරන මෙම ප්‍රවර්ධනය පෙදෙසට පමණක් නොව මුලු දේශයේම පෝෂණ තත්වයට, ආහාර සුරක්ෂිතතාවය සහ ආර්ථික උනන්තියට ඉවහල් වනු ඇත.

35. වාර්තාව වෙසෙසින් සම්පාදනය කරන ලද්දේ පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියේ පාරිසරික ඇගයීමවාර්තාව ලබා දීම වෙනුවෙනි. පේදුරුතුඩුව තටාක පහසුකම්වල පොදු පිහිටීම **රූපසටහන 1.3** දක්වයි.

**රූපසටහන 1-3 පේදුරුතුඩුව සංවර්ධන පරිශ්‍රයේ ඇනට ඇති පහසුකම්වල පිහිටීම**




36. 1875 ඉදි කරන ලද පේදුරුතුඩුව ධීවර වරාය අබලන් වු හා වෙරළතීරය පුරා විහිදුනු පටු වෙරළබඩ කොරල් ගැටි පැරයක් මත ඇති කොංක්‍රිට් වාප්පුවකින් සමන්විත වන අතර එයට ජලජ හෝ භෞමික යටිතල පහසුකම් කිසිවක් නැත. තටාකයට ඉඩ ලබා ගැනීම පිනිස මෙම ගැටිපරය හාරා ඇති අතර එය සෘජුවම විවෘත වන්නේ මුහුදටය. එහෙයින් සාගර කලගුණය නිසා ධීවර කටයුතුවලට ආරක්ෂාකාරී නොවේ (රූපසටහන **1.4**).

**රූපසටහන 1-4 පේදුරු තුඩුවේ දැනට ඇති තටාක පහසුකම්**





37. 2016 වසරෙහි ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් සිදු කරන ලද ශාක්‍යතා අධ්‍යයනය අනුව යාපනය දිස්ත්‍රික්කයේ තිබෙන ඵලදායීම ධීවර වරායක් ලෙසින් පේදුරුතුඩුව ධීවර වරාය හඳුනා ඇත. එනමුත් වඩා විශාල ධීවර යාත්‍රා සඳහා ප්‍රමාණවත් පහසුකම් නොමැති කම නිසා මෙන්ම තිබුනාවූ පහසුකම් යුද්ධ කාලයෙහි හානියට ලක් වුනු නිසා හා සුනාමි ව්‍යවශනය හේතුවෙන් ඇති වුනු විනාශය ප්‍රතිස්ථාපනය නොකරන ලද හෙයින් එම වරායේ උපරිම ඵලය නෙලා ගැනීමට නොහැකි තත්වයක් මෙහි පවතියි.

38. මෙම ධීවර ධීවර වරාය සංවර්ධනය කරනු ලබන්නේ නම් ධීවරයන්, මාළු වෙළෙන්දන්, ශ්‍රමිකයන්, අපනයකයකරුවන් ඇතුලු ධීවර කර්මාන්තය හා බැඳි පුළුල් ප්‍රජාවකට මෙය ප්‍රයෝජනවත් වනු ඇත. එපමණක් නොව දේශයේ පෝෂණයටද මෙම ධීවර වරාය සංවර්ධනය කිරීම මගින් ගුණාත්මයෙන් යුත් මතශ්‍යන් ලබා ගැනීමට හැකි වන හෙයින් දැයේ පෝෂණයටද වැඩි දායකත්වයක් ලැබෙනු ඇත. එමෙන්ම මෙම ධීවර ධීවර වරාය ඉදිකිරීම මගින් විශාල සංඛ්‍යාවකට රැකියා අවස්ථා උදා වී පෙදෙස් වාසීන්ගේ ආර්ථික හා ජීවන තත්වයද ඉහළ යනු ඇත.

### 1.2.3 පාරිසරික ඇගයීම් වාර්තාවේ අරමුණු

39. ආසියා සංවර්ධන බැංකුව විසින් මුල්‍ය සහය දක්වනු ලබන B කාණ්ඩයේ ව්‍යාපෘති සඳහා එම ආයතනයේ පරිසර හා සමාජ ආරක්ෂා ප්‍රතිපත්තියට අනුව පරිසර ඇගයීමක් සිදු කිරීම යනු පූර්ව අවශ්‍යතාවයක් වන අතර මෙම කාණ්ඩය සඳහා ආසියා සංවර්ධන බැංකුව පාරිසරික වාර්තා නිර්වචනය කරනු ලබන්නේ ප්‍රාරම්භක පරිසර පරීක්ෂාවක් ලෙසිනි. තවද වෙරළ සංරක්ෂණ පනතට අනුව වෙරළ කලාපයේ සිදු කරන සියලුම අළුත් සංවර්ධන කටයුතු සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළබඩ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව (CCCRMD) වෙතින් සංවර්ධන අනුමැතියක් ලබා ගත යුතුය. මෙම ව්‍යාපෘතියේ දැවැන්ත බව සැලකිල්ලට ගන්නා කල පාරිසරක බලපෑම් වාර්තාවක් ලබා ගැනීම එම අනුමැතිය ලබා ගැනීම සඳහා වන පූර්ව අවශ්‍යතාවයක් වන හෙයින් යෝජිත පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් මෙම පාරිසරික ඇගයීමවාර්තාව සම්පාදනය කර ඇත්තේවෙරළ සංරක්ෂණ සහ වෙරළබඩ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ ආසියා සංවර්ධන බැංකුව ලබා දුන් යොමු කිරීමේ අනුදේශය මත පදනම්වය.

40. පේදුරුතුඩුව සඳහා වන නව වරායේ සැලැස්ම ඉදිකිරීම හා මෙහෙයුම ආදිය හා බැඳි පරිසරික ඇගයීම මෙම වාර්තාවේ අරමුණු අතර වෙයි. ඇගයීමක් අවශ්‍ය වන්නේ පාරිසරික කළමනාකරණ සැලැස්ම මගින් ව්‍යාපෘතියේ එක් එක් අදියරවල ඇති විය හැකි අනපේක්ෂිත සෞඛ්‍ය ආරක්ෂා හා පාරිසරික බලපෑම් අවම කිරීමට / කළමනාකරණය කිරීමට පියවර ගැනීම පිණිසය. කොන්ත්‍රාත්කරු විසින් පාරිසරික කළමනාකරණ සැලැස්මතවත් විස්තරාත්මක කරනු ඇති අතර එයට අනාගතයෙහි පූර්ව ඉදිකිරීම්, ඉදිකිරීම් හා මෙහෙයුම් අදියරවල ඇති විය හැකි බලපෑම්ද ඇතුලත් කරනු ඇත.

41. ඇගයීම සම්පාදනය කිරීමෙහි උපදේශක විසින් යොමුකිරීමේ අනුදේශය අනුගමනය කරනු ඇති අතර මෙය **අනුබද්ධය** 1 හි ඇත. පාරිසරික ඇගයීමවාර්තාව සම්පාදනය කර ඇත්තේ පහත කරුණු සඳහාය:

- යෝජිත මැදිහත්වීම් නිසා ඇති විය හැකි විභව පාරිසරික බලපෑම් හඳුනාගැනීම සහ ඇගයීම
- පුරෝකථනය කරන ලද ඍණාත්මක බලපෑම් වැළැක්වීමට, අවම කිරීමට, විසඳුම් ලබා දීමට හෝ හානිපූර්ණ ලබා දීමට සඳහා වන යෝජනා
- ව්‍යාපෘතියේ සමස්ත පාරිසරික තිරසාර බව අත් කර ගැනීම සඳහා අවම කිරීමේ පියවර ව්‍යාපෘති විකල්ප ලබා දෙන සහ පාරිසරික කළමනාකරණ සැලැස්මක් සහ අධීක්ෂණ වැඩසටහනක් සම්පාදනය කළ යුතුය.

## 1.2.4 පාරිසරික අධ්‍යයනයේ ඉලක්කය සහ පරාසය

42. මෙම වාර්තාවේ පරාසය සැලැස්මේ ඉදිකිරීම් හා මෙහෙයුම් අදියරවල පාරිසරික ඇගයීම සිදු කිරීම හා පූර්ව ඉදිකිරීම් ඉදිකිරීම් සහ මෙහෙයුම් අදියරවල ක්‍රියාකාරකම් සඳහා වන පාරිසරික කළමනාකරණ සැලැස්මක් සම්පාදනය කිරීමයි. ඇගයීම පදනම් වන්නේ පරිශ්‍ර පිහිටීම, සැලසුම සහ ව්‍යාපෘතියේ ආකෘතිය මතය.

43. පාරිසරික ඇගයීම සඳහා යෝජිත අධ්‍යයන පෙදෙස ආවරණය කළ යුතුය යැයි යොමු කිරීමේ අනුදේශය සුවිශේෂීව අවධාරණය කරයි. මෙම ව්‍යාපෘති පෙදෙස ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් නිසා සෘජුවම බලපෑම්වලට ලක් වන පෙදෙස් සහ ව්‍යාපෘති පෙදෙසේ මායිමේ සිට මීටර් 500 ක් දක්වා විහිදෙන ව්‍යාපෘතියේ බලපෑම් ප්‍රදේශය, වෙරළ තීරය දෙපස කිමී 2 ක දුර ව්‍යාපෘති පරිශ්‍රයේ මායිමේ සිට මුහුද දෙසට තිබෙන එක් කිලෝ මීටරයක දුර ආදිය ඇතුලත් වෙයි. ව්‍යාපෘතිය සඳහා වන ප්‍රාරම්භක සංවර්ධන ක්‍රියාවලියට පහත කරුණු ඇතුලත් වෙයි:

- ව්‍යාපෘති පසුබිම යෝජිත මැදිහත්වීම් ඉදිකිරීම් ක්‍රමවේද භාවිත කරන සහ පූර්ව ඉදිකිරීම් ක්‍රියාකාරකම් ආදිය හුරුකර ගැනීමට පාරිසරික උපදේශකවරුන්, ව්‍යාපෘති කාර්ය මණ්ඩලය හා විස්තරාත්මක සැලසුම් කණ්ඩායම (DDT) සමග සාකච්ඡා කළ ප්‍රාරම්භක වෛෂ්‍යකරණ සමය.
- ව්‍යාපෘති ප්‍රදේශයේ නිරීක්ෂණ චාරිකා, පාරිසරික හා සමාජීය සමීක්ෂණ හරහා පරිශ්‍රයේ මෙන්ම ඉන් පිටත භෞතික, ජීව විද්‍යාත්මක සහ සමාජාර්ථික වාතාවරණය ආදියෙහි සාමාන්‍ය මූලික රේඛා තත්වය ස්ථාපනය කිරීම.
- භෞතික, ජීව විද්‍යාත්මක සහ සමාජාර්ථික වාතාවරණයට ව්‍යාපෘති ක්‍රියාකාරකම් නිසා ඇති විය හැකි පාරිසරික ගැටළුවල වෛෂ්‍යකරණයක් පාර්ශවකරුවන් සහ පෙදෙස්වාසීන් විශේෂයෙන් ප්‍රතිලාභීන් හා බලපෑමට ලක්වුවන් සහ පෙදෙසේ ප්‍රජා මූලි සංවිධාන- සමග පවත්වන සාකච්ඡා මගින් සිදු කිරීම.
- ක්‍රියාත්මක කිරීමට ප්‍රථම අවශ්‍ය කරන අනුමැති හා නිශ්කාසන හඳුනා ඒවා ලබා ගැනීම.
- විස්තරාත්මක පාරිසරික කළමනාකරණ සහ අධීක්ෂණ සැලැස්මක් සැකසීම
- පාරිසරික කළමනාකරණ හා පාරිසරික අධීක්ෂණ වැඩසටහන් සඳහා පිරිවැය ඇස්තමේන්තු සැකසීම

## 1.2.5 පාරිසරික වාර්තාව සම්පාදනය කිරීමට යොදාගත් ක්‍රමවේද සහ තාක්ෂණවල කෙටි වින්‍යාශය

44. පාරිසරික ඇගයීමවාර්තාව සම්පාදනය කිරීම සඳහා වන මාර්ගෝපදේශය යොමුකිරීමේ අනුදේශය ලබා දෙයි.

45. මෙම වාර්තාව සම්පාදනය කිරීමට අනුගමනය කරන ලද ක්‍රමවේදය:

– දැනට ඇති ලේඛන පුනරීක්ෂණය කිරීම

– අවශ්‍ය කරන වැඩිපුර තොරතුරු හඳුනාගැනීම

– පරිශ්‍රයට සිදු කරන ක්ෂේත්‍ර චාරිකා

– ක්ෂේත්‍ර පරීක්ෂා පැවැත්වීම

– පාර්ශවකාර හා ප්‍රජා සාකච්ඡා පැවැත්වීම

– වාර්තාවේ කෙටුම්පත සම්පාදනය කිරීම

46. **දැනට ඇති ලේඛන පුනරීක්ෂණය කිරීම**

පහත සඳහන් ලේඛන පුනරීක්ෂණය කරන ලදී

- ව්‍යාපෘති සැකසුම් තාක්ෂණික සහයෝග ලේඛනය (2017). IEM කෙටුම්පත 2017 මැයි 5 ආසියා සංවර්ධන බැංකුව TA-9049 SRI. උතුරු පළාතේ තිරසාර ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය ව්‍යාපෘති සැකසුම් තාක්ෂණික සහයෝග ලේඛනය FCG ANZDEC, RDC.
- ව්‍යාපෘති සැකසුම් තාක්ෂණික සහයෝග ලේඛනය(2017)අවසාන ප්‍රාරම්භක පාරිසරික පරීක්ෂාව ඔක්(2017). ආසියා සංවර්ධන බැංකුව TA-9049 SRI. උතුරු පළාතේ තිරසාර ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය ව්‍යාපෘති සැකසුම් තාක්ෂණික සහයෝග ලේඛනය FCG ANZDEC, RDC.
- ව්‍යාපෘති සැකසුම් තාක්ෂණික සහයෝග ලේඛනය (2016). පාරිසරික ඇගයීම සහ පුනරීක්ෂණ ක්‍රියාරාමුව කොටුම්පත 5 මැයි 2017 ආසියා සංවර්ධන බැංකුව TA-9049 SRI. උතුරු පළාතේ තිරසාර ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය ව්‍යාපෘති සැකසුම් තාක්ෂණික සහයෝග ලේඛනය FCG ANZDEC, RDC.
- ආසියා සංවර්ධන බැංකුව (2009)ආරක්ෂා ප්‍රතිපත්ති ප්‍රකාශය ජුනි 2009.
- පේසාලයි සඳහා වන මොරටුව විශ්ව විද්‍යාලයේ ශක්‍යතා අධ්‍යයනය (මොරටුව විශ්ව විද්‍යාලය 2016a), පේදුරුතුඩුව (මොරටුව විශ්ව විද්‍යාලය2016b), යාපනය දිස්ත්‍රික්කයේ ධීවර යාත්‍රා නැංගුරම් පළවල් සහ තොටුපළවල් (මොරටුව විශ්ව විද්‍යාලය, 2016d), මුල්තිව් (මොරටුව විශ්ව විද්‍යාලය, 2016c), කිළිනොච්චි (මොරටුව විශ්ව විද්‍යාලය, 2016e), සහ මන්නාරම (මොරටුව විශ්ව විද්‍යාලය, 2016f); (iii) ව්‍යාපෘති සැකසුම් තාක්ෂණික සහයෝග ලේඛනය - ප්‍රතිදානය 1 සඳහා වන මොරටුව විශ්ව විද්‍යාලයේ අධ්‍යයනයේ තාක්ෂණික සම්ප්‍රජන්‍යතාවය (ව්‍යාපෘති සැකසුම් තාක්ෂණික සහයෝග ලේඛනය2017d)
- ප්‍රකාශයට පත් කරන ලද පාරිසරික ඇගයීම් (ප්‍රාරම්භක පාරිසරික පරීක්ෂාවේසහපාරිසරක බලපෑම් වාර්තා සහ වෙබ් අඩවි ඇතුලු අනෙකුත් මුලාශ්‍රවල තිබෙන අදාල ලියවිලි මෙම ලියවිල්ලට යොමු ලැයිස්තුව ලෙසින් ලබා දී ඇත.

47. **අවශ්‍ය කරන වැඩිපුර තොරතුරු හඳුනාගැනීම** ඉහත ලැයිස්තු ගත කර ඇති ව්‍යාපෘති ලේඛන පුනරීක්ෂණය කිරීම මත පහත තොරතුරු පාරිසරික ඇගයීමවාර්තාව සැකසීමට අවශ්‍ය විය:

- වෙරළබඩ හා සාගර පරිසර අධ්‍යයන මත වන වැඩිදුර සමීක්ෂණ හා සමාජමය ඇගයීම, භූතාක්ෂණික විමර්ශන භූවිද්‍යා සමීක්ෂණ අවසන් කරන ලද සැලැස්ම සඳහා වන වාර්තා
- ජල ගුණාත්වය, පරිමණ්ඩිත ශබ්දය සහ දුවිලි මට්ටම් වැනි භෞතික සංරචක ඇගයීම

48. **පරිශ්‍රයට සිදු කරන ක්ෂේත්‍ර චාරිකා:** අනෙකුත් කණ්ඩායම් සාමාජිකයන්, ආසියා සංවර්ධන බැංකුවේ මෙහෙය සඳහා වන කණ්ඩායම සහ සැලසුම් ඉංජිනේරුවන් සමග උපදේශකවරුන් යෝජිත ව්‍යාපෘති පරිශ්‍රයට කිහිප වතාවක්ම ගියහ.

49. **අවශ්‍ය කරන අධ්‍යයන පැවැත්වීම:** දූෂණ බලපෑම්වල අනාගත මට්ටම සැසඳීමට මූලික රේඛා විධානය පාරිසරික ඇගයීම් වාර්තාවේ අතිශය වැදගත් අංගයක් වන හෙයින් සැලසුම් අරමුණු සඳහා සිදු කරන ලද පරීක්ෂා සහ විමර්ශනවලට අමතරව පහත කරුණු ඇතුලත් පාරිසරික මූලික රේඛා ඇගයීම්ද සිදු කරන ලදී:

- භූතාක්ෂණික විමර්ශන
- අගාධමිති සමීක්ෂණ
- භෞමික හා සාගර පාරිසරික සහ ජීව විද්‍යාත්මක ඇගයීම් සමීක්ෂණ
- මුහුදු ජල ගුණත්වය
- භූගත ජල ගුණත්වය, විශේෂයෙන් අවට කණින ළිඳෙන් පානීය අවශ්‍යතාවයන්ට ගන්නා ජලය
- පෙදෙසේ පරිමණ්ඩිත වාතයේ ගුණත්වය
- පෙදෙසේ පරිමණ්ඩිත ධ්වණී මට්ටම්

50. **පාර්ශවකාර හා ප්‍රජා සාකච්ඡා පැවැත්වීම.** ශාඛ්‍යතා අදියර, ව්‍යාපෘතිය සුදානම් කිරීමේ අදියර, විස්තරාත්මක සැලසුම් අදියර වැනි ව්‍යාපෘතියේ සෑම තලයකම ව්‍යාපෘතියේ මුඛ්‍ය පාර්ශවකරුවන් වන රාජ්‍ය ආයතන, පළාත් මහ ඇමති හා පළාත් සභා නිලධාරීන්, යාපනය දිස්ත්‍රික්ක ලේකම්, ප්‍රාදේශීය ලේකම්වරුන් මධ්‍යම පරිසර අධිකාරිය, DOF, CC &වෙරළ සංරක්ෂණ සහ වෙරළබඩ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, ප්‍රජා සංවිධාන ධීවර සංවිධාන මෙතෝදිස්ත උසස් බාලිකා පාසැලේ පාසැල් සංවර්ධන සමිතිය සහ පොදු ජනයා ආදීන් වෙතින් විස්තරාත්මක මගපෙන්වීම් ලබා ගන්නා ලදී.

51. **ව්‍යාපෘතියේ ප්‍රධාන ප්‍රතිලාභීන්:** පේදුරුතුඩුව ධීවර ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය ජාතික වටිනාකමක් ඇති ව්‍යාපෘතියකි. සෘජු ප්‍රතිලාභ හිමි වන්නේ බහුදින යාත්‍රා සහිත ධීවර ප්‍රජාවටය. ධීවර සංවර්ධන පනතට අනුව ධීවර වරායක් යනු පොදු දේපළක් වන හෙයින් එය භාවිත කිරීමට භෞමික සීමා පැනවිය නොහැක. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම මගින් ධීවර කර්මාන්තය හා වාණිජමය ධීවර වරායක් හා බැඳි විවිධ ඉසව් හරහා සෘජු මෙන්ම වක්‍ර රැකියා අවස්ථා හා ආදායම් උත්පාදනය වන අතර මත්ස්‍ය තොග සහ සිල්ලර අලෙවි හා ඇසිරුම් ක්‍රමවේද වැඩිදියුණු වී ධීවරයන්ගේ ආරක්ෂාව තහවුරු වනවා පමණක් නොව ගුණාත්මයෙන් යුත් මත්ස්‍යයන් ලැබීම මගින් දේශයේ පෝෂණයද ඉහල යනු ඇත.

52. i) ආරක්ෂාකාරී යාත්‍රා තොටවල් (දැනට මෝසම් කාලවල මෙම තොටුපළවලට දැඩි තර්ජන ඇති වේ) ii) ඉදිකිරීම් හා මෙහෙයුම් අදියරවල උත්පාදනය වන සෘජු රැකියා අවස්ථා iii) ධීවර වරායට භාණ්ඩ හා සේවා සැපයීම වැනි ව්‍යාපෘතියේ කරුණු මගින් පෙදෙසේ ප්‍රජාව සෘජුවම ප්‍රතිලාභ ලබන අතර මෙයට අමතරව නවීන ධීවර ධීවර වරායක සම්ප්‍රාප්තියත් සමග පෙදෙසේ ඉඩම්වල වටිනාකමද ඉහළ යනු ඇත.

# දෙවන පරිච්ඡේදය

## 2. ආයතනික නෛතික හා ප්‍රතිපත්ති ක්‍රියාරාමුව

53. යෝජිත ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකාවේ පාරිසරික නීති නියාමන හා ආසියා සංවර්ධන බැංකුවේ ආරක්ෂා ප්‍රපත්ති මගින් නියාමනය වනු ඇත.

54. ඒ අනුව මෙම පරිච්ඡේදය මෙම ව්‍යාපෘතියට අදාල ශ්‍රී ලංකාවේ දේශීය නීති නියාමන සහ ප්‍රතිපත්තින් මෙන්ම ආසියා සංවර්ධන බැංකුවේ ආරක්ෂා ප්‍රතිපත්ති ප්‍රකාශය ප්‍රතිපත්ති සහ ව්‍යාපෘතියේ ඉදිකිරීමට හා මෙහෙයුමට අදාල ජාත්‍යන්තර ගිවිසුම් ආදිය පැහැදිලි කරනු ඇත.

## 2.1 ශ්‍රී ලංකාවේ පරිසරය සහ සම්පත් හා බැඳි නෛතික ප්‍රතිපාදන හා නියාමන

### 2.1.1 දේශීය නීති හා නියාමන

55. යෝජිත පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය ආයෝජනයට දේශීය පාරිසරික නීති හා නියාමන ගණනාවක්ම අදාල වන අතර මෙම නීති හා නියාමනවල සංෂේපයක් පහත වගුව 2-1 හි ලබා දී ඇත. (ආසියා සංවර්ධන බැංකුව 2017)

**වගුව 2-1 පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය හා බැඳි පාරිසරික නීතිවල සංක්ෂේපය**

| නීතිය | ව්‍යාපෘති අදාලතාවය | රජයේ යොමු ලක්ෂ්‍යය |
|---|---|---|
| ව්‍යවස්ථාව (1987) | රාෂ්ට්‍රීය මුහුදු සීමා ඇතුලත වන මතශ්‍ය හා ධීවර ස්ථාන සමගාමිව පාලනය වෙයි | ධීවර හා සාගර සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, උතුරු පළාත් සභාව |
| 1980 ජාතික පරිසර පනත අංක 47 සහ 2000 එහි සංශෝධන අංක 53 | වෙරළබඩ කලාපයට පිටත ව්‍යාපෘති සඳහා වන අනුමැති. ගොඩබිමේ මුලාශ්‍රවලින් ඇති වන දූෂණ වැළැක්වීම හා පාලනය | මධ්‍යම පරිසර අධිකාරිය |
| 2011 වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත අංක 49 | වෙරළබඩ කලාප සඳහා වන සංවර්ධන අනුමැති. වෙරළබඩ සම්පත් ලේඛනය සහ කළමනාකරණ සැලැස්ම | වෙරළ සංරක්ෂණ සහ වෙරළබඩ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව |
| ධීවර හා ජලජ සම්පත් පනත සංශෝධිත (2016) | ධීවර ප්‍රතිපත්ති, අධීක්ෂණය සහ කළමනාකරණය | ධීවර හා සාගර සම්පත් සංවර්ධන අමාත්‍යාංශය |
| 2009 ශාක හා ජීවි සංරක්ෂණ (සංශෝධන) පනත අංක 22 | වන ජීවි සංරක්ෂණ පෙදෙසේ සහ ආරක්ෂිත ජීවි විශේෂ | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව |
| 1907 වනාන්තර ආඥා පනත (සංශෝධිත) අංක 17 | වනාන්තර සංරක්ෂණය හා කළමනාකරණය කිරීම හා ගස් කැපීම | වන දෙපාර්තමේන්තුව |
| 2008 සාගර දූෂණ වැළැරක්වීමේ පනත අංක 35 | සාගර මුලාශ්‍රවලින් ඇති වන දූෂණ වැළැක්වීම හා පාලනය | සාගර පරිසර ආරක්ෂක අධිකාරිය |
| 1987 ප්‍රාදේශිය සභා පනත අංක 156 | සෞඛ්‍යය හා ස්වස්තථාවය සහා පොදු මාර්ග භාර පළාත් පාලන ආයතන | ප්‍රාදේශීය සභාව |
| 1984 මාදැල් නියාමනය | වෙරළබඩ පෙදෙස්වල මාදැල් ධීවර කටයුතු කළමනාකරණය කර බලපත්‍ර නිකුත් කරයි | ධීවර හා සාගර සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලය |
| 1992 පතල් සහ ඛණිජ පනත අංක 33 | ගල් කැඩීම සඳහා බලපත්‍ර නිකුත් කරයි | භූවිද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය |
| 1998 පුරාවස්තු (සංශෝධන) පනත අංක 24 | පුරාවස්තු සංරක්ෂණය | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව |
| 1950 ඉඩම් අත් කර ගැනීමේ පනත අංක 9 | වන්දි ගෙවීම ඇතුලත්ව පොදු අරමුණු සඳහා ඉඩම් අත් කර ගැනීම | ඉඩම් අමාත්‍යාංශය, දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලය |
| 1996 පාංශු සංරක්ෂණ (සංශෝධන) පනත අංක 24 | පාංශු සම්පත් සංරක්ෂණය හා පාංශු භාවිතය හා පාංශු ඛාදනය අවම කිරීම | ඉඩම් අමාත්‍යාංශය |

වෙරළ සංරක්ෂණ සහ වෙරළබඩ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව = වෙරළ සංරක්ෂණ සහ වෙරළබඩ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මධ්‍යම පරිසර අධිකාරිය = මධ්‍යම පරිසර අධිකාරිය**DoA** = පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව **DWC**= වනජීවී සංරක්ෂන දපාර්තමේන්තුව **GSMB** = භූවිද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්‍යාංශය **MEPA** = සාගර පරිසර ආරක්ෂක අධිකාරිය **MFARD** = ධීවර හා සාගර සම්පත් සංවර්ධන අමාත්‍යාංශය **MoL** = ඉඩම් අමාත්‍යාංශය **NPC** = උතුරු පළාත් සභාව **PS** = ප්‍රාදේශීය සභාව **FD** = වන දෙපාර්තමේන්තුව **MoA** = ඉඩම් අමාත්‍යාංශය**DS** = දිස්ත්‍රික්ක ලේකම් කාර්‍යයාලය

56. දේශයේ පරිසරය ආරක්‍ෂා කිරීමේ හා කළමනාකරණය කිරීමේ වගකීම පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහිම අවධාරණය කර ඇත (ශ්‍රී ලංකා රජය 1978-10) පරි 6 (රාජ්‍ය නියාමන ප්‍රතිපත්ති සහ මූලික රාජකාරී) කොටස 27 (14) සහ 28 (f) මෙසේ ප්‍රකාශ කරයි: "ප්‍රජාවගේ ප්‍රයෝජනය සඳහා රජය විසින් පරිසරය ආරක්‍ෂා කර සංක්‍ෂණය කර වැඩිදියුණු කළ යුතුය" සහ "ස්වාභාව ධර්මයා ආරක්‍ෂා කර එහි වටිනාකම සංරක්‍ෂණය කිරීම සෑම ශ්‍රී ලාංකිකයෙකුගේම වගකීමකි"

### 2.1.2 ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ශ්‍රී ලංකා ජනරජයේ ව්‍යවස්ථාව 1978

57. රාෂ්ට්‍රීය මුහුදු සීමාව ඇතුලත වන මත්ස්‍යයන් හා ධීවර පරිශ්‍ර (පළාත් සභා ආඥාව යටතේ) පළාත් සභා ලැයිස්තුවට ඇතුල් නොවන බව හා එය අයත් වන්නේ සංගාමී ලැයිස්තුවට (මධ්‍යම ආණ්ඩුව හා පළාත) යැයි ශ්‍රී ලංකා රජයේ ව්‍යවස්ථාව (1978) අවධාරණය කරයි. රාෂ්ට්‍රීය මුහුදු සීමාවෙන් පිටත ඇති මත්ස්‍යයන් හා ධීවර පරිශ්‍ර තිබෙනුයේ අවශේෂණ ලැයිස්තුවෙහිය (මධ්‍යම ආණ්ඩුව)

### 2.1.3 1980 ජාතික පරිසර පනත අංක 47 සහ 2000 සංශෝධිත පනත අංක 53

58. නියාමන පරිසරයේ ආරක්‍ෂාව කළමනාකරණය සහ වැඩිදියුණු කිරීම සඳහා මෙන්ම පරිසරයේ නඩත්තුව සහ එහි ගුණත්වය පාලනය කිරීම සඳහාද දූෂණ ය වැළැක්වීම, අවම කිරීම හා පාලනය කිරීම සඳහා වන පරිපාලන සැකසීම ජාතික පරිසර පනත (ශ්‍රී ලංකා රජය 1980) ලබා දෙයි.

59. ජාතික පරිසර පනත ක්‍රියාත්මක කරනුයේ පාරිසරික සහ වනජීවී සම්පත් අමාතයාංශය යටතේ ඇති මධ්‍යම පරිසර අධිකාරිය විසිනි. මෙම ආයතනය ස්ථාපිතව ඇත්තේ මහවැලි සංවර්ධන සහ පාරිසරික අමාත්‍යාංශයයටතේ වන අතර පනතේ ප්‍රතිපාදන ක්‍රියාවට නැංවීමේ වගකීම මෙම ආයතනය සතුය. දේශයේ පරිසරය හා ස්වාභාවික සම්පත් ආරක්‍ෂා කිරීම සියලුම පරාස පාහේ මෙම පනත මගින් ආවරණය වෙයි.

60. මෙම පනත මගින් වෙරළ කලාපයෙන් පිටත ඇති ඉඩම් හා ස්වාභාවික සම්පත් සංරක්‍ෂණය කිරීම හා කළමනාකරණය කිරීමේ වගකීම් මධ්‍යම පරිසර අධිකාරියට පවරා ඇත. තවද මුහුදට සහ මිරිදිය ජල මූලාශ්‍රවලට බැහැර කරන අපත ජලයේ ප්‍රමිතිය කළමනාකරණය කිරීම හා පාරිසරික හායනය සඳහා අධීක්‍ෂණය කිරීම මධ්‍යම පරිසර අධිකාරියසතු කාර්‍යභාරයකි. අදාල සම්මිති නිර්ණය කිරීම මගින් පාරිසරික ගුණත්වය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මෙන්ම පාරිසරික දූෂණ ය පාලනය කිරීම සඳහා වන ප්‍රතිපාදන පනතේ IV B කොටස ලබා දෙයි.

61. සංවර්ධන ව්‍යාපෘතිවල බලපෑම් ඇගයීම අවම කිරීම හා කළමනාකරණය කිරීම සඳහා ජාතික පරිසර පනතට ප්‍රධාන නියාමන ප්‍රතිපාදන දෙකක් ඇතුලත් කර ඇත:

i. විශාල සංවර්ධන ව්‍යාපෘති සඳහා වන පාරිසරක බලපෑම් වාර්තා ක්‍රමවේදය - 23 ජුනි 1993 ප්‍රකාශයට පත් කරන ලද අති විශේෂ ගැසට් අංක 772/22 හි සඳහන් නියාමන

ii. දූෂණ ය පාලනය කිරීම සඳහා වන පාරිසරික ආරක්‍ෂක බලපත්‍රය (EPL) - 25 ජනවාරි 2008 ප්‍රකාශයට පත් කරන ලද අතිවිශේෂ ගැසට් අංක 1533/16 හි සඳහන් නියාමන

62. පාරිසරක බලපෑම් වාර්තාව සඳහා වන ප්‍රතිපාදන ජාතික පරිසර පනතේ IV C කොටසෙහි ලබා දී ඇති අතර 'නිර්දේශිත ව්‍යාපෘති' සඳහා ප්‍රාරම්භක පාරිසරික පරීක්ෂාව හෝ පාරිසරක බලපෑම් වාර්තාව ඉදිරිපත් කළ යුතුය යැයි අවධාරණය කරයි. මෙය - 23 ජුනි 1993 විශේෂ ගැසට් අංක 772/22 හිද අවධාරණය කර ඇත.

63. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියේ පරාසය වෙරළ සංරක්ෂණ සහ වෙරළබඩ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ඇගයමට ලක් කර ඇති අතර මෙය සඳහා පාරිසරික බලපෑම් වාර්තාවක් අවශ්‍ය වෙයි. මෙම නිර්ණය කිරීම ආසියා සංවර්ධන බැංකුව ආරක්ෂා ප්‍රතිපත්ති ප්‍රකාශයේ ප්‍රාරම්භක පාරිසරික පරීක්ෂාව පිළිබිඹු කරන හෙයින් ක්‍රියාදාම දෙකටම අනුකූල වී ඇති බව තහවුරු කරනා ලෙසින් එක් සුවිශේෂී පාරිසරික වාර්තාවක් සම්පාදනය කර ඇත.

64. ශ්‍රී ලංකාවේ පාරිසරික හා ස්වාභාවික සම්පත් මත වන ප්‍රතිපත්ති සම්පාදනය මහවැලි සංවර්ධන සහ පාරිසරික අමාත්‍යාංශයේ කාර්යභාරයක් වන හෙයින් අමාත්‍යාංශයේ අංශ කිහිපයක් හරහා ප්‍රමුඛව කටයුතු කරන රාජ්‍ය ආයතනය ලෙසින් පවතියි. වෙරළ සංරක්ෂණ සහ වෙරළබඩ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව ව්‍යාපෘති සංවර්ධන එකගතාවය (DC) නිකුත් කිරීම සඳහා වගකීම් දරයි. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියසඳහා විවිධකාර අනුමැති ලබා දිය යුතු අමාත්‍යාංශ සහ එහි විවිධ අංශ **වගුව 2-2 හි** ලබා දී ඇත.

**වගුව 2-2 ව්‍යාපෘති සංවර්ධන එකගතාවය සඳහා වන ඉල්ලුම හා සම්බන්ධ මුඛ්‍ය රාජ්‍ය ආයතන**

| ආයතනය | පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය හා බැඳි භූමිකාව |
|---|---|
| ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය | ව්‍යාපෘතියේ පාරිසරික ඇගයීම සම්පාදනය කිරීම වන අතරව්‍යාපෘති කළමනාකරණ ඒකකය / ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය හරහා එය ක්‍රියාත්මක කරනු ලැබේ |
| | CFHC: ශ්‍රී ලංකාවේ ධීවර වරාය කළමනාකරණය භාර රාජ්‍ය ආයතනය මෙය වන නමුත් දැනට උතුරේ දිස්ත්‍රික්කවල ධීවර වරාය කිසිවක් සඳහා නිත්‍ය නියෝජනයක් මෙම ආයතනය ලබා නොදෙයි. උතුරු පළාතේ තිරසාර ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය ප්‍රතිදාන 1 යටතේ ධීවර වරාය නැංගුරම්පළවල් සහ තොටුපළවල් සඳහා වන ප්‍රවර්ධක මෙම ආයතනයයි. |
| | ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව: ධීවර හා ජලජ සම්පත් පනතේ (FARA) ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම සඳහා වන සමස්ත වගකීම අයත් වන්නේ මෙම ආයතනයට වන අතර ආයතනයේ විශේෂ යොමුව තිබෙනුයේ අදාල ජාත්‍යන්තර හා කලාපීය ගිවිසුම්වලට අනුකූල වීම කෙරෙහිය. ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව දිස්ත්‍රික්ක කාර්යයාල සහාකර ධීවර අධ්‍යක්ෂවරුන් යටතේ තිබෙන අතර යාපනය දිස්ත්‍රික්කයට නිත්‍ය ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව නියෝජනයක් ඇත. |
| | ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන ආයතනය (NARA):ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් හා බැඳි පර්යේෂණ පැවැත්වීම හා සම්බන්ධීකරණය ලබා දීම සංවර්ධනය හා කළමනාකරණය කිරීම ආදිය පැවරී ඇති ප්‍රධානතම ජාතික ආයතනය මෙයයි. 'සාගර ජීව විද්‍යාත්මක සම්පත් අංශය 'සමාජාර්ථික සහ අලෙවිකරණ පර්යේෂණ අංශය''පාරිසරික අධ්‍යයන අංශය''පශ්චාත් අස්වනු තාක්ෂණ ආයතනය''සාගර විද්‍යාව සඳහා වන ජාතික ආයතනය''සාගර භූලක්ෂණ හා සාගර විද්‍යාව සඳහා වන ජාතික ආයතනය''ජාතික ජලවිද්‍යා කාර්යයාලය''අධීක්ෂණ හා ඇගයීම් අංශය' වැනි පර්යේෂණ අංශ ගණනාවක්ම ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන ආයතනයට ඇතුලත් වෙයි. එසේ වුවද උතුරු පළාතේජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේකාර්යයාලයක් නොමැත. |
| | |
| මහවැලි සංවර්ධන සහ පාරිසරික අමාත්‍යාංශය (මහවැලි සංවර්ධන සහ පාරිසරික අමාත්‍යාංශය) | පාරිසරික හා ස්වාභාවික සම්පත් මෙම අමාත්‍යාංශයේ වගකීමයි. ජෛව විවිධත්වය පාරිසරික දූෂණ පාලනය, රසායන ද්‍රව්‍ය කළමනාකරණය, කාලගුණ විපර්යාස, ස්වාභාවික සම්පත් කළමනාකරණය, තිරසාර සංවර්ධනය හා තිරසාර පරිසරය ආදිය සඳහා අංශ මෙම අමාත්‍යාංශයේ ඇත. |
| | අමාත්‍යාංශයේ විධාන ක්‍රියාත්මක කිරීමේ විවිධ ආයතන පහත පරිදි වේ: |
| | ➢ මධ්‍යම පරිසර අධිකාරිය: 2000 ජාතික පරිසර පනතේ (සංශෝධන) අංක 53 (ශ්‍රී ලංකා රජය 2000) ප්‍රතිපාදන ක්‍රියාත්මකකිරීම මධ්‍යම පරිසර අධිකාරියයේ වගකීම වන අතර ජාතික වශයෙන් පාරිසරික ආරක්ෂා බලපත්‍ර ක්‍රමවේදය නියාමනය කිරීමේ කාර්‍ය භාරයද මෙම අධිකාරිය සතු වෙයි. එමෙන්ම වෙරළ කලාපයෙන් පිටත ඇති ප්‍රාරම්භක පාරිසරික පරීක්ෂාව / පාරිසරක බලපෑම් ක්‍රියාදාමයේ වගකීමත් මධ්‍යම පරිසර අධිකාරියට පවරා ඇති අතර අවශ්‍ය විට ව්‍යාපෘතියකට අනුමැතිය ලබා දීමට අදාල අනෙකුත් රාජ්‍ය ආයතනවල සහයද ලබා ගනු ඇත. තවද නිර්දේශිත නොවන ක්‍රියාකාරකම් සම්බන්ධ පාරිසරික නිර්දේශ, විධිය, වාතයේ ගුණත්වය, ශබ්ද නියාමනය ආදියද අධිකාරියේ වගකීම්ය. උතුරු පළාතේ සියලුම දිස්ත්‍රික්කවල අධිකාරියේ කාර්‍යයාල පිහිටා ඇත. |
| | ➢ වෙරළ සංරක්ෂණ සහ වෙරළබඩ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව: 2011 වෙරළ සංරක්ෂණ |

| | |
|---|---|
| | පනත (සංශෝධන) අංක 49 (ශ්‍රී ලංකා රජය 2011) යටතේ කාර්‍ය භාර පවරා ඇති මෙම දෙපාර්තමේන්තුව පනතේ නිර්වචනය කර ඇති පරිදි මූලික වශයෙන් වෙරළ කලාපයේ සම්පත් සංරක්ෂණය කිරීම හා සමීක්ෂණ පැවැත්වීම, කලාපයේ නිෂ්පාදන ඇතුලත්ව 'වෙරළ කලාපය' ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කරයි. (වචනාවලියට යොමු වන්න) මධ්‍යම පරිසර අධිකාරිය සහ වෙරළ සංරක්ෂණ සහ වෙරළබඩ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවමෙන් නොව වෙරළ කලාපය තුල සංවර්ධන ව්‍යාපෘති සඳහා අනුමැති සම්පාදන ක්‍රියාවලියට අන් රාජ්‍ය ආයතනවලට වගකීම් පැවරිය හැකි නමුත් සහය ලබා ගැනීමට දෙපාර්තමේන්තුවට නොහැක. දෙපාර්තමේන්තුවට 'බලපෑමට ලක් පෙදෙස්''වෙරළ උද්‍යාන''සංරක්ෂිත පෙදෙස්''විශේෂ කළමනාකරණ පෙදෙස්' යැයි පෙදෙස් නම් කළ හැකි අතර 'වෙරළබඩ ප්‍රවේශ සැලසුම්' සහ 'විශේෂ කළමනාකරණ පෙදෙස් සඳහා වන සැලසුම්' ඇතුලත්ව මෙම පෙදෙස් සඳහා සැලසුම් සම්පාදනය කර ක්‍රියාත්මක කළ හැකිය. වෙරළ සංරක්ෂණ සහ වෙරළබඩ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවඅංශ 3 කට බෙදා ඇත: (i) අධීක්ෂණය හා පර්යේෂණ කටයුතු භාර වෙරළබඩ පර්යේෂණ සහ සැලසුම් අංශය (ii) වෙරළතීර කළමනාකරණ ව්‍යාපෘති සහ පවතින වෙරළාරක්ෂක ව්‍යුහ නඩත්තුව භාර වෙරළ කටයුතු අංශය (iii) සංවර්ධන බලපත්‍ර ක්‍රියාදාමය සහ විශේෂ කළමනාකරණ පෙදෙස් සඳහා වන සැලසුම් භාර සැලසුම් අංශය. යාපනය දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලයෙහි වෙරළ සංරක්ෂණ සහ වෙරළබඩ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අංශයක් ඇති අතර කිළිනොච්චි හා මන්නාරම් දිස්ත්‍රික්කවලද එම දිස්ත්‍රික්ක ලේකම් කාර්යාලවලට අනුයුක්තව වෙරළ සංරක්ෂණ සහ වෙරළබඩ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව නිලධාරීන් පත්කර ඇත. |
| | ➢ සාගර පාරිසරික ආරක්ෂක අධිකාරිය (MEPA) 2011 සාගර දූෂණ වැළැක්වීමේ පනත (ශ්‍රී ලංකා රජය 2011) යටතේ කාර්යභාර පවරා ඇති මෙම අධිකාරියට අයත් වන්නේ සාගර හා සම්බන්ධ දූෂණ වැළැක්වීම පමණි, භෞමික මූලාශ්‍ර දූෂණ වැළැක්වීම මධ්‍යම පරිසර අධිකාරියේ රාජකාරි පරාසයකි. තෙල් වැගිරීම සම්බන්ධ හදිසි අවස්ථා සැලසුම්, අපද්‍රව්‍ය ලබා ගැනීම බංකර් ඉදිකිරීමේ අනුමැති ආදිය සාගර පාරිසරික ආරක්ෂක අධිකාරියේ වගකීම් වේ. යාපනයේ එක් ප්‍රාදේශීය කාර්‍යයාලයක් මගින් සාගර පාරිසරික ආරක්ෂක අධිකාරියඋතුර නියෝජනය කරයි. |
| | ➢ ජාතික සංචිත හා අභයභූමි හඳුනා ගැනීම, ගැසට් කිරීම සහ කළමනාකරණය කිරීම සහ 2009 දී අංක 22 දරණ සත්ත්ව හා ශාක ආරක්ෂණ (සංශෝධන) පනත යටතේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට පවරා ඇත. පනතේ උපලේඛනවල ලැයිස්තුගත කිරීම සඳහා සත්ත්ව හා ශාක විශේෂ හඳුනාගෙන ඇති අතර ඒවා එයට අදාලව ආරක්ෂා කරනු ලැබේ.<br>➢ DWC සමුද්‍රීය ඒකකයට උතුරු පළාතේ ජාතික උද්‍යාන හා රක්ෂිත ගණනාවක සාගර මෙහෙයුම් මධ්‍යස්ථාන ඇතුළත් වේ. මෙයට වන්කලයි අභයභූමිය, ඇඩම්ස් පාලම ජාතික උද්‍යානය, චන්ඩිකුලම් ජාතික උද්‍යානය සහ කොකිලායි අභයභූමිය ඇතුළත් වෙයි. ශ්‍රී ලංකාවේ CITES සඳහා කළමනාකරණ හා තාක්ෂණික අධිකාරිය වන්නේ සහ CMS / බොන් සම්මුතිය සහ RAMSAR සම්මුතිය සඳහා ජාතික කේන්ද්‍රස්ථානය වන්නේ DWCය. DWC ආරක්ෂිත ප්‍රදේශ සහ විශේෂ පරිපාලනය කරනු ලබන්නේ දිස්ත්‍රික්කවලට ගැලපෙන දිස්ත්‍රික්කවල ඇති ප්‍රදේශවලය. උතුරු පළාත් දිස්ත්‍රික්ක තුනක් (යාපනය, මුල්ලතිව් සහ කිලිනොච්චි) පරිපාලනය කරන කලාපීය සහකාර අධ්‍යක්ෂ කාර්යාලයක් කිලිනොච්චියෙහි ඇත. වව්නියා දිස්ත්‍රික්කයේ මඩුහි සහකාර අධ්‍යක්ෂ කාර්යාලයක් උතුරු පළාතේ වවුනියා සහ මන්නාර දිස්ත්‍රික්කය සමඟ එක්ව කටයුතු කරයි.<br>➢ 1992 අංක 33 දරණ පතල් හා ඛනිජ පනත යටතේ සේවා සැපයීම සඳහා පිහිටුවන ලද භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ඛනිජ සංවර්ධනයේ ප්‍රධාන ආයතනය වේ. මෙය අවධාරනය කරන්නේ ඛනිජ පදනම් කරගත් කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමට රජය දක්වන කැපවීමයි. කාර්යාංශයට ප්‍රාථමික මෙහෙයුම් හතරක් ඇත: භූ විද්‍යාත්මක සිතියම්කරණය සහ ඛනිජ ගවේෂණය, පතල් කැණීම් සහ පතල් නියාමනය (මූලික ක්‍රියාකාරකම්) සේවාදායක ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාකාරකම් (ඛනිජ සම්පත් සමීක්ෂණ, රසායනාගාර සේවා, භූ භෞතික හා විදුම් කොන්ත්‍රාත්තු) සහ භූ විද්‍යා තොරතුරු. පතල් අංශය මේ වන විට යාපනය ඇතුළු ප්‍රදේශවල ප්‍රාදේශීය කාර්යාල 14 ක් පවත්වාගෙන යයි. යෝජිත ව්‍යාපෘතියට ආම්පන්න සහ පිරවුම් ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් අවශ්‍ය වේ. පතල් බලපත්‍ර ලබා දීම සහ අධීක්ෂණය භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය සින් ක්‍රියාත්මක කරනු ලැබේ. |
| | ➢ මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්‍යාංශය (CECB): මෙම කාර්‍යාංශය කටයුතු කරන්නේ ස්වයං මූල්‍ය ප්‍රතිපාදිත රාජ්‍ය සංස්ථාවක් ලෙසින් වන අතර ඉංජිනේරු උපදේශන, ඉදිකිරීම් හා එය හා බැඳි සේවා මෙම ආයතනය ලබා දෙයි. ගොඩනැගිලි, මහා මාගර් හා දුම්රිය මාර්ග, පාළම් ජලවිදුලිය වාරිමාර්ග වෙරළබඩ ධීවර වරාය සහ ජල සම්පාදනය ආදිය මෙම සංස්ථාව නිපුණත්වය දක්වන ඉසව් වේ. ඉංජිනේරු ද්‍රව්‍ය සඳහා පර්යේෂණාගාරයක් සහ භූවිද්‍යා විමර්ශන ඒකකයක් ඇති මෙම ආයතනයේ ප්‍රාදේශීය කාර්‍යයාලයක් කිළිනොච්චියේ පිහිටා ඇත. |
| ආරක්ෂක අමාත්‍යාංශය **(MD)** | ආරක්ෂක අමාතයාංශය සහ එය යටතේ වන ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට (DMC) 2005 ආපදා කළමනාකරණ පනත අංක 13 (ශ්‍රී ලංකා රජය 2005) මගින් ලබා දී ඇති බලතල අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය කාලගුණ විපර්යාසය මුල් කර ගත් ආපදා කළමනාකරණ ගැටළු සඳහා කාලගුණ විපර්යාස ලේකම් කාර්‍යයාලය (CCS) සමග සමීපව කටයුතු කරයි. මුහුදු මට්ටම ඉහළ යාම, කුණාටු විසර්ජනය, වෙරළඛාදනය, නියඟය ආදිය සඳහා ජාතික අනතුරු ප්‍රෝෆයිලයක් (ශ්‍රී ලංකා රජය 2012a) |

| | |
|---|---|
| | ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට විසින් සම්පාදනය කරන ලදී. ආපදා කළමනාකරණ අමාත්‍යාංශයසහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යටතේ ආපදා කළමනාකරණ ඒකකයක් සෑම දිස්ත්‍රික්ක ලේකම් කාර්යයාලයකම පිහිටා ඇත. |
| බුද්ධසාසන සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය **(MBCRA)** | ශ්‍රී ලංකාවේ සංස්කෘතික කටයුතු භාරව ක්‍රියා කරන්නේ බුද්ධසාසන සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශයයි. ඒ අනුව දිවයිනේ සියලුම සංස්කෘතික අගයන් ඇති පරිශ්‍ර සහ ඒවාට අදාලව පැන නගින ප්‍රශ්න නිරාකරණයද මෙම අමාත්‍යාංශයේ විෂය පතයේ කරුණු වේ. |
| පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව **(DoA)** | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව (DoA) ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා කරුණු භාරව කටයුතු කරන අතර මෙම දෙපාර්තමේන්තුව කිසිම අමාත්‍යාංශයක් යටතට පත් කර නොමැති හෙයින් අමාත්‍ය නොවන රජයේ දෙපාර්ත්මෙන්තුවක් ලෙසින් නිර්වචනය වන සුවිශේෂී ආයතනයකි. |

### 2.1.4 2011 වෙරළ සංරක්ෂණ පනත (සංශෝධන) අංක 49

65. 2011 වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත අංක 49 (ශ්‍රී ලංකා රජය 2011) වෙරළබඩ කලාපය සංරක්ෂණය සඳහා වන පරිපාලනමය ප්‍රතිපාදන සපයයි. වෙරළබඩ කලාපය ඇතුලත තිබෙන සම්පත් අධ්‍යයනය කිරීම එම කලාපයේ නිෂ්පාදන හා සම්පත් කළමනාකරණය මෙන්ම කලාපය ඇතුලත ව්‍යාපෘති සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ යාන්ත්‍රණය සම්පාදනය කිරීම ආදිය මෙම පනත යටතේ වන ප්‍රධාන ක්‍රියාකාරකම් වෙයි. වෙරළ කලාපයක් තුල දක්නට ඇති ජීවී හා අජීවී සියලුම සම්පත් පනත යටතේ 'වෙරළබඩ සම්පත්' යැයි නිර්වචනය කර ඇති අතර (ශ්‍රී ලංකා රජය 2016b) පනත යටතේ 'කළමනාකරණය' යන්නෙහි අරුත පුනර්ජනනීය හා පුනර්ජනනීය නොවන වෙරළබඩ සම්පත් එක්ව හෝ වෙන්ව කළමනාකරණය කිරීමයි. එනමුත් ධීවර හා ජලජ සම්පත් බැහැර කෙරේ. මෙම සම්පත් අයත් වන්නේ 1996 ධීවර හා ජලජ සම්පත් පනතටය අංක 2 (සංශෝධිත).

66. 'බලපෑමට ලක් පෙදෙස්''වෙරළ උද්‍යාන සංරක්ෂණ පෙදෙස්''විශේෂ කළමනාකරණ පෙදෙස්' ආදිය ප්‍රකාශයට පත්කිරීමට පනත ඉඩ සලසන අතර 'වෙරළබඩ ප්‍රවේශ සැලැසුම්' සහ 'විශේෂ පෙදෙස් කළමනාකරණ සැලසුම්' සංවර්ධනය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමටද ප්‍රස්ථාව සලසයි. එපමණක් නොව කොරල් (31A (1)) සහ වැලි (31E (1))වැනි වරළබඩ සම්පත් ගැනීම සම්බන්ධ තහනම් පැනවීමටද මෙම පනතේ ප්‍රතිපාදන ඇත.

67. වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් නොමැතිව විස්තර කරන ලද ක්‍රියාකාරකම හැර වෙරළබඩ කලාපයක් තුල අන් කිසි සංවර්ධන ක්‍රියාකාරමක කිසිදු පුද්ගලයෙකු නොයෙදිය යුතුය යැයි වෙරළ සංරක්ෂණ පනතේ ඡේදය 14 අවධාරණය කරයි. 'වෙරළබඩ කලාපය' යනු 'ගොඩබිම දෙසට මීටර් 300 මධ්‍යන්‍ය උච්ච් ජල රේඛාව හා මුහුදේ සිට කිමි 2 ක මධ්‍යන්‍ය අවම ජල රේඛාව ඇතුලත පිහිටි පෙදෙස' යැයි නිර්වචනය කර ඇත. ගංගා, උල්පත්, කලපු හෝ සාගරය හා නිත්‍යව හෝ සෘතුමය වශයෙන් සම්බන්ධ වන අන් ජලස්කන්ධ සඳහා වන විග්‍රහය අනුව ගොඩබිම් දෙසට ඇති දුරෙහි භෞමික සීමාව මෙය මධ්‍යන්‍ය අවම ජල රේඛාවෙන් හඳුනා ගත් ස්වාභාවික පිවිසුම් ලක්ෂ්‍ය දෙක අතර ලම්බාකාරව මණින ලද කිමි 2 ක් වන අතර මෙහි ප්‍රස්ථාරමය පැහැදිලි කිරීම **රූපසටහන 2.1** හි දක්වා ඇත.

**රූපසටහන 2-1 වෙරළබඩ කලාප නිර්වචනය (ශ්‍රී ලංකා රජය 2016b)**




මූලාශ්‍රය ශ්‍රී ලංකා ජනරජය 2016 බී

68. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියේ යෝජිත සංවර්ධන ක්‍රියා පරාසය ඇතුලත් වන්නේ වෙරළබඩ කලාපයකට හෙයින් ආමාත්‍යාංශ නිර්ණායක අනුව වෙරළ සංරක්ෂණ සහ වෙරළබඩ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවවිසින් නිකුත් කරන සංවර්ධන අනුමැතියක් ලබා ගැනීම අවශ්‍ය වනු ඇත. මෙයට අමතරව වෙරළ කලාපය තුල දූෂණ ඇති කළ හැකි හා එය හා බැඳි ගොඩබිම මුල් කර ගත් සියලු නිර්දේශිත ක්‍රියාකාරකම් සඳහාමධ්‍යම පරිසර අධිකාරියද බලපත්‍රයක් නිකුත් කරනු ඇත. එමෙන්ම සාගර දූෂණ ය වැළැක්වීම හා පාලනය කිරීම සාගර පාරිසරික ආරක්ෂක අධිකාරිය සතු වගකීමකි.

69. ඉහත සඳහන් පරිදි ව්‍යාපෘතිය ජාතික පරිසර පනත (NEA) යටතේ වන නිර්දේශිත සංවර්ධනයක් වන නමුත් CCD විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ මෙසේ සඳහන් කරයි: ‘වෙරළ කලාපය ඇතුලත සිදු කරන සියලුම පොදු ක්‍රියාකාරකම් CCD බලපත්‍ර ක්‍රියාවලියට විෂය වේ’. එහෙයින් සංවර්ධන කටයුතු ආරම්භ කරන්නට පෙර රාජ්‍ය ආයතනය වන CCD වෙතින් උපදෙස් ලබා ගත යුතුය. එසමගම සුළු බලපත්‍ර හා ප්‍රධාන බලපත්‍ර යනුවෙන් බලපත්‍ර වර්ග දෙකක් ඇත යැයිද එම මාර්ගෝපදේශ පෙන්වා දෙයි: කුඩා නිවාස සහ කුඩා පරිමාණ වාණිජ කටයුතු සඳහා සුළු බලපත්‍ර නිකුත් කරනු ලබන අතර ප්‍රධාන බලපත්‍රය අවශ්‍ය වන මහා පරිමාණ නිර්දේශිත ක්‍රියාකාරකම් 19 ක් ඇත. මෙයින් 10 ක් පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියට අදාල වෙයි: i) වර්ග අඩි 1000 ක (වර්ග මීටර 93 ක්) හෝ එයට වඩා වැඩි භූමි ප්‍රමාණයක නිවාස සහ එය හා බැඳි ගොඩනැගිලි ii) ධීවර වරාය ව්‍යුහ සහ ජලතරණ නාලි iii) පොදු සහ ආගමික ගොඩනැගිලි iv) වෙරළතීර ආරක්ෂක කටයුතු v) මළාපවහන පිරියම් පහසුකම් සහ සාගර මෝය vi) ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම vii) කැණීම් පිරවීම් උද්‍යානලංකාරකරණය හා සරණී කිරීම viii) වැලි සිප්පි හෝ ශාක ඉවත් කිරීම ix) වැලිකණ්ඩි කැඩුම සහ x) ප්‍රතිසංස්කරණය

70. ධීවර කටයුතු හා සම්බන්ධ ගොඩනැගිලි හා යටිතලපහසුකම් සඳහා මාර්ගෝපදේශ විශේෂිත සංවර්ධණ නිර්දේශ පනවයි. මෙයට මීටර 200 ක අවරෝධ කලාපයක් ඇතුලත් වන නමුත් ජාතික වශයෙන් වැදගත්කමක් ඇති ව්‍යාපෘති සඳහා මෙයට අධ්‍යක්ෂවරයා විශේෂයක් කළ හැකිය. මෙම කරුණ පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියට අදාල වන්නකි.

71. මෙයට අමතරව වෙරළ කාලපය තුල තහනම් වන විශේෂිත ක්‍රියාකාරකම් 7 ක් මාර්ගෝපදේශ සඳහන් කරයි. එයින් පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියේ ක්‍රියා පරාසයට ඇතුල් වන්නක් හැටියට පර්යේෂණ අරමුණු නොවන කාරනා

සඳහා කොරල් ඉවත් කිරීම සඳහන් කළ හැකිය. ධීවර වරාය ඉදිකිරීමට කොරල් ඇතුලත්ව කොරල් පර ඉවත් කිරීම අවශ්‍ය වන හෙයින් මෙනිසා පරිසර පද්ධතියට ඇති විය හැකි බලපෑම් හා ඒවායෙහි ප්‍රතිඵල මෙම ප්‍රාරම්භක පාරිසරික පරීක්ෂාවට ඇතුලත් කර ඇත. බලපත්‍රය ඉදිරිපත් කරන විට මෙම කරුණ ගැන CCD සමග පුළුල් ලෙසින් සාකච්ඡා කරනු ඇත.

### 2.1.5 ධීවර හා ජලජ සම්පත් පනත සංශෝධිත (2016)

72. ශ්‍රී ලංකාවේ ධීවර හා ජලජ සම්පත් කළමනාකරණය කිරීමට, නියාමනය කිරීමට, සංවර්ධනය කිරීමට හා සංරක්ෂණය කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ධීවර හා ජලජ සම්පත් පනත සංශෝධිත (2016) (ශ්‍රී ලංකා රජය 2016) ලබා දෙන අතරම මෙම කරුණුවල ආදාල කලාපීය හා ජාත්‍යන්තර සම්මුතිවලට අනුකූල වීමටද සහය ලබා දෙයි. එසමගම ‘ජලජසංස්කෘතිය’‘ජලජ සම්පත්’ සහ ‘මතශ්‍යයන්’ යන යෙදුම්වලටද පනත විග්‍රහ ලබා දෙයි (වචනාවලියට යොමු වන්න)

73. ධීවර හා ජලජ සම්පත් පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමේ වගකීම භාර ආයතනය ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයයි. පනතෙහි පරිපාලනමය ප්‍රතිපාදන කිහිපයක් තිබෙන අතර එයින් ගණනාවක්ම පහත සඳහන් පරිදි යෝජිත උතුරු පළාතේ තිරසාර ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘති ආයෝජනයට අදලා වෙයි:

i. **බලපත්‍ර ලබා දීම**: බලපත්‍ර ලබා දීම ප්‍රතික්ෂේප කිරීම, කෝනදේසි සහිතව බලපත්‍ර ලබා දීම, තිරසාර බව අනුව බලපත්‍ර අළුත් කිරීම ආදිය ඇතුලත්ව ‘ධීවර මෙහෙයුම් සඳහා බලපත්‍ර නිකුත් කිරීම’

ii. **මතශ්‍ය හා ධීවර සම්පත් ආරක්ෂා කිරීම: ‘ධීරව කළමනාකරන ප්‍රදේශ’** (FMA) හා ‘ධීවර සංවර්ධන හා කළමනාකරණ සැලැස්ම’ නිර්මාණය කිරීමේ වගකීම සහිත ධීවර කළමනාකරණ ‘සම්බන්ධීකරණ කමිටු’ නියම කිරීමද ඇතුලත්ව ධීවර කමිටු ස්ථාපනය කිරීම හා මෙහෙයවීම සහ ‘ධීවර කටයුතු සඳහා වන විවෘත හා සංවෘත සෘතුව’ නිර්ණය කිරීම.

iii. **‘සංරක්ෂණය’** ඇතුලත්ව ධීවර රක්ෂිත නියම කිරීම

iv. **‘ජලජසංස්කෘතිය’** රජයේ ඉඩම් බදු දීම ඇතුලත්ව ජලජසංස්කෘති ක්‍රියාකාරකම් සඳහා බලපත්‍ර ලබා දීම.

v. අනෙකුත් පරිපාලනමය ප්‍රතිපාදනවලට ‘මතභේද සමතයකට පත් කිරීම’‘වැරදි සහ දණ්ඩන’ සහ නියාමන (ඡේදය 61) ඇතුලත් ‘පොදු’ කාරනා සහ පෙළයෙදුම් භාවිතාව (ඡේදය 66) ආදිය ආවරණය කරයි.

vi. **නියාමන**: නියාමන හා බැඳි විධාන පුළුල් වන අතර එය පහත කරුණුද ආවරණය කරයි: (a)මතශ්‍යයන් සහ අනෙකුත් සාගර සම්පත් ගැනීම හා ගොඩ බෑසීම සහ ගොඩ බසින ප්‍රදේශ කළමනාකරණය (61.1); (b)සංඛ්‍යාති රැස් කිරීම හා ධීවර කටයතුවල නියැලී සිටින පුද්ගලයන් විසින් තොරතුරු ලබා දීම සඳහා වන ප්‍රතිපාදන මතශ්‍යයන් පැසිරුම් කිරීම හෝ අලෙවි කිරීම සහ ජලජසංස්කෘති ව්‍යවසායය. (61.s)මතශ්‍යයන් වැඩෙන පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම ඇතුලත්ව (61.sc) මතශ්‍යයන් හා ජලජ සම්පත්වලට හානි ඇති විය හැකි ආකාරයෙන් ශ්‍රී ලාංකික රාසෂ්ට්‍රීය සාගර සීමාව ඇතුලත කර්මාන්ත හා ගෘහස්ත අපද්‍රව්‍ය බැහැර කිරීම සහ පිරවීම වැළැක්වීම (61.sd)ජාතික ධීවර එකමුතු හා ධීවර සංවිධාන දිස්ත්‍රික්ක හා ගම් මට්ටමින් පිහිටුවීම (61.si)(c) UNCLOS යටතේ නිර්දේශිත පියවර ඇතුලත්ව සංරක්ෂණ හා කළමනාකරණ පියවර ක්‍රියාත්මක කිරීම (ඡේදය 61 (t) (i)) IOTC (ඡේදය 61(t) (ii))මතශ්‍ය සමුහ ගිවිසුම (ඡේදය 61 (t) (iii))සහ නීති විරෝධි වාර්තා නොකරන ලද හා නියාමනය නොකතරන ලද ධීවර කටයුතු නැවැත්වීම හා තුරන් කිරීම සඳහා වන ධීවර වරාය තත්ව පියවර මත වන එක්සත් ජාතීන්ගේ ගිවිසුම් IUU (ඡේදය 61 (t) (iv))

### 2.1.6 2009 ශාක ජීවී ආරක්ෂාක (සංශෝධන) ආඥා පනත අංක 22

74. 2009 ශාක හා ජීවී ආඥා පනතේ (සංශෝධන) අංක 22 (ශ්‍රී ලංකා රජය 2009) ජාතික රක්ෂිත හා අභය භූමි නිර්මාණය කිරීමට ප්‍රතිපාදන ලබා දෙන අතර ආරක්ෂා කරනු ලබන ශාක හා ජීවීන්ට ෂෙඩියුලද ලබා දෙයි. ජාතික රක්ෂිතයක් තිබිය හැක්කේ රජයේ ඉඩමක වන නමුත් අභය භූමියක් පුද්ගලික ඉඩමක වුවද නිර්මාණය කළ හැකිය. ශාක හා ජීවීන්ගේ ආරක්ෂාව, රක්ෂණය හා සංරක්ෂණය සඳහා වන ප්‍රතිපාදන ලබා දෙන පනත වාණිජ අරමුණු සඳහා ශාක හා ජීවීන් අපයෝජනය කිරීමද වළක්වයි. ජාතික රක්ෂිත පාලන කිරීමට හා කළමනාකරණය කිරීම රක්ෂිත හෝ අභය භූමි නොවන තැන්වල අලින් හා මී

ගවයන් ආරක්ෂා කිරීම ආරක්ෂිත සතුන් අල්ලා ගැනීම හා තබා ගැනීම ආනයනය කිරීම හා අපනයනය කිරීම සහ ශාක ආරක්ෂා කිරීම ආදියට අවශ්‍ය සංශෝධන පනතට ඇතුලත් කර ඇත.

75. පනත යටතේ වන ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීමේ රාජ්‍ය ආයතනය වන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වන අතර මෙයට සියලුම ජාතික උද්‍යාන, රක්ෂිත , අභය භූමි, ශාක හා ජීවීන් ඇතුලත් වන අතර පනතේ ෂෙඩියුලයේ ලැයිස්තුගත වී ඇති ශ්‍රී ලංකාවේ තිබෙන රක්ෂිත සියලු විශේෂවල වගකීමද මෙම ආයතනයට පැවරී ඇත.

ජාතික උද්‍යාන, රක්ෂිත , අභය භූමි කිහිපයක් උතුරු පළාතේ ඇත:

- වාන්කලෙයි රක්ෂිතය (වාන්කලෙයි)- හෙක් 4839 විශාල මෙම රක්ෂිත 2008 වසරෙහි ප්‍රකාශයට පත් කරන ලද අතර මෙය RAMSAR තෙත් බිම් පරිශ්‍රයකි. මෙය පිහිටා ඇත්තේ මන්නාරම් දිස්ත්‍රික්කයේ හෙවත්පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියපරිශ්‍රය පිටතිනි
- ඇඩම්ස් බ්‍රිජ් ජාතික උද්‍යානය - හෙක් 18,990 විශාල මෙම ජාතික උද්‍යානය 2015 වසරෙහි ප්‍රකාශයට පත් කරන ලද අතර මෙය පිහිටා ඇත්තේ මන්නාරම් දිස්ත්‍රික්කයේ හෙවත්පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියපරිශ්‍රය පිටතිනි
- චුණ්ඩිකුලම් ජාතික උද්‍යානය - හෙක් 19,565.33 විශාල මෙම ජාතික උද්‍යානය 2015 වසරෙහි ප්‍රකාශයට පත් කරන ලද අතර මෙය පිහිටා ඇත්තේ කිළිනොච්චි දිස්ත්‍රික්කයේ හෙවත්පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියපරිශ්‍රය පිටතිනි
- කෝකිලායි රක්ෂිතය - හෙක් 1995 විශාල මෙම රක්ෂිත 1951 වසරෙහි ප්‍රකාශයට පත් කරන ලද අතර මෙය පිහිටා ඇත්තේ මුලතිව් මන්නාරම් දිස්ත්‍රික්කයේ හෙවත්පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියපරිශ්‍රය පිටතිනි
- විඩත්තල්තීවු ස්වාභාවික රක්ෂිතය - හෙක් 29,180 විශාල මෙම රක්ෂිතය 2016 වසරෙහි ප්‍රකාශයට පත් කරන ලද අතරමෙය පිහිටා ඇත්තේ මන්නාරම් දිස්ත්‍රික්කයේ හෙවත්පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියපරිශ්‍රය පිටතිනි

76. 1970 ශාක සහ ජීවී ආරක්ෂක ආඥා පනතේ පරි 469 ජේදය 75 හි මෙසේ සඳහන් වෙයි: 'ජාතික රක්ෂිත හා අභය භූමි ධීවර ආඥා පනතේ ජේදය 2 යටතේ ව්‍යස්ථාපිත වන දින එම ජාතික රක්ෂිත හා අභය භූමි සියල්ල සඳහා වන ප්‍රතිපාදන බල රහිත වනු ඇත: එසේ වුවද ඉහත සඳහන් පරිදි ජාතික රක්ෂිත සහ අභය භූමිවලින් පිටත ආඥා පනතේ විධිවිධාන එලෙසින්ම බලාත්මක වී තිබෙනු ඇත'

77. එමෙන්ම ශාක හා ජීවී පනත මෙසේද අවධාරණය කරයි: ආඥාවේ ජේදය 2 යටතේ ප්‍රකාශයට පත් කර ඇති කිසිදු රක්ෂිතයක මායිමේ සිට සැතපුමක දුරක් ඇතුලත අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිඛිත අනුමැතිය නොමැතිව කිසිදු රාජ්‍ය හෝ රාජ්‍ය නොවන සංවිධානයක් හෝ පුද්ගලයෙක් කිසිදු ආකාරයක සංවර්ධන කටයුත්තක් නොකළ යුතුය'

78. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියට අදාලතාවයෙන් යුත් පහත කරුණු ශ්‍රී ලංකා ශාක හා ජීවී පනතේ ෂෙඩියුලයේ අන්තර්ගත කරයි:

(i) **මුහුදු ක්ෂීරපායීන්:** තල්මසුන් කිහිපයක් ඩොල්ෆින් මසුන් *(Ballaenopteridae, Physeteridae, Delphinidae)*හා ඩුගොං *(Dugongdugon)*ඇතුලත්ව

(ii) **උරගයන්:** කිඹුලන් වර්ග දෙකක් *(Crocodyluspalustris)* - වගුරු හො මගර සහ *C. porosus* - estuarine සහ මුහුදු ඉබ්බන් වර්ග 5 ක් *Caretta caretta*- ගුඩ්ඩයා*Chelonia mydas* – කොළ*Eretmochelys imbricata* – හෝක්ස්බිල්, *Lepidochelysoliva*මධ්‍යම පරිසර අධිකාරිය – ඔලිව් රිඩ්ලි සහ*Dermochelys coria*මධ්‍යම පරිසර අධිකාරිය – ලෙදර්බැක්

(iii) **පක්ෂීන්:** විශාල සංඛ්‍යාවක් ඒකදේශික 46 ක් සමග අභිජනනය වන පෙදෙසේ පක්ෂි විශේෂ 240 ක්

(iv) **මතශ්‍යයන්:** ඇතැම් ගල්පර මතශ්‍යන් ඇතුලත්ව මතශ්‍ය විශේෂ කිහිපයක් (මෝරුන් සඳහන් නොවුනි)

(v) **අපෘෂ්ඨිකවංශිකයන්:** සියලුම පථංගකාමී ජීවී විශේෂ ඇතැම් කොරල් ඇතුලත්ව වාලසිකයන්ත යෝධ බෙල්ලන් ඇතුලු ඇතැම්පුෂ්ටිකයන් (*Tridacna sp.)*, කුටීර රුවල් බෙල්ලන් (*Nautilus sp.*) සහ කඩදාසි බෙල්ලන්

(*Agronauta sp.);*ඇතැම් ගල්කුරු පණුවන් සහ මුහුදු තියඹරන් ඇතුලු ඇතැම් ශල්‍යවර්මියන් (*Pseudicolochirus sp.*)

(vi) **ශාක**: නිපා තල් (*Nypafruticans)*, වැනි කඩොලාන පරිසරයේ වැවෙන විවිධ ශාක සහ සුලබ කඩොලාන ගස් (*Lumnitzeralittorea*, *Ceriopsdecandra*m, *Sonneratiaaptelata)* සිහත භාක විශේෂ 28ක්

79. 1887 වසරෙහි ඇති කළ හා පසුව විවිද සංශෝධනවලට ලක් වුනු ශ්‍රී ලංකාවේ පැරණීතම පනත්වලින් එකක් වන වනාන්තර ආඥා පනත යටතේ වානාන්තර රක්ෂිත ගැසට් කර ඇත. මෙම පනත යටතේ ගැසට් කර නොමැති එහෙත් ජීව විද්‍යාත්මක හා ජල විද්‍යාත්මක වැදගත්කම අනුව තෝරා ඇති වනාන්තර රක්ෂිත මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන විට සැලකිල්ලට ගත යුතුය.

### 2.1.7 1951 ගස් කැපීම් (පාලනය) පනත අංක 9

80. 1951 ගස් කැපීම් (පාලනය) පනත අංක 9 (පරි 452) යටතේ, 1962 ඔක් 13 අංක 18856 ගැසට් ප්‍රකාශයෙහි කෘෂිකර්මාන්ත ඉඩම් වාරිමාර්ග හා බලශක්ති අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත්කරන ලද ගස් කැපීම් (පාලනය) පනත මගින් ගස් කැපීම තහනම, නියාමනය හා පාලනය කිරීමට ආදිය පාලනය කෙරේ. කැපිය යුතු ගස් සඳහා බලය ලත් නිලධාරිවරයෙකු විසින් නිකුත් කළ වලංගු බලපත්‍රයක් තිබිය යුතුය.

### 2.1.8 2008 සාගර දූෂණය වැළැක්වීමේ පනත අංක 35

81. 2008 සාගර දූෂණ වැළැක්වීමේ පනත අංක 35 (ශ්‍රී ලංකා රජය 2008) අනෙකුත් කරුණු සමග සාගර පාරිසරික ආරක්ෂක අධිකාරිය සහ සාගර පරිසර සභාව පිහිටුවීමට අවශ්‍ය යාන්ත්‍රණය ලබා දෙන අතර මෙහි කාර්‍ය භාරය වනුයේ 'ශ්‍රී ලාංකිය රාෂ්ට්‍රීය මුහුදු සීමාවේ එහි ධීවර වරාය හා වෙරළ ඇතුලු සාගර කලාපවල නෞකා මුල් කර ගත් ක්‍රියාකාරකම් මගින් උතපාදනය වන දූෂණ ය වැළැක්වීම අවම කිරීම පාලනය හා කළමනාකරණය කිරීම' හා 'ශ්‍රී ලාංකිය රාෂ්ට්‍රීය මුහුදු සීමාවේ එහි ධීවර වරාය හා වෙරළ ඇතුලු සාගර කලාප තෙල් සහ වෙනත් හානිකර සංඝටක නිසා ඇති වන දූෂණ කළමනාකරණය කිරීම සහ ආරක්ෂා කිරීම හා රැක ගැනීමයි'

82. සාගර දූෂණය, තුවාල වීම්, අපරාධ සහ සිවිල් බැඳීම් ඇති කළ හැකි සාගර දූෂණතෙල් ඇතුලු ස්වාභාවික සම්පත් ගවේෂණය කිරීමේ සහ එය හා බැඳි ක්‍රියාකාරකම්වල යෙදී සිටින විට ඇති වන සාගර දූෂණ ය වැළැක්වීම හා සියලුම වැරදි සඳහා වන මුල්‍යමය වැරදි දඩ ඇතුලත්ය (දූෂණ ය වැළැක්වීම සාපරාධී බැඳීම් කොටස VII)

83. නෞකාවක මුහුදේ තෙල් මියරක හෝ නළ මාර්ගයක හිමිකරු හෝ මෙහෙයුම්කරු වෙරළ කලාපයට තෙල් හෝ යම් හානිකර සංඝඨකයක් බැහැර කිරීම සඳහා සාගර පාරිසරික ආරක්ෂක අධිකාරිය වෙතින් බලපත්‍රයක් ඉල්ලුම් කළ හැකිය යැයි පනතේ ජේදය 28 අවධාරණය කරන අතර දූෂක වර්ගය හා බැහැර කරන්න ඉසව්ව සැලකිල්ලට ගෙන එම බැහැර කිරීම නිසා ජීවින් කිසිවකට හෝ ජල ගුණත්වයට හානි ඇති වන්නේ නැත යැයි හා කිසිදු සාගර ක්‍රියාකාරකමකට බාධා ඇති වන්නේ නැත යැයි නිශ්වය කර ගත් පසු අදාල බලපත්‍රය සාගර පාරිසරික ආරක්ෂක අධිකාරිය විසින් නිකුත් කළ යුතුය යැයිද එයින් පසුව වන 29 ජේදය අවසර දෙයි. බලපත්‍ර ඉල්ලීම් ක්‍රමවේදය නියම කරනුයේ 2013 ජුනි 28 දිනක අංක 1816/3719 දරණ අතිවිශේෂ ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලද සාගර පාරිසරික ආරක්ෂා (මුහුදේ බැහැර කිරීම සඳහා වන බලපත්‍ර නිකුත් කිරීම) නියාමනය අංක 01/2013 මගිනි. තවද නියාමනයේ ෂෙඩියුල 1 මගින් ධීවර වරාය කටයුතු හා ගොඩබිමෙහි සිදු කරන කර්මාන්තවලින් බැහැර කිරීම් සිදු කරන විට අනුකූල විය යුතු ගුණත්ව සම්මිතින්ද ලබා දී ඇත.

### 2.1.9 1987 ප්‍රාදේශීය සභා පනත අංක 15

84. ප්‍රාදේශීය සභාවලට අයත් ප්‍රදේශ නිශ්චය කිරීම සඳහා වන නෛතික යාන්ත්‍රණය මෙන්ම පොදු ජන සෞඛ්‍යය, පොදු පහසුකම් සේවා සහ පොදු මාර්ග ආදිය සාමාන්‍ය සුවපහසුව සහ සුබසිද්ධිය සහිතව ලබා දීමේ පළාත් පාලන ආයතනවලට අවශ්‍ය ප්‍රතිපාදන ආදිය ප්‍රාදේශී සභා පනත ලබා දෙයි. එමෙන්ම මාර්ග, පාලම්, ගොඩනැගිලි, අපත ජලය, මලාපවහන කාණු පද්ධති ආදියද ප්‍රාදේශීය සභා බලයට යටත් හෙයින් ඒවා සංවර්ධනය කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා ගත යුතුය.

### 2.1.10 1984 මාදැල් නියාමනය

85. 1984 මාදැල් ධීවර ක්‍රියාකාරකම් සඳහා වන නියාමනය සහ පසුව එයට සිදු කරන ලද සංශෝධන සියල්ල දිවයිනේ සිදු කරන එවන් ක්‍රියාකාරකම්වලට අදාල වෙයි. මෙම නියාමනයේ ප්‍රධාන ලක්ෂණ අතර මාදැල් ධීවර කටයුතු සිදු කළ හැකි හා වෙරළේ එය සීමා කරන විශේෂ ඉසව් නියම කිරීම හා ආරක්ෂා කිරීමයි.මෙම ලක්ෂණ ප්‍රජා මූල ධීවර කළමනාකරණයේ මූලධර්ම හා සැසඳෙන අතර අතීතයේ මෙම ධීවර ක්‍රමයේ සාම්ප්‍රදායික කළමනාකරණ පැවතුම් අන්තර්ගත කරයි.

86. සියලුම මාදැල් කටයුතු සිදු කළ යුත්තේ සුවිශේෂී ලෙසින් නියාමනයෙන් හඳුනා, නම් හා අංක කර ඇති නිර්දේශිත හා වෙන් කර දී ඇති මාදැල් ධීවර ධීවර වරායවලින් හා ලියාපදිංචි කර බලපත්‍ර හිමියන් විසින් පමණි. බොහෝ මෙවන් ධීවර වරායවලට එකකට වැඩි කෙනෙකු නමින් ලියාපදිංචි කරන ලද හා මීටර 500 සිට කිමී එකක් දක්වා දිග ‘පාඩු’ එකකට වැඩි සංඛ්‍යාවක් තිබේ. මෙම නියාමනවල දක්නට ඇති පොදු ලක්ෂණයක් නම් ආඥා පනතේ ලබා දී ඇති ප්‍රජා මූල සංකල්පයට දක්වන ප්‍රමුඛතාවයයි. බොහෝ අවස්ථාවල පෙදෙස් වාසීන් විසින් ඔවුන්ගේ ධීවර පෙදෙස්වලට ගැලපෙන හා ඔවුන් විසින්ම ඇති කර ගන්නා ලද රීතීන් අනුමත කරනු ලැබ නීති ගත කරනු ලැබීමයි. තවත් සුවිශේෂී ලක්ෂණ කිහිපයක් පහත දක්වා ඇත:

- එක් පාඩුවකට එකකට වැඩි ලියාපදිංචි හිමිකරුවන් හෝ කණ්ඩායම් සිටින විට ඒ සියල්ලන්ගේම එකඟතාවය අනුව හිමිකම් වාර සඳහා එය භ්‍රමණය කරන ක්‍රමයක් අනුගමනය කරනු ලැබේ.
- මදැල් ධීවර වරායක් ඇතුලත යාන්ත්‍රික යාත්‍රා භාවිතය තහනම් වෙයි.
- මාදැල් ධීවර වරාය මෙහෙයුමක් සමයෙහි එහි මුහුදු සීමාව ඇතුලත යාන්ත්‍රික බෝට්ටු ජලතරණය කළ නොහැක.
- මාදැල් ධීවර වරායකට යාබදව මාදැල් ක්‍රියාකාරකමට යොදා ඇති බෝට්ටු හැර වෙනත් බෝට්ටු කිසිවක් නැංගුරම්ලෑම හෝ එයට යාබද නවතා තැබීම තහනම්ය.
- මාදැල් ධීවර වරායක් ඇතුලත මෙම නියාමන මගින් නිර්දේශිත ධීවර බෝට්ටු හැර වෙනත් ධීවර ආම්පන්න කිසිවක් භාවිත කිරීම තහනම්ය.

### 2.1.11 1992 පතල් සහ ඛණිජ පනත අංක 33

87. ශ්‍රී ලංකාවේ සිදු කරන සියලුම ඛණිජ ගවේෂණ සියල්ල සඳහා භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යයාංශය (GSMB) වෙතින් බලපත්‍ර ලබා ගත යුතුය යැයි 1992 පතල් සහ ඛණිජ පනත අංක 33 අවධාරණය කරයි. ඉදිකිරීම් සඳහා කරන ගල් කොරි ක්‍රියාකාරකම්ද මෙයට ඇතුලත් වන අතර පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය පරිශ්‍රයේ භාවිත කරන ගල් ලබා ගන්නා ගල් වළ සියල්ල අදාල පතල් බලපත්‍ර ලබා තිබීම තහවුරු කර ගත යුතුය.

### 2.1.12 2008 පුරා වස්තු (සංශෝධන) පනත අංක 24

88. 1998 පුරා වස්තු (සංශෝධන) පනත අංක 24 සහ 2000 ඔක් 24 අති විශේෂ ගැසට් අංක 1152/14 මගින් ප්‍රකාශයට පත් කරන ලද ක්‍රියාත්මක කිරීමේ නියාමන අනුව හෙක් 0.25 ට වඩා විශාල භූමි ප්‍රදේශයක සිදු කරන සංවර්ධන ක්‍රියාකාරකම් සියල්ල සඳහා පුරාවිද්‍යා බලපෑම් ඇගයීමක් සිදු කළ යුතුය. මෙහි අරමුණ පෙදෙසේ පුරාවස්තූන් කිසිවක් තිබේද හා තිබේ නම් අදාල සංවර්ධන කටයුත්ත නිසා ඒවාට ඇති විය හැකි බලපෑම් කෙබඳුද යන්න නිශ්චය කර ඒ අනුව අවශ්‍ය නම් විකල්ප ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීමයි.

### 2.1.13 1950 ඉඩම් අත් කර ගැනීමේ පනත අංක 9

89. 1950 ඉඩම් අත් කර ගැනීමේ පනත අංක 9 ඉඩම් අමාත්‍යාංශයේ වගකීම් පරාසයට අයත් වන අතර පොදු කටයුතු සඳහා පනතේ නිර්දේශ එහි මාර්ගෝපදේශ අනුව ක්‍රියාත්මක කිරීම හා කළමනාකරණය කිරීම සඳහා අමාත්‍යාංශයට ඒ ඒ

දිස්ත්‍රික්කවල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සහය ලැබෙයි. දේශීය වශයෙන් ස්ව කැමැත්ත නොමැතිව වුවද ප්‍රජාව වෙනත් ස්ථානයක පදිංචි කරවීම සඳහා වන යාන්ත්‍රණයකට අවශ්‍ය ප්‍රතිපාදනය මෙම පනත ලබා දෙන නමුත් අවතැන් කරවීම මෙන්ම වගා බෝග හානි කිසිවක් එය හා බැඳෙන්නේ නම් ඒ සැම සඳහා බලපෑමට ලක් වන්නන්ට වන්දි ගෙවීමක් සිදු කළ යුතුය. ඉඩම් අත් කර ගැනීම සම්බන්ධ වැඩිදුර මගපෙන්වීම් 2008 පළාත් පාලන ආයතන නියාමන ලබා දෙයි.

#### 2.1.14 1996 පාංශු රක්ෂණ (සංශෝධන) පනත අංක 24

90. මෙම පනතේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම කෘෂිකර්මාන්ත අමාත්‍යාංශයට අයත් කාර්ය භාරයක් වන අතර i) පසේ ඵලදායිතා ධාරිතාවය වැඩි දියුණු කිරීම ii) ඛාදනයට පත් වූ භූමිය බාදනයට පත් වීම පාලනය කිරීමට ප්‍රතිපෝෂණය කිරීම iii) ගංවතුර, ලවනතාවය, ක්ෂාරියතාව, ජල රැඳීම නිසා පසට ඇති වන හානි වැළැක්වීම සඳහා පාංශු සම්පත් හා ඉඩම් ආරක්ෂා කිරීම ආදිය සඳහා මෙම පනත ප්‍රතිපාදන සලසා ඇත. එමෙන්ම සංරක්ෂිත භූමි පෙදෙස් ප්‍රකාශයට පත් කිරීමේ හා එම භූමිවල වැවිලි බෝග සංරක්ෂණය සඳහා වන මාර්ගෝපදේශ ලබා දීමේ කාර්යභාරය පනතට පැවරී ඇත.

## 2.2 ජාතික පාරිසරික හා සම්පත් ප්‍රතිපත්ති

### 2.2.1 උතුරු පළාත් ඒකාබද්ධ මුලෝපා පාරිසරික ඇගයීම් ප්‍රතිපත්තිය (ISEA)

91. මධ්‍යම පරිසර අධිකාරියසහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් 2014 වසරෙහි උතුරු පළාත සඳහා ඒකාබද්ධ මුලෝපා පාරිසරික ඇගයීම් ප්‍රතිපත්තියක් සම්පාදනය කරන ලදී. මෙය ප්‍රතිපත්තියකට වඩා ප්‍රවේශයක් වන අතර මෙයට මුලෝපා පාරිසරික අරමුණු (SEO) මත පදනම් වුනු යෝජිත ක්‍රියාකාරකම් කිහිපයක් සඳහා සංවර්ධන උපකල්පිත තත්වයන් හෙවත් සීනරි තුනක් යෝජනා කර ඇත: i) සිරිත් පරිදි කටයුතු කිරීමේ සීනරිය ii) සංරක්ෂණ සීනරිය iii) සංවර්ධන සීනරිය.

92. ඉහත සීනරි තුන නිසා ඇති විය හැකි බලපෑම් සඳහා උතුරු පළාත සඳහා ඒකාබද්ධ මුලෝපා පාරිසරික ඇගයීම් ප්‍රතිපත්තිය වර්ණ කේත භාවිත කරයි:

**සුදු** - ඒවායෙහි තත්වය වැඩිදියුණු වීමේ ශාක්‍යතාවය ඇති

**රතු** - ඒවායෙහි තත්වය සමග ගැටුම් ඇති විය හැකි ශාක්‍යතාවය ඇති හා එහෙයින් අවම කිරීමේ පියවර අවශ්‍ය වන හා විශේෂ අවධානය යොමු කළ යුතු

**තැඹිලි** - ඒවායෙහි තත්වයන් සමග ගැටුම් ඇති විය හැකි හා අවම කිරීමේ පියවර ගත හැකි සහ

**කොළ**- ඒවායෙහි තත්වයන් සමග අන්තර්කරණයක් නොමැත.

93. මුහුදේ හා ගොඩබිම් ජල මූලාශ්‍රවල සිදු කරන සියලුම ධීවර කටයුතු එකම ක්‍රියාකාරකමක් යටතේ මෙම උතුරු පළාත සඳහා ඒකාබද්ධ මුලෝපා පාරිසරික ඇගයීම් ප්‍රතිපත්තිය සඳහන් කරන අතර එය ඍජුවම ජෙදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියට අදාල වෙයි. ප්‍රතිපත්තියේ ඉහත සීනරු තුනෙන් එකක්වත් මුලෝපා පාරිසරික අරමුණෙහි වැඩිදියුණු වන බවක් නොපෙනෙ අතර පළමු සීනරිය යටතේ ‘සාගර ජෛව විවිදත්වය’ යන කරුණ යටතේ මුහුදේ ධීවර ස්ථාන මුලෝපා පාරිසරික අරුමණේ තත්වය සමග ඍජුවම ගැටිය හැකි හෙයින් ‘ආපදා ඇති විය හැකි’ තත්වය සමග අන්තර්කරණය කිරීමක් සිදුවිය නොහැක. අනෙකුත් මුලෝපා පාරිසරික අරමුණු සමග විභව ගැටුමක ශාක්‍යතාවය ඇත. දෙවෙනි හා තෙවෙනි සීනරි ගත් කල ඒ සැම මුහුදු ධීවර ස්ථාන සෑම එකක්ම සමගම ගැටෙන විභවතාවය ඇති ඒවාය.

94. ජෙදුරුතුඩුවේ දැනට තිබෙන කුඩා ධීවර වරාය උතුරු පළාත සඳහා ඒකාබද්ධ මුලෝපා පාරිසරික ඇගයීම්, ප්‍රතිපත්තිය විසින් ඉස්මතු කර පෙන්වන නමුත් මෙය සැලකිය යුතු ලෙසින් විශාල හා ඵලදායීතාවය වැඩි ධීවර වරායක් බවට ප්‍රතිසංවර්ධනය වීම ගැන සාකච්ඡා නොකරයි. (උතුරු පළාත සඳහා ඒකාබද්ධ මුලෝපා පාරිසරික ඇගයීම් ප්‍රතිපත්තියේ සිතියමේ පිටුව 47 හි යෝජිත සංවර්ධන අවස්ථා ගැබ්ව ඇති හා ජලධාර පෙදෙස් වෙතට යොමු වන්න) කෙසේ වුවද, උතුරු පළාතේ වත්මන් තත්වය ගැන පුළුල් ලෙසින් උතුරු පළාත සඳහා ඒකාබද්ධ මුලෝපා පාරිසරික ඇගයීම් ප්‍රතිපත්තිය තොරතුරු ලබා දෙයි. තවද මෙය පාරිසරික තිරසාර සංවර්ධනය සඳහා සැලකිල්ලට ගත යුතු පැහැදිලි යාන්ත්‍රණද ලබා දෙනු දැකිය හැකිය.

### 2.2.2 කාලගුණ විපර්යාස ප්‍රතිපත්ති

95. ශ්‍රී ලංකාව සඳහා වන ජාතික කාලගුණ ආදේශ කිරීමේ මූලෝපාය (CCS, 2010), ශ්‍රී ලංකාව සඳහා වන ජාතික කාලගුණ ආදේශ කිරීමේ මූලෝපාය (CCS, 2012) සහ ශ්‍රී ලංකාවේ කාලගුණික බලපෑම් සඳහා වන ජාතික ආදේශ කිරීමේ සැලැස්ම (CCS, 2016a) ආදිය කාලගුණ විපර්යාස ලේකම් කාර්යාලය විසින් සම්පාදනය කරන ලද අතර කාලගුණ විපර්යාස ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වන මූලික මෙවලමක් වන්නේ 2015 පැරිස් ගිවිසුම යටතේ වන අපේක්ෂිත දේශීයව අදිටන් කරන ලද දායකත්ව (INDC) ක්‍රියාදාමයයි.

96. 2016 අප්‍රේල් මස අපේක්ෂිත දේශීයව අදිටන් කරන ලද දායකත්ව ඇගයීමක් ශ්‍රී ලංකාව ඉදිරිපත් කළ අතර (ශ්‍රී ලංකා රජය 2016a) අපේක්ෂිත දේශීයව අදිටන් කරන ලද දායකත්ව සියල්ල පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියට අදාල වෙයි. විශේෂයෙන් කරුණු තුනක අදාලතාවය සැලකිල්ලට ගත යුතුය: i) කඩොලාන සහ වෙරළබඩ ශාකවලට ඇති වන බලපෑම් අවම කිරීමේ පියවර ii) ධීවර ස්ථානවල වෙරළ සහ සාගර අංශය ජෛව විවිධත්ව අංශය සංචාරක හා විනෝදායන අංශයෙහි ආහාර සුරක්ෂිතතාවයට අදාල ආද්ශ පියවර iii) කාලගුණ විපර්යාස නිසා ඇති වන හානිවලට වන්දි ගෙවීම.

97. ශ්‍රී ලංකාව පැරිස් ගිවිසුමට අත්සන් කිරීම නිසා ශ්‍රී ලංකාවේ ‘අපේක්ෂිත දේශීයව අදිටන් කරන ලද දායකත්ව’ දැන් ‘දේශීයව අදිටන් කරන ලද දායකත්ව’ බවට පත්ව ඇති අතර අපේක්ෂිත දේශීයව අදිටන් කරන ලද දායකත්ව ක්‍රියාත්මක කිරීම සඳහා සූදානම් තත්ව සැලැස්මක් 2016 අගෝස්තු මස සම්පාදනය කරන ලදී (CCS, 2016b).

### 2.2.3 ධීවර ප්‍රතිපත්තිය

98. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියට අදාල ධීවර ස්ථාන හා බැඳි ප්‍රධාන ප්‍රතිපත්ති ලියවිලිවලට මේවාද ඇතුලත් වෙයි: ධීවර හා ජලජ සම්පත් ක්ෂේත්‍රයේ දස වසර සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාරාමුව 2007-2016 (ශ්‍රී ලංකා රජය 2007); 2013 සිට 2016 සඳහා මාර්ග සිතියම ලබා දෙන 2013-2016 මධ්‍යම වාර ප්‍රතිපත්ති ක්‍රියාරාමුව 2013-2016 (ශ්‍රී ලංකා රජය 2012); සහ 2015 MFARD කාර්යසාධන වාර්තාව (ශ්‍රී ලංකා රජය 2015). මූලික මූලෝපායේ ප්‍රධාන අරමුණු සයක් තිබුනු අතර නව ක්‍රියාරාමුවක් නොමැති විට මෙය ක්‍රියාරාමුව ලෙසින් තවමත් සැලකිල්ලට ගනු ලැබෙමින් පවතියි.

1. “වෛද්‍ය පර්යේෂණ ආයතනය විසින් පුද්ගලයෙකුට දිනකට අවශ්‍ය සත්ව ප්‍රෝටීන් ප්‍රමාණය ලබා ගැනීමට ආහාරයට ගත යුතු මත්ස්‍ය ප්‍රමාණය යැයි නිර්දේශ කර ඇති මත්ස්‍ය මාංශ ග්‍රෑම් 60, 2013 වසර වන විට ලබා ගත හැකි පරිදි දේශීය මත්ස්‍ය අස්වැන්න වැඩි කර ගැනීම.
2. 2013 වන විට දේශීය සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය මෙටො 685,690 දක්වා වැඩි කර ගැනීම.
3. තරගකාරී අලෙවිකරණය ප්‍රවර්ධනය කර මත්ස්‍ය මිල යහපත් මට්ටමකින් තබා ගැනීම.
4. 2013 වන විට අපනයනය කරනු ලබන මත්ස්‍ය ප්‍රමාණය මෙටො 36,700 දක්වා වැඩි කර එමගින් විදේශ විනිමය ඉපැයීම.
5. සමාජ බලගැන්වීම් ජීවනෝපා විවිධාංගීකරණය ප්‍රජා පොදු පහසුකම් සහ යටිතලපහසුකම් වැඩිදියුණු කිරීම හරහා ධීවර සමූහයාගේ ජීවන රටාව උසස් තලයකට නැංවීම.
6. එක්සත් ජාතීන්ගේ සාගර නීතිය මත වන සම්මුතිය සහ ධීවර කටයුතු ජෛව විවිදත්වය සහ සාගර පරිසර සංරක්ෂණයට අදාල අනෙකුත් ජාත්‍යන්තරව එකඟ වූ ගිවිසුම්වල අවධාරණය කර ඇති වගකීම්වලට අනුකූලව ධීවර ස්ථාන තිරසාර ලෙසින් කළමනාකරණය කිරීම”

99. අරමුණු අංක 2 උතුරු පළාතේ තිරසාර ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය විෂයයෙහි සුවිශේෂී අදාලතාවයක් ඇති අරමුණක් වන අතර එය කරුණු දෙකක් අන්තර්ගත කරයි: i) යාත්‍රා පෙළ වැඩි කිරීම මගින් වෙරළාසන්න හා ගැඹුරු මුහුදේ ධීවර

ක්‍රියාකාරකම් ඉහළ නැංවීම. (ii) උතුරු පළාතේ ධීවර කටයුතු පුනරුත්තාපනය කිරීම. මේ අතර ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ හතක් ඉදිරිපත් කර ඇත:

1. "ධීවර සම-කළමනාකරණය සඳහා වැඩියෙන් ධීවර කළමනාකරණ පෙදෙස් ප්‍රකාශයට පත් කිරීම'
2. ධීවර බෝට්ටු ලියාපදිංචි කිරීමට, ධීවර කටයුතු සඳහා බලපත්‍ර නිකුත් කිරීමට, මතශ්‍යන් රැස් කිරීමට, බලපත්‍ර ලබා දීමට, ප්‍රවාහනය කිරීමට, සන්තකයේ තබා ගැනීමට, වෙළඳාම් කිරීමට සහ මතශ්‍යන් අපනයනය කිරීම ආදියට ගාස්තු අය කිරීම නවතා දැමීම.
3. මොනෝෆිලමන්ට් දැල් භාවිත කිරීම, සන්තකයේ තබා ගැනීම, ආනයනය කිරීම, ප්‍රවාහනය කිරීම, මිල දී ගැනීම සහ අලෙවි කිරීම තහනම් කිරීම
4. යාන්ත්‍රික නොවන හැර ට්‍රෝලර් යාත්‍රාවලින් ධීවර කටයුතු සිදුකිරීම තහනම් කිරීම.
5. ධීවර යාත්‍රාවල ජීවිතාරක්ෂක කබා පැළඳ සිටීම අනිවාර්ය කිරීම
6. ධීවර ක්ෂේත්‍රයට වසර 5 ක ආදායම් බදු සහනය ලබා දීම
7. සහන මිලට ඉන්ධන ලබා දීම"

100. උතුරු පළාතේ තිරසාර ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සහ සුවිශේෂී ලෙසින් PPPDFP යටතේ යෝජිත ආයෝජන විෂයයෙහි මුලෝපා ක්‍රියාත්මක කිරීමෙහි ඇති පහත සඳහන් බාධක මධ්‍යම කාලීන ප්‍රතිපත්ති ක්‍රියා රාමුව (ශ්‍රී ලංකා රජය 2012) මගින් හඳුනා ඇත: (i) මධ්‍යම රජයේ මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීමෙහි දක්නට ඇති අනවධානය (ii) වෙරළාසන්න සහ ගැඹුරු මුහුදේ යාත්‍රා සඳහා සහන බැංකු ණය ලබා දීමට අවධානය ප්‍රමාණවත් ලෙසින් යොමු නොකිරීම (iii) ධීවර කටුයුතු සහ පශ්චාත් අස්වනු සඳහා පිල්නෙට් ලෝංලයින් ශීතකරණ වැනි නවීන තාක්ෂණ පිළිබඳ දැනුවත් බව අඩු වීම (iv) පමණට වඩා අධික අස්වනු නෙලා ගැනීමට තුඩු දෙන ආකාරයෙන් නිසි කළමානකාරීත්වයක් නොමැති වීම (v) මතශ්‍යයන් මිල කිරීම (vi) බලපත්‍ර ගැටලු නිසා මතශ්‍යයන් අපනයනය කිරීමට ඇති බාධා. සුවිශේෂී බාධා 5 ක් 2013-12196 මාර්ග සිතියමෙහි ලැයිස්තු ගත කර ඇත.

1. "දේශීය මතශ්‍ය නිෂ්පාදනය සහ ඒක පුද්ගල ප්‍රතිදානය වැඩි කිරීමට
2. ගොඩ බානු ලබන මාළුවල ගුණත්වය වැඩිදියුණු කිරීමට සහ පශ්චාත් අස්වනු අපතේ යාම සම්පූර්ණයෙන් තුරන් කිරීමට හෝ යටත් පිරිසෙයින් සැලකිය යුතු මට්ටම්වලින් අවම කිරීමට
3. මතශ්‍ය ආපනයනය ඉහල නැංවීමට
4. සම්පත්වල දීර්ඝ කාලීන චිරත්සායී බව තහවුරු කිරීමට ධීවර කළමනාකරණය වැඩිදියුණු කිරීමට
5. ධීවර සමූහයාගේ සමාජ ආරක්ෂාව ඉහළ නැංවීමට"

101. අක් වෙරළ / ගැඹුරු මුහුදු ධීවර කටයුතු මගින් 2013 වසර සඳහා වන නිෂ්පාදන ඉලක්කය මෙටොන් 332,300 යැයිද 2014 ට මෙටොන් 383,200 යැයිද 2015 ට මෙටොන් 452,900 යැයිද, 2016 ට මෙටොන් 583,900 යැයිද මාර්ග සිතියම දක්වයි. 2015 සඳහා වන ධීවර වාර්ෂික සංඛ්‍යාතිය (ශ්‍රී ලංකා රජය 2016d) අනුව 2013 සහ 2014 වසරවල නිර්ණය කර ගත් ඉලක්කය ඉක්මවන (පිළිවෙලින් මෙටොන් 445,930 සහ 459,300) ලද අතර හඳුනාගත් ප්‍රධාන බාධක පහත පරිදි වෙයි:

1. "ඉහළ මට්ටමේ තාක්ෂණය නොමැති කම ගැඹුරු මුහුදේ සම්පත් උපරිමයෙන් නෙළා ගැනීමට බාධාවකි
2. මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධනය හා ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීම සඳහා පුද්ගලික අංශය සිදු කරන ආයෝජන ප්‍රමාණවත් නොවේ
3. පශ්චාත් අස්වනු අපතේ යාම් සාපේක්ෂව ඉතා ඉහළ (30%)වන අතර ප්‍රවාහන පහසුකම් සහ වෙළඳපල දාමය ඉතා දුර්වල අඩියක පවතියි

4. වෙරළබඩ පරිසරය ඇතුලු ජලජ පරිසරය හායනයට ලක් වී ඇති අතර එහි කළමනාකරණය දුර්වල තත්වයක පවතියි

5. විශ්වාසනීය හෝ නූතන දිනය දක්වා වු සාගර හා අභ්‍යන්තර ධීවර පරිශ්‍ර සඳහා වන සම්පත් දත්ත ලබා ගන්නට නොමැත

6. තිබෙන්නාවූ සාගර සම්පත් හා සසඳන කල නෙලා ගනු ලබන ප්‍රමාණය අඩුය. ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලිය හැකි ධාරිතාවය ඉහළ බෝට්ටුවල ප්‍රතිශතය මුළු බෝට්ටු සංඛ්‍යාවෙන් 9 % ක් පමණක් වන අතර 43 % ක් යාන්ත්‍රික නොවන සාම්ප්‍රදායික යාත්‍රා වේ. ඉතිරිය පිටතින් එන්ජිම් සවිකරන ලද බෝට්ටු වේ"

102. පහත කරුණු ඇලත්ව, 2012 මූලික රේඛා මට්ටමක සිට 2016 දක්වා ප්‍රතිදානය වැඩි වන රටාවක් මාර්ග සිතියම හඳුනාගනියි (ශ්‍රී ලංකා රජය 2012 වගුව 19)

- මහ මුහුදට යා හැකි යාත්‍රා 150 ක්
- බහු දින යාත්‍රා 850 ක්
- එක් දින යාත්‍රා 1800 ක්
- OFRP බෝට්ටු 5400 ක්
- අළුත් ධීවර ධීවර වරාය / ධීවර ධීවර වරාය බවට වැඩිදියුණු කළ නැංගුරම්පළවල් 7 ක්
- මෙටොන් 3000 ක් අයිස් නිෂ්පාදන ධාරිතාවය
- ධීවර ධීවර වරාය හා නැංගුරම්පළවල වැඩිදියුණු කල යටිතලපහසුකම් 42 ක්
- මසුන් පිරියම් කරන කලාප 4 ක් (උතුරු පළාතේ එකක්වත් නොමැත)
- ශීතකරණ පහසුකම් සහිත විශාල / බහුදින යාත්‍රා 250 ක්
- කුඩා ගොවිපළවල් ඇතුලත්ව ජලජ රෝපිත ගොවිපළවල් 300 ක්
- අපනයන බලපත්‍ර 40 ක් (MSC, ඕගනික ආදි)
- යාත්‍රා අධීක්ෂණ පද්ධතියක් පිහිටුවීම (VMS);
- සම කළමනාකරණය සහිත ධීවර කළමනාකරණ ප්‍රදේශ (FMA) 80 ක්
- යාන්ත්‍රික නොවන සාම්ප්‍රදායික යාත්‍රා 2000 ක් මෙහෙයුම්වලින් ඉවත් කරන ලදී

103. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශය කාර්‍යසාධන පුනරීක්ෂණ 2015(ශ්‍රී ලංකා රජය 2015) ධීවර ක්ෂේත්‍රයේ මූලික මායිස් ලකුණු මෙසේ ලැයිස්තු ගත කරයි:

- ජනවාරි-සැප් 2015 මත්ස්‍ය නිෂ්පාදනය මෙටොන් 384,610
- එක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය දිනකට/ග්‍රෑම් 44.6 යි
- දෙවන කාර්තුව අවසානයෙහි දළ දේශීය නිෂ්පාදිතයට ධීවර ක්ෂේත්‍රයේ දායකත්වය 1.7 % කි
- අපනයන ආදායමට මත්ස්‍ය හා ධීවර නිෂ්පාදවනවල ධීවර ක්ෂේත්‍රයේ දායකත්වය 1.8 % කි
- සුරතල් මසුන් අපනයනය කිරීම මගින් ලද විනිමය ආදායම රු. බිලියන 1.957

104. ධීවර ක්ෂේත්‍රය සඳහා වන මුඛ්‍ය ක්‍රියාකාරකම් සහ යෝජිත සංවර්ධන ගණනාවක් ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ කාර්‍යසාධන පුනරීක්ෂණය පෙන්වා දෙන අතර එයින් බොහෝමයක් පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියටද අදාල වෙයි. විශේෂයෙන් යාත්‍රා අධීක්ෂණය, ලොග්පොත, අස්වනු සහතිකය වැනි දේ හඳුන්වා දීම මගින් අක්වෙරළ / ගැඹුරු මුහුදු ධීවර පරිශ්‍ර කළමනාකරණය දියුණු කිරීමට සිදු කරන වැයම් ගැනද පුනරීක්ෂණය සඳහන් කරයි.

105. ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුවසමග ව්‍යාපෘති සැකසුම් තාක්ෂණික සහයෝග ලේඛනය,ප්‍රාරම්භක පාරිසරික පරීක්ෂාව (ආසියා සංවර්ධන බැංකුව, 2017) සිදු කරන සාකච්ඡා මගින් උතුරු පළාතට අදාල පහත කරුණු පෙන්වා දෙයි:

- යෝජනා වී ඇති කලපු ධීවර කළමනාකරණ ප්‍රදේශ 116 න් 28 ක් ප්‍රකාශයට පත් කර ඇති අතර පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිපරිශ්‍රය ඇතුලත එකක්වත් නොමැත
- ධීවර රක්ෂිත / අභය ස්ථාන නිශ්චය කර නොමැති අතර තිබෙනුයේ ඇතැම් සෘතුමය රක්ෂිත (සැම තැනම) පමණී. නිදසුනකට සැප්තැම්බර් සිට පෙබරවාරි දක්වා පොකිරිස්සන්
- වෙරළබඩ ධීවර කළමනාකරණ ප්‍රදේශ යෝජනා වී ඇති නමුත් පිහිටුවා නොමැත
- අක්වෙරළ ධීවර කළමනාකරණ ප්‍රදේශ යෝජනා වී නොමැත

106. වගකීම් සහිත ධීවර පරිශ්‍ර සඳහා වන කල්ක්‍රියා සංග්‍රහය (CCRF):

- **මුහුදු පක්ෂීන්:** මුහුදු පක්ෂීන් සඳහා ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියා සැලැස්මක් සම්පාදනය කර නොමැත. මුහුදු පක්ෂී සැරිසැරීම ධීවර යාත්‍රාවලට ප්‍රශ්නයක් නොවේ යැයි ශ්‍රී ලංකාව අදහස් කරන අතර විධිමත් පුනරීක්ෂණයක් සිදු කර නොමැත.
- **මෝරුන්:** මෝරුන් සඳහා හා ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියා සැලැස්මක් සම්පාදනය කර ඇත. (ශ්‍රී ලංකා රජය 2013) මෝරුන්ගේ පැවතුම් තත්වය සැලකිල්ලට ගෙන මෝරු විශේෂ කිහිපයක් ඇල්ලීමට තහනම් පවනවා ඇත. 2012 සහ 2015 වසරවල තල්මස් මෝරුන් ඇලු ඇතැම් මෝරුන් ඇල්ලීමට තහනම් පනවන ලදී.
- **මුහුදු ඉබ්බන්:** සාගර ඉබ්බන් ශ්‍රී ලංකාවේ නීතිය මගින් ආරක්ෂා කරනු ලැබේ. J හැඩ බිලිකොකු තහනම් හෙයින් දිග රැහැන් ධීවර කටයුතුවලදී භාවිත කරනු ලබන්නේ වටකුරු කොකු පමණී. මහ මුහුදේ කිමි 2.5 ට වඩා දිග දැල් දේශීය නීති අනුව තහනම්ය. වෙනම පෙට්ටියක ලොග් පොත් හරහා අතුරු අස්වැනු වාර්තා කරනු ලැබේ.
- **නීති විරෝධී, වාර්තා නොකරන ලද සහ නියාමනය නොකරන ලද (IUU) ධීවර පරිශ්‍ර:**නීති විරෝධී, වාර්තා නොකරන ලද සහ නියාමනය නොකරන ලදධීවරකටයුතු සඳහා 2013 වසරෙහි ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියා සැලැස්මක් සම්පාදනය කර ඇත(SLNPOA-IUU) (ශ්‍රී ලංකා රජය 2013b).

### 2.2.4 වෙරළබඩ සම්පත් ප්‍රතිපත්තිය

107. වෙරළබඩ සම්පත් කළමනාරකණය සඳහා වන ප්‍රතිපත්තියේ ප්‍රධානතම ලියවිල්ල වන්නේ නිශ්චිත කාලයකට වරක් සම්පාදනය කිරීමේ විධානය සහිත වෙරළබඩ කලාප සහ වෙරළබඩ සම්පත් කළමනාකරණ සැලැස්මයි (වෙරළ සංරක්ෂණ සහ වෙරළබඩ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව). මෙහි අළුත්ම කෙටුම්පත නිකුත් කරන ලද්දේ 2016 ගිම්හානයේදීය(ශ්‍රී ලංකා රජය 2016) පහත ලබා දී ඇත්තේ එහි උපුටනයකි:

108. සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ මුඛ්‍ය මෙවලම් වනුයේ: සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා අනුමැතියයි. (**රූපසටහන 2.2** ට යොමු වන්න) අනුමැතියේ කොන්දේසිවලට වෙරළබඩ පසුබෑම සහ අනෙකුත් කලාපීය කොන්දේසි ඇතුලත් වෙයි. 'බලපෑමට ලක් පෙදෙස්''වෙරළ උද්‍යාන''වෙරළබඩ ප්‍රවේශ සැලසුම්''සංරක්ෂණ පෙදෙස්' සහ 'විශේෂිත කළමනාකරන පෙදෙස්' ආදිය සඳහා කළමනාකරණ සැලැස්ම නිර්මාණය කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදු කෙරේ.

109. උතුරු පළාත ඇතුලත්ව ශ්‍රී ලංකාවට යාවත්කාල කරන ලද වෙරළබඩ පසුබෑම් සැලැස්ම ලබා දෙයි. 'බලපෑමට ලක් පෙදෙස්''වෙරළ උද්‍යාන''වෙරළබඩ ප්‍රවේශ සැලසුම්''සංරක්ෂණ පෙදෙස්' සහ 'විශේෂිත කළමනාකරන පෙදෙස්' ආදිය දැනට උතුරු පළාතට නිර්දේශ කර ඇත. යාවත්කාල කරන ලද වෙරළබඩ පසුබෑම්වල නිර්දේශ කර ඇති පසුබෑම් දුර ආරක්ෂිත පෙදෙස්වලට ආදාල වන්නේ නැත. මන්ද යත් වෙරළබඩ ගාකටස් යටතට එන ආරක්ෂිත පෙදෙස් සලකනු ලබන්නේ 'ඉදි නොවුනු කලාප' ලෙසිනි.

110. RAMSAR තෙත්බිම් පරිශ්‍ර අවරෝධ කලාප අභය භූමි කැලෑ රක්ෂිත සංරක්ෂිත වනාන්තර ජාතික උරුම කැලෑ පෙදෙස් තිර ස්වාභාවික රක්ෂිත ජාතික උද්‍යාන ස්වාභාවික රක්ෂිත වන කොරිඩෝර සරණාගත සහ සාගර රක්ෂිත ආදිය ආරක්ෂිත පෙදෙස්වලට අයත් වෙයි.

111. ධීවර කළමනාකරණ ප්‍රදේශ, ධීවර රක්ෂිත සහ අන් නිර්දේශිත ප්‍රදේශ හෝ පරිශ්‍ර යැයි රජය විසින් ප්‍රකාශයට පත් කර ඇති පෙදෙස්වලට පසුබෑම් ඉසව්ව ලෙසින් මීටර් 300 ක දුරක් වෙන් කළ හැකිය යැයි දක්වා ඇත. එමෙන්ම පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර ඇති සියලුම වෙරළබඩ පුරාවිද්‍යා පරිශ්‍ර සඳහා මීටර් 200 ක පසුබෑම් ඉසව්වක් වෙන් කළ යුතුය.

112. ‘බලපෑම්වලට ලක් වුනු පෙදෙස්’ කිසිවක් සැලැස්ම යෝජනා නොකරයි. දැනට තිබෙන ‘වෙරළ උද්‍යාන’ දෙක ලැයිස්තුවේ ඇති නමුත් අළුත් ‘වෙරළ උද්‍යාන’ යෝජනා කර නොමැත. දැනට ඇති ‘වෙරළ උද්‍යාන’ දෙකින් එකක්වත් උතුරු පළාතේ පිහිටා නොමැත. අළුත් ‘සංරක්ෂිත පෙදෙස්’ යෝජනා කර නොමැත. වෙරළ ප්‍රවේශ සැලැසුම් නිර්දේශ කර නොමැත.

113. පහත පෙදෙස් උතුරු පළාතේ විශේෂ කළමනාකරණ පෙදෙස් යැයි ප්‍රකාශ කිරීමට යෝජනා වී ඇති අතර මේවායෙහි උතුරු අන්ත පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියට ආසන්නව පිහිටා ඇත:

- මුලතිව් දිස්ත්‍රික්කය: නන්දිකඩාල් කලපුව සහ නායාරු පුනීල මෝය
- යාපනය දිස්ත්‍රික්කය: මනල්කාඩු වැටිය, යාපනය පුනීලමෝය (ටවුම පෙදෙස), තොන්මානාරු කලපුව, කන්කසන්තුරෙයි සහ කීරමලෙයි වෙරළබඩ පෙදෙස, මන්දත්තීවු, ඩෙල්ෆ්ට්, නයිනාතිවු දුපත්, කාරයිනගර් (කැසුවාරිනා වෙරළ ඇතුලත්ව) නාවලි වෙරළ පෙදෙස.
- මන්නාරම් දිස්ත්‍රික්කය: මන්නාරම් බොක්ක: තලෙයිමන්නාර් වෙරළබඩ පෙදෙස, සිලාවත්තුරෙයි, අරිප්පු සහ අරුවියාරු වෙරළබඩ පෙදෙස, කොණ්ඩක්කි බොක්ක

රූපසටහන 2-2 සංවර්ධන බලපත්‍ර අවශ්‍යතා (1981 වෙරළ සංරක්ෂණ පනත අංක 57 (සහ එහි සංශෝධන)




Source: Coast Conservation Act No. 57 of 1981 (and its amendments)

## 2.2.5 ජෛව විවිධත්ව ආරක්ෂිත පෙදෙස් සහ ජීවී ප්‍රතිපත්ති

114. ආරක්ෂිත පෙදෙස් සහ ශාක / ජීවීන් සඳහා වන ප්‍රධාන ප්‍රතිපත්ති ලියවිල්ල වන්නේ ජාතික ජෛව විවිධත්ව මුලෝපා ක්‍රියා සැලැස්මයි (NBSAP)/ එය CBD යටතේ පාර්ශවකරුවන්ගේ එකගතාවයට COP ට ප්‍රතිචාර දක්වයි. ජාතික ජෛව විවිධත්ව මුලෝපා ක්‍රියා සැලැස්ම(ශ්‍රී ලංකා රජය 2016) 2016-2022 වතවානුව ආවරණය කරයි. 2022 වන විට ඉලක්ක 12 ක් අත් කර ගැනීමට යෝජනා කර ඇති අතර කිසිදු ඉලක්කයක් ප්‍රමාණාත්මක කර නොමැත. මේවා අතරින්ජේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියට අදාල ඉලක්ක පහත සඳහන් වෙයි:

- ඉලක්කය 3 ආරක්ෂිත ප්‍රදේශ හා සම්බන්ධය. 10% ක් වන *අයිචි* ඉලක්කය හා සසඳන කල සාගර පෙදෙසින් 0.3 % ක් නීතිය මගින් ආරක්ෂිත බව දක්වා ඇත. වෙරළබඩ හෝ සාගර ආරක්ෂිත පෙදෙස් ජාලයට යෝජිත එක් කිරීම් කිසිවක් ගැන සඳහනක් නොමැත.
- ඉලක්කය 4 ආරක්ෂිත ජීවීන් හා සම්බන්ධය. ප්‍රමුඛ කාර්යභාරය රතු ලැයිස්තුව යාවත්කාල කිරීමය. කිසිදු ජීවියෙක් වැඩිදුර ආරක්ෂාව සඳහා නිර්දේශ කර නොමැත. එසේ වුවද, ඉලක්කය 4 හි ක්‍රියාමාර්ගය 6 මෙසේ සඳහන් කරයි: 'කැස්බෑවන්

බෝ කරන ස්ථාන සුදුසු විද්‍යාත්මක කළමනාකරණය සඳහා සහ අධීක්ෂණ ක්‍රියාවලියක් සමග ප්‍රමාණවත් මගපෙන්වීම් සහිතව නියාමනය කළ යුතුය'

- ධීවර පරිශ්‍ර ඇතුලත්ව ජෛව විවිධත්වය තිරාසර ලෙසින් උපයෝගී කිරීම හා ඉලක්කය 6 සම්බන්ධ අතර මෙසේ සටහනක් එක් කර ඇත: විශේෂයෙන් සාගර ක්ෂේත්‍රයෙහි නිසි සම්පත් කළමනාකරණය මගින් අස්වනු ක්‍රමවේද ප්‍රවර්ධනය කර පමණට වඩා අස්වනු නෙලීම වැළැක්විය යුතුය' තවද ඉලක්කය 6 හි ක්‍රියාමාර්ගය 4 මෙසේ සඳහන් කරයි: 'භෞමික ජලජ හා සාගර පද්ධතිවල ජීව විද්‍යාත්මක සම්පත්වලින් විනාශකාරී අස්වනු ක්‍රම වැළැක්වීම පිණිස යහවර්යා උනන්දු කරන්න' තවද ඉලක්කය 6 හි ක්‍රියාමාර්ගය 5 මෙසේ සඳහන් කරයි: 'පමණට වඩා අල්ලා ගැනීම නිසා වඳවෙමින් සිටින මිරිදිය හා සාගර වරල් මාළුවන් / බෙල්ලන් අල්ලන වත්මන් මට්ටම් ඇගයීමට ලක්කර 'එවා පුනරුත්තාපනය කිරීම සඳහා සැලසුම් නිර්මානය කරන්න'
- ජෛව විවිධත්වයේ සාම්ප්‍රදායික භාවිතාව බලගැන්වීම හා ඉලක්කය 7 සම්බන්ධය. අර්ධ වශයෙන් ප්‍රජා මුල කළමනාකරණය වැඩිදියුණු කිරීම මගින් මෙය සාක්ෂාත කරන මෙන් යෝජනා කර ඇත. ඉලක්කය 7 හි ක්‍රියාමාර්ගය 6 මෙසේ සඳහන් කරයි: 'ධීවර කළමනාකරණ ප්‍රදේශවල ඇති හිදැස් හඳුනා ඒවා නිරාකරණය කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කරන්න'
- ඉලක්කය 11 නම්‍යශීලී බව වැඩි කර කාලගුණික විපර්යාසයද සැලකිල්ලට ගෙන පාරිසරික පද්ධතිමුල් කර ගත් ආදේශ ක්‍රම හරහා වනාන්තර තෙත්බිම් කඩොලාන සහ කොරල්පර වැනි පාරිසරික පද්ධති ආදේශ කිරීම හා සම්බන්ධය. ඉලක්කය 11 හි ක්‍රියාමාර්ගය 1 මෙසේ සඳහන් කරයි: 'කාලගුණ විපර්යාසය, යටිතලපහසුකම් සංවර්ධනය, සහ ස්වාභාවික ව්‍යසන නිසා ජෛව විවිධත්වයට ඇතිවන බලපෑම් පර්යේෂණයට ලක් කර අධීක්ෂණ වැඩසටහන් ආරම්භ කරන්න' ඉලක්කය 4 හි ක්‍රියාමාර්ගය 6 මෙසේ සඳහන් කරයි: 'ක ඉලක්කය 11 හි ක්‍රියාමාර්ගය 43 මෙසේ සඳහන් කරයි: 'දියබස්නා සඳහා කඩොලාන සහ ගං ඉවුරු ප්‍රතිස්ථාපන හා සංරක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න'

## 2.3 ආසියා සංවර්ධන බැංකුවේ ආරක්ෂා ප්‍රතිපත්තිය (ආරක්ෂා ප්‍රතිපත්ති ප්‍රකාශය)

115. ආසියා සංවර්ධන බැංකුවවේ ආරක්ෂා ප්‍රතිපත්ති ප්‍රකාශය 2009 අරමුණු මෙසේ වේ: (i) ව්‍යාපෘති නිසා පරිසරයට හා බලපෑමට ලක්වුවන්ට දරුණු බලපෑම් ඇති නොවන සේ වග බලාගත යුතුය (ii) වැළැක්වීම සාක්ෂාත් නොවන විට හැකි සෑම විටම ව්‍යාපෘති නිසා පරිසරයට හා බලපෑමට ලක්වුවන්ට දරුණු බලපෑම් අවම කිරීමට අඩු කිරීමට සහ /හෝ වන්දි ගෙවීමට කටයුතු කළ යුතුය (iii) ණය ගන්නන්ගේ / සේවාදායකයන්ගේ පද්ධති ශක්තිමත් කිරීමට සහ පාරිසරික හා සමාජ අවදානම් කළමනාකරණය කිරීමට, ධාරිතාවය ගොඩනගැනීමට ඔවුන්ට සහය දක්වන්න. පාරිසරික ආරක්ෂාවට සම්ප්‍රජනනයාතාවය අවශ්‍ය වන අතර මෙයට යෝජිත ව්‍යාපෘතියක ප්‍රාරම්භක අදියරවල එය හා බැඳි පාරිසරික ගැටළුවලට යොමු වීමද ඇතුලත් වෙයි.

116. අවශ්‍ය වන පාරිසරික ඇගයීමේ මට්ටම නිශ්චය කරනු පිණිස ආරක්ෂා ප්‍රතිපත්ති ප්‍රකාශයවිසින් විභව ව්‍යාපෘති හෝ ක්‍රියාකාරකම්වල බලපෑම් A, B හෝ C ආදි වශයෙන් ශ්‍රේණිගත කරන අතර ආසියා සංවර්ධන බැංකුවේ ආරක්ෂා ප්‍රතිපත්ති ප්‍රකාශයශ්‍රී ලංකා රජය දේශීය ආරක්ෂා පද්ධතිය (CSS) හා සමගාමී වෙයි.

117. ආසියා සංවර්ධන බැංකුව සහව්‍යාපෘති සැකසුම් තාක්ෂණික සහයෝග ලේඛනයඋපදේශකවරුන් කාණ්ඩ B යේ පූර්ණ පරිසර නිරීක්ෂණයක් උතුරු පළාතේ තිරසාර ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය ඇතුලත සිදු කිරීමට කටයුතු කළහ. විභව බලපෑම් පරිශ්‍රයට සීමා වූ ඒවා බව සහ එයින් ප්‍රතිස්ථාපනය නොකළ හැකි ඒවා තිබෙනුයේ අල්ප වශයෙන් බවද බොහෝ බලපෑම්වලට අවම කිරීමේ පියවර නොපමවා සම්පාදනය කර ගත හැකි බවද එවිට පෙනී ගියේය.

118. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියේ ක්ෂණික පාරිසරික ඇගයීමක් (REA) සිදු කළ ව්‍යාපෘති සංවර්ධන සහයපාරිසරික කණ්ඩායම B වර්ගීකරණය තහවුරු කළ අතර ඒ අනුව මෙම ප්‍රාරම්භක පාරිසරික පරීක්ෂාවවාර්තාව සම්පාදනය කර ඇත්තේ ආරක්ෂා ප්‍රතිපත්ති ප්‍රකාශයට සමගාමීව විභව බලපෑම්වලට යොමු වීමට අවශ්‍ය නිර්දේශිත ඇගයීම් මට්ටමකිනි.

119. ලෝක බැංකු කණ්ඩායමේ පාරිසරික සෞඛ්‍ය සහ ආරක්ෂා මාර්ගෝපදේශ (EHSG) වැනි ජාත්‍යන්තර පිළිගැනීමට පාත්‍රව ඇති සම්මිතිවල සඳහන් වන පරිදි ආසියා සංවර්ධන බැංකුවේආරක්ෂා ප්‍රතිපත්ති ප්‍රකාශයදූෂණ වැළැක්වීමේ හා පාලනය කිරීමේ තාක්ෂණ සහ චර්යාවලට අනුකූල වේ. ජාත්‍යන්තර යහචර්යාවල සන්දර්භය පාරිසරික සෞඛ්‍ය සහ ආරක්ෂා මාර්ගෝපදේශ ලබා දී පාරිසරික කාර්යසාධනය සඳහා වන ඉලක්ක නිර්ණය කරයි. පාරිසරික සෞඛ්‍ය සහ ආරක්ෂා මාර්ගෝපදේශයට ආදේශ කර ඇති සම්මිති, සම්ප්‍රජනන්‍ය මූලධර්ම සහිතවද ප්‍රවේශම්කාරී ප්‍රවේශයකින් සමන්විතව ශ්‍රී ලංකා රජයේ පාරිසරික සම්මිතිවලට සමගාමීව මෙම ලියවිල්ල පුරා උපයෝගී කරනු ඇත. ආරක්ෂා ප්‍රතිපත්ති ප්‍රකාශයයටතේ නිර්දේශිත පරිදි හා පාරිසරික සෞඛ්‍ය සහ ආරක්ෂා මාර්ගෝපදේශයේ අවධාරනය කර ඇති පරිදි වෘත්තිමය සහ ප්‍රජා සෞඛ්‍ය හා ආරක්ෂා පියවර ආදේශ කළ යුතුය.

## 2.4 ජාත්‍යන්තර හා කලාපීය සම්මුති සහ ගිවිසුම්

120. වායුගෝලය ජෛව විවිධත්වය සාගර හා වෙරළබඩ භෞමික සහ රසායන භාවිතාව මත වන කලාපීය හා ජාත්‍යන්තර සම්මුති හා ගිවිසුම් කිහිපයකට ශ්‍රී ලංකාවද අත්සන්කරුවෙක් වෙයි. එයින් කිහිපයක් ව්‍යාපෘතියට අදාලතාවය ඇති ඒවාය. මෙම ගිවිසුම්වල නම් දිනය අරමුණු ආදිය **අනුබද්ධය 2** හි ලබා දී ඇත.

## 2.5 ශ්‍රී ලංකා පාරිසරික නිශ්කාසන සහ අනුමැති

121. වෙරළකලාපය ඇතුලත වන අදාල බලාධිකාරිය වන වෙරළ සංරක්ෂණ සහ වෙරළබඩ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව හා එයින් පිටත බලාධාකාරිය වන මධ්‍යම පරිසර අධිකාරියවෙතින් සංවර්ධන කටයුතු බලපත්‍රයක් ලබා ගැනීම පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියට අවශ්‍ය වනු ඇත. මෙයට අමතරව මත්ශ්‍යයන් හා ඇතැම් සාගර දූෂණ පරාස සඳහා වන බලාධිකාරිය වන MFARD වෙතින්ද සාගර සම්පත් දූෂණ සම්බන්ධ රාජ්‍ය ආයතනය වන සාගර පාරිසරික ආරක්ෂක අධිකාරිය වෙනිත්ද ශාක ජීව පනතට යටතේ ජෛව විවිධත්වය ආරක්ෂා කිරීමේ කලාප සම්බන්ධව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙතින්ද අනුමැති හා නිශ්කාසන ලබා ගැනීම අවශ්‍ය වන ඇත. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියට අවශ්‍ය වන අනුමැති හා බලපත්‍රවල ලැයිස්තුවක් පහත **වගුව 2.3** හි ලබා දී ඇත.

**වගුව 2-3 පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියට අවශ්‍ය වන අනුමැති හා බලපත්‍රවල ලැයිස්තුව**

| | නිශ්කාසනය / අනුමැතිය | අවශ්‍ය වන අවස්ථාව | තත්වය |
|---|---|---|---|
| 1 | වෙරළ සංරක්ෂණ සහ වෙරළබඩ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවවේ අනුමැතිය | ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර | ප්‍රාරම්භක පාරිසරික පරීක්ෂාව /m පාරිසරක බලපෑම් වාර්තාවඉදිරිපත් කළ යුතුව ඇත |
| 2 | වඩමරාච්චි උතුර ප්‍රාදේශීය ලේකම්ධීවර වරායගේ අනුමැතිය | ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර | අනුමැතිය ලබා දී ඇත |
| 3 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ (NWSDB) අනුමැතිය | ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර | අනුමැතිය ලබා දී ඇත ඇමුණුම 2.1 |
| 4 | යාපන දිස්ත්‍රික්ක සම්බන්ධීකරණ කමිටුවේ එකගතාවය | ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර | අනුමැතිය ලබා දී ඇත. ඇමුණුම 2.2 |
| 5 | වඩමරාච්චි උතුර ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය | ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර | අනුමැතිය ලබා දී ඇත |
| 6 | දිස්ත්‍රික්ක ඉඩම් භාවිතා කමිටුවේ අනුමැතිය | ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර | DCC විසින් අනුමැතිය ලබා දී ඇත |
| 7 | දිස්ත්‍රික්ක පාරිසරික කමිටුවේ අනුමැතිය | ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර | ප්‍රාරම්භක පාරිසරික පරීක්ෂාව / පාරිසරක බලපෑම් වාර්තාවඉදිරිපත් කිරීමෙන් පසු සම්පූර්ණ කිරීමට නියමිතය |
| 8 | පේදුරුතුඩුව නගර සභාවේ අනුමැතිය | ඉදිකිරීම් ආරම්භ කිරීමසට පෙර ගොඩනැගිලි සඳහා වන ප්‍රාරම්භක අනුමැතිය සහ ගොඩනැගිලි සඳහා වන සහතිකකිරීම | සලකා බැලෙමින් තිබේ. සැළැසුම් සම්පූර්ණ කිරීමෙන් පසු නගර සභාවට ඉදිරිපත් කිරීමට නියමිතය |
| 9 | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය | ක්‍රියාකාරකම් ආරම්භ | අනුමැතිය ලබා දී ඇත |

| | | | |
|---|---|---|---|
| | ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අනුමැතිය | කිරීමට පෙර | |
| 10 | ලංකා විදුලිබල මණ්ඩලයේ (CEB) අනුමැතිය | ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර | ව්‍යාපෘතිය සඳහා විදුලිය සැපයිය හැකිය යැයි ලංකා විදුලිබල මණ්ඩලය තහවුරු කර ඇත. ඇමුණුම 2.3 |
| 11 | ආරක්ෂක අමාත්‍යාංශය (නාවික) | ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර | සලකා බැලෙමින් තිබේ |
| 12 | ශ්‍රී ලංකා රේගුව | ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර | සලකා බැලෙමින් තිබේ |
| 13 | බර වාහන හා යන්ත්‍රෝපකරණ ප්‍රවාහනය කිරීමට මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතිය | ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර | සලකා බැලෙමින් තිබේ |
| 14 | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමැතිය | ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර | පුරාවිද්‍යා බලපෑම් අධ්‍යයනයක් සිදු කර ඇති අතර අවශ්‍ය නිර්දේශද ලබා දී ඇත. ඇමුණුම 9 |
| 15 | පේදුරුතුඩුව නගර සභාව සමග ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා වන සැලසුම | ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර | සලකා බැලෙමින් තිබේ. අවසාන සැලසුම් රූපසටහන් නිම කිරීමෙන් පසු ඉදිරිපත් කරනු ඇත |
| 16 | පිපිරීම් මෙහෙයුම් සඳහා භූවිද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය | ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර | සලකා බැලෙමින් තිබේප්‍රාරම්භක පාරිසරික පරීක්ෂාව / පාරිසරක බලපෑම් වාර්තාවපාරිසරික කළමනාකරණ සැලැස්ම මත පදනම්ව කොන්ත්‍රාත්කරු භාර ගනු ඇත |
| 17 | ගල් කොරි හා කැණීම් පෙදෙස් සඳහා භූවිද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය | ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර | සලකා බැලෙමින් තිබේ: ප්‍රාරම්භක පාරිසරික පරීක්ෂාව / පාරිසරක බලපෑම් වාර්තාව ඉදිරිපත් කිරීමෙන් පසු පාරිසරික කළමනාකරණ සැලැස්මඅනුමත කර ගනීමට භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්ය්‍යාංශයට ලබා දෙනු ඇත |
| 18 | ගල් කොරි සඳහා වන පරිසර ආරක්ෂක බලපත්‍රය | ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර | ප්‍රාරම්භක පාරිසරික පරීක්ෂාව / පාරිසරක බලපෑම් වාර්තාව ඉදිරිපත් කර එයට අනුමැතිය පළ වුවහොත් සලකා බලනු ලැබේ |
| 19 | වැලි හා ගල් ප්‍රවාහනය කිරීමට පොලිසිය හා ප්‍රාදේශීය ලේකම් කාර්යයාලයේ අනකුමැතිය | ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට පෙර | සලකා බැලෙමින් තිබේ |

# තුන්වන පරිච්ඡේදය

## 3. ව්‍යාපෘතියේ විස්තරය

### 3.1 ව්‍යාපෘතියේ විස්තරය

#### 3.1.1 පිහිටීම

122. ව්‍යාපෘතිය පිහිටා ඇත්තේ 9°49’43.43”N සහ 80°14’8.36” E හි ය. යෝජිත ව්‍යාපෘතිය AB 21 මාර්ගය ඔස්සේ, දිස්ත්‍රික්කයේ වඩමාරච්චි උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ (VNDS)ය. යෝජිත ධීවර ධීවර වරාය ප්‍රදේශය පේදුරු තුඩුව ග්‍රාම නිලධාරී කොට්ඨාශය තුල පිහිටා ඇත. අවට ප්‍රදේශය, නැගෙනහිරින් කොද්දඩි, සහ බස්නාහිරෙන් පේදුරු තුඩුව සහ සුප්පරමාදම් යන ගම් ද ආවරණය කරයි.අවට ප්‍රදේශයේ දෘශ්‍යමානයන් ද, යෝජිත ව්‍යාපෘතියේ පිහිටීමේ සිතියම ද පිළිවෙලින් රූපය 3.1 සහ 3.2 හි දී ඇත

**රූපසටහන 3-1 ව්‍යාපෘතියේ අවට ප්‍රදේශයේ දෘශ්‍යමානයන්**




2.Eastern Side of project site

පවත්නා ජෙටිය 1. ව්‍යපෘති ප්‍රදේශයේ බස්නාහිර අඩවිය 2. ව්‍යාපෘති ප්‍රදේශයේ නැගෙණහිර අඩවිය

**රූපසටහන 3-2 යෝජිත ව්‍යාපෘතියේ පිහිටීමේ සිතියම**




### 3.1.2 ව්‍යාපෘතියේ විස්තර

123. ඉදිකරනු ලබන ප්‍රධාන ව්‍යාපෘති ව්‍යුහයන්හි, දිය කඩන 2, ධීවර වරාය දෝණිය පිහිටුවීම, ජැටි, ධීවර වරාය වේදිකාව, සහ භූමියේ පිහිටි යටිතල පහසුකම් ගොඩනැගිලි ඇතුලත් වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන කොටස්, රූපය 3.4 හි දී ඇත. එකිනෙක ප්‍රධාන ව්‍යුහයන් පිලිබඳ විස්තර පහත කොටසෙහි දී ඇත.

**i. දියකඩන**

124. දියකඩන ව්‍යුහයයන් දෙකක් ඉදි කෙරෙනු ඇත. ප්‍රධාන දියකඩනය වන්නේ නැගෙණහිර කොටස අතර, එය මීටර 886 කින් සහ වෙරළ ආසන්නයේදී මුහුදු මට්ටමේ සිට මුහුදු මට්ටමෙන් පහළ මීටර 10 දක්වා ඇති ගැඹුරකින් යුක්ත වේ. දෙවන දියකඩනය, ධීවර ධීවර වරාය දෝණියේබස්නාහිරෙන් ඉදිකෙරෙනු ඇති අතර, ජලයේ ගැඹුර මීටර 0 සිට - 9 දක්වා යුක්ත වනු ඇත. දියකඩනයේ සාම්පල හරස් කැපුම රූපය 3.3 හි දී ඇත. 2070 සඳහා පුරෝකථනය කරනු ලැබ ඇති මුහුදු මට්ටම, මීටර 0.45 ලෙස සලකනු ලැබ ඇත.

**රූපසටහන 3-3දිය කඩනයේ සාම්පල හරස් කැපුම**



### ii. ධීවර ධීවර වරාය ද්‍රෝණිය

125. ධීවර ධීවර වරාය ද්‍රෝණියේ ප්‍රමාණය හෙක්ටයාර් (Ha) 17.8 කි. ආසන්න වශයෙන් පල් වැලි 18000 ක් $m^3$ ඉවත් කිරීම සඳහා හෙක් 1.6 ක් ඉවත් කිරීම අවශ්‍ය වනු ඇත. ද්‍රෝණියේ ගැඹුර, බස්නාහිර දෙසින් ධීවර වරාය ද්‍රෝණියේ දී මුහුදු මට්ටමෙන් පහළ මීටර් 5 (-5) සිට ප්‍රවේශ ඇල ආසන්නයේදී මුහුදු මට්ටමෙන් පහළ මීටර් 10 (-10) දක්වා වේ. පැමිණෙන විශාල බහුදින යාත්‍රා (IMUL)සඳහා පහසුකම් සැලසීම පිණිස මෙය සැලසුම් කරනු ලැබ ඇත. ද්‍රෝණියේ ගැඹුර නැගෙණහිර දෙසින් ජැටි බිත්තියේදී මුහුදු මට්ටමෙන් පහළ මීටර් 3 (-3) සිට ප්‍රවේශ ඇල ආසන්නයේදී මුහුදු මට්ටමෙන් පහළ මීටර් 10 (-10) දක්වා වේ.

රූපසටහන 3-4 ව්‍යාපෘතියේ යෝජිත කාර්යයන්



### iii. ද්‍රෝණිය කැණීම

127. ව්‍යාපෘති කැණීම් වැඩසටහන, ධීවර වරාය බැම්ම අසල සිදු කෙරෙනු ඇත. ද්‍රෝණියේ බස්නාහිර අංශය, මධ්‍යන්‍ය මුහුදු මට්ටමෙන් පහළ මීටර් - 5 දක්වා කණීනු ලබන අතර, නැගෙනහිර අංශය, මුහුදු මට්ටමෙන් පහළ මීටර් - 3 ක් දක්වා කණීනු ලැබේ. කැණීම් සැලැස්ම, රූපය 3.5 හි දක්වා ඇත.

128. සම ගැඹුරු සමෝච්ඡ රේඛා පාංශු අධ්‍යයනය අනුව, මීටර් 1 ක් පමණ වන ඉහළ තට්ටුව මෘදු පස්වලින් යුක්ත අතර, බත්තලක නැංවූ චූසන මඩ කැනියක් මගින් සියලුම ද්‍රව්‍ය පිරවුම් ප්‍රදේශයට (පර ගොඩකිරීම් ප්‍රදේශය) සෘජුවම පොම්ප කරනු ලැබේ. මීටර් 1 ක් පමණ වන දෙවන තට්ටුව, කැනියක් භාවිතා කරමින් ඉවත් කරනු ලබන අතර, තද හුණුගල් සහිත පතුල් තට්ටුව, රසායනික සහ පුපුරණ ද්‍රව්‍ය භාවිතා කරමින් ඉවත් කෙරෙනු ලැබේ. ව්‍යාපෘති ප්‍රදේශයට (බස්නාහිර දෙසින් පිහිටි) යාබදව ඇති මෙතෝදිස්ත මහා විද්‍යාලයේ එදිනෙදා කටයුතුවලට ශබ්දයෙන් සහ දෙදරීමෙන් බාධා නොවන පරිදි, එම පාසැලට යාබද කොටස්වල, රසායනික පිපිරවීම් කරනු ඇත. පුපුරන ද්‍රව්‍ය භාවිතය, ධීවර වරාය ද්‍රෝණියේ බස්නාහිර කොටස්වලට පමණක් සීමා කෙරෙනු ඇත. පිපිරවීමෙන් ඇතිවන ද්‍රව්‍ය, බත්තලක් මතුපිට නංවනු ලබන කැණීම් යන්ත්‍රයක් භාවිතා කරමින්, වෙරළට ඔබ්බෙන් ඇති පිරවීමේ ප්‍රදේශයට ප්‍රවාහණය කරනු ලැබේ.

129. මුහුදු පතුල, ඉහල තට්ටුව වැලිවලින් සමන්විත මූලික වශයෙන්ම යටින් පිහිටි හුනුගල්වලින් සමන්විත ය. ඉවත් කළ යුතු වැලි 18,600 $m^3$ වේ. සියලුම ද්‍රව්‍ය, මෙම ද්‍රව්‍ය ධීවර වරාය ගොඩකිරීමේ ප්‍රදේශයේ පිරවීම් කටයුතු සඳහා භාවිතා කෙරෙනු ඇත.

**රූපසටහන 3-5 කැණීමේ සැලැස්ම**



### iv. නැංගුරම් පහසුකම්

130. සෑම ධීවර ගමනකට පසු ධීවරයන් විවේකයක් ගන්නා බැවින්, විවේක කාලය තුළදී, යාත්‍රාවන් ධීවර වරාය ද්‍රෝණියෙහි නැංගුරම් ජැටිය ඔස්සේ නැංගුරම් ල තැබෙනු ඇත. නැංගුරම් ජැටියතුළදී, ධීවරයෝ තම ධීවර දැල්, වියලා ගැනීමට හෝ අලුත්වැඩියා කරගැනීමට පිටතට ගෙනයන අතර, ඊළඟ ධීවර ගමනට පෙර ඒවා තම බෝට්ටුවලට නැවත පටවති. ප්‍රාථමික (නැගෙනහිර දෙස) දියකඩනය ආශ්‍රිතව නැංගුරම් ජැටි තුනක් ඇති අතර එහි දිග මීටර් 120 ක් වනු ඇත හා මධ්‍යම ප්‍රමාණයේ IMUL යාත්‍රා 12 ක් (වාණිජ යාත්‍රා) නවතා තැබීමේ පහසුකම් සහිත වනු ඇත. දෙවෙන ජැටිය මීටර් 115 ක් දිග වන අතර එහි මධ්‍යම ප්‍රමාණයේ IMUL යාත්‍රා 48 ක් නවතා තැබිය හැකිය. තුන්වන ජැටිය මීටර් 70 ක් දිග වනු ඇති අතර කුඩා ප්‍රමාණයේ IMUL යාත්‍රා 32 ක් එහි නවතා තැබිය හැකිය. ජැටිවල පිහිටීම පහත රූපසටහන 3.6 හි දක්වා ඇත.

**රූපසටහන 3-6 ජැටිවල පිහිටීම**



v. **ඉඩම් ගොඩකිරීම** යෝජිත පරිශ්‍රයේ ප්‍රදේශය, පවත්නා මාර්ගයේ භූමි මට්ටමට මීටර් 2 ක් පමණ පහළින් පිහිටා ඇත. එහෙයින්, වෙරළ පහසුකම් සැලසීම පිණිස, වෙරළ ප්‍රදේශය සහ අන්තර් උදම් පර සමතලා ප්‍රදේශය ගොඩකිරීම අවශ්‍ය වේ. සුදුසු පිරවීමේ ද්‍රව්‍යවලින්, හෙක්ටයාර් 16 ක පමණ ප්‍රමාණයක් නැවත පිරවීම අවශ්‍යවන බවට ඇස්තමේන්තු කර ඇත. යෝජිත පිරවීම් ප්‍රදේශය රූපය 3.7 හි දක්වා ඇත. අවශ්‍ය නැවත පිරවීම් ද්‍රව්‍ය ප්‍රමාණය 117,000 m3 ක් පමණ වනු ඇත. කැණීම් කරනු ලබන ද්‍රව්‍ය18,000 m3 ක් පමණ පවතිනු ඇති අතර, එය, නැවත පිරවීම පිණිස භාවිතා කළ හැකිය. ඉතිරි 99,000 m3, ව්‍යාපෘති ප්‍රදේශයෙන් පිටත පිහිටි බලපත්‍රලාභී ගල් කොරිවලින් හා අඩවිවලට ලබා ගත හැකි වනු ඇත.

**රූපසටහන 3-7 ඉඩම් නැවත පිරවීමේ ප්‍රදේශය**



131. ස්පෝටක පිපිරවීමට වඩා වැඩි වියදම්කාරී වනු ඇත. වඩා ඇත ප්‍රදේශයන් සියල්ලෙහි ඩයිනමයිට් පිපිරවීම් සිදුකිරීම අපේක්ෂා කරන අතර ඇතිවිය හැකි ශබ්ද සහ දෙදරීම් බලපෑම් අඩුකිරීම සඳහා මෙතෝදිස්ත ගැහැණු පාසලට සෘජුවම තදාසන්න ප්‍රදේශයන්හි රසායනික පිපිරවීම් භාවිතා කරනු ඇත. ශිල්ප ක්‍රම දෙකම භාවිතා කරනු ඇත.

### vi ධීවර වරාය වේදිකාව

132. විශාල වාණිජමය ධීවර යාත්‍රා සඳහා මෙන්ම මධ්‍යම ප්‍රාමණයේ ෂෑඹ්බ යාත්‍රා, පෙදෙසේ කුඩා ධීවර බෝට්ටු සහ ධජ්‍යෘජ සඳහා තොටමළු බැම් තුනක් ඉදි කරනු ඇති අතර ඉන් විශාලතම බැම්මේ දිග මීටර් 270 ක් වනු ඇත. මෙය -5 ප මුහුදු මට්ටමක් සහිතව වනු ඇත හා බෝට්ටු 8 ක් නවතා දැමීමට හැකි වනු ඇත. දෙවෙනි බැම්ම මීටර් 324 ක් දිග වනු ඇත. මෙය 3.5 ප මධ්‍යයන්‍ය මුහුදු මට්ටමක් සහිතව වනු ඇත. මෙය බෝට්ටු 35 ක් නවතා දැමීමේ පහසුකම් සහිත වනු ඇත. තුන්වන ඵබම්ම මීටර් 60 ක් දිග වනු ඇති අතර මෙය 1.5 ප මධ්‍යයන්‍ය මුහුදු මට්ටමක් සහිතව ඉදි කරනු ඇත. මෙහි බෝට්ටු 24 ක් නවතා තැබිය හැකිය. මෙයට අමතරව බන්ධන සැපයුම සඳහා මීටර් 70 ක තවත් බැම්මක් ඉදි කරනු ඇත.

**රූපසටහන 3-8 සැලසුම් පෙනුම උන්නතාංශ පෙනුම හරස්කඩ පෙනුම**



**ධීවර වරාය වේදිකාව පිරිසැලසුම**



**ධීවර වරාය වේදිකාව ඉදිරි පෙනුම**




**ධීවර වරාය වේදිකාව වැඩ කටයුතු**

## vi. බෑවුම් වේදිකාව

133. බෑවුම් වේදිකාවේ ප්‍රමාණය වන්නේ මීටර් 45 ං මීටර් 10 ය. බෑවුම් වේදිකාවේ ප්‍රධාන අවශ්‍යතාවය වන්නේ ධීවර යාත්‍රා නඩත්තු කිරීම සහ අලුත්වැඩියාව යි. බෑවුම් වේදිකාව සමන්විතවන්නේ, වෙරළේ සිට ජලය දක්වා බෑවුම්වන සාමාන්‍යයෙන් කොන්ක්‍රීට් බෑවුමක් මත හෝ කණු ව්‍යුහයයක් මත ඉදි කරන ලද පීලි මාර්ගයකි. ධීවර යාත්‍රාවක් ජලයේ සිට ගොඩබිමට හෝ ඊට ප්‍රති විරුද්ධව චලනය කරන සෑම අවස්ථාවකදීම විදුලි බලයෙන් හෝ ඩීසල් බලයෙන් ක්‍රියාත්මක වන වින්චියෙන් එය ඇදගනු ලැබේ. බෑවුම් වේදිකාවකට ටොන් 75 දක්වා වන යාත්‍රාවක් පිළිබඳව කටයුතු කළ හැකි බැවින්, ඒවාට, වඩා විශාල යාත්‍රා පිළිබඳව කටයුතු කළ හැකිය. බෑවුම් මගක් සඳහා වඩාත්ම ආර්ථිකමය සහ පහසුම බෑවුම වන්නේ 1:12 (8.3%) ය. යෝජිත බෑවුම් වේදිකාවේ දික් අතට පැතිකඩ රූපය 3.8 හි දැක්වේ

රූපසටහන 3-9 යෝජිත බෑවුම් වේදිකාවේ දික් අතට  පැතිකඩ




Slipway Layout




Slipway Elevation




Slipway Section A-A




Slipway Section B-B

## 3.1.3 වෙරළබඩ යටිතල පහසුකම්

**දැල් ප්‍රතිසංස්කරණ ශාලාව** දැල් ප්‍රතිසංස්කරණ ශාලාව, වර්ග මීටර් 1,050 ක් පමණ සහිත තනි මහල් ගොඩනැගිල්ලකි. ගඩොල් සහ කොන්ක්‍රීට් නිරවරණයක් සහිත භාග බිත්තියෙන් මෙය ඉදි කෙරෙනු ලැබේ. පොළොව සිමෙන්තියෙන් වන අතර වහල උළුවලින් කෙරේ.

**ප්‍රජා ශාලාව සහ ආපන ශාලාව** ප්‍රජා ශාලාව සහ ආපන ශාලාව, දෙමහල් ගොඩනැගිල්ලකි. මුළු බිම් ප්‍රමාණය වර්ග මීටර් 890 කි. පහල මාලය ආපන ශාලාව සඳහා වෙන් කෙරෙන අතර ඉහල මාලය ප්‍රජා ශාලාව සඳහා වෙන් කෙරේ. ආපන ශාලාව, කාර්ය මණ්ඩලයේ 6 දෙනෙකු සඳහා ඉඩකඩ සහ අසුන්ගැනීමේ පහසුකම්වලින් මුළුතැන්ගෙය සමන්විත වේ. ඉහල මාලය, සමිති කාර්යාලය සහ 125 දෙනෙකුහට අසුන් ගත හැකි ප්‍රජා ශාලාවෙන් යුක්ත වේ.

**අවිවාහක නිල නිවාස,** වර්ග මීටර් 420 කින් යුක්ත තනි මහල් ගොඩනැගිල්ලකි. එහි, ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් අට දෙනකු සඳහා පහසුකම් සැලසීම පිණිස ද්විත්ව නිදන කාමර හතරක්ද, කනිෂ්ඨ නිලධාරීන් 10 දෙනකු සඳහා ශයනාගරයක්ද ඇත. ද්විත්ව නිදන කාමර සඳහා නාන කාමර හතරක්ද, ශයනාගාරය සඳහා පොදු නානකාමර තුනක්ද සපයනු ඇත. මීට අමතරව, කෑම ශාලාවක් සහ සාලයක් ද සපයනු ලැබේ.

**ධීවර වරාය කළමණාකරුගේ නිල නිවස:** ධීවර වරාය කළමණාකරුගේ නිල නිවස, දෙමහල් ගොඩනැගිල්ලකි. බිම් මහල, ගරාජයකින්, ගබඩාවකින් සහ නැවතීමේ පහසුකම් සහිත වේ. ගරාජයෙහි, ධීවර වරාය කළමණාකරුගේ වාහනය (HM)සහ නියෝජ්‍ය ධීවර වරාය කළමණාකරුගේ (DHM) වාහනය වශයෙන්, මෝටර් රථ දෙකක් නවතා තැබිය හැකිය. වර්ග මීටර් 222 කින් යුක්ත බිම් මහල ධීවර වරාය කළමණාකරු සඳහාද, වර්ග මීටර් 156 කින් යුක්ත ඉහල මාලය නියෝජ්‍ය ධීවර වරාය කළමණාකරු සඳහා ද ලැබේ. මහල් දෙකෙහිම නිදන කාමර දෙකක් සහ නාන කාමර දෙකක්, කෑම ගබඩාව, කෑම ශාලාව සහ උපයෝගිතා කාමරවලින් සමන්විත ය.

**සන්නිරීක්ෂණ ගොඩනැගිල්ල:** මෙම ගොඩනැගිල්ලේ ප්‍රමාණය වර්ග මීටර් 1,600 (40 m x 40 m) කි. සන්නිරීක්ෂණ ගොඩනැගිල්ල, දෙමහල් ගොඩනැගිල්ලක් වන අතර, එහි සාමුද්‍රික පොලිසිය, වෙරළාරක්ෂක සේවය සහ ඈත මුහුදේ ධීවර සේවය යන අයට පහසුකම් සලසයි. බිම් මහල, ඉහත නිලධාරීන්ගේ කාර්යාල සඳහා ය. සාමුද්‍රික පොලිසි කාර්යාලය සහ වෙරළාරක්ෂක සේවය කාර්යාල සඳහා, ජ්‍යෙෂ්ඨ නිලධාරීන් තිදෙනකු, කනිෂ්ඨ නිලධාරීන් දෙදෙනකු සහ සහායකයන් සඳහා පහසුකම් සැපයෙන අතර, එකිනෙක පහසුකම් සඳහා නාන කාමර සැපයේ. ඈත මුහුදේ ධීවර සේවා කාර්යාලය සඳහා, එක් ජ්‍යෙෂ්ඨ නිලධාරියකු, එක් සහායකයකු සහාය කාර්ය මණ්ඩලයේ සිවු දෙනෙකු සහ අමුත්තන් සඳහා ආසන පහසුකම් සැපයේ. ගුවන් විදුලි පණිවිඩ කාර්යාලය

සඳහා පහසුකම් බිම් මහලෙහි සැලසෙනු ඇත. පළමුවන මහල, සාමුද්‍රික පොලිසිය, වෙරළාරක්ෂක සේවය සහ ඈත මුහුදේ ධීවර සේවය සඳහා නවාතැන් පහසුකම් සලසනු ඇත. සාමුද්‍රික පොලිසියේ නවාතැන් පහසුකම්, ඇඳන් 5 කින් සහ නාන කාමරයකින් යුක්ත වනු ඇත. වෙරළාරක්ෂක සේවය සඳහා නවාතැන් පහසුකම් වශයෙන්, නිදන කාමර දෙකක්, නාන කාමර 2 ක්, කෑම ගබඩාව, කෑම ශාලාව සහ සාලයෙන් යුක්ත වනු ඇත. ඈත මුහුදේ ධීවර සේවය සඳහා නිදන කාමරයක්, නාන කාමරයක්, සාලයක් සහ කෑම ශාලාව යන පහසුකම් සපයනු ලැබේ.

**වෙන්දේසි ශාලාව:** වෙන්දේසි ශාලාව වර්ග මීටර් 1,200 (100 m x 12 m)තනි මහලේ ගොඩනැගිල්ලක් වනු ඇති අතර, මහුදු ප්‍රදේශයට ආසන්නව, ධීවර වරාය වේදිකා බිත්තියේ සිට මීටර් 2 ක් දුරින් වන අතර, අසල්වැසි ප්‍රජාවනට ඇතිවන ගන්ධය සහ ශබ්දය අඩු කිරීම පිණිස, ආසන්නතම නේවාසික ප්‍රදේශයේ සිට මීටර් 50 ක් දුරින් පිහිටුවනු ඇත. එහි, ලොරි රථ නැවැත්වීමේ ස්ථාන 16 ක් පිහිටුවනු ඇති අතර, වෙන්දේසි මස්තකයන් 28 ක්, සවිකර ඉදිකෙරෙනු ඇත. වෙන්දේසි ශාලාවේ සියලුම අප ජලය, රැස් කිරීමේ වලකට යොමු කෙරෙන අතර, අපේක්ෂිත භාවිතා කරන්නන් සංඛ්‍යාව අනුව පහසුකම් සැලසෙන පරිදි, අපජල පිරියම් කිරීමේ පද්ධතියක් සැලසුම් කරනු ලබ ඇත. එහි, පූතික සැලසුම් පද්ධතියක් භාවිතා කෙරේ.

**වාහන නවත්වා තැබීමේ ප්‍රදේශය**: යෝජිත ධීවර වරාය සඳහා වාහන නවත්වා තැබීමේ ප්‍රදේශ දෙකක් සැලසෙනු ඇත. එකක් පොදු ප්‍රදේශයක් වනු ඇති අතර, අනෙක වෙන්දේසි ශාලාව සඳහා ය. පොදු වාහන නවත්වා තැබීමේ ප්‍රදේශය, වාහන 30 ක් නවත්වා තැබීම පිණිස වර්ග මීටර් 3,750 කින් යුක්ත වන අතර, වෙන්දේසි ශාලා වාහන නැවතුම් ප්‍රදේශය, පාපැදි 90 ක්, මෝටර් බයිසිකල් 50 ක්, ට්‍රැක්ටර් 51 ක්, ලොරි රථ 6 ක් සහ අනෙකුත් වාහන 21 ක් සඳහා පහසුකම් සැලසීමට සැලසුම් කරනු ලබ ඇත.

**මහජන වැසිකිළි**: මහජන වැසිකිළිවල සමස්ත ප්‍රදේශය වර්ග මීටර් 82 කි. පිරිමින් සඳහා වැසිකිළි 5 ක්, සේදීමේ බේසම් තුනක් සහ මුත්‍රා කිරීමේ පහසුකම් හතරක් සැලසෙනු ඇති අතර, කාන්තාවන් සඳහා වැසිකිළි පහක්, සේදීමේ බේසම් හතරක් සැපයෙනු ඇත.පිරිමි සහ කාන්තා ආබාධිත පුද්ගලයන් සඳහා එක ආබාධිත වැසිකිලියක් සැපයේ.

ව්‍යාපෘති අඩවිය තුල භාවිතා කෙරෙන සියලුම වැසිකිළි සහ අපජල පද්ධති, භාවිතා කරනු ඇතැයි අපේක්ෂිත භාවිතාකරුවන්ගේ සංඛ්‍යාවගේ අපේක්ෂිත ඉල්ලුම සැපයීම පිණිස සැලසුම් කරනු ලබ ඇත. සියලුම පද්ධතීන්, අඩවිය තුල පවත්නා අපජල පිරියම් කිරීමේ සැලැස්මට සම්බන්ධ කෙරෙනු ඇත. (පහත බලන්න)

**අපජල පිරියම් කිරීමේ පහසුකම**: ධීවර වරාය තුල කෙරෙන මෙහෙයුම්වලින් ජනනය වන මළාපවහනයද ඇතුලත්ව, සියලුම අපජලය පිරියම් කිරීම පිණිස, ව්‍යාපෘති ප්‍රදේශය තුල පිරියම් කිරීමේ පහසුකම් සැපයෙනු ඇත. දිනකට අපජලය ඝන මීටර්61.8ක් උත්පාදනය වනු ඇති ඇස්තමේන්තු කරනු ලබ ඇත. සුදුසු පිරියම් කිරීමේ පද්ධතිය පිළිබඳව 3.6.2. කොටසේදී සාකච්ඡා කෙරේ.

**ආරක්ෂක සේවා පහසුකම්**: ආරක්ෂක ඇතිරීම් දෙකක් පිහිටුවනු ඇත. එකක් ඇතුළුවන ස්ථානයේ ද, දෙවැන්න ඉදිකිරීම් අවධියේදී තීරණය කරනු ලබන ස්ථානයේදී වනු ඇත. නාන කාමර සහිත සෑම ආරක්ෂක ඇතිරීමක්ම වර්ග මීටර් 30 ක් වනු ඇත.

**බර කිරීම් පාළම සහ පාලක කාර්යාලය:** ධීවර වරාය කිරීම් පාළම, අඩවියේ ප්‍රධාන ගේට්ටුව අසල පිහිටුවනු ඇත. මුළු භූමි ප්‍රමාණය වර්ග මීටර් 70 කි. ආරම්භයේදී ටොන් 40 ක බර කිරීම පිණිස පහසුකම සැපයෙන අතර, අනාගතයේදී අවශ්‍යතාවයක් මතු වුවහොත්, සැලසුම අනුව ටොන් 60 පහසුකම සැලසිය හැකි ය.

**ඉන්ධන පහසුකම්**: කුඩා සහ විශාල බෝට්ටු යන දෙවර්ගයම සඳහා සේවා සැපයීම පිණිස, ඉන්ධන කාර්යාලයක් සහ 3 ‍ං ද්විත්ව සංයෝජක ඒකක සහිතව, ලීටර් 36000 ං 3 ටැංකි පවතිනු ඇත. ඉන්ධන කාර්යාලයේ භූමි ප්‍රදේශය වර්ග මීටර් 30 කි. ඉන්ධන පහසුකම, ගොඩ බෑමේ ආසන්නයේ ස්ථානගත කෙරෙනු ඇති අතර, එහි ශ්‍රී ලංකා සම්මත ආරක්ෂක සහ ආරක්ෂාකාරී අවශ්‍යතාවයන් ද ඇතුලත් වනු ඇත.

**ගොඩබෑමේ ගොඩනැගිල්ල:** ගොඩබෑමේ ගොඩනැගිල්ලේ මුළු බිම් ප්‍රමාණය වර්ග මීටර් 1,100 කි. සකස්කිරීමේ ශීත කාමර තුනක් පවතිනු ඇති අතර, සෑම ශීත කාමරයක්ම ගබඩාවකින්, කාර්යාලයකින් සහ ප්‍රලම්බ කාමරවලින් යුක්ත ය. සෑම ශීත කාමරයකින්ම ඉහල නැගෙන උන්නත පැතලි ඵලකයක් පවතිනු ඇත. ශීත කාමරවලින් උත්පාදනය වන අප ජලය, අපජල පිරියම් කිරීමේ යන්ත්‍රාගාරයට යොමු කෙරෙනු ඇත.

**ට්‍රාන්ස්ෆෝර්මරය සහ ජෙනරේටර් පහසුකම්**: A 800 kVA ට්‍රාන්ස්ෆෝර්මරයක් සහ 250 kVA සහ 350 kVA ධාරිතාවයෙන් යුක්ත පොරොත්තු ජෙනරේටර් පිහිටුවීම පිණිස පහසුකම් සැලසෙනු ඇත. ධීවර වරාය තුල විකල්ප සූර්ය බලය සැපයෙනු ඇති අතර, අතිරික්තය, විදුලි බලය සපන්නා වෙත අලෙවි කෙරෙනු ඇත.

**ආරක්ෂක වැට:** ඉහළින් හරිත වගාවක් සහිතව, මීටරයක් උසැති ගල් තාප්පයක් සහ දම්වැල් සවිකිරීමක් යෝජිත ය.

ඊට අමතරව, පුද්ගලික අංශයට ආයෝජනය කිරීම පිණිස ආපනශාලාවක් (මීටර් 4,115), අලෙවි මධ්‍යස්ථානයක් සහ වාණිජ අවකාශ ) මීටර් 35 ං මීටර් 8 / එකක 2), ශීත කාමරයක් සහ අයිස් යන්ත්‍රාගාරයක් සහිත පොදු විනෝදාත්මක ස්ථානයක් සලස්වනු ලැබේ.

## 3.2 සියලුම ව්‍යාපෘති සංරචක දැක්වෙන විස්තරාත්මක චිත්‍ර:

134. දිය කඩන, ජැටි, ජැටි තාප්ප, ධීවර වරාය ද්‍රෝණිය, ඇතුළුවීමේ ඇල, යෝජිත කැනීම් ප්‍රදේශ, කසළ හෙළන ස්ථාන, ධීවර වරායට ඔබ්බෙන් පහසුකම්, අඩවියට පැමිණෙන ප්‍රවේශ මාර්ග, රක්ෂිත ආදිය ANNEX 3 හි දී ඇත.

## 3.3 සංවර්ධනය සහ ඉදිකිරීම් සඳහා කාල සීමාව:

135. මාස 15 ක් සඳහා වැඩ කොන්ත්‍රාත්කරු ප්‍රක්‍රමණය කිරීම පිණිස මාස 15 ද ඇතුලත්ව, ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත ඉදිකිරීම් කළ රාමුව වර්ෂ පහකි. කාර්යයන් ආරම්භවීමට පෙර, ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විස්තරාත්මක කාර්ය සැලැස්ම සකස්කර PIMU හි අනුමැතිය ලබා ගනියි. තාවකාලික ඉදිකිරීම් කාර්ය වැඩසටහන රූපය 3.10 හි දී ඇත

රූපසටහන 3-10 තාවකාලික ඉදිකිරීම් කාර්ය වැඩසටහන

PPD




කාර්යය --- ප්‍රධාන (නැගෙණහිර) දියකඩනය ----- ද්විතියික (බස්නාහිර) දිය කඩනය
ධීවර වරාය වේදිකාව ඉදිකිරීම --- වැලි කැණීම -- පාෂාණ කැණීම
වේදිකා ඉදිකිරීම ---- බෑවුම් මග ඉදිකිරීම ---- වෙරළත යටිතල පහසුකම්
බාහිර කාර්යයන් --- ව්‍යාපෘතිය සම්ර්ණපූර්කිරීම

## 3.4 මූල්‍ය වෙන්කිරීම් සහ ආයෝජනයන්

136. ව්‍යාපෘතියේ පිරිවැය රු. බිලියන 12 ක්($ 75,840,000.00)ඇස්තමේන්තු කරනු ලැබ ඇත. දේශීය බදු ÷ ලංකා රජයවෙතින් සැපයීම සමග,ADBවිසින් අරමුදල් සපයනු ලැබීම.

## 3.5 වෙනත් සියලුම ස්වාභාවික සම්පත් පරිභෝජනය සහ හරිත ඉදිකිරීම් සංකල්ප

137. ස්වාභාවික සම්පත් අතුරින් ප්‍රධාන කොටස වන්නේ, අනුමත ප්‍රාදේශීය ගල්වලවල් වෙතින් ලබා ගන්නා කළුගල් පාෂාණ සහ ආනයනය කරනු ලබන හෝ දේශීය වෙළඳපොළෙන් මිළදී ගනු ලබන ලී දඬු ය.

138. ජාත්‍යන්තර පිළිගැනීම සහතික කරමින්, ගොඩනැගිලි ඉදිකරනු ලබන්නේ දේශගුණික ප්‍රත්‍යස්ථිථි, බල ශක්ති කාර්යක්ෂම / ඉතිරිකරන් සහ හරිත ඉදිකිරීම් සංකල්ප අනුව ය. සාධනීය ගොඩනැගිලි ද්‍රව්‍ය සහ බල ශක්ති අවශ්‍යතාවයන් භාවිතා කෙරේ. හැකි අවස්ථාවලදී, ඉදිකිරීම් ද්‍රව්‍ය ලෙස පරිසර හිතකාමී ද්‍රව්‍ය භාවිතා කෙරේ. සැලසුමේ කාර්යක්ෂමතාවය සහතික කිරීම පිණිස, (ගොඩනැගිලි සිසිල් කිරීම පිණිස සුළං දිශාවට යොමු කිරීම) බලශක්ති අඩු කිරීමද ඇතුලත් කරනු ලැබ ඇත.

### දේශගුණික ප්‍රත්‍යස්ථිථිය

139. වෙරළුත පහසුකම් ගොඩනැගිලි සැලසුම්වල ඇතුලත් කර ඇති දේශගුණික ප්‍රත්‍යස්ථිථි ලක්ෂණ:

- මුහුදු සුළං සහ වර්ෂාව නිසා ඇතිවන බලපෑම් පාලනය පිණිස, පළල් වහළ අගු
- තෙත්වීම මගහැරවීම පිණිස, කාර්යාල කොටස් ඔස්සේ කොරිඩෝර සැලසුම් කිරීම
- ‍හේ බැහීම අඩුකිරීම පිණිස, සිමෙන්ති භාවිතය අවම කිරීම
- ගෘහ අභ්‍යන්තර සැප පහසුව වැඩිකිරීම පිණිස, ගඩොල් සහ උළු භාවිතා කිරීම
- වෙරළබඩ සාමුද්‍රික කාලගුණ තත්වයන්හි බලපෑම අඩු කිරීම පිණිස, ගොඩනැගිලි වහල පද්ධතිය ආවරණය කිරීම
- බිත්ති/ කණුවලට තෙතමනය අවශෝෂණය කිරීම වැළැක්වීම පිණිස බාහිර කාන්දු වලක්වන ද්‍රව්‍ය භාවිතා කිරීම
- වානේ ද්‍රව්‍ය සඳහා මළ බැඳීම් නාශක යෙදීම් භාවිතා කිරීම / ගැල්වනයිස් වනේ භාවිතා කිරීම

### බලශක්ති සංරක්ෂණය සහ හරිත ගොඩනැගිලි සංකල්පය

140. වෙරළට ඔබ්බෙන් පිහිටි ගොඩනැගිලි සඳහා පහත දැක්වෙන හරිත ගොඩනැගිලි සංකල්ප සලකා බලනු ලැබේ.

- හරස් වාතාශ්‍රය සහ ස්වාභාවික ආලෝකකරණය සඳහා, උපරිම ප්‍රතිපාදන තබා ඇත.
- ප්‍රාදේශීයව ලබාගතහැකි ද්‍රව්‍ය (උදා: ගඩොල්, දව, මැටි ගඩොල්)
- සිමෙන්ති සහ වානේ අවම වශයෙන් භාවිතාකිරීම
- ක්‍රියාකාරිත්ව සහ පාරිසරික අවශ්‍යතාවයන් සලකාබලමින්, ඵලදායී ප්‍රධාන සැලසුම් සකස්කිරීම
- සූර්ය බලය භාවිතා කිරීම
- උෂ්ණත්ව දූපත් බලපෑම් අඩුකිරීම පිණිස හු දර්ශණය
- වර්ෂා ජල අස්වැන්න ලබාගැනීම

**රූපසටහන 3-11 යෝජිත ගොඩනැගිලිවල සංකල්ප සැලසුම**

පරිපාලන ගොඩනැගිල්ල - පළමුවන මහල ආලින්දය



පරිපාලන ගොඩනැගිල්ල - ඉදිරිපස දර්ශනය



පරිපාලන ගොඩනැගිල්ල - පිටුපස දර්ශනය



පරිපාලන ගොඩනැගිල්ල - පිටුපස  ආලින්දය

## 3.6 ඉදිකිරීම් සහ මෙහෙයුම් කාර්යයන්ගේ විස්තර

### 3.6.1 ජල අවශ්‍යතා ( ඉදිකිරීම් සහ මෙහෙයුම් අදියර)

**ජල අවශ්‍යතා / ජලය සැපයීමේ පද්ධතිය**

141. **ඉදිකිරීම් කාලය තුළදී ඇස්තමේන්තුගත ජල අවශ්‍යතාවය දිනකට ඝන මීටර් 20 (20 $m^3$/day) වන අතර, මෙහෙයුම් කාලයේදී එම ප්‍රමානය දිනකට ඝන මීටර් 111 (111 $m^3$ /day) වේ**

**වගුව 3-1 ජල අවශ්‍යතාවය**

| මූලාශ්‍රය | පුද්ගයන්/ප්‍රදේශ/ඒකක | අනුපාතය | උත්පාදන අනුපාතය |
|---|---|---|---|
| වෙන්දේසි ශාලාව සහ දැල් ප්‍රතිසංස්කරණ ශාලාව | 2500 $m^2$ | 10 l/m2 | 25,000 |
| බෝට්ටු | 400 unit | 100l/boat | 40,000 |
| කාර්යමණ්ඩලය පූර්ණකාලීන නේවාසික | 50 persons | 120 l/d/person | 6,000 |
| කාර්යමණ්ඩලය පූර්ණකාලීන අනේවාසික | 50 persons | 50 l/d/person | 2,500 |
| ධීවරයන් හා කාර්යමණ්ඩලය | 500 persons | 50 l/d/person | 25,000 |
| අමුත්තන් | 500 persons | 25 l/d/person | 12,500 |
| **දිනක මුළු උත්පාදනය** | | | **111,000** |

142. **ඉදිකිරීම් අදියර:** ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රමානවත් මනා තත්වයේ ජලය, ව්‍යාපෘතිය ආසන්නයේ නොමැත. එහෙයින්, ව්‍යාපෘතියේ අවශ්‍යතාවයන් සඳහා ජලය කිරීම පිණිස, පෙරමුසු කොන්ක්‍රීට් භාවිතා කරනු ලැබේ. අනෙකුත් ජල අවශ්‍යතා සඳහා, කොන්ත්‍රාත්කරු විසින් සුදුසු ජලය සොයාගත යුතු වේ. වෙරළට ඔබ්බෙන් යටිතල පහසුකම් ඉදිකිරීම 2021 දී සම්පූර්ණ කරනු ලැබේ. කාලය වනවිට, එනම් 2020 දී, යාපනයේ කරදියෙන් ලුනුරස ඉවත්කිරීමේ යන්ත්‍රාගාරය සම්පූර්ණ කරනු ලැබ මෙහෙයුම් සිදු කෙරෙනු ඇත. ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය සමග සාකච්ඡා කර, ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය ජල ප්‍රමාණයන් සපයා ගැනීමට හැකිවනු ඇත.

143. **මෙහෙයුම් අදියර** : ව්‍යාපෘතිය මෙහෙයුම් සඳහා අවශ්‍ය සමස්ත ජල අවශ්‍යතාවය දිනකට ඝන මීටර් 102 $m^3$/d ක් ලෙස ඇස්තමේන්තු කරනු ලැබ ඇත. යාපනය - කිලිනොච්චි ජල සම්පාදන ව්‍යාපෘතියේ ලුනුරස ඉවත්කිරීමේ යන්ත්‍රාගාරය සම්පූර්ණ කර ක්‍රියාත්මක වනවිට, අවශ්‍ය බිමට ගතහැකි ජල ප්‍රමාණය සැපයිය හැකිබව NWSDBදන්වා ඇත. වරායේ භූමිය පදනම් කරගත් පහසුකම් (2023 දී අපේක්ෂිත) අවශ්‍ය වන විට, යන්ත්‍රාගාරය 2020 දී සම්පූර්ණ කර ක්‍රියාත්මක වනු ඇත.

### 3.6.2 අප ජලය

**අපවාහ වර්ග**

144. ඉදිකිරීම් කාලයේදී ඇතිවන අප ජලය ප්‍රධාන වශයෙන් උත්පාදනය වන්නේ, ගෘහමය භාවිතයද ඇතුළුව, සේවකයන්ගේ කටයුතු වලිනි. මෙම කාලයේදී සියලුම ගෘහමය අප ජලය සුවහනීය පූතික පද්ධතීන්ට මුදා හරිනු ඇත.

145. **වගු අංක 3.2** හි දක්වා ඇති පරිදි, ක්‍රියාත්මක කිරීමේ අවධියෙන් අප ජලය ඝන මීටර 61.8 ක් ($61.8m^3$)ක් ඉපදවෙනු ඇත. අප ජලය ඉපදෙනුයේ ප්‍රධාන වශයෙන් මත්ස්‍යයන් පිළියෙලකිරීමේ ප්‍රදේශයෙන්, වෙන්දේසි ශාලාව සේදීමෙන් සහ සාමාන්‍ය ස්නානය කිරීමේ අවශ්‍යතාවයන්ගෙනි. වෙන්දේසි ශාලාවෙන් සහ මත්ස්‍යයන් පිළියෙළ කිරීමේ ප්‍රදේශයෙන් ඉපදවෙන අප ජලය, ලේ සේදීමෙන් සහ පිරිසිදු කිරීම් වලින් නිකුත් වන ජලය, මාංශ කැබලි, ලේ සහ බඩවැල් වලින් නිකුත් වන ද්‍රාව්‍ය ද්‍රව්‍යයන්, ක්ෂාලකයන් සහ අනෙකුත් පිරිසිදුකාරක ද්‍රව්‍යයන්ගෙන් අපිරිසිදුවනු ඇත. ධීවර වරාය ක්‍රියාකාරිත්වය හා සම්බන්ධ කාර්යයන්ගෙන් ඉපදවෙන සියලුම අප ජලය, අඩවියෙහි අප ජලය පිරියම් කිරීමේ යන්ත්‍රාගාරයට මුදාහරිනු ඇත.

**වගුව 3-2 ඉපදවෙන සමස්ත අප ජලය ප්‍රමාණය**

| මූලාශ්‍රය | පුද්ගයන්/ප්‍රදේශ/ඒකක | අනුපාතය | සමස්ත අප ජලය (L)per day) | උත්පාදන අනුපාතය | අපද්‍රව්‍ය ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| වෙන්දේසි ශාලාව සහ දැල් ප්‍රතිසංස්කරණ ශාලාව | 2500 $m^2$ | 10 l/m2 | 25,000 | 100% | 25,000.00 |
| බෝට්ටු | 400 unit | 100l/boat | 40,000 | 0% | - |
| කාර්යමණ්ඩලය පූර්ණකාලීන නේවාසික | 50 persons | 120 l/d/person | 6,000 | 80% | 4,800.00 |
| කාර්යමණ්ඩලය පූර්ණකාලීන අනේවාසික | 50 persons | 50 l/d/person | 2,500 | 80% | 2,000.00 |
| ධීවරයන් හා කාර්යමණ්ඩලය | 500 persons | 50 l/d/person | 25,000 | 80% | 20,000.00 |
| අමුත්තන් | 500 persons | 25 l/d/person | 12,500 | 80% | 10,000.00 |
| **දිනක මුළු උත්පාදනය** | | | **111,000** | | **61,800.00** |

**කැලිකසල බැහැරකිරීම සඳහා වැඩ පිළිවෙල (ඉදි කිරීම් සහ ක්‍රියාත්මක කිරීම් යන අවස්ථා දෙකෙහි දීම ),**

146. ඉදිකිරීම් කාලයේදී සියලුම අප ජලය සහ කැලි කසල, ගෙන යා හැකි පූතික ටැංකි වලට බැහැර කිරීමට යෝජනා කර ඇත. තාවකාලික පූතික පද්ධතියෙහි පෙඟවුම් වලවල් ඇතුලත් වනු ඇත. ක්‍රියාත්මක කිරීමේ කාලයේදී අප ජලය අඩවියෙහි ඇති අපජලය පිරියම් කිරීමේ යන්ත්‍රාගාරය වෙත යොමු කෙරෙනු ඇත.

**අප ජලය පිරියම් කිරීමට සහ බැහැර කිරීමට යෝජිත ක්‍රම වේදය**

147. මත්ස්‍ය වරායේ ක්‍රියාත්මක අවධියෙන් උත්පාදනය කළ අප ජලය කළමනාකරණය සහ පිරියම් කිරීම සඳහා සක්‍රිය කළ රොන්බොර ක්‍රියාවලියක් උපයෝගී කරගනු ඇත. මෙම ක්‍රියාවලියේ ප්‍රධාන වාසිය වනුයේ අප ජලයෙන්BOD, COD සහ අනෙකුත් පෝෂකයන් කාර්යක්ෂමව සහ සාධනීය අන්දමින් ඉවත් කිරීමයි. මේ ආකාරයේ අප ජලය පිරියම් කිරීමේ යන්ත්‍රයක් දික්ඕවිට ධීවර වරායේ ඒ හා සමාන අප ජලය පිරියම් කිරීම සඳහා සාර්ථකව ක්‍රියාත්මක කෙරේ.

**රූපසටහන 3-12 සක්‍රීය කළ රොන්බොර ජලය පිරියම්කිරීමේ ප්‍රවාහ සටහන**




අප ජලය ගලා ඒම - ප්‍රාථමික පිරියම් කිරීම - පළමු පැහැදුම් ටැංකිය - **රොන්බොර** පිරියම් කිරීම සහ අපහරණය - පළමු **රොන්බොර**
වාතය කැවීමේ ටැංකිය -- **සක්‍රීය කළ රොන්බොර ප්‍රතික්‍රීකරණය - ද්විතීයික** පැහැදුම් ටැංකිය
අපද්‍රව්‍ය **සක්‍රීය කළ රොන්බොර - විෂබීජ නාශනය - අවසාන අපවාහය**

148. සංකල්පික ක්‍රියාත්මක කල රොන්බොර පිරියම් කිරීමේ ප්‍රවාහ සටහනක් **3-12 රූප සටහනෙහි** සපයා ඇති අතර එහි ඇතුලත් වන්නේ:

**පූර්ව පිරියම් කිරීම**: සැකසුම් කිරීමේ කොටසෙන් සහ වෙළඳපොල ප්‍රදේශයෙන් ඉපදවෙන අප ජලය, පිරියම් කිරීමේ යන්ත්‍රයට ඇතුල් වන කොරපොතු සහ අනෙකුත් මත්ස්‍ය කොටස් ඉවත් කිරීම සඳහා, පෙරනයන් ඔස්සේ යවනු ඇත. කොරපොතු සහ තැන්පත් වූ ද්‍රව්‍ය පෙරනයන්ගෙන් ඉවත් කර වරායේ සාමාන්‍ය ඓන්ද්‍රීය අපද්‍රව්‍ය කළමනාකරණ පාලනය ඔස්සේ බැහැර කෙරෙනු ඇත.

**මූලික පිරිසිදු කාරකය**: පූර්ව පිරියම් කල අප ජලය මූලික පිරිසිදුකාරකය වෙත යොමු කරනු ඇති අතර එහිදී පිරිසිදු කාරකයේ පත්ලේදී විශාල අංශු බැහැර කිරීම සඳහා තෝරා ඉවත් කරනු ඇත. අප ජලය, වායු කැවීමේ ටැංකියකට යොමු කෙරෙනු ඇත.

**වායු කැවීමේ ටැංකිය**: පිරියම්කාරකය පත්ලේ පහසුවෙන් තැන්පත්වන ඓන්ද්‍රිය ද්‍රව්‍යයන් වියෝජනය කිරීම සඳහා සහ විශාල ප්‍රමාණයේ කැටි සෑදීම සඳහා, වාතය යාන්ත්‍රිකව අප ජලය වෙත සැපයේ. පිරියම් කළ ජලය (මිශ්‍ර ද්‍රාවයන්) ද්විතීය පිරියම්කාරයකට බැහැර කෙරේ.

**ද්විතීය පිරියම්කාරකය**: මිශ්‍ර ජලය ද්විතීය පිරියම් කාරකයට බැහැර කෙරෙන අතර එහිදී ජෛව බැක්ටීරියා පත්ලේ තැන්පත්වී, මළ බැක්ටීරියා ඉහලට මතුවී මධ්‍යයේ පැහැදිලි ද්‍රාවයක් සහිත පොත්තක් සකසයි. මෙම පිරිසිදු ජලය ඉන් පසු ජල මාර්ගයකට බැහැර කිරීම හෝ පොඟවාගැනීම සිදුවේ. සක්‍රිය කළ බැක්ටීරියානු රොන්බොර ලෙස හැඳින්වෙන ජෛව බැක්ටීරියා, ටැංකියට

ඇතුල්වන නව අමු අප ද්‍රව්‍ය, වායු කැවීමේ ටැංකියට ආපසු යැවෙන අතර මළ බැක්ටීරියානු පොත්ත බැහැර කිරීම සඳහා වියලි තලයන් මත රොන්බොර ලෙස ඉවත් කෙරේ.
**රොන්බොර වියළීමේ තලයරී** මූලික සහ ද්විතීය තැන්පත්වීමේ ටැංකිවලින් ලබා ගත් රොන්බොර බැහැර කිරීමට පෙර, තෙතමන අන්තර්ගතය අඩුකිරීම සඳහා වියලි තලයක් මත එක්රැස්කෙරෙනු ඇත. වියළීමේ තලයන්වලින් ඇති වූ අප ජලය පිරියම් කිරීමේ යන්ත්‍ර වලට ආපසු හරවා යැවීම හෝ ඒවා වියලි තලයන් මතම පෙඟීමට ඉඩ හැරීම හෝ කෙරෙනු ඇත.

**පිරියම් කළ අප ජලය බැහැර කිරීමේ අවසන් ස්ථානය, ජාතික ප්‍රමිතීන්ට අනුව ක්‍රම වේදය.**

149. උත්පාදනය කළ අපජලය ජාතික පරිසර පනතට අනුකූලව, කාර්මික සහ දේශීය අපජලය සාගර වෙරළ කලාපයට මුදාහැරීම ධාරණය කිරීමේ සීමාවන් දක්වා මෙන්ම, ලෝක බැංකුවේ පාරිසරික සෞඛ්‍ය ප්‍රමිති (EHS) උපදේශනයන් හා අනුකූලවන ලෙස පිරියම් කරනු ඇත. ප්‍රමාණවත් තනුකතාවයක් ලබාගැනීම සඳහා වෙරළ ප්‍රදේශයෙන් මී. 100 ක් පමණ ඇතින් නැගෙනහිර දෙස දිය කඩනය ඔස්සේ නල මාර්ගයක් සපයනු ඇත.

**ඝන අප ද්‍රව්‍ය**

**ඉදිකිරීම් අවධිය**

150. ඉදිකිරීම් අවධියේදී ටිපර් ට්‍රක් රථ 500 ක් අතර ප්‍රමාණයක අප ද්‍රව්‍ය නිමවෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.
151. **ඉදිකිරීම් අප ද්‍රව්‍ය:** සියලුම ඉදිකිරීම් අප ද්‍රව්‍ය, ප්‍රති චක්‍රීකරණය කළහැකි අප ද්‍රව්‍ය සහ ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි අප ද්‍රව්‍ය ලෙස වෙන් කෙරෙනු ඇත. සියලුම ප්‍රති චක්‍රීකරණය කළහැකි අප ද්‍රව්‍ය දේශීය ප්‍රතිචක්‍රිකාරක ද්‍රව්‍ය එක්රැස් කරන්නන් හට විකුණා දමනු ඇත. ප්‍රති චක්‍රීකරණය කළ නොහැකි ද්‍රව්‍ය යෝජිත යලි පිරවීමේ කටයුතු සඳහා යොදාගනු ඇත. ඉදිකිරීම්වල අවසාන අවධියේදී ඉතිරිවන කිසියම් හෝ අප ද්‍රව්‍යයන් (සුළු ප්‍රමාණයක්) පළාත් අධිකාරියේ බැහැර කිරීමේ අඩවියෙහි බැහැර කෙරෙනු ඇත.
152. **නාගරික ඝන අපද්‍රව්‍ය:** කම්කරු කඳවුරුවලින් උත්පාදනය වන නාගරික ඝන අප ද්‍රව්‍ය, මූලාශ්‍රයේදීම වෙන්කොට වෙන් වෙන්ව එක්රැස්කරගනු ඇත. ප්‍රතිචක්‍රීකරණය කළහැකි ද්‍රව්‍ය පළාත්බද ප්‍රතිචක්‍රීකරණය කළහැකි ද්‍රව්‍ය එක්රැස් කරන්නන් හට දෙනු ලබනු ඇති අතර සෙසු කොටස් අදාළ ප්‍රාදේශීය අධිකාරී එක්රැස්කිරීමේ ක්‍රමය ඔස්සේ බැහැර කෙරෙනු ඇත.
**මෙහෙයුම් අපද්‍රව්‍ය**
153. **මෙහෙයුම්** අවධියේදී ඝන අපද්‍රව්‍ය වලට ප්‍රධාන වශයෙන් ඇතුලත් වන්නේ, මත්ස්‍ය අපද්‍රව්‍ය, ගෘහමය අපද්‍රව්‍ය සහ අපද්‍රව්‍ය පිරියම් කිරීමේ යන්ත්‍රයෙන් ඉපැදෙන රොන්බොර ය. එක් එක් අපද්‍රව්‍ය ප්‍රමාණයන් පහත වගුගත කර ඇත.

| සංරචක | මිනිසුන් සංඛ්‍යාව | වර්ග ප්‍රමාණය ($m^2$) | පැටවීමේ ධාරිතාවය | තොග ඝන අපද්‍රව්‍ය පරිමාව (L/day) | ඝන අපද්‍රව්‍ය (kg/day) |
|---|---|---|---|---|---|
| ප්‍රජා ශාලාව සහ ආපන ශාලාව | - | 890 | 0.86L/m2/day | 765.4 | 202.1 |
| කාර්ය මණ්ඩලය | 24 | 799 | 0.85kg/person | - | 20.4 |
| පොදු විනෝදාත්මක ස්ථානය | - | 4115 | 0.05L/$m^2$/day | 205.7 | 54.3 |
| අධීක්ෂණය | - | 1600 | 0.05L/$m^2$/day | 80 | 21.1 |
| **එකතුව** | | | | | **297.9** |
| **රොන් බොර පිරිපහදුව** | | | | | **50-100** kg/month |
| **මතසය අපද්‍රව්‍ය** | | | | | **50- 100 kg/day** |

154. ධීවර වරාය අවන්හල, බෝට්ටු සහ අනෙකුත් පොදු ප්‍රදේශයන්ගෙන් ඉපදවෙන සියලුම ගෘහමය ඝන අපද්‍රව්‍ය මූලාශ්‍රය අනුව වෙන් කෙරෙනු ඇත.(වෙන් කිරීම සඳහා වෙනස් වර්ණ සහිත බඳුන් තැබීමෙන්) වෙන් කරන ලද ප්‍රතිචක්‍රීකරණය කළහැකි අපද්‍රව්‍ය පළාත් බද ප්‍රතිචක්‍රීකරණය කළහැකි අපද්‍රව්‍ය එක්රැස්කරන්නන් හට විකුණනු ඇති අතර ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි අපද්‍රව්‍ය පළාත් අධිකාරී එක්රැස්කිරීමේ ක්‍රමය ඔස්සේ බැහැර කෙරෙනු ඇත.

155. මත්ස්‍ය අපද්‍රව්‍ය වෙන්ව එක්රැස්කිරීම සඳහා වෙන්දේසි ශාලාවේ විකුණුම් මධ්‍යස්ථානයේ සහ සැකසුම් කිරීමේ මධ්‍යස්ථානයේ එක්රැස්කිරීමේ පහසුකම් (බැරල්/බඳුන්) සපයනු ඇති අතර එම අප ද්‍රව්‍ය සයිලෝ ආහාර නිපදවීම සඳහා යොදාගත හැකි අතර ඒවා පුද්ගලික කොන්ත්‍රාත්කරුවෙකුට සත්ව ආහාර ලෙස භාවිතා කළ හැකිය.

156. ඉතා ඉහල මෙහෙයුම් ඇති කාලයන්හිදී මසකට/වියලි රොන්බොර කි.ග්‍රෑ.50 සිට 100 අතර ප්‍රමාණයක් උත්පාදනය වනු ඇත. මේවා ප්‍රධාන වශයෙන් ඓන්ද්‍රිය ද්‍රව්‍යයන්ගෙන් සංයුක්ත වන අතර, ඒවා, ධීවර වරාය ප්‍රදේශයේ, මූලිකව, ධීවර වරාය මායිමේ සහ නැගෙනහිර දිසාවේ ස්ථානයන්හි භූ දර්ශනිකරණ අරමුණු සඳහා යොදාගනු ඇත..

157. ක්‍රියාත්මක කිරීමේ අවධියේදී, අපද්‍රව්‍ය එක්රැස් කරන්නන්හට පහසුවෙන් ලඟාවිය හැකි ස්ථානයක අපද්‍රව්‍ය එක්රැස්කිරීම සඳහා මධ්‍යම ගබඩා පහසුකමක් සපයනු ඇත. කසල ශෝධකයින් විසින් කසල විසිරවීම වැළැක්වීම සඳහා සියලුම ඓන්ද්‍රිය අපද්‍රව්‍යයන් සුදුසු පියනක් සහිත බඳුන් වල එක්රැස්කරනු ඇත. නාගරික ඝන අපද්‍රව්‍ය සඳහා ධීවර වරාය කළමනාකාරිත්වය මගින් අපද්‍රව්‍ය බැහැර කිරීමේ අඩවියක් පවත්වා නොගනු ඇත. ධීවර වරාය ක්‍රියාකාරිත්වය හේතුකොටගෙන උත්පාදනය වූ සියලුම නාගරික ඝන අපද්‍රව්‍ය බැහැර කෙරෙනු ඇත්තේ පළාත් අධිකාරියේ එක්රැස් කිරීමේ ක්‍රම ඔස්සේ වන අතර, ප්‍රතිචක්‍රීකරණය කළහැකි ද්‍රව්‍යයන් ප්‍රතිචක්‍රීකරණය සඳහා බැහැරට විකුණනු ඇත.

158. ප්‍රතිචක්‍රීකරණ අරමුණු සඳහා පහසුවෙන් බැහැරට විකිණියහැකි විවිධ කාණ්ඩයන්හි අපද්‍රව්‍යයන් වෙන් කොට තබාගැනීම සඳහා සියලුම පොදු ප්‍රදේශයන්ට වෙනස් වර්ණ කේතයන් සහිත බඳුන් සපයනු ඇත. ඇමුණුම 4

## 3.7 ඉදිකිරීම් සහ ක්‍රියාත්මක කිරීමේ අවධීන්හිදී ශ්‍රම අවශ්‍යතාවය '

**ඉදිකිරීම් අවධිය**

159. ඉදිකිරීම් අවධියේදී පුහුණු සහ නුපුහුණු කම්කරුවන් 100 ක් පමණ අවශ්‍ය වනු ඇත.

160. ජනගහනයෙන් 51% ක් රු:3000/= කට වඩා අඩු ආදායමක් ලබන බවත් වෙරළ ප්‍රදේශයේ ජනතාවගෙන් විශාල කොටසක් ඔවුන්ගේ ජීවනෝපාය සඳහා අර්ධ කාලින ධීවර කටයුතුවල නියැලෙන බවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල දත්ත අනාවරණය කරයි. එහෙයින්, ඉදිකිරීම් කටයුතු සඳහා අවට ප්‍රදේශයෙන් ප්‍රමාණවත් නුපුහුණු ශ්‍රමිකයන් සංඛ්‍යාවක් ලබාගත හැකිවනු ඇත.

161. ඉදිකිරීම් කාලයේදී, යෝජිත ධීවර වරායේ යොදාගැනීමට ඉඩ ඇති සාමාන්‍ය සහ උපරිම ශ්‍රමිකයන් සංඛ්‍යාව විය හැක්කේ, පුහුණු, නුපුහුණු සහ අර්ධ පුහුණු ශ්‍රමිකයන් ද ඇතුලත්ව, පිළිවෙලින් 50 ක් සහ 100 ක් පමණය. ප්‍රදේශයේ පළාත් බද ජනයාට ප්‍රමුඛත්වය දෙනු ඇත.

**මෙහෙයුම් අවධිය**

162. වරායේ මෙහෙයුම් පවත්වාගැනීම සඳහා , විවිධ කාණ්ඩයන් කිහිපයක සේවකයින්, දළ වශයෙන් 37 ක් අවශ්‍ය වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. ඉදිරියේදී ඇතිවන සේවක අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන පූර්ණකාලීන සේවකයින් 50 සහ පූර්ණකාලීනව නොවන සේවකයන් 50 ලෙස උපකල්පනය කෙරේ මෙහෙයුම් කාලයේදී කාර්ය කිරීමේ අවස්ථාවන් සඳහා පළාත්බද ජනතාවට ප්‍රමුඛත්වය දෙනු ඇත. පළාත්බද ප්‍රදේශයන්හි අවශ්‍ය ශ්‍රමිකයින් හිග කමක් ඇතිවුවහොත් පිටස්තරයින් බඳවාගනු ඇත. අවන්හල මෙහෙයුම් බැහැරට පවරනු ඇති අතර, එම පහසුකම ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රදේශයන්හි ධීවර සංවිධානවලට අවස්ථාවක් ලබාදෙමින්, එය තරඟකාරී ලෙස ටෙන්ඩර් කරනු ඇත. තාවකාලික සේවක අවශ්‍යතාවය වගු අංක 3-3 හි දක්වා ඇත.

**වගුව 3-3 මෙහෙයුම් කාලයේදී සේවක අවශ්‍යතාවය**

| පිහිටීම | ස්ථානය | පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අවන්හල | 6 |
| 2 | ධීවර වරාය කළමනාකරු ⭑සහකාර ධීවර වරාය කළමනාකරු | 5 |
| 3 | සන්නිරීක්ෂණ ගොඩනැගිල්ල | |
| | පොලිසිය | 7 |
| | වෙරළාරක්ෂක | 7 |
| | ගැඹුරු මුහුදේ ධීවර | 6 |
| 4 | ආරක්ෂක | 2 |
| 5 | බරකිරීමේ කාමරය | 2 |
| 6 | ඉන්ධන සැපයුම | 2 |
| | මුළු ගණන | 37 |
| | ඉදිරියේදී සේවක අවශ්‍යතාවයන් | 50 |

## 3.8 ඉදිකිරීම් සිදුකිරීමේදී යොදාගැනීමට පවත්නා විධික්‍රම පිලිබඳ විස්තර

163. පොන්නාලේ - පේදුරු තුඩුව පාර ඔස්සේ මායිම් බිත්තිය සකස්කිරීම, කාර්යකිරීමේ ප්‍රදේශය වටා බාධකයන් පිහිටුවීම, අනතුරු ඇඟවීම් දැන්වීම් තැබීම සහ පවතින මාර්ගවලට බාධා නොකර අභ්‍යන්තර වැඩ බිම් පිවිසුමක් ඉදිකිරීම වැනි ආරක්ෂක පියවරයන් ස්ථාපනය කිරීම සමග ඉදිකිරීම් කටයුතු ආරම්භ වනු ඇත.

### 3.8.1 ඉදිකිරීම් ක්‍රමවේදය

**I දියකඩනය ඉදිකිරීම**

164. දියකඩනයන් දෙකක් ඉදිකිරීමට යෝජනා කර ඇත. ප්‍රධාන දිය කඩනය වනු ඇත්තේ, වෙරළ අසල මී. 0 ක ගැඹුරකින් ඇරඹී සාගරයේ (-10)MSLවලින් අවසන් වන, මී 880 ක දිගකින් යුත් නැගෙනහිර කොටසයි. මී. 425 ක දිගකින් යුත් ද්වීතීය දිය කඩනය, බස්නාහිර දෙස ඉදිකරනු ඇති අතර, එය වෙරළ ආසන්නයේ MSL 0 කින් ආරම්භ වීMSL(-9)ක ගැඹුරකින් අවසන් වේ. පේදුරුතුඩුව දිය කඩනයේ නියැදි හරස්කඩක් **3.13 රූප සටහනෙහි** දක්වා ඇත. දිය කඩනය ඉදිකිරීම, මධ්‍යය, ෆිල්ටර් ලේයරය, අක්පාව, අභ්‍යන්තර ලේයරය හෝ ද්වීතීය ලේයරය සහ මූලික ලේයරය හෝ ආරක්ෂක ලේයරය සහ පෘෂ්ඨය යනාදියෙන් සමන්විත වේ.

**රූපසටහන 3-13 පේදුරු තුඩුව ධීවර වරායට යෝජිත දිය කඩනයේ නියැදි හරස්කඩක්**



165. **මධ්‍යය** :මධ්‍යය ඉදි කිරීම, වෙරළ අන්තයෙන් ආරම්භ වී මුහුද දෙසට විහිදෙයි. කි.ග්‍රෑ 1 සිට 250 දක්වා ගල් 4-5 ඔ ටිපර් වලින් මී. 0 සිට මී. -10 දක්වා මධ්‍යන මුහුදු මට්ටමට රැගෙන යනු ඇත. අත්තිවාරමේ පළල මී. 6 ක් වනු ඇති අතර උස මී. 15 ක් වේ. ආරම්භයේදී, මෙම මධ්‍යය, ඉදිකිරීම් අරමුණු සඳහා දිය කඩනයේ අක්වෙරල අන්තයට ළඟා වීමට ප්‍රවේශ මාර්ගයක් ලෙස ක්‍රියා කරයි. ඉන්පසු මධ්‍යයන් අක්වෙරල අන්තයේ සිට භූමි ප්‍රදේශය දෙසට 1:2 ක් බෑවුමක් සහිත හැඩයක් ගනී.

166. **ෆිල්ටර් ස්තරය:** අතිවිශාල රළුගල් ව්‍යුහය, ක්ෂරනය වීම, රළ සහ සැඩ පහරවල් වලින් ඇති කරවුනු කැළඹීම් හේතුකොටගෙන විශේෂයෙන් වැලි සහිත පතුල්වල අධික ගිලා බැසීම් නිසා සිදුවිය හැකි කැඩී බිඳී යාම් වලින් ආරක්ෂා විය යුතුය. දියකඩන ව්‍යුහය හරහා විශාල ජල ප්‍රමාණයන් ගමන් කරන අතරතුර එය රඳවාගැනීම සඳහා පෙරහනයක් හෝ ඇතුරුම් තට්ටුවක් අවශ්‍ය වේ.

167. **අක්පා ගොඩැල්ල ඉදිකිරීම**: අක්පා ගොඩැල්ල ඉදිකිරීම සඳහා අවශ්‍ය ගල්, ටිපර් ලොරි මගින් මධ්‍ය ස්ථරය මතින් රැගෙන යනු ලබයි. අක්පා ගොඩැල්ල සඳහා ගල්වල ප්‍රමාණය වනුයේ ස්ථරයන් දෙකක සහිත 1 සිට 5 Tදක්වා සන්නාහයන්ය. උස සහ පතුලේ පළල දුරවල් අනුව වෙනස්වනු ඇත.ඉමෙම ගල්, ප්‍රමාණවත් උද්දණ්ඩ දිගක් සහිත සුදුසු දොඹකරයක් මගින් මෙහෙයවනු ඇති අතර දියකඩනය දෙපසෙහිම අක්පා ගොඩැල්ල පෙදෙසෙහි ස්ථානගත කරනු ඇත.

168. **අභ්‍යන්තර ස්ථරය (ද්විතීය ස්ථරය)**: 0.3 සිට 0.6 දක්වා ප්‍රමාණවල ගල් සහිත ස්ථරයන් දෙකක් තිබෙනු ඇත. ද්විතීය ස්ථරය ඉදිකිරීම සඳහාTසන්නාහය භාවිතා කරනු ඇත. මෙම ස්ථරය, අතින් දැමීම හෝ අවම වශයෙන් 8/10Tධාරිතාවක් සහිත කැනියකින් තැබීම හෝ කරනු ඇත. සියලුම ස්ථානයන්හි ද්විතිය ස්ථරයේ ප්‍රමාණවත් ඝනකමක් අතුරන ලද්දේදැයි තහවුරු කරගැනීම සඳහා ද්විතීය ස්ථරයෙහි ඝනකම ශබ්ද දම්වැලක් මගින් පරීක්ෂා කරනු ඇත. කිසියම් හෝ ස්ථානයක, ශබ්දයන් ගැනීම මගින් දැනගත් පරිදි, අඩු ගල් ප්‍රමාණයක් තැන්පත් කර ඇත්නම්, එවිට එම ප්‍රදේශයේ ස්ථරයේ ප්‍රමාණවත් ඝනත්වය ළඟා කරගැනීම සඳහා පිරවීමක් සිදු කරනු ඇත.

169. **සන්නාහ ස්තරය (මූලික ස්ථරයන්)**: සන්නාහ ස්ථරය 1:2 බෑවුම මත ද්විතීය ස්තරය මතුපිට ස්ථාපනය කිරීම සඳහාය. ද්විතීය ස්ථරය ඉදිකිරීම සඳහා, 3 සිට 06 දක්වා වූTසන්නාහයන් ප්‍රමාණයේ ගල් තට්ටු දෙකක් යොදාගනු ඇත. දියකඩන ව්‍යුහයේ කෙළවර ළඟාවන තෙක් දිය කඩනය ඉදිකිරීම මී. 10 දිග ඡහිතව සිදු කරනු ඇත. කුනාටු සමයන්හිදී දියකඩනය සෑම විටම ආරක්ෂාකාරී බව මෙමගින් තහවුරු කරයි. ඉදිකිරීම් සිදුකිරීමේදී ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් මධ්‍ය සහ ද්විතීය ස්ථරයන්හි ආරක්ෂාව තහවුරු කළ යුතු වේ. සමස්ත ස්ථානීය උපකරණයක් භාවිතා කරමින් සෑම මී.50 ක ප්‍රාන්තරයක් සඳහා දියකඩනයේ එකෙලිකිරීම පරීක්ෂා කෙරෙනු ඇත. දියකඩනයෙහි මුදුනත ළඟාවීමෙන් පසු ශීර්ෂ කොටස පිහිටුවනු ඇත. අක්පා ගොඩැල්ල කොටස ශීර්ෂ කොටසෙහි තැන්පත් කිරීමට ටොන් 8 සිට 10 දක්වා ධාරිතාවක් සහිත දොඹකරයක් යොදවනු ඇත.,

170. **මස්තකය**: ජෙටියෙහි, නැගෙනහිර දිය කඩනයෙහි මී. 480 සිට මී. 498 දක්වා වෙනස්කම් සහ මුදුනත පළල මී. 8 ක් වනු ඇති බටහිර දියකඩන ජෙටියෙහි මී. 175.8 සිට මී. 193.8 දක්වා වෙනස්කම් හැර දිය කඩනයන් දෙකම ඔස්සේ ශීර්ෂයෙහි මීටර් හතරක පළලක් පවත්වාගනු ඇත

### ii කැණීම

171. මුහුදු පත්ලෙන් ඝන මීටර් 18,000 ද්‍රව්‍ය ප්‍රමාණයක් මඩ කැණීම් කිරීමට යෝජනා කර ඇත. භූ ශිල්පීය විමර්ශනයන්ට අනුව-1 to -2 m MSL ප්‍රමාණයක් වැලි වන අතර ඉතිරිය හුණු ගල්ය. මෙම ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා, කැණීම සහ පිපිරවීම වැනි භාවිතා කරන ක්‍රම දෙකක් ඇත.

172. **කැණීම් උපකරණ තෝරාගැනීම**: ප්‍රධාන සහ නඩත්තුකිරීමේ කැණීම් වැඩ ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ කාණ්ඩයේ කැණීම් උපකරණයන් ඇත. මීට පහත සඳහන් දෑ ඇතුලත් වේ.

- Trailing Suction Hopper Dredger (TSHD&)
- Cutter Suction Dredger (CSD&)
- Grab Dredger.
- Backhoe Dredger.
- Bucket Dredger.

173. ආරම්භක ප්‍රධාන කැනීම්වල කැණීම් ක්‍රියාත්මක කිරීම සඳහා විශාල කැණීම් ප්‍රමාණයක් සිදු කිරීම අවශ්‍ය වේ. මෙයින් ඇඟවෙනුයේ ධීවර වරායයන්හි කැණීම් ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගත හැකි එකම කැණීම් උපකරණ කාණ්ඩයන් දෙක වනුයේCSDසහGrab Dredgerපමණක් බවයි.

174. **Cutter Suction Dredger:** (CSD)කපන චූෂණ කැණියක්, ඝන පාංශු කැපීමට සහ බණ්ඩනය කිරීම සඳහා භ්‍රමනය වන කැපුම් හිසකින් සංයුක්ත වෙයි. පස කැණීම් පොම්ප ඔස්සේ උරාගෙන, පාවෙන නල මාර්ගයක් ඔස්සේ සහ වෙරළෙහි ඇති නලමාර්ග ඔස්සේ නික්ෂේප ප්‍රදේශයකට බැහැර කෙරේ.

175. **Grab Dredger**: හුණුගල් ස්තරය ඉවත් කිරීම සඳහා පිපිරවීම් ක්‍රියාවලියක් සිදුකිරීම අවශ්‍ය වේ. පිපිරවූ ද්‍රව්‍ය මුහුදු පත්ලෙන් ඉවත් කිරීම සඳහාGrabහෝ clamshell dredgersයොදාගනු ඇත.

176. **පිපිරවීම**: හුණුගල් ඉවත්කිරීම සිදු කරනු ඇත්තේ පමාකිරීමේ ස්පෝටකයක් සහ රසායනික පිපිරවීම් යොදාගනිමිනි. රසායනික පිපිරවීම හා සංසන්දනාත්මකව, ස්පෝටක පිපිරවීම මගින් වැඩි දෙදරීමක් උත්පාදනය කරනු ඇත. රසායනික පිපිරවීම ස්පෝටක පිපිරවීමට වඩා වැඩි වියදම්කාරී වනු ඇත. වඩා ඇත ප්‍රදේශයන් සියල්ලෙහි ඩයිනමයිට් පිපිරවීම් සිදුකිරීම අපේක්ෂා කරන අතර ඇතිවිය හැකි ශබ්ද සහ දෙදරීම් බලපෑම් අඩුකිරීම සඳහා මෙතෝදිස්ත ගැහැණු පාසලට සෘජුවම තදාසන්න ප්‍රදේශයන්හි රසායනික පිපිරවීම් භාවිතා කරනු ඇත. ශිල්ප ක්‍රම දෙකම භාවිතා කරනු ඇත.

**iiiඉඩම් ගොඩ කිරීම**

177. යෝජිත අඩවියේ වෙරළ ප්‍රදේශය පවතින බිම් මට්ටමෙන් මී. 2 ක් පමණ පහතින් තිබෙන අතර ඒවා ගොඩකළ යුතුව ඇත. හෙක්ටෙයාර 16 ක පමණ ප්‍රදේශයක් සුදුසු ද්‍රව්‍යයන්ගෙන් ගොඩකළ යුතුව ඇතැයි ඇස්තමේන්තු කර ඇත. අඩවියේ කණින ලද සියලුම ද්‍රව්‍ය, යලි පිරවීම් සඳහා භාවිතා කෙරෙනු ඇත. අවශ්‍ය වන්නේ නම් අතිරේක ද්‍රව්‍යයන්, බලපත්‍රලාභී ගල් කොරිවලින් සහ අඩවිවලින් ලබාගනු ඇත.,

**ivජැටි ඉදිකිරීම**

178. මෙම කාණ්ඩයේ ව්‍යුහයන් සඳහා, පිහිටි ගල මතුපිට රැඳුණු තනි සහායක කුළුණු ඉදිකිරීමට යෝජිතය (2.5m) . කුළුණු මගින් කුළුණු වැස්ම සහ තට්ටුවේ උපරිව්‍යුහය සඳහා ආධාරකයක් සැපයේ.

**vධීවර වරාය වේදිකාව ඉදිකිරීම**

179. ධීවර වරාය වේදිකාවයනු බෝට්ටු රැඳවිය හැකි පස් රැඳවෙන ව්‍යුහයන්ය. ඒවා බැඳුම් කණු සහ වැලකුම් කණුවලින් සංයුක්ත වේ.

**viවෙරළ ගොඩනැගිල්ල ඉදිකිරීම**

180. **භූමිය සැකසීම සහ භූමිය පිරිසිදු කිරීම**ඊ වඩා විශාල ව්‍යුහයන් ප්‍රමාණයක් ඉදිකරනු ඇත්තේ යලි පිරවූ ප්‍රදේශයේ බැවින් විශාල ලෙස පිරිසිදුකිරීමක් සිදුනොවේ. බිම් පිරවීමට පෙර භූමිය පිරිසිදුකිරීම සිදු කරනු ඇත. සාමාන්‍යයෙන්, මෙම කාර්යයේදී බැකෝ වැනි විශාල යන්ත්‍රෝපකරණ භාවිතා වේ.

181. **අත්තිවාරම ඉදිකිරීම**ඊ අත්තිවාරම ඉදිකිරීමේදී පස් සෑරීම සහ රළු ගල් හා සම්බන්ධ වැඩ සිදුවනු ඇත. සෑරීම් කටයුතු අතින් සහ බැකෝ භාවිතයෙන් සිදුකරනු ඇත.

182. **උපරි ව්‍යුහය ඉදිකිරීම**ඊ උපරි ව්‍යුහය ඉදිකිරීමේදී කොන්ක්‍රීට් වැඩ සහ මේසන් වැඩ සමග බිත්ති ඉදිකිරීම සිදු වේ. කොන්ක්‍රීට් පතුල ඉදිකිරීම, මේසන් වැඩ, ලී වැඩ (දොර සහ ජනේල සවිකිරීම), විදුලි රැහැන් ඇදීම සහ මෙවලම් ස්ථාපනය, ජල සැපයුම, නාන කාමර මෙවලම් ආදිය සවිකිරීමද අතින් සිදුකෙරේ.

183. **වහල ව්‍යුහය ඉදිකිරීම**: වහල ව්‍යුහයන් සඳහා, අනුමත කළ දැව යොදාගනු ඇති අතර වහලයට හෝ ධීවර වරාය අඩවියේ ඇස්බැස්ටෝස් භාවිතා නොකරනු ඇත.

## 3.9 ඉදිකිරීම් ද්‍රව්‍ය මූලාශ්‍රයන් සහ ප්‍රවාහනය, වාහන ගමනාගමන කළමනාකරණ සැලැස්ම

184. ඇස්තමේන්තුගත සන්නාහ අවශ්‍යතාවය327,500 $m^3$. කි. ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා අවශ්‍ය වන එපමණ විශාල සන්නාහ/ගල් ප්‍රමාණයක් සඳහා මූලාශ්‍රයන් විය හැකි විශාල පරිමානයේ ගල් ආකරයන් යාපනය දිස්ත්‍රික්කයේ නොමැත. එහෙයින්,

ද්‍රව්‍ය සඳහා මුල ද්‍රව්‍යයන් ලබාගනු ඇත්තේ ව්‍යාපෘති අඩවියෙන් සැලකියයුතු දුරක සිටය. DDT මගින් සිදු කරන ලද ද්‍රව්‍ය සමීක්ෂණයකින් මුලතිවු සහ අනුරාධපුර දිස්ත්‍රික්ක වල තිබිය හැකි මුලාශ්‍රයන් තුනක් හඳුනාගෙන ඇත. ප්‍රවාහන මංපෙත් වල විස්තර පහත දක්වා ඇත. තෝරාගත් ගල් වලවල් වල සිට ව්‍යාපෘති අඩවිය දක්වා ප්‍රවාහන මාර්ග, **3.14 රූප සටහනෙහි** දක්වා ඇත.

**රූපසටහන 3-14 ව්‍යාපෘති අඩවියට පාෂාණ ප්‍රවාහනය කිරීමේ මාර්ග**




Common Road (A9)

From Mega Naguma Quarry
From Srisena Quarry
From BPPE Quarry

P. G. K. D. Sirisena ගල්වල පිහිටා ඇත්තේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ නොච්චියාගම, කුරුළුපාතගල ය. ගල්වලෙහි සිට ව්‍යාපෘති අඩවියට දුර කි.මී. 225 ක් පමණය.

ප්‍රවාහන මංපෙත: අඩවිය ⟶ නොච්චියාගම ⟶ අනුරාධපුර ⟶ රඹව ස්පඉැජ්⟶ මහනුවර / යාපනය (9) පාර.

**රූපසටහන 3-15 මංපෙත සිරිසේන ගල්වලේ සිට ආරම්භ වී රම්බාව මහනුවර - යාපනය මාර්ග මංපෙත' 9 (ලා කොළ පැහැති) දක්වා විහිදෙයි.**



ii. මග නැගුම ගල්වල මා. සං. අ. විසින් ක්‍රියාත්මක කරන අතර, අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගනේවල්පොල කැකිරාව මාර්ගයෙහි පිහිටා ඇත. ගල්වලෙහි සිට ව්‍යාපෘති අඩවියට දුර කිමී. 225 ක් පමණය.

ප්‍රවාහන මාර්ගය: අඩවිය → ගනේවල්පොල හන්දිය → හබරණ, මාදන්කඩවල පාර → මහනුවර /යාපනය මහා මාර්ගය(A 9)

**රූපසටහන 3-16 මාර්ගය, මගනැගුම ගල්වල අඩවියෙන් ආරම්භ වී ්: 9– මාර්ගයේ රම්බෑව හන්දිය දක්වා විහිදෙයි.**




iii. Business Promoters and Partners Engineering (BPPE)ගල්වල, මුලතිවු දිස්ත්‍රික්කයේ ඔඩ්ඩුසුඩාන් හි KATE Quarryහි 14 වැනි සැතපුම් කණුව හි පිහිටා ඇත.
ගල්වල සිට ව්‍යාපෘති අඩවිය දක්වා දුර කි.මී.135 ක් පමණ වේ.
මාර්ගය: අඩවිය → ඔඩ්ඩුසුඩාන්, මාන්කුලම් මාර්ගය → මහනුවර - යාපනය මහා මාර්ගය(A 9)

**රූපසටහන 3-17 මාවත BPPE ගල්වලෙන් ආරම්භ වී ්: 9– මාර්ගයේ මාන්කුලම් හන්දිය දක්වා**



vi. මහනුවර - යාපනය මහා මාර්ගයේ සිට පේදුරුතුඩුවේ ව්‍යාප"ති අඩවිය දක්වා විකල්ප මාර්ග තුනක් ඇත&

අ& මහනුවර - යාපනය අධිවේගී මාර්ගය(A 9)→සොරාන් පත්තු -තලයඩි පාර (B402)→ පේදුරු තුඩුව - මරුතන්කර්නි පාර → නැගෙනහිර වෙරළ පාර → ව්‍යාපෘති අඩවිය

ආ& මහනුවර - යාපනය අධිවේගී මාර්ගය(A 9)→ පුලෝලි - කොඩිකාමම් - කච්චායි →යාපනය පේදුරු තුඩුව පාර → ව්‍යාපෘති අඩවිය.

ඇ. මහනුවර - යාපනය අධිවේගී මාර්ගය(A 9)→ පුලෝලි වාවාකච්චේරි පාර (B75)→ පේදුරු තුඩුව යාපනය පාර → ව්‍යාපෘති අඩවිය

**රූපසටහන 3-18(A 9– මාර්ගයේ සිට විකල්පයන්**




185. ඉදිකිරීම් කටයුතු සඳහා පාෂාණ/සන්නාහ/ගල්327,500 $m^3$පමණ අවශ්‍ය වේයැයි ඇස්තමේන්තු කර ඇත. මේ සඳහා ගල්වලවල් සහ ව්‍යාපෘති අඩවිය අතර වාහන ගමනාගමන සංචලනයන් විශාල සංඛ්‍යාවක් අවශ්‍ය වේ. ප්‍රවාහන මාර්ගයන් නගර සහ නාගරික මධ්‍යස්ථාන කිහිපයක් පසුකර යයි. මෙම ස්ථානයන් පසුකරන විට සැලකියයුතු වාහන ගමනාගමන තදබදයක් තිබිය හැකිය.

186. ගල්වලවල් තෝරාගැනීමේ තීරණය, ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු ට භාරය. ඉතාමත් සුදුසු මාවත සහ ගමනාගමන කාල වේලාවන් තීරණය කිරීම සඳහා ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර කොන්ත්‍රාත්කරු විසින් ප්‍රවාහන බලපෑම් තක්සේරුවක් සිදුකළ යුතුය.

187. **තොග පවත්වාගැනීම**: පාෂාණමය සන්නාහයන් දුර පෙදෙස්වල සිට ප්‍රවාහනය කෙරේ. සන්නාහයන්ගේ හිඟකම ඉදිකිරීම් කටයුතුවල සුමට ප්‍රගතියට බාධා කළහැකි හෙයින් ඉදිකිරීම් අවධියේදී සන්නාහයන්ගේ අඛණ්ඩ සැපයුමක් තහවුරු කෙරේ. එහෙයින්, තාවකාලික තොග පවත්වාගැනීමේ ප්‍රදේශයක් නිර්දේශ කෙරේ. පාෂාණ සන්නාහයන් ව්‍යාපෘති අඩවියේ ගල්පර ප්‍රදේශයේ ගබඩා කරනු ඇත.

## 3.10 අවශ්‍ය/ සැපයෙන යටිතල ව්‍යුහ පහසුකම්

### i. ව්‍යාපෘතිය මගින් සැපයෙන යටිතල පහසුකම් පිලිබඳ විස්තර.

188. **පිරවීමේ ද්‍රව්‍ය**: වෙනරළ පහසුකම් සඳහා 99.000 ක පිරවීමේ ද්‍රව්‍ය අවශ්‍ය වනු ඇත යැයි ඇස්තමේන්තු කර ඇත. යාපනය දිස්ත්‍රික්කයේ යෝග්‍ය ගල් වළවලවල් නොමැති හෙයින් පිටතින් මෙම පිරවීමේ ද්‍රව්‍ය ලබා ගනු ඇත.

189. **3-4 වගුවෙහි** දක්වා ඇති පරිදි ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා දිනකට ගමන් වාර 945 ක් අවශ්‍ය වනු ඇත යැයි ගණන් බලා ඇත. එනිසා ගල් කොරි පරිශ්‍රවල වැඩකටයුතු ආරම්භ කිරීම පෙර විස්තරාත්මක ප්‍රවාහන බලපෑම් ඇගයීමක් ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් සම්පාදනය කළ යුතුය.

3-4 වගුව

| ද්‍රව්‍ය | ගල් සන්නාහය | පිරවීමේ ද්‍රව්‍ය |
|---|---|---|
| අවශ්‍ය ප්‍රමාණය | 327,500 $m^3$ | 99,000$m^3$ |
| මුළු බර **(a)** | 629,375 t | 262,350t |
| ඩම්ප් ලොරි ධාරිතාවය | 10 t | 10 t |
| පැටවුම් ප්‍රමාණය | 62,937.5 | 26,235 |
| ඉදිකිරීම් වකවානුව | 3 years | 1 year |
| දිනකට ප්‍රවාහන වාර ගණන **(b)** | 840 | 105 |

iii. ප්‍රවේශවීම්/ගාල් කිරීම් පහසුකම් පිලිබඳ විස්තර

190. අඩවිය වෙත යහපත් මාර්ග ජාල පද්ධතියක් ඇත. පහත සඳහන් මාර්ගයන් ව්‍යාපෘති අඩවිය සහ යාපනය දිස්ත්‍රික්කයෙන් පිටත ප්‍රදේශය එකිනෙකට සම්බන්ධ කරයි.

i. AB20 - යාපනය - පේදුරු තුඩුව මාර්ගය

ii. AB21 - යාපනය - පොන්නාලෙයි - පේදුරුතුඩුව මාර්ගය

iii. B370 - පේදුරු තුඩුව - නැගෙනහිර වෙරළ මාර්ගය

iv. B371 - පේදුරුතුඩුව - මරුතන්කර්නි මාර්ගය

191. ඊට අතිරේකව, අභ්‍යන්තර මාර්ග, වාහන ගමනාගමනය කළහැකි තත්වයේ පවතින යහපත් තාර පාරවල්ය. එහෙයින්, අතිරේක ප්‍රවේශ මාර්ගයක් අවශ්‍ය නොවේ.

192. **ගාල් කිරීම**: සැලසුමෙහි, ධීවර වරාය තුල ප්‍රමාණවත් ගාල් කිරීමේ පහසුකම් සපයා ඇත. යෝජිත ධීවර වරාය සඳහා ගාල් කිරීමේ ප්‍රදේශයන් දෙකක් සපයා ඇත. එකක් පොදු මහජනතාවගේ භාවිතය සඳහා වන අතර අනෙක විශේෂයෙන් වෙන්දේසි ශාලාව සඳහාය. පොදු ගාල් කිරීමේ පෙදෙසෙහි වාහන 30 ක් ගාල් කිරීම සඳහා 3,750 $m^2$ ක සමස්ත භූමි ප්‍රදේශයක් ඇති අතර වෙන්දේසි ශාලාවේ ගාල් කිරීම් පෙදෙස බයිසිකල් 90 ක්, යතුරු පැදි 50 ක්, ට්‍රැක්ටර් 51 ක්, ලොරි 6 ක්, සහ අනෙකුත් වාහන 21 ක් සඳහා ඉඩ සැලසෙන සැලසුම් කර ඇත.

193. **වෙරළ වෙත ප්‍රවේශය:** ව්‍යාපෘතිය හේතුකොටගෙන නැගෙනහිර පැත්තෙහි මී. 300 ක පමණ වෙරළ ප්‍රදේශය අහිමි වනු ඇත. නමුත්, මෙම ප්‍රදේශයෙන් ඔබ්බට, වෙරළෙහි කොඩ්ඩාඩි ගොඩබෑසීමේ අඩවියට විවෘත ප්‍රවේශ මාර්ගයක් ඇත. එහෙයින්, ව්‍යාපෘතිය යටතේ නව වෙරළ ප්‍රවේශ මාර්ගයක් සකස් නොකරනු ඇත.

**iv. සංනිවේදනය**

194. ප්‍රදේශය තුල ප්‍රමාණවත් සංනිවේදන පහසුකම් පවතී. ප්‍රදේශයේ ප්‍රජාවට පුද්ගලික අංශයේ ජංගම දුරකථන සහ සාමාන්‍ය දුර කථන මාර්ග ඇත. ජංගම දුර කථන සමග අවශ්‍ය අභ්‍යන්තර සංනිවේදන ක්‍රමයන් සපයනු ඇත.

**v. ව්‍යාපෘතිය මගින් ප්‍රජාවට සැපයෙන යටිතල පහසුකම් සහ ප්‍රාදේශික ප්‍රජාවට ලැබෙන අනෙකුත් ප්‍රතිලාභයන්.**

195. සාමාන්‍යයෙන්, ප්‍රදේශයේ ප්‍රජාවට ප්‍රමාණවත් යටිතල පහසුකම් පවතී. මාර්ග සංවර්ධන අධිකාරිය (සෘෘ) දැනටමත් පවතින පොන්නාලෙයි-පේදුරු තුඩුව මාර්ගය වැඩි දියුණු කිරීමට සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය යටතේ යාපනය දිස්ත්‍රික්කයෙහි නැංගුරම් පොළවල් හයක් සහ ගොඩබෑමේ අඩවි හතක් වැඩි දියුණු කරනු ඇත.

## 3.11 වෘත්තීය සෞඛ්‍යය සහ ආරක්ෂාව

196. විශාල ධීවර වරායක් ඉදිකිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන සෞඛ්‍ය සහ ආරක්ෂක ගැටළු, අනෙකුත් මහා පරිමානයේ ව්‍යාපෘතීන් වලදී ඇතිවන ගැටළු වලට සමානය. මීට, ඉදිකිරීමේ ද්‍රව්‍ය වල තිබිය හැකි දූවිලි සහ අනෙකුත් ගොඩනැගිලි

සංඝටකයන්ගේ අන්තරායකාරී ද්‍රව්‍ය වලට විවෘත වීම සහ  බර උපකරණ යොදාගැනීම හෝ පුපුරන ද්‍රව්‍ය භාවිතය හා සම්බන්ධ භෞතික අනතුරු ද ඇතුලත් වේ.

197. ඉදිකිරීම් කාලයේදී පහත සඳහන් ඉදිකිරීම් ආරක්ෂණ අවශ්‍යතාවයන් ක්‍රියාත්මක කරනු ඇත:

- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ(ILO)අංක 62 දරණ ගිවිසුමේ අවශ්‍යතාවයන් සහ  ශ්‍රී ලංකාවෙහි කර්මාන්තශාලා ආඥා පනතෙහි අංක 167  සහ ආරක්ෂක සහ සෞඛ්‍ය රෙගුලාසි වලට අනුකූලව කම්කරුවන්ගේ ආරක්ෂාව සඳහා මෙම ඉදිකිරීම් වලට අදාළ වන ප්‍රමාණයට ඒවා හා අනුකූල වීමරි
- සේවකයන්ට සහ කාර්ය මණ්ඩලයට ආරක්ෂක ඇස් මුවාවන්, හෙල්මට්, මුහුණු ආවරණ, සපත්තු වැනි සියලුම අවශ්‍ය ආරක්ෂක උපකරණයන් සැපයීමරි
- සෞඛ්‍යය සහ ආරක්ෂාව හා ලිංගාශ්‍රිත රෝග පිළිබඳව අඛණ්ඩ පුහුණුවක් සහ දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම.
- සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පනවන ලද ඩෙංගු පාලන වැඩ සටහන් කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීමරි
- වැඩ අඩවිවල සහ ශ්‍රමික කඳවුරුවල මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීමරි
- අගල්, භාවිතා කළ සහ හිස් ටින්, බඳුන්, ටයර්, තාවකාලිකව සාරන ලද වලවල් ද ඇතුළු සියලුම ප්‍රදේශයන්හි ජලය එක් රැස්වීම වැලැක්වීමරි
- මදුරුවන් සහ පිලවුන් විනාශකිරීම සඳහා නිරතුරුව අනුමත රසායනිකයන් යෙදීමරි
- මීයන් වැනි පලිබෝධකයන් සහ මැස්සන් වැනි අනෙකුත් රෝග වාහකයන් බෝවීම වැළැක්වීම සඳහා සියලුම වැඩ අඩවි, ශ්‍රම කඳවුරු, කාර්යාල සහ ගබඩා ගොඩනැගිලි පිරිසිදුව සහ කුණු කසල වලින් තොරව පවත්වා ගැනීමරි
- ශ්‍රම කඳවුරක කිසියම් හෝ සැලකියයුතු බෝවෙන රෝගයක් පැතිරී යාම ඉංජිනේරුවරයා වෙත සහ ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි (MOH)හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂක  (PHI)වෙත ක්ෂණිකව වාර්තා කිරීම. අධිකාරීන් විසින් නිකුත් කරන ලද කිසියම් හෝ උපදෙසක් වේ නම්, ඒ සියල්ල කොන්ත්‍රාත්කරු විසින් ක්‍රියාත්මක කරනු ඇතරි
- රෙගුලාසි වලට අනුකූලව වැඩ බිමෙහි ප්‍රථමාධාර මෙවලම් මල්ලක් සැපයීම.
- සෞඛ්‍ය  සහ ආරක්ෂක රෙගුලාසිවලට අනුකූලව සෑම වැඩ පොලක සහ ශ්‍රම කඳවුරක ස්නානය කිරීමේ පහසුකම්, වැසිකිලි සහ මුත්‍රා කුටි ප්‍රමාණවත් සංඛ්‍යාවක් සැපයීම.
- අඩවියෙහි හදිසි ගිනි-නිවීමේ උපකරණ පවතින බව තහවුරු කරගැනීම.
- ඉන්ධන තොග පවත්වාගැනීමේ සැලැස්මක් සහ ඉන්ධන උතුරා යාමකදී ප්‍රතිචාර දැක්වීමේ සැලැස්මක් සකස් කිරීම.

## 3.12 මෙහෙයුම සහ නඩත්තුව

**ජලය සහ මූලාශ්‍රයන්ගේ අවශ්‍යතාවය**

198. ඉදිකිරීමේ සහ මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය ජලය, ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය (NWS&DB)මගින් සපයනු ඇත. ඇස්තමේන්තුගත ජල අවශ්‍යතාවය ඉදිකිරීම් කාලය සඳහා දිනකට10 $m^3$සහ ක්‍රියාත්මක කිරීමේ කාලයේදී එය දිනකට102 $m^3$ක් පමණය.

**මළාපවහන සහ අප ජලය බැහැර කිරීමේදී යොදාගැනීමට යෝජිත ක්‍රම**

199. 3.6. 2, කොටසෙහි විස්තර කර ඇති පරිදි ධීවර වරාය ක්‍රියාත්මක වීමෙන් පැණ නගින සියලුම අප ජලය, අප ජල පිරියම් කාරක යන්ත්‍රයකට බැහැර කොට පිරියම් කල අප ජලය මුහුදට බැහැර කරනු ඇත.

**යොදාගැනීමට යෝජිත කසල තෙල් ප්‍රතිග්‍රාහක පහසුකම්**

200. ධීවර වරාය අඩවිය තුල කසල තෙල් එක්රැස් කිරීම සඳහා මධ්‍යගත කසල තෙල් එක්රැස් කිරීමේ ක්‍රමයක් සපයා ඇත. පොදුවේ, අනෙකුත් ධීවර වරායයන්හි දක්නට ලැබෙන පරිදි, ඒවා කාර්මික උදුන්, දැව පිරියම් කිරීම් (සාමාන්‍ය පුරුදු), ඉන්ධන තෙල් ලබාගැනීම සඳහා භාවිතා කිරීමට බෝට්ටු හිමිකරුවන් කසල තෙල් එක්රැස්කොට විකුණති.

**නඩත්තු කැනීම් වලට අදාළ විස්තර.**

201. වැලි චලනය පිළිබඳ අධ්‍යයනයට අනුව, වැලි රාශිභූතවීම අවම වනු ඇති අතර ධීවර වරාය ද්‍රෝණිය තුල කිසිදු එවන් දෙයක් සිදු නොවනු ඇතැයි අපේක්ෂා කෙරේ. (PPDහි අවසාදිත ප්‍රවාහන අධ්‍යයනය , ඇඑබ 2018). ආන්තික එක් රැස්වීම අපේක්ෂා කෙරෙනුයේ ව්‍යාපෘති ප්‍රදේශයේ නැගෙනහිර පෙදෙසෙහිය. (එය වසරකට ඝන මී 1330 ලෙස ඇස්තමේන්තු කර ඇත). වරායෙන් බටහිර ප්‍රවාහන ධාරිතාවය වන්නේ බටහිර දෙසට වසරකට ඝන මී.75 ක් පමණක් බව එම අධ්‍යයනයම අනාවැකි පල කරයි. නැගෙනහිර සිට චලනය වන වැලි ධීවර වරාය ව්‍යුහයන් හරහා ගමන් කිරීම ධීවර වරාය ව්‍යුහයන් මගින් වැලැක්වුවද, බටහිර දිසාවේ ප්‍රවාහන ධාරිතාවය ඉතා කුඩා හෙයින් බටහිර දෙස වෙරළඛාදනය අවම වනු (හෝ සිදු නොවනු) ඇත. නඩත්තු කැනීම් කිසිවක් අපේක්ෂා නොකෙරේ. කෙසේ වුවද, නැගෙනහිර දෙස අඛණ්ඩව එක්රැස්වන වැලි වසර පහකට වරක් සාරා/කැනීම් කොට සංවර්ධන කටයුතු වලින් බටහිර පැත්තෙහි තැන්පත් කල හැකිය. .

## 3.13 සෞන්දර්යාත්මක සහ දෘෂ්ඨීමය පරිසරය

202. දැනට, යෝජිත භූමි ප්‍රදේශය විවෘත මුහුද වන අතර මුහුද දර්ශනයට බාධාවක් නොමැත. ගොඩනැගිලි ඉදිකළවිට පයින් ගමන් කරන්නන්ට සහ සංචාරකයන්ට මුහුදෙහි දර්ශනයට බාධා ඇතිවනු ඇත. කෙසේ වුවද, තට්ටු කිහිපයක් සහිත ගොඩනැගිලි වැනි, වඩා ඉහල උන්නතාංශයන්හිදී, විශේෂයෙන් මෙතෝදිස්ත බාලිකා උසස් පාසලෙහි සිට දර්ශනය කරන්නන්හට, විශාල බාධාවන් නොමැත. සියලුම ගොඩනැගිලි මුහුදෙහි දර්ශනයට බාධාවීම අවම වන ආකාරයට ස්ථානගත කොට සහ නිර්මාණය කොට ඇත.

## 3.14 අනාගත පුලුල්කිරීම

203. අවශ්‍ය වන්නේ නම්, වරායේ අනාගත වැඩි දියුණුකිරීම් සිදු කිරීමට ව්‍යාපෘතියේ සැලැස්ම අවකාශ සලසා ඇත. ධීවර වරාය මෙහෙයුම් ඇරඹුණු විට, අයිස් කම්හල් සහ විනෝද කටයුතු වැනි ක්‍රියාකාරකම් පුද්ගලික අංශයේ ආයෝජකයන් මගින් ආරම්භ කිරීමට සලකා බැලීම් සඳහා විවෘත වේ.

## 3.15 විකල්පයන් ඇගයීම

204. ධීවර වරාය පහසුකම් සංවර්ධනය සඳහා උතුරු පළාතෙහි වැඩි දියුණු කළහැකි අඩවි කිහිපයක්MFARDREAවිසින් හඳුනාගන්නා ලදී. කෙසේ වුවද, ශක්‍යතා අධ්‍යයනයන් මගින් නිගමනය කරනු ලැබුයේ මුලතිවු දිස්ත්‍රික්කයේ චලායි සහ මුලතිවු ස්ථාන ගතව ඇත්තේ ඍජු, වැලි සහිත වෙරළ තීරයන්හි බවත් ප්‍රධාන කලපුමය පරිසර පද්ධතීන් හි මුහුදු පිටවානයන්ට ආසන්නව බවත්ය. එහෙයින්, මෙම අඩවිවල අවසාදිත බැරවීම් හි සැලකියයුතු වාරික විචල්‍යතාවයන් පවතින අතර, කිසියම් හෝ සංවර්ධන කාර්යයක්, හාත්පස ප්‍රදේශයේ අවසාදනය සහ වෙරළඛාදනය පිළිබඳ සැලකිය යුතු ගැටළු වලට තුඩු දිය හැකිය. ඊට අතිරේකව, පේදුරු තුඩුව ප්‍රදේශය හා සංසන්දනාත්මකව, වර්තමාන තත්වය යටතේ මෙම ස්ථානයන්හි එවැනි සංවර්ධන කටයුතු සඳහා ඉල්ලුම ඉතා අඩුය. මන්නාරම්දිස්ත්‍රික්කයේ, පේසාලේ සහ සිලාවතුරෙයි නොගැඹුරු ප්‍රදේශයන්හි ස්ථානගතව ඇති අතර මෙම ස්ථානයන්හි කරන ඕනෑම සංවර්ධන කාර්යයක් දළ වශයෙන් 3.0m MSLක ගැඹුරකට සීමාවනු ඇති හෙයින් එයින්IMULබෝට්ටු සහ ගැඹුරු-මුහුදු ධීවර යාත්‍රා වැනි වඩා විශාල ධීවර යාත්‍රාවන් ක්‍රියාත්මක කරවීමට සීමාවන් පැනවෙනු ඇත. යාපනය දිස්ත්‍රික්කයේ ගුරුනගර් ද කලපු පරිසරයක ස්ථානගතව ඇති අතර එහිද, ශක්‍යතා අධ්‍යයනයෙන් -2.5m MSLක ගැඹුරක් දක්වමින් ගැඹුරෙහි සීමාවක් පෙන්වයි. මෙම තත්වයන් හේතුකොටගෙන, උතුරු පළාතේ ගැඹුරු ධීවර වරාය පහසුකමක් සංවර්ධනය සඳහා වඩාත්ම සුදුසු ප්‍රදේශය යාපනය අර්ධද්වීපයේ උතුරු වෙරළ තීරය යයි සැලකිණි. ඉහත කරුණු මත පදනම්ව, පේදුරු තුඩුව, උතුරු පළාතේ ගැඹුරු ධීවර වරායක් සංවර්ධනය කිරීම සඳහා ඉතාමත් සුදුසු ස්ථානය ලෙස හඳුනාගනු ලැබිණි.[1]

205. ඒ අනුව, යාපනය කලාපයේ ප්‍රධාන තොටුපොල පහසුකමක් සඳහා ඉතාමත් සුදුසු අඩවියPPFHDP අඩවිය සංවර්ධනය කිරීම බවට එකඟත්වයකට පත්වීය.

**රූපසටහන 3-19 උතුරු පළාතේ ධීවර වරායයන් සංවර්ධනය සඳහා ශක්‍යතා අධ්‍යයනයේදී තක්සේරුවට ලක්කරන ලද විභව අඩවි**




(Source: Admiralty Charts, United Kingdom Hydrographic Office)

**තාක්ෂණික විකල්පයන්:**

206. තාක්ෂණිකවිකල්පයන් සකස් කිරීමේදී, ක්‍රියාකාරිත්ව පැතිකඩ, වෙරළ ආසන්නව ගල්පර පැවතීම සහ ජලතරණ පැතිකඩයන් සැලකිල්ලට ගන්නා ලදී. මේ සම්බන්ධයෙන් ශිල්පීය විකල්පයන් 3 ක් සැලකිල්ලට ගන්නා ලදී.

207. **විකල්පය 1**: පිරි සැලසුම, ප්‍රක්ෂේපණය කල බෝට්ටු කාණ්ඩයට ඉඩ සැලසීම සඳහා ප්‍රමාණවත්ය යන අවශ්‍යතාවය සම්පූර්ණ කරයි. ඊට අමතරව, එය ඊශාන(NE)දෙසින් එන රළ පහරට ආවරණ සපයයි. කෙසේ වුවද, ධීවර වරාය පිවිසුම ස්ථානගතව ඇත්තේ නොගැඹුරු ගල්පර ප්‍රදේශයක බටහිර දෙසට නැඹුරුවය. ඊශාන දිග රළ පහර පවතිද්දී, බටහිර දිශාභිමුඛව ළඟාවන ධීවර බෝට්ටු දුෂ්කරතාවයට පත්විය හැකිය. ඊට අමතරව, නොගැඹුරු ගල්පර ප්‍රදේශයක් පැවතීම කුණාටු සහිත තත්වයන්හිදී යාත්‍රා කිරීමේ අවදානමක් ඇති කරවයි.




208. **විකල්පය 2**: 2 වැනි විකල්පය සකස් කරන ලද්දේ 1 වැනි විකල්පයට වැඩි දියුණුවක් ලෙසය. 1 වැනි විකල්පයේ බොහෝ ලාක්ෂනිකයන් රදවා ගන්නා ලද අතර ධීවර වරාය පිවිසුම නොගැඹුරු ගල්පර ප්‍රදේශයෙන් ඉවතට ගෙනගොස් තවදුරටත් එය උතුරු දිශාභිමුඛව යොමු කරන ලදී,. මෙය 1 වැනි විකල්පයේ හඳුනාගන්නාලද දුර්වලතාවයන් නිවැරදි කරන ලද අතර මෙම විකල්පයෙන් අභ්‍යන්තර නාවික සංචලනයන් ප්‍රශස්තකරණය කරනු නොලැබිණි. IMULබෝට්ටු බටහිර ද්‍රෝණියෙහි සංකේන්ද්‍රනය කරන අතර වඩා විශාල IMUL බෝට්ටු නැගෙනහිර දොණියෙහි සංකේන්ද්‍රණය කිරීමට නියමිතය. වඩා විශාල IMULබෝට්ටු වලට නැංගුරම් ලෑම සඳහා නැගෙනහිර බොක්කට ළඟා වීමට බටහිර බොක්ක ප්‍රදේශය ඔස්සේ යාමට සිදුවේ. මෙය විශාල IMULවලට එතරම් පහසු වැඩ පිළිවෙලක් නොවන අතරIMULවල සංචලනයට, වඩා විශාල IMULවල සංචලනය මගින් බාධාවන් ඇති කරවයි. එහෙයින් තෙවැනි විකල්පයක් සලක බලන ලදී.




.




209.	**3 වැනි විකල්පය** ගොඩ නංවන ලද්දේ ධීවර වරාය පිවිසුම, උතුරු දිශාභිමුඛව යොමුකොට ධීවර වරාය පිය සටහනෙහි මැද ස්ථානගත කිරීමෙනි. මෙමගින් වඩා විශාල IMUL, IMULදොණි ප්‍රදේශය හරහා ගමන්කිරීම වැලැක්වෙනු ඇති අතර, ධීවර වරාය තුල වඩා විශාල ඔරු/ඔරු ඔබ  වල සංචලනය ප්‍රශස්ත තත්වයට පත්වනු ඇත.

**3 වැනි විකල්පය** විකල්පයන් 3 අතරින් ඉතාමත් සුදුසු විකල්පය ලෙස තෝරාගනු ලැබිනි.

# සිව්වන පරිච්ඡේදය

## 4. පරිසරයේ විස්තරය - මූලික රේඛා දත්ත

### 4.1 දළ විශ්ලේෂණය

210. උතුරු පළාතේ විශේෂයෙන් යාපනය දිස්ත්‍රික්කය සහ පේදුරු තුඩුව ධීවර වරාය සංවර්ධන පරිශ්‍රයේ භෞතික, ජීව විද්‍යාත්මක සහ සමාජාර්තික පරිසරයේ මූලික රේඛා තත්වයන් පහත විස්තරකර ඇත. ලබා දී ඇති තොරතුරු පදනම් වී ඇත්තේ ක්ෂේත්‍ර චාරිකා වාර්තා සහ ඇගයීම සමයෙහි ලැබුනු හා ලබා ගත් තොරතුරු මතය. උතුරු පළාතේ තිරසාර ධීවර සංවර්ධන ව්‍යාපෘතියේ (ආසියා සංවර්ධන බැංකුව2017) අවසාන ව්‍යාපෘති සුදානමේ තාක්ෂණික සහයෙහි (PPTA) සහ ප්‍රාරම්භක පරිසර බලපෑම් වාර්තාවේ විස්තරාත්මක තොරතුරුද මෙම වාර්තාව සඳහා උපයෝගී කර ඇති අතර මෙම වාර්තාව වැඩිදුර පසුබිම් තොරතුරු සඳහා යොමු කර ඇත.

211. භූ ගත ජලමූලාශ්‍ර සහ ළිංවලින් වාරි ජලය ලබා ගන්නා 'යාපන අර්ධද්වීපය' සහ වසර පුරා පවතින ගංගාවලින් ජලය ලබා ගන්නා වැව්වලින් සිය වාරි අවශ්‍යතා සපුරා ගන්නා 'වන්නිය' යන සුවිශේෂී භෞතික ප්‍රදේශ දෙකකින් සමන්විත උතුරු පළාත ආවරණය වී ඇත්තේ ග්‍රීෂ්ම කලාපීය කැලෑවලිනි. දිවයිනට අයත් කුඩා දූපත්වලින් වැඩි සංඛ්‍යාවක් අයත් වන්නේද (බටහිර අන්තයෙහි) මෙම පළාතටය. එසමගම පළාතේ කලපු ගණනාවක්ම ඇති අතර යාපනය කළපුව ඉන් විශාලතම එක වෙයි. තවද පළාතේ පිටාර තැනිතලාද, වෙරළබඩ තැනිතලාද වැලිපර සහ දිගු වෙරළ තීරද මෙහි ඇත. වර්ග කිමී 1130 ක් විශාල මෙම පළාතේ වර්ග කිමී 4 ක් (4%පමණ) කලපු වේ. උසම ස්ථානයේ උස වන්නේ මුහුදු මට්ටමේ සිට මීටර් 10 ක් පමණී.

212. පළාතේ කාලගුණික රටාව ඍජුවම බලපෑම් ලබන්නේ වියලි / උෂ්ණාධික නිරිතදිග මෝසම් සුළඟ (පෙබරවාරි - සැප්) සහ තෙත් / සිසිල් ඊසානදිග මෝසම් සුළඟ (ඔක් - ජන) ආදියෙනි. ඒ අනුව ජනවාරි සිසිල්ම මාසය වන අතර මැයි උෂ්ණතම මාසය වෙයි. සාපේක්ෂ ආර්ද්‍රවතාවය දිවා කාලයෙහි 70 % සිට රාත්‍රී කාලයෙහි 90% අතර උච්චාවචානය වෙයි.

213. පේදුරු තුඩුවද ඇතුලත්ව යාපන අර්ධද්වීපයේ උතුරු පෙදෙසේ වෙරළ තීරයේ වැඩි කොටසක් සමාන්තරව දිවෙන ගැටිපරවලින් හා ගල්පරවලින් සමන්විත වන අතර ඝන ගල්පර මුහුළුවලින් මායිම් වුනු පැතලි හා තිරස් අන්තර් උදම් ගල්පරවලට ඇතුල් වී වෙරළේ ගැඹුරු ජලයට ගලා යයි. **(රූපසටහන 4.1).** පෙදෙස පුරා ගැටිපර ස්වාභාවිකව මෙන්ම කෘතිමවද විවෘතව (කුඩා බෝට්ටු ද්වාර) ඇති අතර මෙය ගල්පර මැදින් මුහුදු තීරයට ඍජු ප්‍රවේශය ලබා දෙයි. **(රූපසටහන 4.2 a).** මෙම ගැටිපර රළ නිසා ඇති වන බාදනයට එරෙහිව ආරක්ෂාව සලසන අතර ධීවර බෝට්ටු නවතා තැබීමට සුදුසු ස්වාභාවික ජල කණ්ඩිද වෙරළ දිගටම නිර්මාණය කර ඇත **(රූපසටහන 4.2 b).**

**රූපසටහන 4-1 පේදුරු තුඩුවට ආසන්න උතුරු වෙරළ තීරයේ නිදසුනක්**



රූපසටහන 4-2 උතුරුවරළ තීරය ඔස්සනෙස් ස්වාභාවික ආරක්ෂාව ලබන ධීවර බෝට්ටු





(a) (b)

214. පේදුරු තුඩුවේ යෝජිත ධීවර වරාය පිහිටා ඇත්තේ 9°49'41.68"N, 80°14'7.59"E පිහිටීමෙහි වන අතර කුඩා කර්මාන්ත එළිපෙහෙළි කිරීම්, කැණීම්, පිරවීම්, සමතලා කිරීම් වැනි අතීත භාවිතාවන් නිසා මෙන්ම වෙනස් කිරීම්වලට ලක්වීම නිසා ස්වාභාවික ශාක වර්ධනය සීමිතය. මේ හේතුවෙන් අඩු ශාක / ජීව පෛව විවිධත්වයකින් යුක්තය. එමෙන්ම බෝට්ටු නවත්වන ස්ථානවල අන්තර් උදම් නොගැඹුරු ගල්පර සහ උප උදම් ගල්පර අයින් සහ බෑවුම් අතිශය වෙනස්වීම්වලට ලක්ව ඇති අතර ධීවර වරාය මුල්කර ගත් දෛනික මිනිස් ක්‍රියාකාරකම් නිසා නිතලවාසී සහ නිර්වෘත්ත ශාක බොහෝ සෙයින් වඳ වී පෛව විවිධත්වයට දැඩි හානි සිදු වී ඇත. අන්තර් උදම් ගල්පර තිරස් වන අතර අඩු ජල සෘතුවල නිරාවරණය වන හෙයින් නිතලවාසී සහ නිර්වෘත්ති සාගර සම්පත් අඩු වී ඇත. මෙහි මිරිදිය පරිසර පද්ධතියක් හෝ කඩොලාන නොමැති හෙයින් සාගර පෛව විවිධත්වයෙන්ද හිස්ය. ඒ අනුව නොගැඹුරු සාගර ශාක හෝ ජීවී ජනගහනය අපේක්ෂිත පරිදි සහ මෙවන් කුඩා පරිමාණ ධීවර වරාය පරිශ්‍රවලට ආවේණික පරිදි යෝජිත පෙදෙසේද අතිශය විරලය. යාබදව නැගෙනහිරෙන් සහ බටහිරින් ඇති සාගර පරිසර පද්ධතිද මේ හා සමාන දිගු කාලීන සාගර බලපෑම් ලක්ෂණ පිළිබිඹු කරන හෙයින් පොදුවේ ගත් කල යෝජිත පරිශ්‍රයෙහි ජනාවාස වෙනස් කිරීම නිසා හෝ ඉදිකිරීම් නිසා සැලකිය යුතු සාගර ජීව විද්‍යාත්මක බලපෑමක් අලුතෙන් ඇති වන්නේ නැත.

## 4.2 භෞතික පරිශ්‍රය

### 4.2.1 කාලගුණය

- ශ්‍රී ලංකාවේ කාලගුණයට බලපෑම් ඇති කරන්නේ මධ්‍යම කඳුකරයේ සහ දකුණු පෙදෙස්වල ඇති කඳුවැටි සහ සෙසු පෙදෙස්වල ඇති සමතලා භූලක්ෂණ විසින් හා නිරිතදිග සහ ඊසාන දිග මෝසම් වැසිය. වාර්ෂික කාලගුණය මෝසම් 4 කට වෙන් කර ඇත: (1) පළමුවැනි අන්තර් මෝසම් වැසි ( මාර්තු- අප්‍රේල්) (2) ඊසානදිග මෝසම් වැසි (මැයි - සැප්) (3) දෙවෙනි අන්තර් මෝසම් වැසි (ඔක - නොවැ) (4) ඊසානදිග මෝසම් වැසි (දෙසැ- පෙබ)
- යාපන අර්ධ ද්වීපයය පිහිටා ඇත්තේ ශ්‍රී ලංකාවේ වියලි කලාපයේ වන අතර මෙම පෙදෙස දිවයිනේ උතුරු, නැගෙනහිර සහ ගිනිකොන ප්‍රදේශයෙන් වැඩි කොටසක් ආවරණය කරයි. තවද මෙම ප්‍රදේශයේ කාලගුණය ඔක්තෝම්බර් - පෙබරවාරි මාසවල දැඩි සුළඟක් ගෙනෙන ඊසානදිග මෝසම මගින් සහ ඉතිරි කාලය පුරා ලැබෙන අඩු වර්ෂාව මගින් බලපෑම් ලබයි.
- **උෂ්ණත්වය:**පේදුරු තුඩුවෙහි අවම උෂ්ණත්වය 20 - 26$^{o}$C අතරද උච්ච උෂ්ණත්වය 28 - 33 $^{o}$C අතර වසර පුරා පවතින අතර මෙහි වාර්ෂික සාමාන්‍යය 28$^{0}$C වෙයි. ජනවාරි පෙබරවාරි මාර්තු මාසවල ශීත කාලගුණයක් පවතින අතර අප්‍රේල් සහ මැයි මාසවල උපරිම වාර්ෂික උෂ්ණත්වය පවතියි. මේ අතර පේදුරු තුඩුවේ සාගරය මතුපිට

උෂ්ණත්වයේ වාර්ෂික සාමාන්‍යයේ උපරිමය28$^{o}$C වු අතර උපරිමය 30$^{o}$C (ජනවාරි) සහ අවමය 26$^{o}$C (මැයි) ලෙස සටහන් වුනි.

- **අවක්ෂේපය:** වාර්ෂික වර්ෂාපතනය මිමි 1000 - 1250 අතර වෙයි. උච්ච වර්ෂා පතනය ඊසානදිග මෝසම මගින් ඔක්තෝම්බර් - ජනවාරි මාසවල ලැබෙන අතර මෙය වසර පුරා ලැබෙන වර්ෂාවෙන් 75 % ක් පමණ වේ.

(**රූපසටහන 4.3** යාපනය දිස්ත්‍රික්කය 2002 සිට 2018 දක්වා ලැබු ාවර්ෂික වර්ෂාපතනයේ සාමානයය).

- ඉතිරි වර්ෂා පතනය වියලිම වකවානුව වන ජුනි - සැප්තැම්බර් මාසවල කඩින් කඩ ලැබේ. සාපේක්ෂ අර්ද්‍රවතාවය දහවල් කාලයෙහි 70 % ක් සහ රාත්‍රියෙහි 90% ක් අතර උච්චාවචානය වෙයි.

**රූපසටහන 4-1 යාපනය සඳහා වන වාර්ෂික අවක්ෂේපණය සහ උෂ්ණත්වය**




**Source**: Metrological Department 2018

215. **උදම්:** ජේදුරු තුඩුව ඇතුලත්ව යාපනයේ උතුරු වෙරළ තීරය සඳහා වන ඓතිහාසික උදම් දත්ත සීමිත වන හෙයින් සංසන්දනය සඳහා කාලානුරූපීත දත්ත ගොඩනගා ගැනීම අසීරුය. කෙසේ වෙතත් සමීප කාලීන උදම් තොරතුරු දත්තවලට අනුව ජේදුරු තුඩුව ඇතුලත්ව උතුරු පළාත සඳහා වන මූලික උදම් සීමා වනාහී, අර්ධ ද්වි -දෛනික (දිනකට දෙවරක්) අසමානතා සහිත හා මීටර 0.6 ක උපරිම (ක්ෂුද්‍ර උද්ම) විචල්‍යතාවයෙන් යුත් අර්ධ ද්වි-දෛනික ලක්ෂණ සහිත වෙයි. විවෘත උතුරු වෙරළ තීරයේ පිහිටා ඇති ජේදුරු තුඩුවට MLWS මී 0.1 සිට MHWS 0.7 දක්වා මි 0.6 ක මහවඩදිය උදම් සහ වාර්ඩ් ඩාටුම් ප්‍රස්ථාරයට සාපේක්ෂව මි 0.3 ක අවම බාදිය උදම් ඇති වෙයි. යාපනය කලපුව සඳහා වන සාපේක්ෂ අගයන් MLWS සඳහා මි 4.0 සහ MHWS සඳහා මි 0. 2 ක් වෙයි. කාරයිනගර්හි මිණුම අනුව ජුනි - අගෝස්තු මාසවල ආසන්න වශයෙන් අවම මුහුදු මට්ටම් මි -0.1 ක් පෙන්නුම් කරන අතර නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල ආසන්න වශයෙන් උපරිම මුහුදු මට්ටම් මි +0.2 සිට + 0.3 දක්වා පෙන්නුම් කරයි (ආසියා සංවර්ධන බැංකුව, 2017).

216. දත්ත සටහන් කරන සමයෙහි පැවති සාගර තත්වයන් අනුව වු කාලගුණ රටා අනුව කුඩා ඍතුමය සහ දෛනික උදම් උච්චාවචාන සටහන් කරන ලදී. දැඩි සුළං සහිත කාලගුණික තත්වයන් සැලකිය යුතු බලපෑමක් උදම් උස්වලට ඇති කරයි. ඉහළ ජල වකවානුවල මෙය ඇති වෙයි නම් ඉහළ වෙරළ ඛාදන සංසිද්ධි සහ ජල පිටාර ගැලීම් ඇති වීමට ඉඩ ඇත.

217. **රළ:** දැඩි සුළං නිසා රළ උත්පාදනය වන නමුත් එය පෙදෙසින් නොකඩවා ඉවත් වන අතර නිරීක්ෂණය කරන ලද ක්ෂේත්‍ර ඕනෑම ලක්ෂ්‍යයක පිළිබිඹු කරනුයේ පෙදෙසින් උත්පාදනය වුනු රළ හා ඈත පෙදෙසකින් උත්පාදනය වුනු රළ යන දෙකමය. මේ අනුව ඕනෑම ස්ථානයක සුළං රළ කාලගුණයේ විචල්‍යතාවය පෙදෙසේ සුළං ක්ෂේත්‍රයට අයත් සංරචකයක් වනවා පමණක් නොව රළ උත්පාදනය කරනු ලබන සාගරයේ පුළුල් පෙදෙස් හරහා වන ඒකාබද්ධ විචල්‍යතාවයටද අයත් වෙයි.

218. පේදුරු තුඩුවට අදාල රළ කාලගුණයට මෝසම් ඍතු ද්විත්වය බලපෑම් ඇති කරන අතර ප්‍රධාන වශයෙන් එය කෙටි කාලීන සුළං රළ ලක්ෂණවලින් සමන්විතය. එනමුත් දිගු කාලීන රළ සංරචකය අවශේෂ බව පෙනී ගියේය. නිරිතදිග මෝසම මැයි සිට සැප්තැම්බර් දක්වා පවතින අතර එහි ප්‍රතිඵලයක් ලෙසින් නිරිතෙන් උස රළ හා දැඩි සුළං ඇති වෙයි. මෙම රළ, විවර්තනයෙන් පසු වයඹ දෙසින් ළඟා වන අතර මෙම ඍතුවේ උත්පාදනය වන රළ උතුරු වෙරළ ඔස්සේ ඒවායෙහි පිහිටීම නිසා පේදුරු තුඩුව මත ඇති කරන ඍජු බලපෑම සීමිතය. මේ අතර ඊසානදිග මෝසම ඔක්තෝම්බර් සිට පෙබරවාරි සිට සැප්තැම්බර් දක්වා පවතින අතර එහි ප්‍රතිඵලයක් ලෙසින් ඊසාන දෙසින් උස රළ හා දැඩි සුළං ඇති වෙයි. මෙම රළනිසා පේදුරු තුඩුව මත ඍජු බලපෑමක් ඇති කරයි. මෙම අතරතුර කාලවකවානුවෙහි සුළං සහ රළ එක් අග්‍රස්ථ දිශාවක සිට තවත් දිශාවකට මාරු වන අතර විස්තරාත්මක සැලසුම් අදියර යටතේ සිදු කරන ලද රළ අධ්‍යයන සමයෙහි දුටු පරිදි 50 - 90 deg. N, සහ270 - 290 deg. N, යන පැහැදිලිවම හඳුනාගත හැකි දිශානුගත පොකුරු දෙකක් පෙන්වයි.

219. පේදුරු තුඩුවෙහි (ආසියා සංවර්ධන බැංකුව, 2016) සිදු කරන ලද හා 2018 (EML 2018) නැවත සිදු කරන ලද රළ හා සුළං අධ්‍යයනයක් විසින් රළවල උසේ සාමාන්‍යය මි 0.5 සිට 1.5 දක්වා වෙනස් වන බව සහ රළ කාල පරතරය තත්පර 4 - 9 දක්වා උච්චාවචානය වන බවද හඳුනාගන්නා ලද අතර මෙම දත්ත **රූපසටහන 4.4.** හි ඉදිරිපත් කර ඇත. පේදුරු තුඩුව හා සම්බන්ධ විස්තරාත්මක පැහැදිලි කිරීමක් EML 2018 හි සඳහන් කර ඇති අතර වැඩිදුර තොරතුරු සඳහා එයට යොමු විය යුතුය.

**රූපසටහන 4-2:පේදුරු තුඩුව වාර්ෂික සීනරිය සඳහා වන වෙරළාසන්න රළ නැගීම උපරිම උස මි 1.5 (මුලාශ්‍රය EML, 2018).**




220. **කුණාටු සර්ජන නැගීම:** සුලිසුළංවලින් හා අඩු පීඩන නිසා උස් රළවලින් උත්පාදනය වන කුණාටු නැගීම් පිළිබඳ ඇගයීමක් යෝජිත ධීවර වරාය සඳහා සමුද්‍ර ව්‍යුහයක් සහ ඒ හා සම්බන්ධ පහසුකම් ගොඩනැගීමට අතිශය වැදගත් වන අතර

වෙනස් හැරවුම් කාල සහිතව කලාපයේ කුණාටු සර්ජන නැගීම් අනුමාන කිරීමට පෙදෙසෙහි අතීතයෙහි සිදු කරනලද ස්වාධීන අධ්‍යයන දෙකක් වත්මන් අධ්‍යයනය සඳහා උපයෝගී කර ගන්නා ලදී. උක්ත අධ්‍යයන දෙකින් සර්ජන අතික්‍රමණ සංඛ්‍යාත ලබා ගැනීම උදෙසා නිවර්තන කුණාටු බලපෑම් ඇතුලත්ව UNESCO-IHE 2014 විසින් සිදුකරන ලද අධ්‍යයනයට වැඩි අවධානය යොමු කරන ලදී. වසර 19 ක කාලයක් පුරා වසර 20, 50 සහ වසර සියයක හැරවුම් කාලයක කුණාටු සර්ජන අනුමාන කිරීම සඳහා *පැරිටෝ බෙදාහැරීම* (GP) යොදා ගනිමින් පැයෙන් පැයට මණින ලද වෙන්නායි වරායේ ජල මට්ටම් මෙම අධ්‍යයනය විසින් විශ්ලේෂනය කරන ලද අතර මුහුදු මට්ටමේ සිට මී 0.69 ක් වු සමුද්‍ර ව්‍යුහ සැලසුම් කිරීමට වසර 50 ක හැරවුම් කාලයකට සාපේක්ෂ කුණාටු සර්ජන නැගීම් යෙවාදා ගන්නා ලදී (ආසියා සංවර්ධන බැංකුව, 2016).

221. ධීවර වරාය සහ අනෙකුත් ධීවර වරාය පහසුකම් ආරක්ෂා කරන දියකඩන කොටස යෝජිත වරායේ බේසම කුණාටු සර්ජන බලපෑම් නිසා ඉහළ නගින ජල මට්ටමට එරෙහිව ආරක්ෂා කිරීම පිණිස ව්‍යුහයට උඩින් එන ජලය වළක්වනු පිණිස මුහුළු ආරෝහය ප්‍රමාණවත් ලෙසින් උස් කර ඇත. එනිසා යෝජිත ධීවර වරාය ඉදිකිරීම හේතුවෙන් කුණාටු මගින් උත්පාදනය කරනු ලබන සර්ජන නැගීම් නිසා වෙරළ තීරයට සැලකිය යුතු බලපෑමක් ඇති වන්නේ නැත. එයට අමතරව මුහුදු මට්ටම් වෙනස්වීම ජේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියට සාධක කර ඇත. දරුණුතම විෂය සීනරිය ලෙසින් වසර 50 කාලයේ රළ නැගීම් අනුමාන කිරීම් මීටර 0.45 ලෙසින් ගෙන ඇති අතර මෙවිට GHG අවම කිරීමට කිසිදු ඵලදායී පියවරක් ගෙන නැත.

### 4.2.2 ප්‍රවාහ සහ රොන්මඩු ගසාගෙන යාම

222. බෙංගාල බොක්ක සහ එයට වඩා පුළුල් ඉන්දියන් සාගරයේ මතුපිට ප්‍රවාහය මෝසම් සුළං මගින් දිවෙන අතර එහි ප්‍රතිපලයක් ලෙසින් පැහැදිලිවම දැකිය හැකි ඍතුමය විචල්‍යතාව දක්වනු දැකිය හැකිය. අපරදිග භූගෝලාර්ධයෙහි ශීත ඍතුවල ආසියානු භූමි ස්කන්ධය සාගරයට සාපේක්ෂව වඩා සිසිල් වන හෙයින් ඉන්දියන් සාගරය මත උණුසුම් වාතය නැගෙන විට එය පොළොව පෙදෙසින් හමන වඩා සිසිල් වාතයෙන් ප්‍රතිස්ථාපනය වී එමගින් නොවැම්බර් සහ අප්‍රේල් අතර ඊසානදිග මෝසම නිර්මාණය වෙයි. මෙම කොරියෝලිස බලපෑම මුහුදු ජලය අපරදිග භූගෝලාර්ධයේ සුළං දිශාවේ දකුණු දෙසට ගමන් කරවන හෙයින් ඊසාන දිග සුළග මුහුදු ජලය නැගෙනහිර සිට බටහිරට -හෙවත් ප්‍රධාන වශයෙන් දිවයිනේ උතුරු මෝසම් ප්‍රවාහය (NMC) ඔස්සේ- ගමන් කරවයි. **(රූපසටහන 4.5a)** (ස්කොට් ඇන්ඩ් මැක්රිරි 2001). අප්‍රේල් හා සැප්තැම්බර් අතර පොළාව වඩාත් උණුසුම් හෙයින් උඩා නගින උණුසුම් වාතය සාගරයෙන් එන තෙත් වාතයෙන් ප්‍රතිස්ථාපනය වී නිරිතදිග මෝසම සහ එය හා බැඳුනු වැසි තත්වයන් නිර්මාණය කර නිරිතදිග සුළග මුහුදු ජලය දකුණු මෝසම් ප්‍රවාහය (SMC) ඔස්සේ ගමන් කරවයි. **(රූපසටහන 4.5 b)** (ඩේ වෝස් සහ කණ්ඩායම 2014)

**රූපසටහන 4-3: ශ්‍රී ලංකාව සහම දකුණු ඉන්දියාව වටා සාගර සංසරණය (a) ඊසානදිග මෝසම (b) නිරිතදිග මෝසම**




**(a)** **(b)**

WICC - බටහිර ඉන්දීය රෙවළබඩ ප්‍රවාහය; EICC - නැගෙනහිර ඉන්දීය රෙවළබඩ ප්‍රවාහය; SMC - දකුණු මෝසම් ප්‍රවාහය NMC- උතුරු මෝසම් ප්‍රවාහය; SD- ශ්‍රී ලංකා කොත

223. ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළේ සාගර ප්‍රවාහ සංසරණය පිළිබඳ විද්‍යාත්මක තර්ක විතර්ක තිබෙන නමුත් පොදුවේ පිළිගත් මතය **රූපසටහන 4.5 (a)** හි දක්වා ඇත. මෙම මතය වන්නේ ඊසානදිග මෝසම් සමයෙහි බටහිර ඉන්දීය වෙරළබඩ ප්‍රවාහය ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළතීරය ඔස්සේ ඇදී නැගෙනහිර සිට බටහිරට ගලන උතුරු මෝසම් ප්‍රවාහය හා එක් වන බවයි. නිරිතදිග මෝසම් සමයෙහි බටහිර සිට නැගෙනහිරට ගලන දකුණු මෝසම් ප්‍රවාහය ඉන්දියාවේ බටහිර වෙරළ ඔස්සේ දකුණට ගලා යන බටහිර ඉන්දීය රෙවළබඩ ප්‍රවාහය සමග එක් වන අතර ශ්‍රී ලංකා යැයි හඳුන්වනු ලබන වම් අතට කැරකෙන ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළහේ නිර්මාණය වෙයි **(රූපසටහන 4.5 (b)).** වැඩි ප්‍රමාණයක් ජලය ශ්‍රී ලංකා කොත විසින් දකුණ ඔස්සේ ගෙන යනු ලබන අතර මදක් නැගෙනහිර ඉන්දීය වෙරළ තීරය ඔස්සේ උතුරු දෙසට ගලා යයි.

224. වෙරළාසන්න ප්‍රවාහ, බොහෝ සෙයින් රළ තත්වයන් මත රඳා පවතින අතර ඉංජිනේරු ව්‍යුහ වෙරළේ තැන්පත් කරන සෑම විටම වෙනස්වීම්වලට ලක් වෙයි. ඊසාන දිග රළ තත්වයකට සාපේක්ෂ ගැඹුරේ සාමාන්‍යය සහිත ප්‍රවාහ ක්ෂේත්‍රයක් ඉතා ඉහළ ලක්ෂණ සහිතව ප්‍රබල ප්‍රවාහයක් වෙරළ ඔස්සේ ගෙන යා හැකි අතර මෙය**රූපසටහන 4.6** දක්වා ඇත. ගල්පරවලින් පිටත පෙදෙස්වල ප්‍රවාහ ප්‍රවේග තත්/මී 1.4-1.6 අගයන්ට පවා ළඟා වන තරමට ප්‍රබල බව පෙනී ගියේය.

රූපසටහන 4-4 ඊසාන දිග රළ තත්වයකට සාපේක්ෂ වෙරළාසන්න  ප්‍රවාශ ක්ෂේත්‍ර




දෛශික මගින් වත්මන් ප්‍රවාහ දිශා සහ විශාලත්ව පෙන්වා ඇති අතර යටින් ඇති වර්ණ ඉරවලු සහ වර්ණ කොටු වත්මන් වේගය (තත්/මී) දක්වයි. ධීවර වරාය ඇතුලත කොළ පාට රේඛාව නැංගුරම් පළවල පිට මායිම දක්වයි

225. ගැටිපර පද්ධතියට පිටතින් නැගෙනහිර සිට බටහිරට සමාන්තරව දිවෙන ශුද්ධ ප්‍රවාහ බලපෑමක් ඇති බව පේදුරු තුඩුවෙහි පරිශ්‍රයට සුවිශේෂී රොන්මඩ ප්‍රවාහය සම්බන්ධව සිදු කරන ලද අධ්‍යයනයක් (EML, 2018) මගින් හඳුනා ගෙන ඇත. මෙහි LST අනුපාතිකය 400 - 2000 $m^3$/yr යන ප්‍රමාණවලින් තිබේ. මෙය සාමාන්‍ය ප්‍රමිතින් අනුවන අවශේෂය. තවද ගල්පර හා වෙරළ තීරය අතර හා වෙරළ තීරයට බලපෑම් ඇති කළ හැකි ඇති LST අනුපාතිකය දක්නට ලැබුනේ එයටත් වඩා අඩු හෙවත් 5 සහ 500$m^3$/yr ප්‍රමාණවලිනි.

**රූපසටහන 4-5 පේදුරු තුඩු ධීවර වරායට යාබදව ඇති රෙවලාසන්න ජල ස්කන්ධ හා සම්බන්ධ රොන්මඩ ප්‍රවාහයේ සංක්ෂේපය (EML, 2018)**




ව්‍යුහ ඉදිකිරීමෙන් පසු පළමු වසරෙහි ගොඩ නගා ගත් ගල්පරවල සිට මුහුද දෙසට වන (නිල්) වෙරළ හා ගල්පර අතර (රතු) වන ශුද්ධ හා දළ වාර්ෂික වෙරළබඩ රොන්මඩ ප්‍රවාහ අනුපාතිකයන් කොළ පාටින් දක්වා ඇත්තේ නැංගුරම්පළවල පිටත මායිමයි.

## 4.2.3 කාලගුණ විපර්යාසය

226. ඉන්දියන් සාගරයේ නිවර්තන කුණාටු සහ වාසුලි වැනි දරුණු කාලගුණික සංසිද්ධි උත්සන්න වීම මනාව ලේඛනගත කරන ලද ලියවිලි බොහෝමයක් තිබුනු අතර ඒවා අඩු කාලපරතර සහිත හට ගන්නා බවක් හා දරුණු බවින් වැඩි වන ප්‍රවණතාවයක් මෙන්ම ඒවා අනාගතයෙහි පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියපරිශ්‍රද ඇතුලත්ව උතුරු පළාතේ වෙරළවලට ආවේණික ලක්ෂණවලින් හෙබි බව පෙන්වුයේය.

227. ගෝලීය උෂ්ණත්ව ප්‍රවණතා සැලකිල්ලට ගන්නා කල වැඩි කාලපරතර සහිතව හෝ දරුණු කාලගුණික තත්වයන් ඇති විය හැකිය යැයි අපේක්ෂා කෙරේ. එනිසා ආපදා කළමනාරණ ප්‍රවේශයක් පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියවිෂයයෙහි පමණක් නොව කලාපයටද අතිශය වැදගත්ය. (i) මුහුදු සර්පන දරුණු කරන මුහුදු මට්ටම ඉහළ යාම, වෙරළඛාදනය වැඩි වීම සහ මහජන හා රාජ්‍ය යටිතල පහසුකම්වලට අවදානම වැඩි වීම (ii) මුහුදු සර්පනයේ හානියේ අවදානම වැඩි කරන දරුණු හා නිතර ඇති වන කුණාටු සහ දැඩි සුළං සහ ජල ගැල්ම නිසා මහජන හා රාජ්‍ය යටිතල පහසුකම්වලට අවදානම වැඩි විම (iii) විශේෂයෙන් යාපනය ඇතුලත කෙටි කාලීන දුෂ්කරතා ඇති කර මිරිදිය පද්ධතියට දිගු කාලීන හානි ඇති කරන හා නිතර ඇති වන හා දිගු කාලවලට පවතින නියං ආදිය උතුරු පළාතේ වාසය කරන මිනිසුන් මුහුණ දෙන ප්‍රධාන ආපදා ලෙස සඳහන් කළ හැකිය.

228. කාලගුණ විපර්යාස ආදේශ පියවර ගැන සලකා බලා පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියව්‍යාපෘතියේ සැලැස්මට සහ වැඩසටහනට සහ අවසන් සැලැස්මට එය අන්තර්ගත කර ඇත. රළ උත්සන්න වී එමගින් හට ගන්නා දැරුණු කාලගුණ රටා සහ සංසිද්ධි ව්‍යාපෘතියට සෘජුවම බලපෑම් ඇති කරනු ඇති අතර මෙම අභියෝග කළමනාකරණය කිරීම සැලැස්මට එක් කර ඇත. 0.45 ක මුහුදු සර්පන සහ 0.69 ක සකුණාටු සර්ජනයට ඔරොත්තු දෙන ආකාරයෙන් වෙරළෙන් පිට ව්‍යුහ සැලසුම් කර ඇත.

229. හරිතාගාර වායු විමෝචනයට ව්‍යාපෘතිය සැලකිය යුතු ලෙසින් දායක නොවනු ඇත යැයි අපේක්ෂිත නමුත් වරායේ සීමාත ඉඩකඩක බෝට්ටුවල සැරිසැරීම නිසා දුම් පිටවීම වැඩි වනු ඇත. එනමුත් දැනට බෝට්ටු ක්‍රියා කරන්නේ යාබද පෙදෙස්වල හෙයින් සමස්ත තත්වයෙහි වැඩි වෙනසක් ඇති වන්නේ නැත. එමෙන්ම බෝට්ටු මනාව නඩත්තු කිරීම හා අළුත් හා වඩාත් කාර්යක්ෂම එන්ජිම් සවි කිරීම මගින් දුම් පිටවීමේ හා හරිතාගාර බලපෑම් අවම කර ගත හැක. නිමාවේ විදුලි අවශ්‍යතා සඳහා විදුලි ජාලයෙන් විදුලිය ලබා ගනු ඇති අතර ජෙනරේටර් තිබෙන්නේ ජාලක විදුලිය බිඳ වැටෙන හදිසි අවස්ථා සඳහා පමණි. ඒ අතරම වහල මත සවි කරන සූර්ය ශක්ති පැනල වැනි විකල්ප විදුලි සැපයුම් මාර්ග ගැනද සලකා බලනු ලැබේ.

230. කාලගුණ විපර්යාසය සහ ස්වාභාවික ආපදා නිසා ඇති විය හැකි ඇතැම් අවදානම් වගුව 4.1 හා දක්වා ඇති අතර මෙය ආදේශ කරගන්නා ලද්දේ 'කෘෂි කර්මාන්ත අංශයේ කාලගුණික අවදානම් සහ ආදේශ කිරීම්' නම් වන ආසියා සංවර්ධන

බැංකුවේ වාර්තාවෙනි. ජේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියවිෂයයෙහි හඳුනාගන්නා ලද විවිධ විකල්ප පියවර මෙහි අන්තර්ගත වෙයි.

**වගුව 4-1 කාලගුණ විපර්යාස නිසා ජේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියඇති විය හැකි අවදානම්**

| කාලගුණ විපර්යාස අනතුර | විභව බලපෑම | සැලැස්මට අන්තර්ගතකර ඇති අවම කිරීමේ පියවර | විකල්ප පියවර |
|---|---|---|---|
| මුහුදු මිට්ටම ඉහළ යාම | පරිශ්‍රය පිහිටා ඇත්තේ මුහුදට ඉතා ආසන්න භූමියක හා ගල්පරයේ ඉදිකර ඇති ධීවර වරායකට යාබදව හෙයින් මුහුදු මට්ටම ඉහළ යාම නිසා ඉදිකිරීම් ද්‍රව්‍යවල ඒකාග්‍රතාවයට බලපෑම් ඇති කර පරිශ්‍රය ජලයෙන් පිරෙනු ඇත. | මුහුදු මට්ටම ඉහළ යාමට ඔරොත්තු දෙන ආකාරයෙන් දියකඩන උස නිමවා ඇත | මුහුදු මට්ටම ඉහළ යාමේ සංසිද්ධි කළමනාකරණය කිරීම පිණිස වෙරළබඩ කලාප ආරක්ෂණ සහ ඉදිකිරීම් ආරක්ෂණ පියවර නිමාවේ සැලැස්මට ඇතුලත් කර ඇත. මුහුදු මට්ටම මී 0. 45 ට සහ කුණාටු සර්ජනය මී 0.69 දක්වා ඔරොත්තු දෙන ආකාරයෙන් දියකඩන උස නිමවා ඇත |
| **වර්ෂාපතනය අඩු වැඩි වීම** | ධීවර වරාය පිරිසුදු කිරීමට ප්‍රධාන නගරයේ ජල සැපයුමෙන් ජලය ලබා ගැනීමට ව්‍යාපෘතියට අවශ්‍ය වනු ඇති අතර එය ලැබීමේ සහ එහි ගුණත්වයේ උච්චාවචනය වරායේ ඵලදායිතාවයට බලපෑම් ඇති කළ හැකිය | සුවිශේෂී පියවර කිසිවක් අනුගමනය කර නොමැත | ජලය නාස්ති නොකර භාවිත කිරීම සඳහා ජල කළමනාකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතු අතර කාර්ය මණ්ඩලයට අදාල දැනීම හා කුසලතාවය ඇති බව තහවුරු කර ගත යුතුය. ජලය සැපයිය යුත්තේ යාපනයේ ජලයෙන් ලවන රසය ඉවත් කරන නිමාවෙන් වන හෙයින් වර්ෂාපතනය නිසා ව්‍යාපෘතියේ ජල සැපයුමට බාධා ඇති වන්නේ නැත. |
| කුණාටු / වාසුලි / චණ්ඩමාරුත | ලුණු ජලය පිරීම නිසා ධීවර වරාය මෙහෙයුම්වලට බලපෑම් ඇති විය හැකිය | ජලගැලීම්වලට ඔරොත්තු දෙන ශක්තිමත් ව්‍යුහ ඉදි කර ධීවර වරාය පරිශ්‍රය ඇතුලත වැඩිදියුණු කල ජලය බැහැර කිරීමේ පද්ධති නිර්මාණය කළ යුතුය | ආපදා කළමනාකරණ පද්ධති සූදානම් තත්වයේ තිබෙන බව හා කාර්ය මණ්ඩලය නිසි ලෙසින් දැනුවත් බව තහවුරු කර ගත යුතුය |
| වැඩිවන උෂ්ණත්වය | සිසිලන පිරිවැය වැඩි වී ව්‍යාපෘතියේ වැය වැඩි විය හැකිය | තාප සංසරණය උපරිම කිරීම සඳහා සිසිලන සහ පරිවරණ පද්ධති ඇතුලත් කිරීම | ආපදා කළමනාකරණ පද්ධති සූදානම් තත්වයේ තිබෙන බව හා කාර්ය මණ්ඩලය නිසි ලෙසින් දැනුවත් බව තහවුරු කර ගත යුතුය |

231. ශ්‍රී ලංකාව සඳහා වන කාලගුණ විපර්යාස අනුමාන (CCS 2016) අනුව ප්‍රධාන වායුගෝලීය විපර්යාස තුනක් ඇති බව දක්වයි: 1) පරිමණ්ඩිත වාත උෂ්ණත්වයේ ක්‍රමානුකූල ඉහළ යාම 2) වර්ෂාපතන රටා බෙදයාමේ වෙනස්වීම් 3) දරුණු කාලගුණික සංසිද්ධිවල කාලපරතරය අඩු වීම හා දරුණු බව වැඩි වීම. මෙයට අමතරව ශ්‍රී ලංකාවද ඇතුලත් ආසියානු කලාපයේ මුහුදු මට්ටම ඉඩහළ යාම 1-3 mm / වසරෙහි නිරීක්ෂණය කර ඇති අතර එය 21 වන සියවස පුරා නොකඩවා වැඩි වනු ඇත යැයි අපේක්ෂිතය. (2050වන විට 15-20 cm). සාගර අම්ලකරණයද වැඩි වනු ඇත යැයි අපේක්ෂා කරන අතර එය කොරල් පරවලට ඍණාත්මක බපලපෑම් ඇති කරනු ඇත යැයිද විශ්වාස කෙරේ.

## 4.2.4 ස්වාභාවික ආපදා

232. ශ්‍රී ලංකාව මුහුණ දෙන ආපදා අතරින් නිවර්තන කුණාටු, වාසුලි සහ සුනාමි ආදිය ප්‍රධාන වන අතර මෙනිසා කුණාටු සර්ජන, ජල ගැලීම් හා ගංවතුරු නිසා පුළුල් භෞතික හා ව්‍යුහමය හානි ආදිය ඇති වෙයි. උතුරු පළාතේ මෙම ආපදා අනතුරාසන්න පෙදෙස් ලෙසින් ජේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියඉස්මතු කරමින් හඳුනා ඇති අතර මෙය රූපසටහන 4.8 හි දක්වා ඇත. ඒ අනුව ව්‍යාපෘති පරිශ්‍රය මෙම අවදානම් වැඩියෙන් ඇති බව පෙනී ගියේය.

රූපසටහන 4-3 උතුරු පළාතේ ස්වාභාවික ආපදා අවදානම් මට්ටම් (මූලාශ්‍රය: මධ්‍යම පරිසර අධිකාරිය/ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය 2014)




233. ශ්‍රී ලංකාවෙහි ගිනිකඳු ක්‍රියාකාරකම් ඉතා විරල වන අතර ගත වනු සියවසෙහි භූමිකම්පා සමයන්හි ගිනිකඳු ක්‍රියාකාරකම් කිසිවක් දිවයින අභ්‍යන්තරයෙහි හෝ දේශයේ වෙරළබඩට ආසන්න පෙදෙස්ල වාර්තා නොවුනි.

234. **සුළිසුළං:** ඉන්දියන් සාගරයේ ඊසාන දිලින් පිහිටා ඇති හා ඉන්දියාව, බංගලාදේශය, මියන්මාරය, ශ්‍රී ලංකාව හා තායිලන්තය භෞමික මායිම් වී ඇති බෙංගාල බොක්ක ලොවේ ප්‍රබලතම හා මරණීය සුළිසුළං උත්පාදනය වන පෙදෙසකි. ගතවුනු වසර සියයක කාලයකදී දිවයිනේ සුළිසුළං තීරයේ පිහිටා ඇති නැගෙනහිර උතුර හා උතුරු මැද පළාත් සුළිසුළං ගණාවකින් හානියට ලක්වු අතර 1922, 1931, 1964, 1978 සහ 2008වසරවල ඇති වුනු සුළිසුළං දරුණුතම ඒවා විය. මේ අතුරින් දිවයිනේ උතුරු පෙදෙසට 2008 නොවැම්බර් 25- 29 දිනවල ප්‍රහාර එල්ල කළ'නිශා' සුළිසුළඟ නිසා දරුණු දේපළ හා ජීවිත හානි ඇති විය. මරණයට පත්වුවන්ගේ සංඛ්‍යාව 15 ක් වු අතර වන්නි දිස්ත්‍රික්කයේ අවතැන් වුවන්ගේ ගණන 60,000 - 70,000 අතර හා යාපනයේ එය 20,000 ක් පමණ විය. තවද 1918 වසරෙන් පසු යාපනයේ සටහන් වුනු හා දශක නවයකින් දිවයිනේ සටහන් වුනු වැඩිම වර්ෂාපතනයද (මිමී 398.8) පැයට/ කිමී 85 වාර්තා ගත වේගයකින් හමා ගිය නිශා සුළිසුළඟ මගින් පෙදසෙට හිමි කර දෙන ලදී.

235. නිශා සුළිසුළගේ ගමන් පථයද ඇතුලත්ව 2008 සුළිසුළං වකවානුවෙහි උතුරු ඉන්දියන් සාගරයේ හටගත් සුළිසුළංවල විස්තර **රූපසටහන 4.9** හි දක්වා ඇති අතර නිශා ගමන් පථයට උස් හා විශාල රළ මෙන්ම වායුගෝලයේ පීඩනය අඩු වීම නිසා මුහුදු මට්ටම ඉහළ යාම ආදියද ඇතුලත් විය. මෙනිසා සාගර ව්‍යුහ සහ වෙරළබඩ පහසුකම් ඉදි කරන විට සුළිසුළං නිසා ඇති වන බලපෑම්ද සැලකිල්ලට ගත යුතුය.

රූපසටහන 4-4 උතුරු ඉන්දියන් සාගරයේ 2008 වකවානුවේ හට ගත් සුළිසුළං



236. **සුනාමි:** භූමි කම්පා ඇති වන විට තිරස් මුහුදු පතුල් විබේද රේඛා අස්ථාන වීම නිසා මෙන්ම ගිනිකඳු පිපිරීම, ගිනිකඳු කඩා වැටීම, උපසාගර නාය යාම් ආදිය නිසා සුනාමි හට ගනියි. සුනාමි නිසා හට ගන්නා භූමිකම්පා ගැඹුරු නොවන නමුත් දරුණු බවින් දැවැන්තය (රිච්ටර් මාපක ඒකක 7 ට වඩා වැඩි). එනිසා තිරස් අස්ථාන වීමක් තිබේ නම් පමණක් මුහුදේ සිදු වන විශාල හා නොගැඹුරු භූමිකම්පා විසින් බොහෝ විට සුනාමි උත්පාදනය වෙයි.

237. ශ්‍රී ලංකාවට සුනාමි හට ගැනීම කලාතුරකින් සිදු වන්නක් වන අතර අවසාන වරට ඒඅන්දමාන් - සුමාත්‍රා කලාපයේ ඇති වුනු රිච්ටර් ඒකක 9.3 ක උපසාගර භූමිකම්පාවක් නිසා- දරුණු ලෙසින් එය දිවයිනට ප්‍රහාර එල්ල කළේ 2004 දෙසැම්බර් 26 වෙනි දිනය. මෙම සුනාමිය නිසා උතුරු පළාතේ මුල්ලත්තිව් හා යාපනය දිස්ත්‍රික්ක ඇතුලත්ව ප්‍රධාන වශයෙන් නැගෙනහිර වෙරළ තීරයට විශාල දේපළ හා ජීවිත හානි ඇති විය. මෙම ව්‍යසනය සම්බන්ධ උපකල්පිත පරිෂණක අනුරුවක් **රූපසටහන 4.10** හි දක්වා ඇත

රූපසටහන 4-5 සුනාමිය ඇති විය හැකි විභවතාවය ඇති දිවයිනේ වෙරළතීර මූලාශ්‍රය: මධ්‍යම පරිසර අධිකාරිය/ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය 2014)




## 4.3 භූ ලක්ෂණය භූගෝල විද්‍යාව සහ පස්

238. වර්ග කිමී 1012 ක් විශාල හා සමතලා භූලක්ෂණයෙන් යුත් (උපරිම උස මධ්‍යම බටහිර තෙල්ලිපලෙයිහි මී 11 කි) යාපනය දිස්ත්‍රික්කය භෞමිකව පිහිටා ඇත්තේ සහ කිළිනොච්චි දිස්ත්‍රික්කයට යාබදව වන අතර මෙයට කුඩා දූපත් හතක් ඇතුලත්ව යාපලන අර්ධද්වීපයද අයත් වෙයි. මයෝසීන යුගය වන විට අර්ධද්වීපය මුහුදෙන් වට වී තිබුනු අතර හුණුගල් ප්‍රමුඛතම උපස්තරය විය. මෙම පෙදෙස වෙරළබඩ භූමි පිටාර තැනි වෙරළාසන්න තැනි, පහත් වැලිකඳු සහ වෙරළ ආදියෙන් සමන්විතය.

239. 1) කලපු තැන්පත් 2) පුනිලමෝය තැන්පත් 3) ඒකාබද්දධ නොවුනු දුඹුරු පැහැ වෙරළ පස් 4) පනාස්තර සහ 5) වැලි කඳු යන පස් වැදෑරුම් භූ ලක්ෂණවලින් යාපනය ප්‍රධාන වශයෙන් සමන්විත වෙයි. මයෝසීන හුණුගල් සහ පනාස්තර අර්ධද්වීපයේ මධ්‍යම මුදුන ආවරණය කර ඇති වැලිකඳු සහ වෙරළ තීර සීමා වන්නේ නැගෙනහිර වෙරළ තීරයට වන අතර කාරෙයිනගර් සිට පෙදුරු තුඩුව දක්වා උතුරු වෙරළ තීරයේ තින් පස් ස්තරයක් ඇත. යාපන අර්ධද්වීපයේ අභිබවනය කරන ගල් ස්තරය වනුයේ උස් ප්‍රමිතියේ පූර්ව කැම්බ්‍රියානු ඛිපරීත ගල් වන අතර ඇතැම් ස්ථාවනල පමණක් ඉහළ ජුරාසික් යුගයට අයත් රොන්මඩ ස්තරයකින් සමන්විතය.

240. යාපන හුණුගල් අයත් වන්නේ මයෝසීන යුගයට වන අතර බටහිරට නැඹුරු ඇතැම් ස්ථාන හැර කොරල් ස්ථරය නිර්මාණ වී ඇත්තේ දුර්වල හා පොදු වේ ගත් කල පැතලි ආකාරයකිනි. ඇතැම් තැන්වල එය දැවැන්ත වන නමුත් ඇතැම් ස්තර ෆොසිවලින් අනූන වන අතර මෙය මධුපටලක ව්‍යුහයක් නිර්මාණය කරයි. හුණුගල්වල ද්‍රවශීලී ගුණය දිවයිනේ භූගත ජල සංචිත අඩංගු භූගත පදර ගණනාවක්ම නිර්මාණය කර ඇති අතර හුණුගල් ඉහල මතුපිට සාපේක්ෂව උස් වයඹ දෙස සිට ගිනිකොන දෙසට පහත් වී එහි චුන්නාකම් පෙදෙසේ ආසන්න ප්‍රදේශ නිර්මාණය කරයි. උතුරු දෙස ඇති උප්පු ආරු කලපුව මෑතක නිර්මාණය වූ හුණුගල්වලින් වැසී ඇත.

241. ඒකාබද්ධ තැන්පත්වල මතුපිට ආවරනය භූවිද්‍යාත්මක ස්ථරවලින් ලාබාලම ඒවා වන අතර එය අර්ධද්වීලයේ දක්නට ඇති පසෙන් වැඩි කොටසක් වෙයි. වඩමරාච්චි කලපුවේ ඊසානෙන් ඇති රොන්මඩ වඩා ගැඹුරු පතුල් නිර්මාණය කරන අතර මෙය ඇතැම් තැන්වල මීයර් 8 - 17 දක්වා වෙයි.

242. උතුරු පළාතේ පස් සිතියම දක්වන **රූපසටහන 4.11** (මූලාශ්‍රය: අවසාන ව්‍යාපෘති සුදානමේ තාක්ෂණික සහය)අනුව යාපනය අර්ධද්වීපයේ වෙරළ ප්‍රදේශ සහ මන්නාරම කිළිනොච්චිය මුලතිව් දිස්ත්‍රික්ක වන්නියේ ප්‍රධාන ගොඩ බිමෙන් කොටසක මතුපිට පස කෘෂිකාර්මික සුදුසුකම අනුව වර්ගීකරණය කරන ලද පස් වර්ග පහකින් සමන්විතය:

- මෑත කාලීන වෙරළ තීරවල සහ වැලිකඳු මත වන රොගසෝල්;
- මෑත කාලීන සාගර චූර්ණමය රොන්මඩ;
- ඝනීභවනයට පත්වුනු සොලොනෙට්ස් සහ සොලොන්චක්ස්;
- චූර්ණමය රත් කහ ලැටොසොල්ස්;
- රත් කහ ලැටොසොල්ස්.

**රූපසටහන 4-6 උතුරු පළාතේ පස් සිතියම**




243. පොදුවේ ගත් කල පස් යනු හුණුගල් මත සුළඟේ හා රළවල බලපෑමෙන් නිර්මාණය වුනු හා සාගර තැන්පතු සහ රොන්මඩවල මිශ්‍රනයක් වෙයි. පේදුරු තුඩුවද ඇතුලත්ව යාපනය අර්ධද්වීපයේ උතුරු වෙරළ තීරයේ පස්වල රොගසොල් තිබෙන අතර වැලිමය පස් නිසා හට ගන්නා පොල්, තල් වැනි තාල වර්ගයේ ගස්වලට උචිතය. එනමුත් ඇතැම් පෙදෙස්වල තෙත් කාලවල වැසි ජලයෙන් වී වගාවද සිදු කරනු ලැබේ. එමෙන්ම වෙනත් බෝගවලටද සුදුසු හා පස් මැටි රොන්මඩ හා පෝර පස් ආදියෙහි මිශ්‍රනයක් වන ලෝම පස් කන්ඩිද අර්ධද්වීපය පුරා දක්නට ඇත. යාපනයේ දූපත් ප්‍රධාන වශයෙන් සමන්විත වන්නේ චූර්ණමය රොන්මඩ සහ ඝනීබවනයට පත්වුනු සොලොනෙට්ස් සහ සොලොන්චක්ස් වලින් වන අතර මෙය අර්ධද්වීපයේ නිරිතදිග අන්තයේද දැකිය හැකිය.

## 4.4 අගාධමිතිය මුහුදු පත්ල සහ වෙරළ තීරය

244. ශ්‍රී ලංකාවේ උතුරු වෙරළ තීරය කොල් සහිත හුණුගල් වැලිගල් සහ පාෂාණමය ගල්පරවලින් සමන්විත වන අතර මෙය වෙරළ තීරයට සමානව පිහිටා රළ මගින් ඇති වන හානියට එරෙහිව මෙන්ම ජලජ ජීවී වාසස්ථානවලටද ආරක්ෂාව සපයයි. මෙම වාසස්ථාන ඇතැමක් පරිශ්‍රය ඇතුලතද පිහිටා ඇත.

245. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියඅවට වෙරළතීරය සහ සාගර ජලය නොගැඹුරු හා වරායේ නැගෙනහිර අන්තයේ මීටර 75 සිට 100 දක්වා වන උදම් අන්තර ගල්පරවලින් සමන්විත වන නමුත් දැනට ඇති වාප්පුවට සමීප වන විට එය මීටර් 20 දක්වා අඩු වී උදම් අඩු වන විට නිරාවරණය වෙයි. ගල්පර පෙළේ දකුණු අන්තය ඉදිකරන ලද පර්වත බැම්මකින් මායිම් වන අතර (**රූපසටහන 4.12 a**) මුහුදට මුහුණලා ඇති උතුරු අන්තය, උපස්තරය ගල්පර බෑවුමක් බවට පත්වන්නට පෙර රළ පිරි කුඩා නොගැඹුරු උප උදම් ගල් පර පෙළක් දක්වා විහිදී ගැඹුර අඩු වෙයි (**රූපසටහන 4.12b**) පෙදෙස පුරා ගල්පර මුදුන සහ අයින වෙනස් වන අතර ඇතැම් ස්ථාන නිසි පරිදි නිමැවී නොමැත.

**රූපසටහන 4-7 පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘති පරිශ්‍රයට යාබද අන්තර් උදම් ගල්පර පද්ධතිය**





**(a)** **(b)**

246. රළු ගල්පර වාසස්ථාන සහ නිතල සම්පත් අන්තර් උදම් උප උදම් ගල්පර මුදුන් හා අයින් ඇතුලත පිහිටා ඇති අතර උතුරට විහිදෙන ඉතිරි වාසස්ථානය සමග වන අයින සහ බෑවුම ලියහිපල් වැලිවලින් සහ රොන්මඩවලින් සමන්විතය. මෙය කොරල්, ගල්පර, නිතල වාස්ථාන හෝ සම්පත් කිසිවකට සහය නොදවක්වයි.

247. පෙදෙසේ විස්තරාත්මක අගාධමිති සිතියම් (**රූපසටහන 4.13**) නිර්මාණය කර ඇති අතර වාප්පුවේ නැගෙනහිර අන්තයයේ වෙරළ බෑවුම 1:35 පමණක් හා වෙරළ තීරයේ සිට මීටර 280 පමණ ඈතින් පිහිටා ඇති පතුල් ආකෘතිය මීටර් 8 දක්වා බව පෙන්නුම් කරයි. මෙයට අමතරව වෙරළ තීරයේ සිට මීටර් 400ක් ඈතින් ජලයේ ගැඹුර මීටර් 10 දක්වා වැඩි වෙයි. මුහුදු පතුල් බෑවුම වරායේ බටහිර අන්තයේ ගැඹුර නැගෙනහිර අන්තයට සාපේක්ෂව ගැඹුරු වෙයි. මෙය 1:11 සිට මීටර් 7 දක්වා වන අතර ගල්පර අයිනේ සිට මීටර් 75 ක් ඈතින් පිහිටා ඇත. ගල්පර අයිනේ සිට මීටර් 170 ක් ඈතින් ජලයේ ගැඹුර මීටර් 9 ට ළඟා වන අතර ව්‍යාපෘතියේ අපේක්ෂිත ජලතරණ නාළිය මීටර් 9-10 දක්වා ගැඹුරුය. මෙය යෝජිත ධීවර වරායට සෑහෙන පරිදි ප්‍රමාණවත්ය.

**රූපසටහන 4-8 පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය පරිශ්‍රයේ වෙරළාසන්න අගාධමිතිය**




248. අන්තර් උදම් ගල්පර සමග ආරම්භ වන වරායේ මුහුදු පත්ල - නැගෙනහිර දෙසින් පිහිටා ඇති වැලි සහ කුඩා කොරල් ගල්වලින් සමන්විත පුළුල් වෙරළ තීරයේ හැර- බොහෝ සෙයින් රළු ගල් කොරල් හා ගල්වලින් සමන්විත වන අතර පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියට යාබද තොටුපළ අවට පෙදෙසේ ස්වාභාවික ගල්පර නාළිකා ඇතුලත් වෙයි. මෙය ධීවර බෝට්ටු ඇතුල් වීමට හා ආරක්‍ෂාව සඳහා භාවිත කෙරේ. **(රූපසටහන 4.14b).**

**රූපසටහන 4-9 පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘති පරිශ්‍රයේ දෙපස වෙරළ තීරවල පින්තූර**



**(a)**



**(b)**

249. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘති පරිශ්‍රයේ නිතලවාසී සාගර පෘෂ්ඨික හා අපෘෂ්ඨිකවංශ සමූහයන් ඇගයීමට ලක් කරන ලද අතර (සාගර ඇගයීම් වාර්තාව අනුබද්ධය 5 ට යොමු යවන්න) එවිට ව්‍යාපෘති පෙදෙසේ මෙන්ම (ව්‍යාපෘතියේ වැඩ කොටසක් සිදු වන මෙයට හරස්ව ඇති හා දෛනිකව රළ ප්‍රහාරවලට ලක් වන) රළු ගල්පර අවට වෙරළේ වාසස්ථානවලද (නැගෙනහිර සහ බටහිර) - විශේෂයෙන් ගල්පර තට්ටුවල- නිර්වෘත්තීන්ගේ ජෛව විවිධත්වය අඩු බව පෙනී ගියේය. ගල්පරවල සහ අන්තර් දම් ගල්පර ස්තරවල අයින්වල සහ බෑවුම්වල රොන්මඩ නැත හෝ ඉතා අඩු වන අතර තිබෙන මෙම රොන්මඩ ස්වල්පය මෙවන් වෙරළ පහර අධික ගල්පර පෙදෙස්වල අපේක්ෂිත පරිදි ඉතා රළුය.

250. ගල්පර අයින සහ තොටුපළට යාබදව ඇති එහි ඉහළ හා පහළ බෑවුම් දෛනික රළපහරවලට නිරාවරණය වන රළු කොරල්වලින් සමන්විත වන අතර එහි බහුල වශයෙන් කුඩා කොරල් ගල්ද ඇති නමුත් මෙයට අන්තර් උදම් ගල්පර තට්ටු පද්ධතියක් නොමැත. එවැන්නක් පෙර තිබි බෝට්ටු ප්‍රවාහනය සඳහා පසුව ඉවත් කරන ලද්දේද යන්නට ලේඛනගත සාධක හමු නොවුනු නමුත් මෙය වෙරළ ඔස්සේ දිස්වන අසාමාන්‍ය තත්වයක් නිසා මෙවැන්නක් සිදු වන්නට ඇත යැයි සැක කෙරේ. ඇගයීම් සමයෙහි සිදු කරන ලද සාගර වාසස්ථාන අධීක්ෂණයද මෙම අනුමානය සනාථ කරයි.

251. ගල්පර බෑවුම නිමවී ඇත්තේ සජීවී කොරල් සහිත මතුපිට තුනී පතුරක් සහිත රළු ගල්පර ව්‍යුහයකිනි. මෙය තිරස්ව සම්පූර්ණයෙන්ම ගල්පර මුල් කරගත් හා සෙමෙන් වෙරළට ඇදී යන රොන්මඩ සහිත මුහුදට 45 % කෝණයකින් පහත් වෙයි. සාගර ඇගයීම මත පදනම්වූ පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිපරිශ්‍රයේ අන්තර් උදම් සහ උප උදම් ගල්පර පිළිබඳ විස්තරාත්මක සංක්ෂිප්තයක් මෙම වාර්තාවේ 4.7. 2 කොටසෙහි ලබා දී ඇත **(අනුබද්ධය 05).**

252. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියසඳහා සිදු කරන ලද භූතාක්ෂණ අධ්‍යයනවල කොටසක් ලෙසින් බෝර් සිදුරු හතක් (3 ක් මුහුදේද 4 ක් අන්තර් උදම් ගල්පර තලයේද) විදින ලද අතර **(රූපසටහන4.15)** සියලුම බෝර් සිදුරු දැක්වුයේ මතුපිට අභිභවනය කරන ලිහිල් පස සහ එයින් අනතුරුව ඇති සම්පිණ්ඩිත පස් ස්තර සහ මීටර් 2.0 - 4.6 අතර ගැඹුරක තැනපත් හුණුගල් සහිත සමාන පස් ලක්ෂණය **(වගුව 4.2).** වෙනස් ස්තර තුනේ ගැඹුරෙහි සාමාන්‍යය ලිහිල් පස මීටර් 0.0 - 2.4 ලෙසින්ද සම්පිණ්ඩිත පස 2.4 - 2.2.8 ලෙසින් හුණුගල් පත්ල 2.8 - 4.6 ලෙසින්ද සටහන් වු අතර එයට අමතරව භූගත ජල මට්ටමේ ගැඹුර මිටර් 0.30 සහ 1.40 ලෙසින් සටහන් විය. (MFAD, 2018).

**රූපසටහන 4-10 පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා විදින ලද භූතාක්ෂණික බෝර් සිදුරු 7**




**වගුව 4-2 පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘති පරිශ්‍රය ඇතුලත බෝර් සිදුරුවල විස්තරය**

| | BH01 | BH02 | BH03 | BH04 | BH05 | BH06 | BH07 |
|---|---|---|---|---|---|---|---|
| මුහුදු මට්ටමේ සිට උස | +.811 | +1.040 | +1.613 | +0.516 | +1.502 | +0.799 | -0.665 |
| පසේ ගැඹුර | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| සම්පිණ්ඩිත පසේ ගැඹුර | 1.00 | 2.70 | 2.60 | 2.60 | 3.50 | 2.40 | 2.80 |
| මුහුදු පත්ලේ ගැඹුර | 3.60 | 2.00 | 4.10 | 3760 | 4.60 | 2.80 | 3.30 |
| බෝර් සිදුරේ ගැඹුර | 3.60 | 5.00 | 7.10 | 4.60 | 4.60 | 5.80 | 7.80 |
| භූගත ජල මට්ටමේ ගැඹුර | 0.30 | 0.50 | 0.30 | 1.00 | 1.40 | 2.80 | 3.30 |

## 4.5 ජල පරාමිතිය සහ ගුණාත්වය

### 4.5.1 මතුපිට ජලය සහ ජලාපවාහනය

253. යාපනයෙහි දක්නට ලැබුනු භූලක්ෂණ හා කාලගුණික තත්වය අනුව නිත්‍යව ගලා යන ගංගා ඇති හෙයින් පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියපරිශ්‍රය අවට ගංවතුරු සංසිද්ධි වාර්තා වී නොමැත. පේදුරු තුඩුවේ සිට බටහිර දෙසින් ඇති තොන්ඩමාන් ආරු සහ යාපනය නගරයේ බටහිරෙන් පිහිටි වාලුකි ආරු නම් කිමි 10 ක් පමණ දිග ගංගා ද්විත්වයමෙන්ම කුඩා දිය දහර කිහිපය පෙදෙසේ තෙත් කාලවල ජලය බැහැර කරයි. එමෙන්ම කලපුව ඇතුලත ඇති මතුපිට ජලයෙන් වැඩි කොටසක් කලපුව ලවන ජලය හෝ කිවුල් ජලයෙන් සමන්විත වන අතර පිටාර ගලන ජලය සඳහා වන රැඳුම් ස්ථාන ලෙසින් ක්‍රියා කරන්නේ මෙම කලපුවයි. එනමුත් සපිද්‍රතාවය සහ මුහුදට ආසන්න හෙයින් මෙම ජලය කිවුල් ගතියෙන්ම පවතියි.

254. විශාල වේල්ල හෝ ජලාශ නිර්මාණය වීමට හෝ දැවැන්ත ජල ස්කන්ධ රඳවා ගැනීමට සුදුසු භූමිභාගද පෙදෙසේ නැති හෙයින් පොළොවේ ගැඹුර වැඩි කිරීමට පස් ඉවත් වී වැසි කාලවල සහ එයින් පසුව කුඩා ප්‍රමාණවලින් ජලය රවා ගන්නා පොකුණු හෙවත් වැව් 600 ක් පමණ මෙහි නිර්මාණය වී තිබෙන අතර මෙය කෘෂිකාර්මික අවශ්‍යතාවයන් සඳහා යොදා ගැනේ.

255. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිපරිශ්‍රයේ සීමිත ප්‍රමාණයක් මිරිදිය ඇති නමුත් තෙත් කාලවල පෙදෙසට ජලය ලැබෙන්නේ වැසි ජල බැහැර කරන පද්ධිත ගණනාවකිනි. ව්‍යාපෘති පරිශ්‍රයට සෘජුවම ජලය ලැබෙන්නේ මොතෝදිස්ත උසස් බාලිකා විදුහලේ බටහිර මායිම ඔස්සේ පිහිටා ඇති වැසි ජල පද්ධතියක් වෙතිනි. **(රූපසටහන 4.16a)** තවත් කුඩා වැසි ජල ප්‍රවාහ දෙකක්පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියපරිශ්‍රයේ මායිම්ලට යාබදව මුහුදට බැහැර වෙයි. මෙයින් එකක් දෙවෙනි හරස් වීදියේද **(රූපසටහන 4.16b)** අනෙක සුබ්බිර්මඩම් මාළු ගොඩ බාන ස්ථානය අසලද **(රූපසටහන 4.16c)** පිළිවෙලින් ව්‍යාපෘති පරිශ්‍රයට නැගෙනහිරෙන් සහ බටහිරෙන් පිහිටා ඇත. ඉදිකිරීම් සමයෙහි ව්‍යාපෘති පරිශ්‍රයේ බටහිර ප්‍රතිසංස්කරණ ක්‍රමවේදයට පාසැලේ ජල වහන පද්ධතිය හරවා යවනු ලැබේ.

**රූපසටහන 4-11 පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘති පරිශ්‍රයේ වැසි ජලබැහැර කිරීමේ පිහිටීම**



**(a)** **(b)** **(c)**

### 4.5.2 භූගත ජලය

256. වසර පුරා පවතින මතුපිට ජල මූලාශ්‍ර නොමැති නිසා යාපනය අර්ධද්වීපයට -දිගු වියලි කාලයේ කෘෂිකර්මාන්තයටද ඇතුලත්ව- ඇති එකම ජල මූලාශ්‍රය වන්නේ භූගත ජලයයි. කාර්ස්ටිය සහ වැලිමය භූගත ජල මූලාශ්‍ර මෙහි දක්නට ඇති අතර හුණුගල් නිධි වඩා විශාල නිසා ප්‍රමාණවලින් ජලය රඳවා ගත හැකිය. මේ අනුව ප්‍රධාන ජලධාරයන් වන්නේ මෙම හුණුගල් ජලධාරය. පේදුරු තුඩුව ඇතුලත්ව යාපනය නගරයේ උතුරෙන් පිහිටා ඇති චුන්නාගම්, අපිනාමිය දිවයිනේ ඇති කයිට්ස්, යාපනය කලපුව සහ වඩමාරච්චි කලපුව අතර ඇති තේමරාච්චි සහ ඊසානදිග වෙරළේ පිහිටා ඇති වඩමරාච්චි යන පෙදෙස්වල විවිධාකාර ජලවිද්‍යා හා භූගෝලීය විද්‍යා ලක්ෂණ සහිත ජලධාර 4 ක් අර්ධද්වීප මහා භූමි ප්‍රදේශය ඇතුලත පිහිටා ඇත. (පානබොක්ක සහ පෙරේරා 2005)

257. ජලධාර මධ්‍යය වන විට ජලධාර කාචයන් වඩා ඝන වන අතර වෙරළාසන්න වන විට කිවුල හා තුනී වන නිසා පානීය ජල සැපයුම අභ්‍යන්තරයෙහි විශ්වාසජනකය. නොවැම්බර් හා දෙසැම්බර් වැසිවලින් ජලධාර පෝෂිත වන අතර පසුව වසර පුරා භාවිතාව හා ස්වාභාවික උප මතුපිට ගලනය නිසා ක්‍රමක්‍රමයෙන් හිඳී යයි. යාපනය සඳහා වන ආර්ෂික බැහැර වීම 10-20 x107 $m^3$ලෙසින් ගණනය කර ඇති අතර මෙයින් අඩක් ගෘහස්ත සහ කෘෂිකාර්මික අවශ්‍යතාවයන් සඳහා ගෙන ඉතිරිය මෝසම්

සමයෙහි මුහුදට ගලා යයි (බාලේන්ද්‍රන් සහ කණ්ඩායම 1968) යෝජිතපේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධනව්‍යාපෘතිය ඇතුලත සමුහ ළිං හෝ භූගත ජලය ලබා ගැනීම් කිසිවක් නොමැති නමුත් ව්‍යාපෘතියට දකුණෙන් සමුහ ළිඳක් පිහිටා ඇත. ($9^{0}49'40.52"$ N, $80^{0}14'8.22"$ E).

258. පානීය අවශ්‍යතාවයන් හැරෙන්නට කෘෂිකර්මාන්තය සහ ගෘහස්ත අවශ්‍යතාවයන් සඳහා පේදුරු තුඩුව පුරා භූගත ජලය උපයෝගී කරගන්නා අතර ජාතික ජලාපවහන හා ජලසම්පාදන මණ්ඩලය විසින් සපයනු ලබන නළ ජලයද මෙහි සීමිත වශයෙන් භාවිත කරනු ලැබේ. මෙයට අමතරව වැසිජලය හා බෝතල්වල ඇසිරූ ජලයද පානීය අවශ්‍යතාවයන් සඳහා යොදා ගන්නා අතර 2020 වසර වන විට ලවන රසය ඉවත් කරන ලද ජලය සැපයීමේ ව්‍යාපෘතියක් මගින් පෙදෙසට අමරත ජලය ලබා දීමට නියමිතය.

259. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියපරිශ්‍රයට **(රූපසටහන 4.17)** යාබදව ඇති නාගරික පෙදෙස්වල පිහිටි භූගත ජල ළිං හතරකින් ජල නියැදි ලබා රජයේ පිළිගැනීම ලබා ඇති පර්යේෂණාගාරයකින් ජලය සහ අපත ජලය සඳහා සම්මත ක්‍රමවේද අනුව ඒවායෙහි ගුණත්වය පරීක්ෂා කරන ලද (EML, 2018 a). අතර ළිං හතරෙන් සෑම ළිඳක් සඳහාම ජලගුණත්වයට අදාල භෞතික හා රසායනික පරාමිතිද සැලකිල්ලට ගන්නා ලදී (අදාල දත්ත සඳහා **අනුබද්ධය** 6 ට යොමුවන්න)පරීක්ෂණ අනුව මෙම ජලවල ක්ලෝරයිඩ් මට්ටම වැඩිව තිබෙන අතර ලුනු දිය හා හුණුගල් මිශ්‍ර වී ගණත්වයද වැඩි වී එහි ගුණත්වය ශ්‍රී ලංකාවේ පානීය සඳහා වන නිර්දේශවලට (SLS 614: 2013) අනුකූල නොවන බව පෙනී ගියේය. එහෙයින් මෙය මිනිස් පරිභෝජනයට නුසුදුසු බව තහවුරු විය. මෙයට අමතරව පේදුරු තුඩුවේ මනාව ක්‍රියාත්මක වන පූතික අපවහන පද්ධතියක් දක්නට නොමැති හෙයින් ජලයෙහි මළාපවහනද මුසු වී ඉහළ මට්ටමේ *ඊ.කෝලි* අන්තර්ගතව තිබෙනුද සනාථ විය.

260. 2020 යාපනය කිළිනොච්චි ජල සම්පාදන ව්‍යාපෘතිය නිම වන තෙක් පෙදෙසේ ජල අවශ්‍යතාවය ඉටු විය යුත්තේ භූගත ජල මුලාශ්‍රවලිනි. ඉදිකිරීම් කටයුතුවල ජල අවශ්‍යතාවය පළමු වසරෙහි ඉතා අවම වනු ඇත.

**රූපසටහන 4-12 මිරිදිය ජල ළිං නියැදි ස්ථාන**



### 4.5.3 මුහුදු ජලය

261. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියපරිශ්‍රයට ඉදිරියෙන් හා වෙරළාසන්න විවිධ සාගර පරිශ්‍ර තුනකින් ජල නියැදි ලබා ගැනීම මගින් මුහුදු ජලයේ ගුණත්වය පරීක්ෂා කරන ලදී. සියලුම පරිශ්‍ර සඳහා මතුපිට ජල නියැදි සටහන් කර ගන්නා ලද අතර මුහුදු ජල නියැදි පරිශ්‍ර අංක 1 මීටර් 5 ක ගැඹුරු නියැදියකින්ද යුක්ත විය **(රූපසටහන 4.18)**. නියැදි ලබා ගන්නා ලද්දේ බෝට්ටුවක් මගින් වන අතර රජයේ පිළිගැනීම ලබා ඇති පර්යේෂණාගාරයකින් ජලය සහ අපත ජලය සඳහා සම්මත ක්‍රමවේද අනුව ඒවායෙහි ගුණත්වය පරීක්ෂා කරන ලදී (EML, 2018 a). මුහුදු ජල ගුණත්වයට අදාල භෞතික හා රසායනික පරාමිති 27 ක් මෙවිට සැලකිල්ලට ගන්නා ලද අතර අදාල දත්ත අනුබද්ධය7 හි දක්වා ඇත.

262. ප්‍රතිඵල සියල්ල අනුව ඇගයීමට ලක් කරන ලද සියලුම මුහුදු ජල පරාමිති සමාන හා පොදුවේ මෙවන් වෙරළාසන්න සාගර පරිශ්‍රවලට අවේණික ප්‍රවාහ සහ කුඩා හා විශාල රළවල අභිබවනය ඇති බව පෙනී ගියේය. එමෙන්ම සාගරයට නිරාවරණය වු උච්චාවචානය සහිත ඒවා බවද පෙනී ගියේය. මතුපිටට වඩා උපස්තරයට ආසන්නව ඉහළින් අවලම්බිත ඝන ද්‍රව්‍ය නියැදි සඳහා සටහන් කරගන්නා ලදී. බොරතෙල් රසායන හෝ ඉහළ මටට්මේ නයිට්‍රජන් සංයෝග දක්නට නොලැබුනු අතර මෙය පරිශ්‍රයේ ජල සංසරණය සහ හැසිරීම හා පැතිරීම සනාථ කරයි. පෙදෙසේ සමුහයේ මළාපහවන මුහුදුට බැහැර කිරීම එහි ඇති *ඊකෝලි* අන්තර්ගතය තහවුරු කරයි. දෛනික රළ සහ ප්‍රවාහ අනුපාතික නිසා මෙය දිය වී යන නමුත් එසේ නොමවන්නට මෙම පෙදෙසට එය ඇතුල් වන මට්ටම් වඩා විශාල විය හැකිය. මළාපවහන මුහුදට බැහැර කිරීමේ ගැළුවට විසඳුම් සෙවීම අවශ්‍ය වන්නා සේම පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතික්‍රියාකාරකම්ද එමගින් සිදු කරන එවන් බැහැර කිරීම් දෙස් විදෙස් නිර්දේශවලට අනුකූල වීම තහවුරු කර ගත යුතුය.

**රූපසටහන 4-13 පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය අවට මුහුදු ජල නියැදි ස්ථාන 3**



## 4.6 වාතය / ශබ්ද පරාමිති සහ ගුණත්වය

### 4.6.1 පරිමණ්ඩිත වායු ගුණත්වය

263. අප්‍රේල් 2018පේදුරුතුඩුව නගරයට යාබදව (වගුව 4.3)පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියපරිශ්‍රයට අවට වෙනස් ස්ථාන 4 ක පරිමණ්ඩිත වායු ගුණත්ව පරාමිති පරීක්ෂා කරන ලදී **(රූපසටහන 4.19)**.

**වගුව 4-3 වායු ගුණත්ව නියැදි පරිශ්‍රවල පිහිටීම**

| යොමු අංකය | GPS | පිහිටීමේ විස්තරය |
|---|---|---|
| L1 | 90.82’8 N 800.23’8 E | දෙවෙනි හරස් වීදිය ආරම්භයෙහි |
| L2 | 90.82’8 N 800.23’6 E | ධීවර වරාය පෙදෙස මධ්‍යයේ ධීවර වරාය ධීවර කාර්යාලය අසල |
| L3 | 90.82’6 N 800.23’6 E | බයිසිකල් සර්විස් කරන ස්ථානය අසල ධීවර වරාය මැද සිට මීටර් 300 ක් ඈතින් |
| L4 | 90.82’9 N 800.23’2 E | මෙතෝදිස්ත උසස් බාලිකා විද්‍යාලය අසල |

**රූපසටහන 4-14 වායු ගුණත්ව නියැදි පරිශ්‍රවල පිහිටීම්**




264. සම්මත වායු ගුණත්ව රැස්කිරීමේ උපකරණ භාවිත කර පැය 24 කාලයක් තුල නියැදි ස්ථාන 4 කින් දත්ත රැස් කරන ලද අතර (EML, 2018c). පසුව ශ්‍රී ලංකාවේ ජාතික පරිසර පනත යටතේ නිර්දේශිත උපරිම අනුමත මට්ටම් අනුව සියලුම දත්ත සසඳන ලදී. අදාල දත්ත වගුව 4.4 ලබා දී ඇත.

වගුව 4-4 නියැදිකරණ පරිශ්‍ර හතරහි රැස් කරන ලද පරිමණ්ඩිත වායු ගුණත්ව දත්ත සහ රජය අනුමත කර ඇති උපරිම මට්ටම්

| දූෂක | L1 | L2 | L3 | L4 | අනුමත උපරිම මට්ටම් (µg/m3) |
|---|---|---|---|---|---|
| ප්‍රමාණය 10 µg ට අඩු අංශුමය ද්‍රව්‍ය (PM10) | 12.9 | 18.4 | 8.2 | 12.2 | 100 |
| ප්‍රමාණය 2.5 µg ට අඩු අංශුමය (PM2.5) | 5.3 | 12.2 | 5.09 | 8.4 | 50 |
| නයිට්‍රජන් ඩයොක්සයිඩ් (NO2) | 11 | 16 | 28 | 8.0 | 100 |
| සල්ෆර් ඩයොක්සයිඩ් (SO2) | 22 | 8 | 18 | <25 | 80 |
| ඕසෝන් (O3) | <20 | <20 | <20 | <20 | 200 |
| කාබන් මොනොක්සයිඩ් (CO) | <500 | <500 | 500 | <500 | 10,000 |

265. ස්ථාන හතරෙහිම රැස් කරන ලද දත්ත විශ්ලේෂනය කිරීමේදී පරිමණ්ඩිත වාතය තිබෙන්නේ අනුමත උපරිම සීමා ඇතුලත බව පෙනී ගියේය. ඒ අනුව පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිපරිශ්‍රයට යාබදව දැනට නිර්දේශවලට අනුකූලන නොවන වායු මෝචන මූලාශ්‍ර කිසිවක් නැති බව සනාථ විය.

### 4.6.2 පරිමණ්ඩිත ශබ්ද ගුණත්වය

266. අප්‍රේල් 2018පේදුරුතුඩුව නගරයට යාබදව (**වගුව 4.5**)පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියපරිශ්‍රයට අවට වෙනස් ස්ථාන 4 ක පැරිමණ්ඩිත ශබ්ද ගුණත්ව පරාමිති පරීක්ෂා කරන ලදී (**රූපසටහන 4.20**).

**වගුව 4-5 ශබ්ද ගුණත්ව නියැදි පරිශ්‍රවල පිහිටීම**

| යොමු අංකය | GPS | පිහිටීමේ විස්තරය |
|---|---|---|
| N1 | 90.82’8 N 800.23’9 E | දෙවෙනි සරස් වීදිය අසල |
| N2 | 90.82’9 N 800.23’4 E | හමුදා සුබසාධන කාර්යාලය අසල |
| N3 | 90.82’9 N 800.23’2 E | මෙතෝදිස්ත උසස් බාලිකා විද්‍යාලය අසල |

රූපසටහන 4-15 ශබ්ද ගුණත්ව නියැදි පරීක්‍ෂාවල පිහිටීම්




267. සම්මත ධ්වනි ගුණත්ව රැස්කිරීමේ උපකරණ භාවිත කර පැය 24 කාලයක් තුළ නියැදි ස්ථාන 4 කින් දත්ත රැස් කරන ලද අතර (EML, 2018d). පසුව ශ්‍රී ලංකාවේ ජාතික පරිසර පනත යටතේ නගර සභා (රෙකුලාසි අංක2 ගැසට් නිවේදන අංක 924/12/1996) පෙදෙස් සඳහා නිර්දේශිත උපරිම අනුමත මට්ටම් අනුව සියලුම දත්ත සසඳන ලදී. මෙම උපරිම මට්ටම් වන්නේ දිවා කාලයෙහි 63 dB (A) සහ රාත්‍රී කාලයෙහි 50 dB (A) වෙයි. අදාල දත්ත වගුව 4.6 හි ලබා දී ඇත.

**වගුව 4-6 නියැදිකරණ පරීක්‍ෂා හතරරෙහි රැස් කරන ලද පරිමණ්ඩිත ශබ්ද ගුණත්ව දත්ත සහ රජය අනුමත කර ඇති උපරිම මට්ටම්**

| පරීක්‍ෂා අංකය | දිවාකාලය | | අනුමත ශබ්ද මට්ටම් | රාත්‍රී කාලය | | අනුමත ශබ්ද මට්ටම් |
|---|---|---|---|---|---|---|
| | **පරිමණ්ඩිත**LAeq(t) dB | **පසුබිම්** LAeq(t) dB | | **පරිමණ්ඩිත**LAeq(t) dB | **පසුබිම්**LAeq(t) dB | |
| N1 | 56 | 52 | 63 dB | 51 | 50 | 50 dB |
| N2 | 62 | 57 | | 50 | 49 | |
| N3 | 60 | 57 | | 53 | 52 | |
| N4 | 64 | 54 | | 57 | 50 | |

268. නියැදිකරණ ස්ථාන හතරෙන්ම ලබා ගත් දත්ත විශ්ලේෂණය කිරීමේදී පරිමණ්ඩිත සහ පසුබිම් ශබ්ද මට්ටම නාගරික පෙදෙස් සඳහා වන මධ්‍යම ශබ්ද මට්ටමේ උපරිමයට ළඟා වන බව පෙනී ගියේය. එනමුත් රාත්‍රී කාලයෙහි පරිමණ්ඩිත සහ පසුබිම් ශබ්ද මට්ටම දෙකම සටහන් වුයේ නාගරික පෙදෙස් සඳහා නිර්දේශිත උපරිමයටත් වඩා මදක් වැඩියෙනි. පාසැල් මෙන්ම පරිපාලන ආයතනවල ගොඩනැගිලි කිහිපයක් ව්‍යාපෘතියේ මීටර් 500 විෂ්කම්භය ඇතුලත පිහිටා ඇත. මෙතෝදිස්ත උසස් බාලිකා විද්‍යාලය මීටර් 100 ක් ඇතුලත තිබෙන අතර එය අයත් වන්නේ ජාතික පාරිසරික පනත යටතේ නිශ්ශබ්ද කලාපයක් යැයි වර්ගීකරණය කර ඇති පෙදෙසකය. ඒ අනුව දිවා කාලය සහ රාත්‍රී කාලය සඳහා වන උපරිම ශබ්ද මට්ටම් වන්නේ පිළිවෙලින් 50 dB(A) සහ 45 dB(A) වේ. කරුණු ඒ අනුව පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියසහ බාලිකා විද්‍යාලයට යාබද පරාසවල ශබ්ද මට්ටම නිර්දේශවලට අනුකූල වන්නේ නැති අතර මෙයට හේතුව බස් රථ සහ විශාල ලොරිවල ශබ්දයයි.

## 4.7 ජෛව විද්‍යාත්මක සම්පත්

269. ශ්‍රී ලංකාව වනාහී ආසියාවේ වැඩිම ශාක, උභයචර, උරග සහ ක්ෂීරපායී විශේෂ ඝනත්වය තිබෙන රටක් වන හෙයින් දෙස් විදෙස් කෝණවලින් ජෛව විවිධත්වය යනු අතිශය වැදගත් රටක් වෙයි. (ස්වාභාව ධර්මය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීම සඳහා වන සංගමය - IUCN, 2012)

### 4.7.1 සාගර සහ වෙරළබඩ ගල්පර වාසස්ථාන ශාක සහ ජීවී

270. ශ්‍රී ලංකාවේ විශාලත්වය වර්ග කිමී 65,000 ක් පමණ වන අතර දිවයින වටා වෙරළ තීරයේ දිග කිමී 1585 කි. මෙයින් වැල්ල හා වැලිකඳු ප්‍රදේශය කිමී 300 ක් වන අතර සාගර ප්‍රදේශය වර්ග කිමී 517,000 කි. මෙයට වර්ග කිමී 21,500 ක රාෂ්ට්‍රීය සමුද්‍ර තීරයක්ද ඇතුලත් වෙයි. තවද වර්ග කිමී 27,800 ක් ආවරණය කරන හා සාමාන්‍යය කිමී 22 ක් වන පටු මහද්වීපික තටාකයක්ද දිවයිනට අයත් වන අතර මෙහි ගැඹුරේ සාමන්‍යය කිමී 66 කි. මෙයට බාධක ගැටිපර සහ අක්වෙරළ පද්ධතිද ඇතුලත් වන අතර සියලුම පද්ධති පිහිටා ඇත්තේ වෙරළේ සිට කිමී 40 ක් ඇතුලතය.

271. උතුරු පළාතේ වෙරළබඩ හා සාගර පරිසරයට දේශයේ වෙරළබඩ පරිසර පද්ධතියේ විශාල කොටසක් අයත් වන අතර මෙයට කොරල් ගල්පර, සාගර හා කිවුල් ජලය මිරිදිය කලපු, කඩොලාන, කැලෑ, මුහුදු, තණබිම්, ලවන ලදු කැලෑ සහ දියදහරා ආදියද ඇතුලත් වෙයි. මෙම ලක්ෂණ නිසා මෙම පෙදෙසට දිවයිනේ අන් පෙදෙස්වල දක්නට නොමැති වෙරළබඩ ජෛව විවධත්වයක් සහ සුවිශේෂී සාගර පරිසර සෞන්දර්ය්‍යක් හිමි කර දී ඇත.

272. ශ්‍රී ලංකාවේ ගල්පර පද්ධතිය 1) සජීවී කොරල් සහ චූර්ණමය සංචරක සහිත නියම කොරල් වාසස්ථාන 2) වැලිගල් සහ 3) පාෂාණමය ගල්පර වාසස්ථාන ලෙසින් ප්‍රධාන වාසස්ථාන තුනකට වර්ගීකරණය කර ඇත.

273. ශ්‍රී ලංකාව වටා ඇති කොරල් ගල්පැර ප්‍රධාන වශයෙන් බලපෑම් ලබන්නේ ජලරෝධයට සැලකිය යුතු බලපෑමක් ඇති කරන දේශයේ මෝසම් කාලගුණ රටාවලින් සහ වෙරළබඩ ජලයට ලැබෙන මිරිදිය ආදියෙනි. එහි ප්‍රතිඵලයක් ලෙසින් උතුරු හා නැගෙනහිර පළාත්වල දක්නට ලැබෙන අර්ධ ශුෂ්ක කාලගුණ සහිත පහළ රොන්මඩ මට්ටම් ඇති පෙදෙස්වලට පුළුල් කොරල් ගල්පර වාසස්ථාන සීමා වී ඇත. මේ අතර නිරිතදිග වෙරළ ප්‍රදේශයේ මොසම් සමයෙහි ලැබෙන අධික වර්ෂාව නිසා සහ එහි ප්‍රතිඵලයක් ලෙසින් ඇති වන රොන්මඩ සහ බොර බාවය නිසා කොරල් ගල්පර වර්ධනය වීම ඉතා මන්දඝාමීය.

274. ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ ගල්පර ඍජුවම වෙරළ තීරයෙන් අවසන් වන උප උදම් කලපු සහ අන්තර් උදම් ගල්පරවලින් ඍජුව වෙරළෙන් අවසන් වන අන්තර් උදම් ගැටිපර පද්ධතිවලින් (ගැටිපර සිදු වන්නේ දිවයිනේ වෙරළ තීරයේ සියයට 2 ක පමණි) සමන්විත වන අතර අන්තර් උදම් ගල්පර කලපුවල හා ගැටිපරවල පළල දිවයින වටා වෙනස් වෙයි. වැල්ලෙන් යුත් ගල්පර දිවයින පුරා ඇත. ජලය අඩු වන විට නිරාවරණය වන ගැටිපර පද්ධතියක් ජේදරු තුඩුවෙහි තිබෙන අතර මෙය ඍජුවම වෙරළ තීරයෙන් අවසන් වෙයි.

275. වැලිගල් සහ පාෂාණමය වාසස්ථාන දිවයින පුරා පුළුල්ව තිබෙන අතර මෙය වෙරළෙහි හා ඔබ්බෙන් මීටර් 50ට වඩා ගැඹුරින් දැකිය හැකිය. ඝන මෙන්ම සිනිඳු කොරල්වලින් මෙම පාරිසරික පද්ධතිය සමන්විත වන නමුත් ඒවායෙහි ප්‍රතිශතය පොදුවේ 10 % ක ආවරණයට වඩා අඩුය. කෙසේ වුවද ජේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියපරිශ්‍රය අවට මෙම පද්ධතිය දක්නට නැත.

276. ශ්‍රී ලංකාවට ඇත්තේ විවෘත මසුන් ඇල්ලීමේ ප්‍රතිපත්තියක් වන අතර මෙම සාගර ප්‍රතිපත්ති අනුව දිවයිනේ ඕනෑම කෙනෙකුට ඕනෑම වෙරළක මසුන් ඇල්ලිය හැකිය. මෙයට අදාල නීති රීතින් නියාමනය කරනු ලබන්නේ ජාතික සහ පළාත් පාලනයන් මගින් වන නමුත් ඓතිහාසිකව ගත්කල ඒ ඒ සමූහයන් පෙදෙසේ සාගර සම්පත් ලබා ගැනීම සම්බන්ධ ඇතැම් ලිඛිත නොවන සම්ප්‍රදායයන් අනුගමනය කරති. මෙය දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට වෙනස් වෙයි.

277. උතුරු පළාතේ ධීවර කලාපයට පුළුල් කිවුල් ජලයෙන් යුත් වෙරළාසන්න කලපු පද්ධති,ගල්පර හා කලපු ඇතුලත්ව නොගැඹුරු වෙරළේ ගැටිපර හෝ අන්තර් උදම් කලාප,ගල්පර කලාපයේ ඈදුරු හෝ කැනියම්වලින් සමන්විත ගල්පර බෑවුම් සහිත උප උදම් කලාප (මීටර් 25 ක ගැඹුරට)ගැඹුරු ගල්පර සහ මීටර් 25 ට වඩා අඩු හා මහද්වීපික තටාකයේ වෙරළෙන් සෑහෙන දුරක් විහිදෙන වෙරළාසන්න ගැඹුරු ජල පෙදෙස්සහ විවෘත සාගරය හෙවත් සාගරමය ධීවර කටයුතු ආදිය මෙම පෙදෙස් වාසීන්ට කුඩා පරිමාණ ධීවර කර්මාන්තය සඳහා අතිශය වැදගත්ය. පළමු කලාප හතර සාමාන්‍යයෙන් වෙරළාසන්න මසුන් ඇල්ලීමෙහි කොටසක් ලෙසින් සලකනු ලබන අතර අනෙක අක්වෙරළ මසුන් ඇල්ලීම යැයි හඳුන්වනු ලැබේ. කෙලවල්ලන් ඇල්ලීම මුල්කර ගත් සාගර සම්පත් වෙත යොමුවුනු බලපත්‍ර ලත් පෙදෙසේ වාණිජමය පරිමාණ ධීවර කර්මාන්තය සඳහා වෙරළේ සිට නාවික සැතපුම් 2 සිට 200 ක් දක්වා වන සුවිශේෂී ආර්ථික කලාපය (EEZ) දක්වා යාමට අවසර දෙයි.

278. උතුරු පළාතේ සාගර පද්ධතිය විශේෂයෙන් අන්තර උදම් උප උදම් වෙළාසන්න ගල්පර සහ අක්වෙරළ මහද්වීපික තටාකය යන ඉසව් හතර කුඩා පරිමාණ ජීවනෝපා සහ වාණිජමය ක්‍රියාකාරකම් සඳහා විවිධාකර සාම්ප්‍රදායික ධීවර මෙවලම් හා උපකරණ යොදා ගනිමින් පුළුල් වශයෙන් ඝවේෂණය කරමින් පවතියි.

279. ප්‍රාරම්භක පාරිසරික පරීක්ෂණ වාර්තාවේ කොටසක් හැටියට පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියට බලපෑම් ඇති කරන පෙදෙස් මුල් කර ගෙන විස්තරාත්මක සාගර මුලික රේඛා සමීක්ෂණයක් දියත් කරන ලද අතර මෙම පුර්ණ සාගර පරිසර ඇගයීම් වාර්තාව අනුබද්ධය 5 හි ඇත හා එහි සංක්ෂේපය 4.7.2 කොටසෙහි දක්වා ඇත. පසුගිය දශක තුනක පමණ කාලයක මෙම පෙදෙසේ පැවති ගැටවම්කාරී තත්වය නිසා සාගර හා වෙරළබඩ ජෛව විද්‍යාත්මක පාරිසරික සහ සම්පත් මුල් කර ගත් මුලික රේඛා දත්තවල හිගයක් පවතින හෙයින් වත්මන් අවශ්‍යතාවය සඳහා දත්ත සැසඳීම ඉතා අසීරුය.

280. **කොරල් පර:** ආසියානු කලාපය තුල ශ්‍රී ලංකාවේ ශාක ජීව විවිධත්වය උසස් තැනක් ගන්නා අතර දිවයිනේ උතුරේ ඇති විශාලතම ගල්පර වාසස්ථානයද සහිතව ගණ වර්ග 68 ක රළු කොරල් විශේෂ 183 ක් මෙතෙක් හඳුනා ඇත. මෙම ගල්පර පද්ධතිය ජලජ ජීවී විශේෂ 606 කට නිවහන වෙයි. කොරල් පර දිවයිනේ වෙරළ තීරයේ සහ අක් වෙරළේ මෙන්ම නිත්‍ය ලවනතාවයක් ඇති පැහැදිලි හා උණුසුම්, නොගැඹුරු වෙරළ තීරයේ ඇති අතර මෙය ප්‍රධාන වශයෙන් ගැටිපර වේ. කොරල් පර ජලජ ජිවින් හා කබලු මසුන් බොහෝමයකට ආහාර, වාසස්ථාන, පැටවි සඳහා වන නිවහන ආදිය ලබා දෙන අතර ස්වාභාවික දියකඩන ලෙස ක්‍රියාකරමින් වෙරළබඩ පෙදෙස ආරක්ෂා කිරීමේ මෙහෙයක්ද කොරල්වලින් ඉටු වෙයි. තවද මිනිසුන්ගේ ආහාර අවශ්‍යතාවයන් සඳහාද ජීවනෝපායටද කොරල් ප්‍රයෝජනවත්ය.

281. **සමුද්‍ර ක්ෂිරපායීන්:** ශ්‍රී ලංකාවේ සමුද්‍ර කලාපයේ සටහන් වුනු කබලු මතශ්‍යන් විශේෂ 27 කින් තුනක් (3) නිල් තල්මහා (*Balaenoptera musculus*) වරල් තල්මහා ***(Finless physalus)*** සහ වරල් නැති මුදු ඌරා*Neophocaenaphocaenoides*), අනතුරාසන්න ලෙසින්ද දෙකක් (2) ස්පර්ම් තල්මහා***(Physeter breviceps)***සහ ඉන්දු ශාන්තිකර කුදු ඩොල්ෆින් ***(Souse chinessis)*** උපද්‍රවයට ලක් විය හැකි ලෙසින්ද ඉතිරිය අවදානම අඩු (7ක්) හෝ දත්ත අප්‍රමාණවත් (16) ලෙසින් සටහන් වී ඇත. (ස්වාභාව ධර්මය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීම සඳහා වන සංගමය - IUCN, 2006 සහ 2007).

282. යාපනයේ වෙරළ තීරයේ හෝ විශේෂයෙන් පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියඅවට තල්මසුන්ට හෝ කුඩා ප්‍රමාණයේ කබලු මසුන් බොහෝ වර්ගයකට සුදුසු වාසස්ථාන දක්නට නොමැති නමුත් ව්‍යාපෘති පරිශ්‍රයට වෙරළ තීරය ප්‍රිය කරන කුඩා ජංගම ඩොල්ෆින් මසුන් ආකශ්‍රනය වී යාබදව ඇති ජලය ඔස්සේ ඇතුල් විය හැකිය. එනමුත් පෙදෙසේ මතශ්‍ය ජනගහණය සඳහා වන ලිපිලේඛන නැති හෙයින් පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියේ කාර්ය පරාසය නිසා මෙම මසුන්ට බලපෑම් ඇති වන්නේ නැත.

283. **ඩුගොං:** මීටර් 3 ක් දිග හා කිලෝ ග්‍රෑම් 400 ක් පමණ බරැති මෙම සමුද්‍ර ක්ෂිපායී විශේෂය ඉතා දුරට ගමන් කළ හැකි හා සිය මුලු ජීවිතයම සාගරයේ ගතකළ හැකි මතශ්‍යයෙක් වන අතර බහුල වශයෙන් වාසය කරන්නේ සාගරයේ නොගැඹුරු තැන්වලය. මුහුදු තණ පමණක් අනුභව කරන මුළුමනින්ම ශාක භක්ෂිකයෙකු වන මෙම ජලජ ජවි විශේෂයේ පැවැත්මට *තර්ජනයට ලක්ව ඇත* ලෙසින් සටහන් වී ඇති අතර (ස්වාභාව ධර්මය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීම සඳහා වන සංගමය -IUCN, 2012). වැඩියෙන්ම ගැවසෙන්නේ මුහුදු තණ ඇති වාසස්ථානවලය. මෙම ජීවී විශේෂයේ සංඛ්‍යාව පසුගිය සියවසෙහි පටන් සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වී ඇති අතර මුලින්ම මෙම මසුන් දක්නට ලැබුනේ පෝක් සමුද්‍ර සන්ධියේ නොගැඹුරු තැන්වල, ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර මන්නාරම් වංකය ඇතුලතය. පෙර කලෙක සම, තෙල් සහ මාංශ වෙනුවෙන් මෙම පෙදෙසේ මසුන් මරන ලදී.

284. යාපනයේ උතුරු වෙරළ තීරය සහ විශේෂයෙන් පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘති පරිශ්‍රය අවට ඩුගොං මසුන් යැපෙන මුහුදු තණකොල නොමැති හෙයින් මෙම මසුන් මෙහි ගැවසෙන්නේ නැති නමුත් තනි ඩුගොං මසුන් හෝ එම මතශ්‍ය පවුල්පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියපරිශ්‍රයට යාබද ජල මාර්ගයෙන් ඇතුල් වීමේ ශාක්‍යතාවය මුළුමනින්ම බැහැර කළ හැක්කක් නොවේ. එසේ පැමිණියද එය සංක්‍රමණ සම්ප්‍රාප්තයක් පමණක් වනු ඇති බැවින් ව්‍යාපෘතියේ කාරිය පරාසය නිසා මෙම මතශ්‍ය විශේෂයට හානි ඇති වන්නේ නැත.

285. **කැස්බෑවුන්:** *ගුඩ්ඩයා*(*Caretta caretta*), *කොළ කැස්බෑවා* (*Chelonia mydas*), *හෝක්ස්බිල්* (*Eretmochelys imbricata*), *ඔලිව් රිඩ්ලි* (*Lepidochelysolivacea*), සහ *ලෙදර්බැක්* (*Dermochelys coriacea*) යන පස් වැදෑරුම් මුහුදු කැබෑවුන් ශ්‍රී ලංකාව අවට මුහුදේ ඇති අතර මේ සියල්ල තර්ජනයට ලකුවුන විශේෂ

ලෙසින්ම ස්වාභාව ධර්මය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීම සඳහා වන සංගමයේ රතු ලැයිස්තුවේ සටහන් වී ඇත. මෙයින් දෙකක් (*හෝක්ස්බිල්සහ ලෙදරබැක්*)අවධි ලෙසින් අනතුරාසන්න වී ඇති අතර ඉතිරි තුන (*ගුඩ්ඩයා*, *කොළ කැස්බෑවා* සහ *ඔලිව් රිඩ්ලි*) උපද්‍රවයට ආසන්න ලෙසින් සටහන් වී ඇත (ස්වාභාව ධර්මය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීම සඳහා වන සංගමය -IUCN, 2012).

286. සියලුම ජීවී විශේෂ ශ්‍රී ලංකාවේ ලගින බව සටහන් ඇති නමුත් උතුරු පළාතේ ලගින බවක් සඳහන් වී නොමැත. ගුඩ්ඩයා සහ හෝක්ස්බිල් විශේෂ සඳහා වන පාරිසරික වාසස්ථාන සහ ආහාර මූලාශ්‍ර පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිපරිශ්‍රයට ආසන්නව යාපනයේ තිබෙන නමුත් මෙම පෙදෙසේ උන් ආහාර ගන්නා බවක් සඳහන් වී නොමැත. එසේම මෙම කැස්බෑ ජීවී විශේෂ පහෙන් හුදෙකලා කැස්බෑවුන් පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිපරිශ්‍රය අවට ස්ථාන හරහා සංක්‍රමිකයන් ලෙසින් මුහුදට යාමේ ශාක්‍යතාවයක් ඇත.

287. **කිඹුලන්**: පුනීලමෝය (*Crocodylusporosus*) සහ වගුරුබිම් (*C. palustris*) යන කිඹුලන් විශේෂ දෙකක් ශ්‍රී ලංකාවේ තිබෙන අතර මේ දෙකම තර්ජනයට ලක්වුනු ජීවීන් යැයි ස්වාභාව ධර්මය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීම සඳහා වන සංගමයරතු ලැයිස්තුවේ සඳහන් වී ඇත. පළමුවැන්න අඩු අවදානම් හා දෙවැන්න උපද්‍රවාසන්න යැයි වර්ගීකරණය වී ඇති අතර ශ්‍රී ලංකාවේ සංරක්ෂණය කරනු ලබන විශේෂ වේ. මෙම ජීවීන් දෙවර්ගයේම විශාල සතුන් උතුරු පළාතේ ගංගා, තෙත් බිම්, කලපු, වෙරළාසන්න පෙදෙස් වැනි පුනීලමෝය වාසස්ථානවල දැකිය හැකි අතර කුඩා එවුන් වැඩියෙන්ම වාසය කරන්නේ තෙත් බිම්වල, මිරිදිය සහ කිවුල් කලපුවලය. .

288. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියපරිශ්‍රයට ආසන්නව ඇති උතුරු වෙරළබඩ පෙදෙසේ කිඹුලන්ට සුදුසු ගංගා හෝ වෙරළබඩ තෙත් හෝ වගුරුබිම්වලට සෘජු ප්‍රවේශය නොමැති නමුත් හුදෙකලා පුනීලමෝය කිඹුලන් පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියපරිශ්‍රය අසලින් සංක්‍රමිකයන් ලෙසින් යා හැකි ශාක්‍යතාවය -විරල වුවත්- ඇත. ඇගයීම් සමයෙහි ලබා ගත් වාචික තොරතුරු අනුව මෙවන්නක් මෑතක සිදු වු බවක් තහවුරු වුයේ නැති හෙයින් පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියේ කාර්‍ය පරාසය නිසා කිඹුලන්ට බලපෑම් ඇති විය නොහැක. එමෙන්ම මිනිසුන්ට මෙම සතුන් නිසා ඇති විය හැකි ආරක්ෂක තර්ජනද ඉතා අවමය.

289. **කඩොලාන**: ලුණුවලට හා ගංවතුරට ඔරොත්තු දෙන දැවමය පඳුරක් වන කඩොලාන ශාකය පුනීල මෝයවල වෙරළ අද්දර අන්තර උදම් හා කලපුවල දැකිය හැකි අතර මෙය වෙරළබඩ ජෛව විද්‍යාත්මක විවිධත්වයෙහි මෙන්ම බාදනය පාලනය කිරීමේ හා දූපත් ආරක්ෂාවට වැදගත් භූමිකාවකින් ක්‍රියා කරයි.

290. ගණ 14 ක් ඇතුලත තත්‍ය කඩොලාන විශේෂ 21 ක් ශ්‍රී ලංකාවේ සටහන් වී ඇති අතර මෙය හෙක් 10000 ක පෙදසෙක් ආවරණය කරයි (ස්වාභාව ධර්මය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීම සඳහා වන සංගමය -IUCN, 2012). මෙයට අමතරව දිවයින පුරා තවත් කඩොලාන වර්ග ගණනාවක්ම ලංකාවේ ඇත. තත්‍ය කඩොලාන විශේෂ අතුරින් දෙකක් ed (*Ceriopsdecandra*, *Lumnitzeralittorea*) අවධි ලෙස අනතුරාසන්න යැයි රතු ලැයිස්තුවේ සටහන් වී ඇති අතර තවත් තුනක් (*Bruguiera cylindrical*, *Sonneratia alba*සහ*Xylocarpusgranatum*) තර්ජනයට ලක්ව ඇත යැයි වර්ගීකරණය කර ඇත. එමෙන්ම තවත් කඩොලාන විශේෂ පහක් (*Bruguieragymnorrhiza*, *B. sexangula*, *Nypafruiticans*, *Sapiumindicum*, *Scyphiphorahydrophyllacea*) උපද්‍රවාසන්න යැයිද ඉතිරිය (5) අවම අවදානය සහිත හෝ (6) අප්‍රමාණවත් දත්ත යැයි සටහන් වී ඇත.

291. උතුරු පළාතට නිශ්චිත කඩොලාන ලැයිස්තුවක් නොමැති නමුත් මෙහි දිස්ත්‍රික්ක හතරෙහිම කඩොලාන දක්නට ඇති අතර (වයඹ හා උතුරු වෙරළෙහි ඉතා සීමිතය) පඳුරුවල සංඛ්‍යාව හා ආවරණය අතින් වැඩියෙන්ම කඩොලාන දක්නට ඇත්තේ දූපත් ඇතුලු ඊසාන දිග කලපුවල හා වෙරළබඩය. ආරක්ෂක හේතූන් මත විශාල භූමි ප්‍රදේශයක කඩොලාන ඉවත් කරන ලද බව දැන ගන්නට ඇත.

292. ප්‍රධාන වශයෙන් යාපනය දිස්ත්‍රික්කයේ කඩොලාන ඇත්තේ මන්දත්තීවු දූපත කයිට්ස් දූපත උප්පාරු කලපුව සහ චාලෙයි කලපුව ඇතුලත් දූපත්වලය. මෙහි වැඩියෙන්ම ඇති කඩොලාන වර්ග වන්නේ *Avicennia marina*සහ*Rhizophora mucronata*යන විශේෂයි.

293. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියඅවට කඩොලාන දක්නට නොමැති හෙයින්ව්‍යාපෘතියේ කාරිය පරාසය නිසා මෙම කඩොලාන විශේෂයන්ට හානි ඇති වන්නේ නැත.

294. **මුහුදු තෘණ:** දෙනිබිම් යැයිද හඳුන්වනු ලබන මුහුදු තෘණබිම් ශ්‍රී ලංකාවේ වෙරළබඩ ජෛව විවිධත්වයට අතිශය වැදගත් සාධකයක් මෙන්ම *Chelonia mydas*, *Dugong dugon*වැනි තර්ජනයට ලක්වුනු කැස්බෑ විශේෂවලට ආහාර මූලාශ්‍ර ලෙසින් සමුද්‍ර පරිසරයේ පැවැත්මට අත්‍යවශ්‍ය සංරචකයක්ද වෙයි. පුනීලමෝය සහ සමුද්‍රමය වාතාවරණවල සිහින් වැල්ලේ ගැඹුරට විහිදුනු මුල් සහිතව වැඩෙන මුහුදු තණ අන්තර් උදම් කලාපයේ සිට උප උදම් කලාප දක්වා කඩොලාන වෙරළ තීර ඔස්සේ පුනීල මෝය නොගැඹුරු ඉවුරු කොරල් පර අන්තර් පර සහ දූපත්වල වැවෙයි. දීප ව්‍යාප්තව ගත් කල උතුරේ ඇති නොගැඹුරු සමුද්‍ර කලපු සහ අන්තර් උදම් පරවල මුහුදු තණ වැඩියෙන්ම දක්නට ඇත. මේ දක්වා මුහුදු තණ විශේෂ 14 ක් හඳුනා ගෙන ඇති අතර එයින් කිසිවක්පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිපරිශ්‍රය අවට නොදක්නා ලදී.

### 4.7.2 සමුද්‍ර ඇගයීම

295. ව්‍යාපෘතියේ උපදේශකයන් විසින් මාර්තු 2018 ව්‍යපෘති පරිශ්‍රයේ අන්තර් සහ උප උදම් සමුද්‍ර පාරිසරික පද්ධතිය සුවිශේෂී වාසස්ථාන සහ සම්පත් සඳහා විස්තරාත්මක සහ කඩිනම් ඇගයීමක් සිදු කරන ලද අතර නිදහස් පිහිනුම මෙන්ම ස්කුබා කිමිදුම් උපකරණද මෙවිට භාවිත කරන ලදී.

296. මෙම ඇගයීම "පේදුරු තුඩුව සමුද්‍ර පරිසර ඇගයීම" යන මැයෙන් වෙනම වාර්තා කර **(අනුබද්ධය 5)** ඇති අතර මෙම තොරතුරු මගින් ව්‍යාපෘතියේ ඉදිකිරීම් සහ මෙහෙයුම් අදියර හා බැඳි මුඛ්‍ය බලපෑම් හඳුනා ගන්නා ලදී. මෙය ව්‍යාපෘතියේ පරිසර කළමනාකරණ සැලැස්මෙහිසාකච්ඡා කර ඇත.

297. මීටර් 30 x 2 ප්‍රමාණයේ ගල්පර 15 ක (අන්තර් උදම් 5 ක් සහ උප උදම් 10 ක්) අනුච්ඡේද යෝජිත ව්‍යාපෘති පරිශ්‍රයට යාබද පෙදෙසින් සහ පාලන පරිශ්‍රයේ නැගෙනහිර සහ බටහිර අන්තවලින් සහ දැනට පේදුරු තුඩුව ධීවර වරාය ඇති ස්ථානය ළඟින්ම ඇති ස්ථානවලින් ගෙන වෙන් වෙන් වශයෙන් ඇගයීමට ලක් කර නිතලවාසී සම්පත් හා බැඳි නිතලවාසී වාසස්ථාන හඳුනා ගන්නා ලදී **(රූපසටහන 4.20).** සියලුම පරිශ්‍ර තුලින් මෙන්ම නිතලවාසී සහ සාමුද්‍ර ජංගම සම්පත් සහිතව පෙදෙසින් ලබා ගන්නා මත්ස්‍ය අස්වනු පිළිබඳ ධීවරයන් සමග සම්මුඛ සාකච්ඡා පැවැත්වීම හරහා තොරතුරු රැස් කරන ලද අතර මෙයට ඡායාරූප සහ වීඩියෝ දසුන්ද එක් කරන ලදී.

298. අන්තර් උදම් අනුච්ඡේදවලට (කිමිදීම සහ / හෝ ඇවිදීම මගින්) වෙරළාසන්න ගල් පර්වතයෙන් (බටහිර) හෝ වැල්ලේ (නැගෙනහිර) නිරාවරණය වන ගල්පර නිතලවාසී වාසස්ථානද ඇතුලත් වූ අතර මෙම කටයුතු සියල්ල සියලු පරිශ්‍රයට පහසු ප්‍රවේශය ලබනු වස් ජලය අඩු කාලවල සිදු කරන ලදී. උප උදම් අනුච්ඡේදවලට (ස්කුබා කිමිදුම්) වෙරළෙන් සෘජුවම ඇති ගල්පර බෑවුමේ නිතලවාසී වාසස්ථාන ඇතුලත් වන අතර ජල ප්‍රවේශය බෝට්ටුවකින් සිදු කරන ලදී.

**රූපසටහන 4-16 පේදුරු තුඩුවේ ව්‍යාපෘති පෙදෙසේ අන්තර් හා උප උදම් සමුද්‍ර ඇගයීම් පරිශ්‍ර**



299. රළවලින් වැල්ල ආරක්ෂා කරමින් හා අන්තර් උදම් ජෛව සමුද්‍රයට වාසස්ථාන සපයමින් සිනිඳු මෙන්ම රළු කොරල් ඇතුලත්ව කොරලීන හුණුගල් සහ වැලිගල්පර සමාන්තරව වෙරළ දෙසට දිවෙනු දැකිය හැකි වු අතර වැලිගල් හුණුගල් සහ පාෂාණමය ගල්පර දිවයිනේ උතුරු පළාතේ පොදුවේ දැකිය හැකි සමුද්‍ර ලක්ෂණ වේ. මීටර් 70 සිට 150 දක්වා අන්තර් උදම් ගල්පර පලළින් විවිධාකාර වු අතර ගල්පර අයිනෙන් අවසන් වී නිතලවාසී උස්තරයෙන් අවසන් වනු පිණිස 450 ක කෝණයකින් හා මීටර් 6 - 8 ක ගැඹුරකින් කෙටි ගල්පර බෑවුමට පහත් වෙයි. මෙවිට උපස්තරයේ වැලි පිරී තිබෙනු ඇති අතර රළු උපස්තරයෙන් සහ එය හා බැඳි නිතලවාසී අපෘෂ්ඨ වංශිකයන්ගෙන් තොර වනු ඇත.

300. ඇගයීමට ලක් කරන ලද සියලුම ගල්පර වසර සියයකට වඩා වැඩි කාලයක මිනිස් ක්‍රියාකාරකම් නිසා සම්පිණ්ඩිත වී ඇති අතර එයට 1) වෙරළබඩ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති (වෙරළ ඔස්සේ ඇති ගල් පවුර) 2) වාප්පුව ඉදිකිරීම 3) තද වැසි කුණාටු සංසිද්ධිවල ඇති වන පරිසර දූෂණ, මළාපවහන බැහැර කිරීම, ධීවර හා ජීවනෝපා කටයුතු මුල් කර ගත් භෞතික / ව්‍යුහමය බලපෑම්ද ඇතුලත්ය.

301. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියව්‍යාපෘතියේ අන්තර් හා උප උදම් සමුද්‍ර පෙදෙස්වල මෙන්ම නැගෙනහිරට හා බටහිර දෙසට ඇති යාබද පාලන පෙදෙස්වල සජීවි හා සිනිඳු කෝරල් ආවරණයේ ප්‍රතිශතය ඉතා අඩු අතර දැනට ඇති වාප්පුවට සමීපයෙහි ඇති උප උදම් සමුද්‍ර පෙදෙසෙහි උපරිම ප්‍රතිශතය වු 6 % සටහන් විය. උපරිම රළු හා සිනිඳු අන්තර් උදම් ප්‍රතිශතය වුයේ 5% කි. එනමුත්පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘති පරිශ්‍රයට යාබදව ඇති අන්තර් හා උප උදම් ගල්පර පෙදෙසේවල හා අවට පාලන පෙදෙස්වල සටහන් වුයේ 1 % ට වඩා අඩු ප්‍රතිශතයකි.

302. වරායේ නැගෙනහිර දෙසට ඇති නොගැඹුරු ජල අන්තර් උදම් වැලිගල්පරය වැඩි වශයෙන් කොරල් ගල් හා වැලිවලින් මෙන්ම මෑත කාලයෙහි වර්ධනය වුනු හා අධ්‍යයන පෙදෙසේ විසිරී ඇති හා සංඛ්‍යාවෙන් අඩු සෙමී 30 පමණ **(රූපසටහන 4.22 a)** දෙලිගුවාර්ගික කොරල්වලින් සමන්විත වන අතර (*Acropora sp. Montipora sp.*වැනි) ශාක න්‍යාස රළු කොරල් පෙදෙස පුරා දක්නට ලැබුනු ප්‍රධානතම රළුකොරල් විබුධයා විය **(රූපසටහන 4.22 b)**. ඇගයීමට ලක් කරන ලද ගැඹුරු ජලයේ අන්තර් උදම් ගල්පර ස්තර සහ නොගැඹුරු ජලයේ උප උදම් ගල්පර ස්තර දැවැන්ත රළු කොරල් සහ අකුරු කොරල්වලින් (*Porites sp.*, *Platygyra spFavia sp.*)සමන්විත විය. **(රූපසටහන 4.23)** උප උදම් ගල්පර නිතලවාසී උපස්තරයෙහි ගැඹුරු පෙදෙස් වැඩි වශයෙන් Sinularia sp වැනි සිනිඳු කොරල්වලින් ආවරණය වී තිබුනි

**රූපසටහන 4-17 පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිපරිශ්‍රයේ වඩා ගැඹුරු අන්තර් උදම් පෙදෙස්වල පිහිටා ඇති නිතලවාසී උපස්තර (a) සහ රළු කොරල් (b) සඳහා වන උදාහරණ**


(a)


(b)

**රූපසටහන 4-18 පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘති පරිශ්‍රයේ උප උදම් පෙදෙස්වල පිහිටා ඇති රළු කොරල් සඳහා වන උදාහරණ**





303. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිපරිශ්‍රයේ බටහිර අන්තයේ ගල් සහිත වෙරළේ සහ යාබද සමුද්‍ර පෙදෙස්වල ආකෘතික නිතලවාසී වාසස්ථානයක් සහ ලවන ජලයේ වැඩි කාලයක් ජීවත් විය හැකි දෙපියලි බෙල්ලන් සහ ස්වාදුභක්ෂිකයන් සහ ජංගම අපෘෂ්ඨිකවංශිකයන් වැනි ජීවීන්ගේ පැවැත්මට සහය වන පුළුල් නිර්වෘත්ත ශාක ජීවී සංයෝගයක් දක්නට ඇති අතර වරායේ බටහිර අන්තයේ තිබෙන්නා වැනි සියලුම උදම් මට්ටම්වල වැඩි ජල ප්‍රමාණයක් රඳවා ගත හැකි පොකුණුවල (*Acropora sp* වැනි) දෙලිගුවාර්ගික කොරල් වීශේෂ මෙන්ම සිනිඳු කොරල්ද දක්නට ඇත. ජලය වැඩි කාලවල ගල්පරවල වාසය කරන මතශ්‍ය විශේෂ මෙන්ම අතැම් තරුණ අවස්ථාවේ සමනළයන්ද *(Chaetodon sp.)*අසරමස්සන්ද (*Pomacanthus sp.)*නිරීක්ෂණය විය.

304. ජලය අඩු කාලවල කොරල් ගල් කැබලි සහ සිනිඳු රොන්මඩ සහිත රලු උපස්තරයකින් ආවරණය වු අන්තර් උදම් ගල්පර නිරාවරණය වන අතර නිරාවරණය නොවන ගැඹුරු පෙදෙස්වල *Padina sp*., *Caulerpa sp*., *Halimeda sp.Turbinaria sp.*ආදි මහා අල්ගා පැළෑටිවල අභිබවනයෙන් යුත් 15-35 % ක පමණ ආවරණයක් දක්නට ඇත (**රූපසටහන 4.24**)

**රූපසටහන 4-19 පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘති පරිශ්‍රයේ මහා අල්ගා පැළෑටිවල පහිටීම සඳහා වන උදාහරණ**





305. අන්තර් උදම් ගල්පරට පහළ ව්‍යුහමය සංකීර්ණයක් ඇති අතර පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘති පරිශ්‍රයේ උප උදම් ගල්පර පද්ධතියට වඩා නිතලවාසී ශාක ජීව විවිධත්වයක් ඇත. මෙය මෙහි බහුලව ඇති නිර්වෘත්ත අපෘෂ්ඨිකවංශිකයන් මගින් තහවුරු වෙයි.

306. උප උදම් ගල්පර පද්ධතිය බෑවුම හරහා පුළුල් වැලි උපස්තරයට යන අතර **(රූපසටහන 4.24)**මෙය කොරල් හා ගල් කැබලි වන ඝන ද්‍රව්‍යවලින් තොර හා අක් වෙරළ දක්වා විහිදෙයි. වැලිමය පත්ලේ මතුපිට ස්තරය ඉතා සිනිඳු වැලිවලින් හා

මඩෙන් වැසී ඇති නිසා දෘශ්‍යය සුන්‍යය. තවද මෙම පත්ලෙහි නිර්වෘත්ත නිතලවාසී ශාක හෝ ජීවීන්ගෙන් තොරය. කකුළුවන් වැනි ජංගම අපෘෂ්ඨීකවංශිකයන් පෙදෙස පුරා ඉතා සුළු සංඛ්‍යාවලින් දක්නට ලැබුනු අතර මත්ස්‍ය කන්ඩායම් හා තනි මත්ස්‍ය වර්ගද නිරීක්ෂණය විය.

**රූපසටහන 4-20 පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘති පරිශ්‍රයේ අක්වෙරළෙහි නිරීක්ෂණය වුනු උපස්තරය**




307. වෙරළාසන්නව ඇති උපඋදම් ගල්පර පෙදෙස්වල වාණිජමය වටිනාකමක් ඇති ජැක් (Carangidae), ස්නැපර් (Lutjanidae), ගරූපර් (Serranidae) සාර්ඩින් (Clupeidae) වැනි මත්ස්‍ය වර්ගද ගල් සහිත කොරල් පරවල පොකිරිස්සන්ද (Panulirus sp.) සිටින අතර අඩු වාණිජමය අගයක් ඇති යෝධ බෙල්ලන් (*Tridacna maxima*) වැන්නන්ද දක්නට ලැබුනි. ඇගයීම් සමයෙහි මුහුදු තෘණ පතුල් සාගර කැස්බෑවන් හෝ තල්මසුන් වැනි ක්ෂීරපායී ජීවීන් දක්නට නොලැබුනු අතර පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිපරිශ්‍රයේ හෝ අවට වෙසෙන බවට හා ගල්පර උපයෝගී කර ගන්නා බවට වාචික තොරතුරුද ඇගයීම් කණ්ඩායමට අසන්නට නොලැබුනි.

308. ඇගයීම් සමයෙහි රැස් කරන ලද ප්ලවාංග නියැදි අනුව ශ්‍රී ලංකාව වටා ඇති වෙරළේ පොදු වර්ගයේ ප්ලවාංග තිබෙන බව පෙනී ගිය නමුත් විශාල මත්ස්‍ය රංචු හෝ අපෘෂ්ඨවංශික බිජු හෝ පිළිවු සටහන් වුයේ නැති හෙයින් මෙමගින් වැඩුනු අපෘෂ්ඨවංශිකයන් හෝ පෘෂ්ඨවංශික උත්පාදනය වීමට මෙම පෙදෙස සුදුසු නොවන බව තහවුරු විය. එසේ වුවද වඩාත් තහවුරු සාක්ෂි සඳහා වැඩිදුර කාලානුරූපීත දත්ත අවශ්‍ය වෙයි. ව්‍යාපෘති පෙදෙස අවට වාසය කරනන්නන් ආහාර, ආදායම හා ජීවනෝපාය සඳහා පෙදෙසේ මත්ස්‍ය සම්පත මත දැඩිව ආධීනව සිටින නමුත් පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියසඳහා අන්තර හා උදම් ගල්පර ඉවත්කිරීම නිසා එයට කිසිවක් ඇති නොවනවා පමණක් නොව ව්‍යාපෘතිය නිසා ධීවරයන්ට අගනා ප්‍රයෝජනද ඇති වුන ඇත.

### 4.7.3 භෞමික වාසස්ථාන ශාක හා ජීවීන්

309. ශ්‍රී ලංකාවේ වාහිණික සපුෂ්ප පැළෑටි විශේෂ 3120 ක් ඇතුලත්ව ශාක විශාල ප්‍රමාණයක් තිබෙන අතර සපුෂ්ප ශාක ඝන 1052 ට අයත් වෙයි. මෙයින් 916 ක් ඒකදේශික වන අතර පර්ණාංග 350 කින් 50 ක් ශ්‍රී ලංකාවට ආවේණික වේ. (ස්වාභාව ධර්මය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීම සඳහා වන සංගමය - IUCN, 2007 & MOE, 2012).

310. යාපන අර්ධද්වීපයෙහි කැලෑ නොමති අතර ජනාකීර්ණ පෙදෙස්වල තල් ගස් හැර (*Borassusflabellifer*) වැව්ලි තිබෙන්නේ අතරින් පතරය. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ස්ථාපිත *Casuarina sp.*වතු වඩමරාච්චි ප්‍රදේශයේ වැලි කඳු ඔස්සේ තිබේ. මේ අතර පෙදෙසේ ඊසාන දිග කිළිනොච්චිය මුලතිව් සහ මන්නාරම දිස්ත්‍රික්කයේ විශාල වනාන්තර දැකිය හැකිය. සෘතුමය වශයෙන් වියලි උතුරු හා නැගෙනහිර තැනිතලාවල (තෙත් හා වියලි කලාපවල සංක්‍රාමික ප්‍රදේශය) නිවර්තන අර්ධ සදාහරිත කැලෑ පෙදෙස් දැකිය හැකි අතර මෙහි පෙදෙසට ආවේණික මෙන්ම යාබද කලාපවලට අයත් ශාක විශේෂද දැකිය හැකිය.

311. යාපන අර්ධද්වීපය සහ පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘති පරිශ්‍රය ජෛව-භෞමිකව අයත් වන්නේ පහත් බිම් වියලි කලාපයට වන අතර ශාකමය වශයෙන් පිහිටා ඇත්තේ වෙරළබඩ සහ සාගර තීරු ශාක කලාපයේය. කඩොලාන, ලවන ලදු කැලෑ, වැලිකඳු සහ වැල්ලේ ශාක ආදිය වෙරළබඩ සහ සාගර තීරු ශාක කලාපයේ ස්වාභාවිකව වැවෙන ශාක වර්ග වේ.

පෙදෙසේ පස සහ ජල සම්පත යන ද්විත්වයම අයත් වන්නේ පොළොවේ හුණුගල් භූවිද්‍යාවට වන අතර පස නිර්මාණය වී ඇත්තේ රළ සහ හුණුගල් මත සුළඟේ බලපෑම් සහිතව සාගර තැන්පතු හා රොන්මඩ මතය. ක්ෂාරය ලවනමය පස රිගසොල් පෙදෙසේ ප්‍රධාන පස් වර්ග වන නමුත් යෝජිත ව්‍යාපෘති පරිශ්‍රය මිනිස් උල්ලංඝණවලට බහුලව ලක්ව ඇත.

312. පුළුල් කලපු, මඩවගුරු, තෘණ භූමි, නොගැඹුරු වෙරළ ආදියෙන් සමන්විත වාන්කලයි සිට කෝකිලායි දක්වා වන උතුරු වෙරළබඩ ප්‍රදේශය ශ්‍රී ලංකාවේ සංක්‍රමික ජලජ පක්ෂීන්ට ඉතා වැදගත් පෙදෙස් වන අතර දිවයිනේ නිරිත දිග ඇති අනෙක් පෙදෙස්වලට සාපේක්ෂව නිතරම මෙම ප්‍රදේශ අධික පක්ෂීන් පවතින ස්ථාන ලෙසින් සටහන් වෙයි.

313. ඉන්දියාව හා බෙංගාල බොක්ක හරහා පියාසර මාර්ග තුනක් ඇති අතර සංක්‍රමික පක්ෂීන් දිවයිනට සම්ප්‍රාප්ත වන්නේ මෙම මාර්ග ඔස්සේය. (**රූපසටහන 4.26)**

314. <u>බටහිර මාර්ගය:</u> මෙය පෘතුවියේ නැගෙනහිර සිට උතුරු හා බටහිර පෙදෙස් ඔස්සේ ඉන්දියාවේ බටහිර වෙරළ මතින් හා පසුව පොදු ලක්ෂ්‍යය වන ඉන්දියාවේ ආන්තික දකුණ ඔස්සේ වැටී ඇති අතර මෙය ඔස්සේ එන පක්ෂීන් පසුව වෙරළ හරහා මන්නාරම සහ දකුණු වෙරළ අතර වෙරළ තීරයෙන් පියාසර කර ලංකාවට සම්ප්‍රාප්ත වෙති.

315. <u>නැගෙනහිර මාර්ගය:</u> සංක්‍රමික පක්ෂීන් මෙම මාර්ගය ගන්නේ පළමුවෙන් යුරෝපය බටහිර සයිබීරියාවද ඇතුලත්ව බටහිර ආසියාවෙන් හා එයින් පසුව කාශ්මීරයද ඇතුලත්ව හිමාලයේ බටහිර පෙදෙස් ඔස්සේ පැමිණි යාපන අර්ධද්වීපයෙන් දිවයිනට ප්‍රවිශ්ට වෙති.

316. <u>අන්දමාන් දූපත් මාර්ගය:</u> මෙය ඉන්දියන් සාගරයේ අන්දමාන් දූපත් හරහා වැටී ඇති අතර මෙය ඔස්සේ එන පක්ෂීන් දිවයිනේ ඊසානදිග වෙරළින් ඇතුල් වෙති.

**රූපසටහන 4-21 උප මහද්වීපය සහ ශ්‍රී ලංකාවේ උතුරු පෙදෙස හරහා ඇති ප්‍රධාන සංක්‍රමික පක්ෂී මාර්ග**




317. ව්‍යාපෘතියේ අංගයක් ලෙසින් ජේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිපරිශ්‍රයේ බලපෑම් ඇති කරන පෙදෙස සඳහා විස්තරාත්මක භෞමික ආධාරක රේඛා පාරිසරික ඇගයීමක් සිදු කරන ලදී. පූර්ණ භෞමික පාරිසරික ජෛව විද්‍යාත්මක ඇගයීම් වාර්තාව **අනුබද්ධය** 8 හිද මෙම වාර්තාව සඳහා වන ආධාරක රේඛා සමීක්ෂණයේ සංක්ෂිප්ත නිරීක්ෂණ **කොටස** 4.7.4 හිද ලබා දී ඇත. දශක තුනක පමණ කාලයක් පැවති ගැටුම්කාරී තත්වය කරන කොට ගෙන උතුරු පළාත සඳහා ශාක හා ජීවී වෙරළබඩ ජෛව විද්‍යාත්මක පාරිසරික සහ සම්පත් ආධාරක රේඛා ඇගයීම් දත්ත කට්ටලවලට හිගයක් ඇති හෙයින් වත්මන් අධ්‍යයනය සඳහා කාලානුරූපිත සංසදනයක් කිරීම අසීරුය.

### 4.7.4 භෞමික ඇගයීම

318. ජාත්‍යන්තර සම්මිතිය සහිත කඩිනම් රේඛා අනුච්ඡේද ක්‍රමවේදයක් උපයෝගී කරමින් ශාක හා ජෛව විවිධත්වය සඳහා මාර්තු 2018 ව්‍යාපෘති උපදේශකයන් විසින් පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියව්‍යාපෘතිය වටා මී 500 ක ව්‍යාපෘති පෙදෙස (PA) සහ බලපෑම් ඇති කරන පෙදෙස් (PIA) සඳහා විස්තරාත්මක කඩිනම් භෞමික ශාක හා ජීවී ඇගයීමක් දිවා කාලයෙහි සිදු කරන ලද අතර එයට අමතරව පෙදෙසේ වෙනස් ජීවී විශේෂ ගැන අවබෝධයක් ලබා ගැනීමට විසිරණ, අඩිසටහන්, ආහාර ඇතුලු සත්ව සලකුණු අධීක්ෂණය කර වැදගත් පාර්ශවකරුවන් සමග සාකච්ඡාද පවත්වන ලදී.

319. මෙම ඇගයීම 'උතුරු පළාතේ පේදුරු තුඩුව ධීවර වරාය සංවර්ධන පරිශ්‍රයේ භෞමික පාරිසරික ජෛවවිද්‍යාත්මක ඇගයීම' යන නමින් වන වෙනම වාර්තාවක පුර්ණ ලෙසින් ලේඛන ගත කර ඇත **(අනුබද්ධය 8).** එහි විස්තර ව්‍යාපෘතියේ ඉදිකිරීම් සහ මෙහෙයුම් අදියරවල විභව භෞමික හා පාරිසරික බලපෑම් හඳුනා ඇති අතර මෙහි සාකච්ජා කර ව්‍යාපෘතියේ පරිසර අධීක්ෂණ වැඩසටහනට ඇතුලත් කර ඇත.

320. මෙම වාර්තාවෙහි භෞමික ශාක හා ජීවී ඇගයීම කොටස් දෙකකින් ඉදිරිපත් කර ඇති අතර මෙයට ව්‍යාපෘතියේ කටයුතු වල පරාසය සෘජුවම ඇතුලත් පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියව්‍යාපෘති පෙදෙස (PA) සහ ආසන්න වශයෙන් මීටර් 500 වටා ව්‍යාපෘති බලපෑම් පෙදෙසද ඇතුලත් වෙයි. වාර්තාවෙහි සඳහන් ව්‍යාපෘති පෙදෙස් ද්විත්වය **රූපසටහන 4.27**හි දක්වා ඇත.

**රූපසටහන 4-22 පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘති පරිශ්‍රය ඇතුලත ව්‍යාපෘති පෙදෙස සහ ව්‍යාපෘති බලපෑම් පෙදෙස**




321. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය පිහිටා ඇත්තේ යාපනය - පොන්නාලයි - පේදුරු තුඩුව මාර්ගයේ වන අතර ව්‍යාපෘති පෙදෙස හා බලපෑම් පෙදෙස යන පෙදෙස් දෙකම වෙනස් කිරීම්වලට ලක්ව ඇති හෙයින් මෙම නාගරික පෙදෙස්වලට අයත් ශාක ජීවී චිත්‍රයද ඒ අනුව වෙනස් වී ඇත. එනිසා වෙරළබඩ හා සාගර තීර ශාකමය කලාපවලට අයත් ආවේණික ලක්ෂණ මෙහි දක්නට නැත.

322. ව්‍යාපෘති පෙදෙස ඇතුලත සටහන් වුනු ප්‍රධාන භෞමික වාසස්ථාන වර්ගවලට වෙරළ හා එය හා බැදි ශාක ගෙවතු සහ පාර දෙපස ඇති හාක ආදිය ඇතුලත් වන අතර ව්‍යාපෘති බලපෑම් පෙදෙස ඇතුලත සටහන් වුනු භෞමික වාසස්ථාන වර්ගවලට වෙරළ හා එය හා බැදි ශාක ගෙවතු මෙන්ම අත් හරින ලද නිවාස සහ මාර්ගයේ ඉඩම් ඇතුලත් වෙයි.

## 4.8 ව්‍යාපෘති පෙදෙස

323. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘති පෙදෙසේ භෞමික සංරචක මිනිස් ක්‍රියාකාකරම් නිසා දැඩි ලෙසින් වෙනස් වී ඇති අතර යාපනය පොන්නාලයි පේදුරු තුඩුව මාර්ගය සහ පේදුරු තුඩුව නැගෙනහිර වෙළ පාර පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියපරිශ්‍රයේ දකුණු අන්තය මායිම් කරන අතර අන්තර් හා උප උදම් ගල්පර හා බැඳි ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු වැඩි කොටසක් අයත් වන්නේ මෙම මාර්ගයට යොබදවය. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියපරිශ්‍රයේ නැගෙනහිර අන්තයට කුඩා එහෙත් මනාව සථාපිත වුනු වෙරළක් අයත් වන අතර මෙය සෘතුමය වැලි රැස්වන චක්‍රයට අයත් වන බව වාර්තා වී ඇත. එමෙන්ම මෙම අන්තයට කොට්ටඩි ධීවර පවුල්වලට අයත් කුඩා නිවාස 21 ක් පුස්තකාලයක් ධීවර සමිති ගොඩනැගිල්ල සහ හානියට පත්වී අත්හරින ලද හා දැනට මාළු දැල් එලීමට හා අළුත්වැඩියා කටයුතු සඳහා භාවිත කරන නඩරාජර් ක්‍රීඩාංගනය ආදියද අන්රේගත වෙයි. ගොඩනැගිලි ඉදිකිරීම හා ඒවායෙහි පැවැත්ම පෙදෙසේ ස්වාභාවික ශාක වර්ධනය සැලකිය යුතු පමණින් වෙනස් කර ඇත. එමෙන්ම පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියව්‍යාපෘතිය නිසා නිවාස 113 කට සුළු ප්‍රමාණ බලපෑම් ඇති විය හැකිය යැයි අපේක්ෂිතය.

324. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිපරිශ්‍රයේ වෙරළට පේදුරු තුඩුවේ නාගරික ජලාපහන පද්ධති දෙකකින් මතුපිට අපත ජලය එන හෙයින් වැසි කාලවල සහ රොන්මඩ සහ ප්ලාස්ටික් අනෙකුත් අපද්‍රව්‍ය රසායන වර්ග වැනි දූෂක පරිශ්‍රය ඇතුලත ඇති අන්තර් උදම් ගල්පරවලට සෘජුවම බැහැර වනු ඇත. මෙම ජලය හෝ දූෂක නිසා පටු වෙරළ ඔස්සේ ඇති භෞමික ශාක හෝ ජීවීන්ට බලපෑම් ඇත් නොකරනවා පමණක් නොව බැහැර වන පිටමුවට සෘජුවම කෙලින්ම ඇති අන්තර් උදම් පරිසරවලටද සෘජු බලපෑම් කිසිවක්ද ඇති නොකරයි. අවම ජල කාලවල මෙම ස්ථාන නිරාවරණය වන හෙයින් ශාක ජීවී වාසස්ථාන රැකෙන අතර වැඩි ජල කාලවල රැල්ල නිසා ජලය තනුක වෙයි.

325. පෙදෙසේ බහුලවම ඇති ගස් වර්ගය පොල් (*Cocos nucifera*) වන අතර සෙමී 80 - 110 වටප්‍රමාණ ඇති ගස් 60 ක් පමණ මෙම පෙදෙසේ ඇති බව ඇස්තමේන්තු කර ඇත. (**රූපසටහන 4.28**)පෙදෙසේ ඇති අනෙකුත් ගස් වර්ගවලට මුඩුබිම් තඹුරු *(Ipomoea pes-caprae)* හිරමනදැත්ත *(Phyla nodiflora)* සුරිය*(Thespesia populnea)* මහසරණ*(Sesuviumportulacastrum)* වරා *(Calotropis gigantean)* මිනිමල්*(Catharanthusroceus)* මුඩුඅවුර*(Canavalia rosea)* අහු*(Cyperusarenarius*, *C. stoloniferus*, *Antigononleptopus*, *Morindacoreia)*), කෝවක්කා *(Gomphrena celosioides*, *Tridaxprocumbens*, *Cocciniagrandis)* ගැටතුඹ*(Leucas zeylanica)* පිටසුදුපලා*(Boerhaviadiffusa)*කටුවැල් බටු *(Cynodondactylon*, *Solanum virginianum)* අත්තෝර*(Cassia occidentalis)* කළුවවුලැටිය*(Phyllanthus sp.*, *Caesalpiniabonduc)* කොහොඹ*(Azadirachtaindica)*මහනුග *(Argemone Mexicana*, *Ficusbenghalensis)* අහු*(Morindacoreia)* ගඳපාන*(Passiflorafoetida*, *Pisonia grandis*, *Hibiscus rosa-sinensis*, *Leucaena leucocephala*, *Citrus sp.*, *Lantana camara)* සහ තල් *(Borassusflabellifer)* ආදිය ඇලත් වෙයි.

326. ව්‍යාපෘති පෙදෙසේ ඇති ශාක විශේෂ 35 න් 24 ක් ආක්‍රමණික ශාක (*L. camara* and *A. leptopus*) වන අතර දෙකක් (මහසරණ -*Trianthemadecandra* සහ වන්කිරුවිලයි - *Sesuviumportulacastrum)* දේශීයව තර්ජනයට ලක්ව ඇති ශාක ලෙසින් වර්ගීකරණය කර ඇත. මේ අතුරින් වන්කිරුවිලයි ස්වාභාව ධර්මය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීම සඳහා වන සංගමය විසින් තර්ජනයට ආසන්න ශාකයක් ලෙසින් නම් කර ඇත.

**රූපසටහන 4-23 කොට්ටඩි ධීවර සමුහයේ නිවාස සහ ප්‍රධාන ශාක**





**(a)** **(b)**

327. ව්‍යාපෘති පරිශ්‍රයේ නැගෙනහිර වෙරළ අන්තයෙහි කොට්ටඩි ධීවර සමුහයට ආසන්නව ඇත. *S. protulacastrum* ශාකය විහදන බහුවාර්ෂික පැළෑටියක් වෙයි. 5.5 m2 ක් වන පළමු බිම් කොටස 9049’43”N සහ 80014’17”E පිහිටීමෙහි ඇති අතර 4.5 m2 වන දෙවන බිම් කොටස 9049’44”N සහ 80014’16”E පිහිටීමෙහි ඇත. (**රූපසටහන 4.29 b**)

**රූපසටහන 4-24 ව්‍යාපෘති පරිශ්‍රයේ නැගෙනහිර වෙරළ අන්තයේ ඇති වන්කිරුවිලයි ශාකය** -*Sesuviumprotulacastrum*







328. ව්‍යාපෘති පරිශ්‍රයේ ස්ථාන දෙකක *T. decandra*නිරීක්ෂණය විය. 1.6 m2 ක් වන හා වර්තමාන පේදරු වරායේ වාප්පුවට ආසන්නව මහ මුහුදු ධීවර කාර්යයාලයට පිටුපසින් ඇති පළමු බිම් කොටස 9049’41”N සහ 80014’09”E පිහිටීමෙහි ඇති අතර **(රූපසටහන4.30a).** 1.2 m2 ක් වන හා ව්‍යාපෘති පරිශ්‍රයේ නැගෙනහිැර වෙරළෙහි කොට්ටඩි ධීවර සමුහයාග් නිවෙස්වලට ආසන්නවපිහිටා ඇති දෙවන බිම් කොටස 9049’42”N සහ 80014’15”E පිහිටීමෙහි ඇත **(රූපසටහන4.30b).** මෙම බිම් කොටසට මිනිස් ක්‍රියාකාරකම් නිසා බාධා ඇති වන අතර මිනිස් වාසස්ථානයකට යන පාරක එක් පැත්තක පමණක් පිහිටා ඇත.

**රූපසටහන4-6 ව්‍යාපෘති පරිශ්‍රයේ නැගෙනහිර වෙරළ අන්තයේ ඇති වන්කිරුවිලයි මහසරණ ශාකය -*Trianthemadecandra***



**(a)**



**(b)**

329. මෙයට පෙර සිදු කරන ලද අධ්‍යයන ගණනාවකින්ම උතුරු පළාතේ යාපනය මන්නාරම වුවනියාව කිළිනොච්චි සහ මඩකළපු දිස්ත්‍රික්කවල මෙම ශාක ද්විත්වය සැලකිය යුතු විහිදීමකින් තිබෙන බව තහවුරු විය (අසේල සහ කණ්ඩායම, 2014; ජෝශප්, 2003, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, 2017; ස්වාභාව ධර්මය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීම සඳහා වන සංගමය, 2012; ස්වාභාව ධර්මය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීම සඳහා වන සංගමය, 2011; ලංකි විදුලිබල මණ්ඩලය, 2016; ශ්‍රී ලංකා රජය, 2017).

330. ගෙවතු වගා: කොට්ටඩි ධීවර සමුහයා වාසය කරන නිවාස 21 ක අධීක්ෂණය කිරීමේදී වෙරළාසන්නව ඇති ශාකවලට සමානව මෙහිද පොල්, සුරිය, වරා, කොහොඹ, මුරුංගා, ගස්ලබු, අඹු, දෙළුම්, තල්, ගඳපාන වැනි ආක්‍රමණික ශාක වර්ග දැකිය හැකි විය.

331. ව්‍යාපෘති පෙදෙසේ ගෙවතුවල දක්නට ලැබුනු ශාක විශේෂ 16 න් 6 ක් පමණක් ශ්‍රී ලංකාවට ආවේණික ශාක වන අතර එකක් හෝ සංරක්ෂණ අගයක් ඇති එක දේශික ශාක නොවීය. මේ අතර ආක්‍රමණික ශාක දෙකක් *(A.leptopus*සහ*L.camara)* නිරීක්ෂණය විය.

## 4.8.1 ව්‍යාපෘති බලපෑම් පෙදෙස

332. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධනව්‍යාපෘති බලපෑම් පෙදෙසට ඉමහත් ලෙසින් නාගරික මිනිස් වෙනස්කම්වලට ලක්ව ඇති පේදුරු තුඩුව නගරයේ සෑහෙන කොටසක් අයත් වෙයි.

333. කොට්ටඩියේ නැගෙනහිර අන්තයෙහි සහ බටහිරට සුබ්බර්මඩම් පෙදෙසේ ව්‍යාපෘති බලපෑම් පෙදෙස ඇතුලත මතශ්‍යයන් බාන ස්ථාන දෙකක් හා ගෙවල් ගණනාවක්ද ඇතුලත්ව පේදුරු තුඩුවේ ව්‍යාපෘති බලපෑම් පෙදෙස්වල රජයේ හා පුද්ගලික ගොඩනැගිලි සහ යටිතල පහසුකම් ව්‍යුහ බොහෝ ඇති අතර මෙයින් ඇතැමක් අත්හැර දමා ඇති ඒවාය (**රූපසටහන 4.31 a**), පෙරිය පිල්ලයාර් කෝවිල වැනි හින්දු ආගමික ස්ථාන මෙන්ම බෞද්ධ පන්සල්ද, සිද්දි විනායගර් විදුහල, හාර්ට්ලි විද්‍යාලය, මෙතෝදිස්ත උසස් බාලිකා පාසැල ඇතුලු පාසැල් කිහිපයක්ද මෙයට අමතරව පොලිස් ස්ථානය ක්‍රීඩා සංකීර්ණය දිස්ත්‍රික්ක මහේස්ත්‍රාත් අධිකරණ සංකීර්ණය අංක 551 හමුදා සේනාංක ගොඩනැගිල්ල සහ පේදුරු තුඩුව නගර සභා ගොඩනැගිල්ල ආදියද මෙහි ඇත (**රූපසටහන4.31 b**),

**රූපසටහන 4-7 පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘති බලපෑම් පෙදෙසේ ඇති සිත්ති විනායගර් පාසැල සහ අත්හරින ලද නිවෙසක්**





**(a)** **(b)**

334. ව්‍යාපෘති බලපෑම් පෙදෙසට භෞමික හෝ භෞතික බලපෑම් කිසිවක් ඇති නොවන නමුත් ඉදිකිරීම් සමයෙහි සහ යම් පමණකට මෙහෙයුම් අදියරෙහි යන්ත්‍රෝපකරණ හා ඉදිකිරීම් වාහන සැරිසැරිය නිසා ශබ්දය හා දූවිල්ල ආදියෙන් බලපෑම් ඇති විය හැකිය. වැඩබිමට ආසන්න ස්ථානවල බලපෑම් මට්ටම් වැඩි වී ව්‍යාපෘතියට ආසන්නව නගරයේ පිහිටි සේවාවලට සහ ව්‍යාපාරවලට හිරිහැර ඇති විය හැකි හෙයින් මෙය පිළිබඳ අවධානය යොමු කළ යුතුය.

335. ව්‍යාපෘති බලපෑම් පෙදෙසේ පහත ප්‍රධාන භෞමික වාසස්ථාන හතරක් ඇත:

- වෙරළ හා වෙරළබඩ ශාක
- ගෙවතු වගා
- අත්හරින ලද නිවාස
- මාර්ගයට අයත් කොටස්

336. ඉහත සියලුම වාසස්ථාන අතිශය බාධා කිරීම්වලට හා වෙනස් කිරීම්වලට ලක් වුනු නාගරික පෙදෙසක පවතින පූර්ණ ලෙසින් ක්‍රියාත්මක වන භෞමික පරිසර පද්ධතියෙන් සමන්විත වන හෙයින් මුලින් තිබුනු ශාක ජීවී සමූහයන් දැන් දක්නට නැත.

337. <u>වෙරළ හා වෙරළබඩ ශාක</u>: ව්‍යාපෘති බලපෑම් පෙදෙසේ ශාක ව්‍යාපෘති පෙදෙස නිරීක්ෂණය වුනු ශාකවලට බෙහෙවින්ම සමාන නමුත් ව්‍යාපෘති පෙදෙසෙහි දක්නට ලැබුනු තර්ජනයට ආසන්න වුනු විශේෂ දෙකක් මෙහි නොමැති අතර ඒකදේශික ශාකද දක්නට නොලැබුනි.

338. <u>ගෙවතු වගා</u>: ස්වකීවය *Cocos nucifera*, *Borassusflabellifer*, *Mangiferaindica*, *Carica papaya*, *Moringa oleifer*, *Punicagranatum*, *Azadirachtaindica* and *Musa x paradisiaca*ආදි පරිභෝජන ශාකද *Hibiscus rosa-sinensis*, *Plumeria obtuse*, *Bougainvillea sp*., *Nerium oleander*වැනි අලංකරණ ශාකද අයත් වෙයි. පෙදෙසේ ආක්‍රමණික ශාක වර්ග දෙකක් (*A. leptopus*සහ*L. camara*) නිරීක්ෂණය විය. මෙහි ඒක දේශික සංරක්ෂණය කරනු ලබන හෝ තර්ජනයකට ලක් වුනු ශාක කිසිවක් නිරීක්ෂණය වුයේ නැත.

339. <u>අත්හරින ලද නිවාස:</u>පේදුරු තුඩුව පුරා මිනිස් නඩත්තුව කලක පටන් අහිමි වු අත් හරින ලද නිවාස හා ඉඩම් කැබලි කිහිපයක්ම විවිධ මට්ටම්වල ඇති අතර මෙවන් හුදෙකලා ස්ථානවල *Passiflorafoetida, Morindacoreia, Azadirachtaindica, Tribulus terrestris, Datura metelAbutilon indicum*වැනි ශාක වැවී ඇති නමුත් ඒ

කිසිවක් ඒක දේශික හෝ සංරක්ෂණය කරනු ලබන හෝ තර්ජනකයට ලක් වුනු ශාක නොවේ. ව්‍යාපෘති බලපෑම් පෙදෙස ගත් කලද එහි ඒක දේශික හෝ සංරක්ෂණය කරනු ලබන හෝ තර්ජනකයට ලක් වුනු ශාක නොවේ.

340. <u>මාර්ගයට අයත් කොටස්:</u> ව්‍යාපෘති බලපෑම් පුරා මෙම ‘කුඩා හරිත පෙදෙස්’ තිබේ. මෙහි ඇති ශාකවලට *Cynodondactylon, Phyla nudiflora, Azadirachtaindica, Thespesia populnea, Solanum virginianum, Passiflorafoetida, Argemone Mexicana, Abutilon indicum* ආදි ශාක විශේෂ අයත් වන අතර *leptopus* සහ *L. camara*නම් වන ආක්‍රමණික ශාකද දැකිය හැකි විය. ව්‍යාපෘති බලපෑම් පෙදෙසේ මාර්ග රක්ෂිත ඉඩම්වලද ඒක දේශික හෝ සංරක්ෂණය කරනු ලබන හෝ තර්ජනකයට ලක් වුනු ශාක කිසිවක් නැත.

341. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘති පෙදෙසේ සහ ව්‍යාපෘති බලපෑම් පෙදෙසේ සිදු කරන ලද ක්ෂේත්‍ර පාරිසරික අධ්‍යයන සමයෙහි ශාක වර්ග 63 ක් නිරීක්ෂණය වු අතර **(රූපසටහන 4.32)**මෙයට පැළෑටි 26 ක් පඳුරු 9 ක් වැල් 8 ක් ඇතුලත් වෙයි. ඒක දේශික ශාක කිසිවක් හමු නොවු අතර නිරීක්ෂණය වුනු ශාක විශේෂවලින් 57 % ක් පෙදෙසට ආවේණික වු අතර ඉතිරිය විදේශික විය. ව්‍යාපෘති පෙදෙසේ සහ ව්‍යාපෘති බලපෑම් පෙදෙස් දෙකෙහිම ආක්‍රමණික ශාක (*A.leptopus* and *L.camara*) දක්නට ලැබුනු අතර මේවායින් ඇති විය හැකි බාධා අවම කිරීමට අවශ්‍ය නම් මෙම ශාක ඉවත් කරනු ලැබේ.

342. ව්‍යාපෘති පෙදෙසේ නැගෙනහිර අන්තයේ වෙරළාසන්න වාසස්ථානවල දේශීයව තර්ජනයට ආසන්න ශාක විශේෂ දෙකක් (*Sesuviumprotulacastrum* සහ*Trianthemadecandra* නිරීක්ෂණය වු අතර මෙය උතුරු පළාතේ සමාන පරිසර වාතාවරණවල පුළුල්ව දැකිය හැකිය. එනමුත් සීමා වන්නේ දිවයිනේ මෙම ප්‍රදේශයට පමණි. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියසංවර්ධන අවශ්‍යතාවයන් සඳහා මෙම ශාක ඉවත් කිරීම අවශ්‍ය වුවහොත් ඒවා ඉවත් කළ යුත්තේ අන් තැනෙක පැළ කරන අරමුණින් සජීවීව හා මුල්වලට හානි ඇති නොවන ආකාරයෙනි.

**රූපසටහන 4-8 පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘති පෙදෙසේ සහ ව්‍යාපෘති බලපෑම් පෙදෙසේ සිදු කරන ලද ක්ෂේත්‍ර පාරිසරික අධ්‍යයන සමයෙහි නිරීක්ෂණය වුනු ප්‍රධාන ශාක ඇති ස්ථානවල විස්තරාත්මක සිතියම**




**ජීවීන්**

343. ව්‍යාපෘති පෙදෙසේ සහ ව්‍යාපෘති බලපෑම් පෙදෙසේ සිදු කරන ලද ක්ෂේත්‍ර අධීක්ෂණ සමයෙහි වර්ගීකරණ කණ්ඩායම් 5 කට අයත් ජීවි විශේෂ 29 ක් දක්නට ලැබුනු අතර මෙයට පක්ෂීන් 13 ක්, සමනළයන් 10 ක්, දියමැස්සන් 3 ක් සහ ක්ෂීරපායීන් උරගයන් සහ ගොඩබිම් බෙල්ලන් එක බැගින් ඇතුලත් වෙයි. එනමුත් එක් දේශික කිසිවක් හමු නොවු අතර සියලුම විශේෂ ශ්‍රී ලංකාවට ආවේණික ඒවාම විය විය.

344. අවධි ලෙස අනතුරාසන්න වී ඇති ගොඩබිම් ගොළු බෙල්ලන් විශේෂයක් *(Trachiafallaciosa)* ව්‍යාපෘති බලපෑම් පෙදෙසේ ගෙයක වැටක තිබී **(රූපසටහන 4.33)** අධ්‍යයන චාරිකා සමයෙහි නිරීක්ෂණය වු නමුත් මෙම විශේෂය ව්‍යාපෘති පෙදෙසේ දක්නට නොලැබුනි. මෙම බෙල්ලන් විශේෂය දිවයිනේ වියලි උතුරු පළාතට සීමා වන අතර යාපනය අර්ධද්වීපය පුරා ගස්වල ගෙවතු පඳුරුවල සහ අත් හරින ලද ඉඩම්වල දක්නට ඇත.

**රූපසටහන 4-9 පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘති පරිශ්‍රයේ ව්‍යාපෘති බලපෑම් පෙදෙසේ අවධි ලෙස අනතුරාසන්න වී ඇති ගොඩබිම් ගොළු බෙල්ලන් විශේෂය*(Trachiafallaciosa)***





345. මෙම ගොඩබිම් ගොළු බෙල්ලන් විශේෂය 2016 සැප්තැම්බර් සිදු කරන ලද ශාක්‍යතා අධ්‍යයන සමයෙහි පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘති පෙදෙසේ දක්නට තිබුනද වත්මන (19.03.2018) නිරීක්ෂණය වුයේ නැත. පළමු මහා දෙවෙනි අධ්‍යයන දෙක පිළිවෙලින් සිදු කරන ලද්දේ වියලි හා තෙත් කාලගුණවල වීම මෙයට හේතුව විය හැකිය. සාමාන්‍යයෙන් ගොළු බෙල්ලන් ජලය බහුල කාලවල වැඩියෙන් දිස් වෙති.

346. පෙදෙස් වාසීන් සමග හෞම උපදේශන කණ්ඩායම පැවැත්වූ සාකච්ඡාවලදීද මෙම බෙල්ලන් විශේෂය වැසි කාලවල පේදුරු තුඩුව නගරය පුරා බහුලව දැකිය හැකි බව අනාවරණය වු අතර මෙම විශේෂය පිළිබඳව ඇති ජෛව විද්‍යාත්මක හා පාරිසරික විශේෂඥ තොරතුරු අනුවද වියලි කාලවල අහිතකර කාලගුණ තත්වයන් මග හැරීමට මෙම ජීවීන් ගිම්හානතරණය කරන බව දැන ගන්නට ලැබුනි. මෙම විශේෂය මෙවර දක්නට ලැබුනේ ව්‍යාපෘති බලපෑම් පෙදෙසේ (9o 49’ 41” N, 80o 14’14” E). නිවසක ගෙවත්තේ තල් වැටක නමුත් වැඩි සංඛ්‍යාවකින් දක්නට නොලැබුනි.

347. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියේඉදිකිරීම් අදියරෙහි බලපෑම් ඇති විය හැකි තැන්වල මෙම බෙල්ලන් දක්නට ලැබුනොත් එවුන්ව ප්‍රවේශමෙන් අතින් රැස් කර සමාන පිහිටීමකට ගොස් හැරලවිය යුතුය යැයි උපදෙස් කෙරේ

348. පාරිසරික අධ්‍යයනය සිදු කරන ලද්දේ සංක්‍රමණික පක්ෂීන්ගේ සාමාන්‍ය සෘතුවේ වු අතර එවිට පෙදෙසේ එවන් පක්ෂීන් නිරීක්ෂණය නොවුනි. එමෙන්ම යෝජිත ව්‍යාපෘති පරිශ්‍රය අතිශයින්ම නාගරික මිනිස් වෙනස් කිරීම්වලට ලක්ව ඇති හෙයින් පක්ෂීන් මෙම පෙදෙස මතුපිටින් සංක්‍රමණය වීමද විරල වී ඇත. මෙම කරුණ ධීවරයන් සහ ධීවර නිලධාරීන් සමග සිදු කරන ලද සංවාදවලින්ද තහවුරු වු අතර තිබෙන්නාවු ලිපි ලේඛනද මෙම මතය තවත් ස්ථිර කළේය.

349. ව්‍යාපෘති පෙදෙසේ සහ බලපෑම් පෙදෙසේ පොදුවේ දක්නට ලැබුනු පරෙවි විශේෂය ප්‍රචණ්ඩ පරෙවියන් (*Columba liviadomestica*) වු අතර ගල් පරෙවියන් *(Columba livia)* මෙහි ගෙවල ඇති කරනු ලබන ගෘහස්ත වර්ගයයි. කැලෑ පරෙවියන්ගේ සංඛ්‍යාව සාපේක්ෂව සුළු වුවත් යාපනය දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති බලපෑම් පෙදෙසේ විසිරී දැකිය හැකිය. එසේ වුවද මෙම විශේෂය ව්‍යාපෘති පෙදෙසෙහි කුඩු සාදා ඇති බවක් හෝ පැටව් ඇති කරන බවක් නිරීක්ෂණය වුයේ නැති හෙයින් යෝජිත ධීවර වරාය පක්ෂි විශේෂයේ පැවැත්මට තර්ජනයක් වන්නේ නැත.

**තර්ජනයට ලක් වුනු හා සංරක්ෂිත ජීවීන්**

350. දිවයිනේ 17,000 කටත් අධික හෞමික පෘෂ්ඨිකවංශිකයන් (ඒක දේශික 315 ක්) සහ අපෘෂ්ඨිකවංශිකයන් 450 ක් (ඒක දේශික 329 ක්) පමණ සිටින අතර මෙයට ඇතුලත් වෙයි එමෙන්ම ජලජ සහ වෙරළබඩ ජීවී විශේෂ 700 ක් පමණ දිවයිනට හිමි වන අතර ශ්‍රී ලංකාව හිමිකම් කියන සපුෂ්ක ශාකවල සංඛ්‍යාව 3210 කි. මෙය ගණ 1052 කට අයත් වන අතර මෙයින් 916 ක් ඒකදේශික හා පර්ණාංග සහිත විශේෂ 350 ක් (මෙයින් 50 ක් ඒකදේශික වෙයි) ඇතුලත් වෙයි. (ස්වාභාව ධර්මය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීම සඳහා වන සංගමය 2007 සහ MOE, 2012).

351. ශාක හා ජීවී විශේෂවල සංරක්ෂණ තත්වය වර්ගීකරණය කරනු පිණිස ස්වාභාව ධර්මය හා ස්වාභාවික සම්පත් සංරක්ෂණය කිරීම සඳහා වන සංගමය (IUCN) රතු ලැයිස්තුව නමින් ක්‍රමවේදයක් පවත්වන අතර මෙම වර්ගීකරණයන් අවධි ලෙසින් අනතුරාසන්න වුනු, අනතුරාසන්න වුනු, තර්ජනයට ලක් වුනු, හානියට ලක් විය හැකි හා අවම සැලකිල්ල යුත් ආදි වශයෙන් කාණ්ඩ කර ඇත. එමෙන්ම වර්ගීකරණයක් සිදු කළ නොහැකි දත්ත ඌන යනුවෙන්ද කාණ්ඩයක් ඇත.

352. ශ්‍රී ලංකාවේ සාගර හා හෞමික ශාක ජීවී තොරතුරු සාධාරණ ලෙසින් ඇගයීමට ලක් කර ඇති නමුත් ඒවායේ සංරක්ෂණ තත්වයට අදාල තොරතුරු අංගසම්පූර්ණ නැත. සමුද්දේශයේ ලායිස්තුගත කර ඇති IUCN, 2007 සහ MOE, 2012ප්‍රකාශන ශ්‍රී ලංකාවේ ශාක හා ජීවීන් පිළිබඳ හා ඒවායෙහි සංරක්ෂණ තත්වය පිළිබඳ විස්තරාත්මක තොරතුරු සපයන අතර වැඩිදුර තොරතුරු සඳහා මෙම වාර්තාවලට යොමු විය යුතුය. ශ්‍රී ලංකාවේ ජීවී විශේෂවල මුළු සංඛ්‍යාව සංරක්ෂණ තත්වය හා කාණ්ඩ පිළිබඳ සංක්ෂේපය පහත **වගුව** 4-7 හි ලාබ දී ඇත. (IUCN, 2007 සහ MOE, 2016).

වගුව 4-7 ශ්‍රී ලංකාවේ ජීවී විශේෂවල මුළු සංඛ්‍යාව සංරක්ෂණ තත්වය හා වර්ගීකරණ කාණ්ඩ

| **වර්ගීකරණ කාණ්ඩය** | ජීවී විශේෂවල මුළු සංඛ්‍යාව | තර්ජනයට ලක් වුනු ජීවී විශේෂවල සංඛ්‍යාව (දන්නා විට) |
|---|---|---|
| ක්ෂීරපායීන් | 123 (28 සාගර) | 49 (9 අවධි ලෙස තර්ජනයට ලක්වුනු) |
| පක්ෂීන් | 453 | 46 (10අවධි ලෙස තර්ජනයට ලක්වුනු) |
| උභය ජීවීන් | 140 | 52 |
| උරගයන් | 211 | 64 |
| සමනළයන් | 245 | 100 |
| ශල්‍යවර්මියන් | 213 | |
| සාගර පුෂ්ටිකයින් | 228 | |
| මතශ්‍යයන් | | |
| සාගර | 969 | 52 |
| මිරිදිය | 93 | 28 |
| රළු කොරල් | 183 | |

353. උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ තර්ජනයට ලක්වනු භෞමික ජීවී විශේෂවලට මිරිදි මතශ්‍යයෙක්, උරගයන් තිදෙනෙක්, එක් උභය ජීවියෙක්, පක්ෂීන් දෙදෙනෙක්, ක්ෂීරපායීන් දෙදෙනෙක්, ශාක 7 ක්, සාගර මෝරුන් හා මඩු මාළුවන් විශේෂ 15 ක්, කරදිය මසුන් 4 ක්, මුහුදු කැස්බෑවන් 5 ක්, තල්මසුන් හා ඩොල්ෆින් මසුන් ඇතුලු මුහුදු ක්ෂීරපායීන් 28 ක්, ඇතුලත් වන අතර ඩුගොන් මසුන් සහ රළු කොරල් බහුතරයක් උතුරු දිස්ත්‍රික්කයේ ගල්පර හා සාගර පෙදෙස්වල තර්ජනයට ලක්වුනු යැයි වර්ගීකරනය කර ඇත. (IUCN, 2012). මෙයට අමතරව සාමුද්‍ර කලාපයේ දක්නට ඇති තල් මෝරුන් (*Rhincodon typus*) සහ ලොකු ඇස් කෙලවල්ලන් (*Thunnusobesus*) හානියට ලක් විය හැකි යැයි වර්ගීකරණය කර ඇත.

### 4.8.2 සංරක්ෂිත පෙදෙස්

354. නිල වශයෙන් දිවයිනේ ලියාපදිංචි ආරක්ෂිත සමුද්‍ර පෙදෙස් (MPA) හයක් ඇති (**රූපසටහන 4.34**) නමුත් ලේඛන වාර්තා අනුව තවත් ආරක්ෂිත භෞමික පෙදෙස් (TPA) 4 ක් ඇති බව පෙනී යයි. මෙයට වෙරළබඩ සහ සමුද්‍රීය පෙදෙස් මෙන්ම සමුද්‍ර පරිසර පද්ධති හෝ විශේෂිත වාසස්ථාන අයත් වන හෙයින් ආරක්ෂිත සමුද්‍ර පෙදෙස් යටතේ මෙයද සඳහන් කළ හැකිය. උතුරු පළාතේ ආරක්ෂිත සමුද්‍ර පෙදෙස් හෝ ආරක්ෂිත භෞමික පෙදෙස් කිසිවක් නොමැති නමුත් මඩු මාර්ගය (1968) චුණ්ඩිකුලම් (1938) යෝධ වැව (1954) වාන්කලායි (2008) වවුනිකුලම් වැව (1963) පරයිතීවු (1973) සහ කෝකිලායි (1951) ආදී වන රක්ෂිත ඇත.

355. මේ සියල්ල පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘති පරිශ්‍රයේ බලපෑම් පෙදෙස්වලට පිටතින් පිහිටා ඇති හෙයින් ව්‍යාපෘතිය නිසා මෙම රක්ෂිතවලට කිසිදු බලපෑමක් ඇති වන්නේ නැත.

**රූපසටහන 4-10 ශ්‍රී ලංකාවේ ආරක්ෂිත සමුද්‍ර පෙදෙස්වල (MPA) පිහිටීම**




### 4.8.3 ඓතිහාසික ආගමික පුරාවිද්‍යාත්මක සහ සංස්කෘතික වටිනාකම් ඇති ස්ථාන

356. පේදුරු තුඩුවෙහි ඓතිහාසික ආගමික පුරාවිද්‍යාත්මක සංස්කෘතික හා විද්‍යාත්මක වටිනාකම් ඇති ස්ථාන සහ ඒ හා බැඳි යටිතලපහසුකම් බොහෝ ඇති අතර මේවා නැරඹීමට දෙසේ විදෙස් සංචාරකයන් විශාල සංඛ්‍යාවක් එති. හින්දු කෝවිල් 231 ක් කිතුනු දෙව්මැදුරු 27 ක් හා මුස්ලිම් පල්ලියක් වඩමරාච්චි උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටා ඇත. මේවා අතුරින් තොන්ඩමාන් ආරු දකුණේ පිහිටි සන්නධි කෝවිල කෙරුදාවිල් දකුණේ පිහිටි මණ්ඩප්පාකාඩු ලෙන පොලිකන්ඩි බටහිර පිහිටි ඔරානි උල්පත පේදුරු තුඩුවේ තෙරුමුඩිමඩම් සහ ප්‍රදීපාගාරය වල්ලිපුරම් පිහිටි වල්ලිපුරම් කෝවිල තුපලෙයි නැගෙනහිර සහ කෝට්ටෙයිහි වැල්ල තොන්ඩමාන් ආරුවෙහි පිහිටි ශුද්ධවූ ළිඳ ආදිය සුවිශේෂී වෙයි. මේ සියල්ල පිහිටා ඇත්තේ පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියව්‍යාපෘති පෙදෙසට පිටතින් නිසා ඒ කිසිවකට බලපෑම් ඇති වන්නේ නැත.

357. ව්‍යාපෘති පෙදෙසේ ඓතිහාසික වටිනාකමක් ඇති ස්ථාන දෙකක්ද ව්‍යාපෘතිබලපෑම් පෙදෙස ඇලත එවන් ස්ථාන 4 ක්ද පිහිටා ඇත. **(රූපසටහන4-11).**

**රූපසටහන4-11 ව්‍යාපෘති පෙදෙසේ සහ ව්‍යාපෘති බලපෑම් පෙදෙසේ පිහිටා ඇති සංස්කෘතික ස්ථානවල සිතියම**



358. ව්‍යාපෘති බලපෑම් පිහිටා ඇති ඓතිහාසික වටිනාකම් ඇති ස්ථානවලට දිශාව පෙන්වන ලෑල්ලක් සහ පේදුරු තුඩුවේ වත්මන් වාප්පුවද ඇතුලත් වෙයි (රූපසටහන **4.36a**සහ රූපසටහන **4.36b**).

**රූපසටහන 4-12 දිශාව පෙන්වන ලෑල්ලක් සහ පේදුරු තුඩුව ධීවර වරාය ඇතුලත් ව්‍යාපෘති පෙදෙස් පිහිටා ඇති ඓතිහාසික ස්ථාන**






**(a)** **(b)**

359. ඓතිහාසික අගයක් ඇති පුරාණ දිශාව පෙන්වන ලෑල්ල තිබෙන්නේ දැනට ඇති වරායේ පිවිසුමට යාබදව (9°49'40.97''N සහ 80°14'7.08''E) වන නමුත් එය තිබෙන්නේ පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියේ පරාසයට පිටතින්ය. තවද එය පිහිටා ඇති ස්ථානයෙන් එය ඉවත් නොකෙරේ.

360. යෝජිත ව්‍යාපෘති ප්‍රදේශයෙහි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් පුරාවිද්‍යා බලපෑම් ඇගයීමක් (AIA) සිදු කරන ලද අතර එවිට සිදු කරන ලද ඉඩම් මිණුමෙන් පරණ රේගු ගොඩනැගිල්ල, වරායේ පරණ පිවිසුම, රැඳවුම් පවුර, පුරාණ කොටුවේ ශේෂ වී තිබෙන කොටස්, පුරාණ ඩිස්පැන්සරිය සහ මෙතෝදිස්ත විද්‍යාලයේ පරණ පිවිසුම ආදි පේදුරු තුඩුව අවට පිහිටා ඇති ඉපැරණි ව්‍යුහ බ්‍රිතාන්‍ය, පෘතුගීසි සහ ඕලන්ද යටත් විජිත යුගයවලට අයත් පුරාවිද්‍යා වටිනාකම් ඇති ව්‍යුහ බව තහවුරු කරන ලදී. එනමුත් එම ව්‍යුහවල තිබෙන කොංක්‍රීට් මගින් මෙය මෑතකදී උල්ලංඝණයට ලක්ව ඇති බව පෙනී යයි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් පුරාවිද්‍යාත්මක බලපෑම් තක්සේරු කිරීම (AIA) යෝජිත ව්‍යාපෘති ප්‍රදේශය තුළ සිදු කරන ලදී. පැරණි රේගු ගොඩනැඟිලි හයක්, පැරණි රේගු ගොඩනැඟිල්ල, ජෙටිවලට පැරණි පිවිසුම, රඳවා තබන ලද බිත්ති, පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති පුරාවිද්‍යා වටිනාකමකින් යුත් පැරණි කොටුව, පැරණි බෙහෙත් ශාලාව සහ පැරණි පිවිසුමේදී යෝජිත ප්‍රදේශයෙහි භූමි සමීක්ෂණයෙන් සොයාගෙන ඇත. පෘතුගීසි, ලන්දේසි හා බ්‍රිතන්‍ය යුගයට අයත් යටත් විජිත ව්‍යුහයන් සියල්ලම. පේදුරුතුඩුවේ ජැටිය ආසන්නයේ පිහිටා ඇත. මෙම ව්‍යුහයන්ගෙන් කොන්ක්‍රීට්ඉදිකිරීම් කිරීම මෑත අතීතයේ සිට ඒවා භාවිතා කර අලුත්වැඩියා කර ඇති බව පෙන්නුම් කරයි. ජල අභ්‍යන්තර සමීක්ෂණයක් AIA හි කොටසක් ලෙස සිදු කරන ලදී. පැරණි රේගු ගොඩනැඟිල්ල, කොටුවේ ඉතිරි, පැරණි බෙහෙත් ශාලාව, මෙතෙඩිස්ට් නෝනිස් විද්‍යාලයේ පැරණි ප්‍රවේශය, කාණ්ඩ B ලෙස වර්ගීකරණය කර ඇති අතර ප්‍රාථමික සන්දර්භය සටහන් කිරීම / ලේඛනගත කිරීමකින් පසු ද්විතීක සන්දර්භය තුළ ප්‍රතිස්ථාපනය කළ හැකිය ජල අභ්‍යන්තර සමීක්ෂණය තුළ වාර්තා කර ඇති බාර්ජ් තුන, පුරාවිද්‍යා වටිනාකමකින් තොර ස්ථානයක් ලෙස ඩී කාණ්ඩයේ ස්ථානගත කර ඇත. AIA වාර්තාව ඇමුණුම 9 හි දක්වා ඇත

361. මෙයට අමතරව හින්දු කෝවිලක් (

362. **රූපසටහන** 4-13**b** -9°49'40.00''N, 80°14'7.78''E) බෞද්ධ පන්සලක් (

363. **රූපසටහන** 4-13**b** -9°49'40.70''N, 80°14'6.67''E) සහ කිතුනු පල්ලියක් (**රූපසටහන 4-14a** - 9°49'41.99''N, 80°14'16.51''E) සහ සංස්කෘතික වැදගත්කමක් ඇති ස්ථානයක් පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘති පෙදෙසේ තිබෙන අතර මේ අතුරින් හින්දු හා කිතුනු ආගමික ස්ථාන දෙක පිහිටා ඇත්තේ ධීවර වරායට යාබදවය. එමෙන්ම ව්‍යාපෘති පෙදෙසට නැගනහිරෙන් ව්‍යාපෘති බලපෑම් පෙදෙස ඇතලත නඩරාජා වේදිකාව නමින් ඉදිකිරීමක්ද (**රූපසටහන 4-14b** - 9°49'42.64''N, 80°14'18.68''E) තිබේ. දැනට අබලන් තත්වයෙහි ඇති මෙම ව්‍යුහය ඉදි කරන ලද්දේ පේදුරු තුඩුවේ නගර සභාවේ සභාපතිවරයෙකුව සිටි නඩරාජා නමැත්තෙකුට ප්‍රණාම වශයෙන් වසර 1972 දීය. කෙසේ වුවද මෙම

ඉදිකිරීම් හතරම පිහිටා ඇත්තේ පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියේ කාර්ය පරාසයට ඔබ්බෙන් වන නිසා ව්‍යාපෘතිය හේතු කොට ගෙන මේ කිසිවකට බලපෑම් කිසිවක් ඇත් වන්නේ නැත.

**රූපසටහන 4-13 පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘති බලපෑම් පෙදෙස ඇතුලත වාප්පුවට යාබදව පිහිටා ඇති පන්සල (a) සහ කෝවිල (b)**



**(a)**



**(b)**

**රූපසටහන 4-14 පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘති පෙදෙසට නැගනහිරෙන් ව්‍යාපෘති බලපෑම් පෙදෙස ඇතුලත පිහිටා ඇති කිතුනු පල්ලිය (a) සහ නඩරාජා වේදිකාව (b)**



**(a)**



**(b)**

## 4.8.4 සමාජාර්ථි ක්‍රියාකාරකම්

**ගෘහස්තවල ස්වාව සහ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම්**

364. පේදුරු තුඩුවේ යෝජිත ව්‍යාපෘති පරිශ්‍රය සහ අවට ප්‍රදේශය පිහිටා ඇත්තේ යාපනය දිස්ත්‍රික්කයේ AB21 මාර්ගය ඔස්සේ වඩමරාච්චි උතුර ප්‍රාදේශීය ලෙක්ම් කොට්ඨාශයේය. වර්ග කි/මී 54.2 ඇති මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මායිම කිමී 1.6 ක් දිග කලපුවකින් හා කිමී 19 වෙරළකින් යුක්ත වන අතර යෝජිත ධීවර වරාය පිහිටනු ඇත්තේ කොට්ටඩි, ප්දුරු තුඩුව හා සුබ්බර්මඩම් යන ගම්මාන තුනක් අයත් වන පේදුරුතුඩුව ග්‍රාම නිලධාරී වසමෙහිය. මෙම ප්‍රදේශයේ මුලු ජනගහණය 1773 ක් වන අතර පවුල් සංඛ්‍යාව 565 කි. පෙදෙසේ ජනගහණ විස්තරය වගුව 4.8 හි දක්වා ඇත.

**වගුව 4-8 පෙදෙසේ ජනගහණ විස්තරය**

| ග්‍රාම නිලධාරි වසම | සම්පූර්ණ භූමි ප්‍රමාණය ($km^2$) | ජනගහණය | ජනඝණත්වය |
|---|---|---|---|
| පේදුරු තුඩුව (J401) | 0.74 | 1,716 | 2,318.92 |

**මූලාශ්‍රය:** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය වඩමරාච්චි උතුර 2019[2]

365. වඩමරාච්චි උතුර ප්‍රාදේශීය ලෙක්ම් කොට්ඨාශයේ මුළු ජණගහණය 45,586 ක් වන අතර මෙයට පිරිමින් 22,088 ක් සහ ගැහැණුන් 23,498 ක් ඇතුලත් වෙති. මෙමගින් වඩමරාච්චි උතුර ප්‍රාදේශීය ලෙක්ම් කොට්ඨාශයේ ගැහැණු ජනගහන ප්‍රතිශතය වැඩි බව පෙනේ. මෙයට හේතුව ප්‍රදේශයේ ආර්ථික සංවර්ධන අවස්ථා අඩු බැවින් පිරිමින් ජිවනෝපාය සඳහා පෙදෙසින් පිටවී ඇති වීමයි. ජනගහණයෙන් 62.1 % ක් 15 -60 අතර වයස් කාණ්ඩයට අයත් වෙති.

366. වඩමරාච්චි උතුර ප්‍රාදේශීය ලෙක්ම් කොට්ඨාශයේ දත්ත අනුව ජනගහණයෙන් 42. 10 % කගේ මාසික ආදායමේ සාමාන්‍යය රු. 5,000ට වඩා අඩු වන අතර රු. 25,000 කට වැඩි ආදායමක් මාසයට උපයන්නන්ගේ ප්‍රතිශතය 16.69 % පමණි **(වගුව 4.9)**

**වගුව 4.9 ඒක පුද්ගල මාසික ආදායමේ ප්‍රතිශතය**

| ග්‍රාම නිලධාරි වසම | මාසික ආදායම (පුද්ගලයන් සංඛ්‍යාව) | | | | | | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| | 5000/= ට වඩා අඩු | 5001/= සිට 10,000/= දක්වා | 10,001/= සිට 15000/=දක්වා | 15,001/= සිට 20,000/= දක්වා | 20,001/= සිට 25,000 දක්වා | 25,001 ට වඩා වැඩි | |
| **J/401 (%)** | 50.31 | 7.06 | 11.66 | 7.82 | 7.52 | 15.64 | 100.00 |
| එකතුව **(%)** | 42.10 | 17.10 | 8.77 | 6.44 | 8.90 | 16.69 | 100.00 |

මූලාශ්‍රය වඩමරාච්චි උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය 2019

367. වඩමරාච්චි උතුරප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාකරම් වන්නේ ධීවර හා කෘෂි කර්මාන්තයයි. මෙහි විස්තර පහත 4-10 වගුවේ ලබා දී ඇත:

**වගුව 4-10 වඩමරාච්චි උතුරප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රැකියා / ජීවනෝපා විස්තරය**

| රැකියාව / ජීවනෝපාය | පිරිමි | ගැහැණු | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| කෘෂිකර්මාන්තය | 1913 | 366 | 2,279 | 19.86 |
| ධීවර කර්මාන්තය | 931 | 211 | 1,142 | 9.95 |
| රජයේ රැකියා | 1348 | 1377 | 2,725 | 23.74 |
| සමුපකාරය | 51 | 32 | 83 | 0.72 |
| පුද්ගලික අංශය | 556 | 185 | 741 | 6.46 |

[2] ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය වඩමරාච්චි උතුර (2015), සම්පත් ප්‍රෝෆයිලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය වඩමරාච්චි උතුර, 2015

| | | | | |
|---|---|---|---|---|
| **ස්වයං රැකියා** | | | - | - |
| මේසන් වැඩ | 566 | 0 | 566 | 4.93 |
| වඩු වැඩ | 472 | 0 | 472 | 4.11 |
| ආභරණ සෑදීම | 43 | 0 | 43 | 0.37 |
| යාන්ත්‍රික ශිල්පය | 161 | 0 | 161 | 1.40 |
| කම්කරු | 3021 | 244 | 3,265 | 28.45 |
| **එකතුව** | **9,062.00** | **2,415.00** | **11,477.00** | **100.00** |

**මූලාශ්‍රය:** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය වඩමරාච්චි උතුර 2019

368. යාපනය දිස්ත්‍රික්කයේ ඒක පුද්ගල දරිද්‍රතා දර්ශක මට්ටම 7.7 % ක් වන අතර මෙය මෙම දර්ශකයේ ජාතික මට්ටම වන 4.4% ට වඩා වැඩිය (**වගුව 4.11)** වඩමරාච්චි උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දරිද්‍රතා තත්වය 9.13 වන අතර දුගී පුද්ගලයන්ගේ ඇස්තමේන්තු සංඛ්‍යාව 2012 වසරෙහි 4317 කි. පේදුරු තුඩුවේ ධීවර කර්මාන්තය සඳහා වන යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හරහා එහි ධීවර සමූහයාගේ ආර්ථිකය වැඩි දියුණු කරන්නට හැකි වනු ඇති යැයි අපේක්ෂා කෙරේ.

**වගුව 4-9 යාපනය දිස්ත්‍රික්කයේ දරිද්‍රතා මට්ටම**

| අංකය | අංශය | ඒක පුද්ගල දරිද්‍රතා දර්ශකය (%) | දුගී පුද්ගල සංඛ්‍යාව | ජනගහණයේ ප්‍රතිශතයක් ලෙසින් (%) |
|---|---|---|---|---|
| 1. | දේශීය | 4.1 | 843,913 | 100 |
| 2. | උතුරු පළාත | 7.7 | 83,834 | 9.9 |

**මූලාශ්‍රය: ජන සංගණන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව** -2016

### 4.8.5 ආර්ථික ව්‍යුහය

369. වඩමරාච්චි උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ආර්ථික ව්‍යුහයට කෘෂිකර්මාන්තය, ධීවර කර්මාන්තය, කර්මාන්තය සහ සේවා අංශය ආදිය ඇතුලත් වෙයි. කෘෂිකර්මාන්තය ගත් කල වී, දුම්කොළ, එලවළු, අල සහ පළතුරු ඇතුලත් වන අතර වෙරළබඩ පෙදෙසෙ ප්‍රධාන වෘතිය වන්නේ ධීවර කර්මාන්තයයි. කර්මාන්ත ගත් කල කොට්ඨාශයේ පැල්පත් කර්මාන්ත (167) කුඩා සහ මධ්‍යම කර්මාන්ත (86) සහ සේවා අංශයෙහි කර්මාන්ත ආයතන 204 ක් ඇත. මෙයින් 56.74 ක් සක්‍රීයව පවතින අතර එමගින් 792 දෙනෙකුට රැකියා අවස්ථා සැපයේ (**වගුව 4.1.2**). වඩමරාච්චියේ මත්ස්‍යන් පැසිරුම් කරන කර්මාන්ත ශාලාව දැනට අලෙවි කළ හැකි නිෂ්පාදන නොමැති කම නිසා වසා දමා ඇති අතර මෙලෙසින් අක්‍රීයව තිබෙන කර්මාන්ත නැවත ආරම්භ කිරීම මගින් තවත් 335 දෙනෙකුට රැකියා ලබා දිය හැකිය. අලෙවි කළ හැකි ද්‍රව්‍ය නොමැති නිසා වඩමරාච්චියේ ඇති මත්ස්‍ය පැසිරුම් කර්මාන්තශාලාව දැනට අක්‍රීයව පවතියි. යෝජිත ව්‍යාපෘතිය නිසා ධීවර කර්මාන්තයට අදාල කර්මාන්තශාලා බොහෝමයක් නැවත මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමේ වාතාවරණයක් උදා විය හැකිය.

වගුව 4-12 **ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය වඩමරාච්චි උතුර කර්මාන්ත ව්‍යුහය** 2018

| කර්මාන්තය | සක්‍රීය | අක්‍රීය | එකතුව | දැනට සේවයේ නියුතු කම්කරුවන් / සේවා නියුක්කතියන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| කුඩා සහ මධ්‍යම | 74 | 12 | 86 | 202 |
| පැල්පත් කර්මාන්ත | 104 | 63 | 167 | 380 |
| සේවා අංශය | 104 | 140 | 244 | 210 |
| එකතුව | 282 | 215 | 497 | 792 |
| % | 56.74 | 43.26 | 100 | |

370. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධනව්‍යාපෘති පරිශ්‍රයේ වැඩියෙන් වාසය කරන්නේ ධීවර පවුල් වන අතර වසර පුරා මෙහි ධීවරයන් මුහුදා යාම සහ වෙරළබඩ මසුන් ඇල්ලීම වැනි කටයුතුවල යෙදී සිටිති. අස්වැන්න අනුව දේශීය හෝ විදේශ මතශ්‍ය වෙළඳපළට මොවුන්ට ප්‍රවේශය ලැබෙයි. කකුළුවන් හා ඉස්සන් ප්‍රධාන ආදායම් මාර්ග වෙයි. මෑතක කෙෂ්ත්‍රයේ ඇති වුනු දියුණුව මෙන්ම නවීන තාක්ෂණ සහ උපකරණවල අවතීර්ණයත් සමග පෙදෙසේ මසුන් ඇල්ලීමේ මෙන්ම අදාල කර්මාන්තවල හැකියාව හා ධාරිතාවය මෙන්ම ආදායමද සැලකිය යුතු අන්දමින් ඉහළ ගොස් ඇති අතර යෝජිත පේදුරු තුඩුව ධීවර වරාය ව්‍යාපෘතියද මේ සියල්ලට අමතර රුකුලක් වනු ඇත.

### 4.8.6 දැනට තිබෙන යටිතල පහසුකම්

371. **ප්‍රවාහනය:** 2009 වසරෙන් පසු රජය විසින් මුලාරම්භ කරන ලද යටිතල පහසුකම් වැඩසටහන් නිසා උතුරු පළාතේ විශේෂයෙන් යාපනය දිස්ත්‍රික්කයේ ප්‍රවාහනය විදුලිය විදුලි සන්දේශය ආදි කෙෂ්ත්‍රවල ප්‍රගතියක් ඇති කර ඇත.කිමි 33.79 ක් වන AB 020යාපනය - පේදුරු තුඩුව මාර්ගය කිමි 51 ක් වන AB 021යාපනය -පේදුරු තුඩුව මාර්ගය මගින් මෙන්ම කිමි 13 ක් වන B371පේදුරු තුඩුව - මරුදංකේණි මාර්ගය කිමි 3.94 ක් වන B370පේදුරු තුඩුව - නැගෙනහිර වෙරළ මාර්ගය මගින් පේදුරු තුඩුව යාපනය දිස්ත්‍රික්කයේ මාර්ග ජාලය හා සම්බවන් වෙයි. එමෙන්ම වල්වෙට්ටි - ඌරිකාඩු - කොම්මන්තුරයි මාර්ගය වල්වේතුරෙයි පොලිස් ස්ථාන පාර පොලිකණ්ඩි-නාවින්දි-කරනවායි මාර්ගය වැනි C පන්තියේ මාර්ග මගින්ද පෙදුරුතුඩුව දිස්ත්‍රික්කයේ අන් තැන් හා සම්බන්ධ වෙයි. තවද කුමරාදිපුලම් පාර කරුකම්නපයි සුසාන භූමය පාර පුත්තලයි කෝවිල් පාර උපයකාර්තිකාමම් පාර වැනි D පන්තියේ මාර්ග මගින්ද ප්‍රදේශයේ විවිධ ස්ථානවල පේදුරුතුඩුවට ප්‍රවේශය ලැබෙයි.

372. **විදුලිය:**ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පාරිභෝගිකයන් 10,369 ක් සහ ආයතන 610 කට විදුලිය සැපයෙන අතර මෙම අන්තයෙන් දැනට වඩමරාච්චියෙහි ඇති යටිතල පහසුකම් ධීවර කර්මාන්තය හා අදාල කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමට වැඩි දුර රුකුලකි.

373. **සන්නිවේදනය:** ප්‍රධාන සන්නිවේධන මාධ්‍ය දුරකථනය වන අතර උතුරු පළාත පුරා ජංගම හා ස්ථාවර දුරකථන සේවා සපයන ශ්‍රී ලංකා ටෙලිකොම් පෙදෙසේ ප්‍රධාන සේවා සපයන්නා වෙයි.

374. සියලුම අනෙකුත් ජංගම දුරකථන සේවා සපයන්නන් සිය සේවාවන් මෙම ප්‍රදේශයට ලබා දෙන අතර දේශීය මෙන්ම දකුණු ඉන්දියාවෙන් විකාශනය වන චන්ද්‍රිකා රූපවාහිනී නාලිකාවලටද මෙහි වැසියන් ප්‍රවේශය ඇත. බ්‍රෝඩ්බෑන්ඩ් අන්තර්ජාල සේවාව 2010 වසරෙහි හඳුන්වා දෙන ලද අතර මෙය ශ්‍රී ලංකා ටෙලිකොම් ADSL සම්බන්තාවයක් හරහා සහ ඩයලොග් සමාගමේ ඇන්ටනාවක් මගින් රැහැන් රහිතවම ලබා ගත හැකිය. IDD, ෆැක්ස් අන්තර්ජාල සේවා සපයන පුද්ගලික කොමිනියුකේෂණන් ආයතනද කිහිපයක්ම මෙහි ඇත.

375. **පාසැල්:** සිද්දි විනායගර් විදුහල, හාර්ට්ලි විද්‍යාලය සහ මෙතෝදිස්ත උසස් බාලිකා පාසැල යන පාසැල් තුන පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිපරිශ්‍රයට ආසන්නව පිහිටා ඇති අතර යෝජිත වරායේ සිට මෙම අධ්‍යාපන ආයතනවලට ඇති දුර ප්‍රමාණය වගුව 4.13 හි ලබා දී ඇත.

**වගුව 4-10 යෝජිත වරායේ සිට ආසන්නව තිබෙන පාසැල්වලට ඇති දුර ප්‍රමාණය**

| අංකය | පාසැල | දුර ප්‍රමාණය **(m)** |
|---|---|---|
| 1. | යා/මෙතෝදිස්ත උසස් බාලිකා පාසැල | 15 |
| 2. | යා/හාර්ට්ලි විද්‍යාලය | 100 |
| 3. | යා/පේදුරු තුඩුවසිත්ති විනායගර් විදුහල | 275 |

376. මෙම පාසැල් පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිපරිශ්‍රයට ආසන්නයෙන් පිහිටා ඇති හෙයින් වැඩිදුර අදහස් විමසීම් සිදු කර ව්‍යාපෘතියේ ඉදිකිරීම් සහ මෙහෙයුම් කටයුතු ගැන පාසැල් කළමනාකරණ දැනුම්වත් කර එනිසා පාසැල්වලට ඇති විය හැකි සමාජීය මෙන්ම මානසික බලපෑම් අවම කිරීමට පියවර ගැනීමට නිර්දේශ කරන ලදී.

377. පාසැල්වල අධ්‍යාපනය ලබන සියලුම සිසුන්ගේ මුළු සංඛ්‍යාව 3157 ක් වන අතර ගුරු මණ්ඩලයේ සංඛ්‍යාව 202 කි **(වගුව 4.14)** මෙතෝදිස්ත පල්ලියද සෙල්ලම් කරමින් ඉගෙන ගන්නා පෙර පාසැලක් පවත්වයි.

**වගුව 4-14 ව්‍යාපෘතිය අවට ඇති පාසැල්වල සිසු - ගුරු විස්තරය**

| පාසැල | සිසුන් සංඛ්‍යාව සහ ශ්‍රේණිය | | | | ගුරුන් සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1 – 5 | 6 – 11 | 12 – 13 | එකතුව | උපාධිධාරීන් | පුහුණු ලත් | වෙනත් | එකතුව |
| යා/හාර්ට්ලි විද්‍යාලය | - | 879 | 512 | 1391 | 48 | 114 | | 62 |
| යා/මෙතෝදිස්ත උසස් බාලිකා පාසැල | - | 839 | 590 | 1429 | 63 | 15 | | 78 |
| යා/පේදුරු තුඩුව සිත්ති විනායගර් විදුහල | 177 | 160 | - | 337 | 5 | 15 | | 20 |

**මූලාශ්‍රය:** ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වඩමරාච්චි උතුර -2019

378. **ආරෝග්‍යශාලා:** ව්‍යාපෘති පරිශ්‍රයට ආසන්නයෙන්ම ඇති ආරෝග්‍යශාලාව මාන්තිකායි මූලික රෝහල වන අතර මෙය කිමී 6 ක් ඈතින් පිහිටා ඇත.

379. **තැපැල් කාර්යාල:** වඩමරාච්චි උතුරෙහි ප්‍රධාන තැපැල් කාර්යාල 2 ක් සහ උප තැපැල් කාර්යාල 11ක් තිබෙන නමුත් ව්‍යාපෘති පෙදෙසේ තැපැල් කාර්යාල කිසිවක් නැත. මෙහි වාසය කරන්නන් මිය අවශ්‍යතාසඳහා යා යුත්තේ පේදුරු තුඩුව තැපැල් කාර්යාගටය.

380. **පොළවල්:**පේදුරු තුඩුවේ මත්ස්‍ය හා එළවළු පොළවල් පිහිටා ඇත්තේ නගරයේ මී 450 ක් ඈතින්ය. ධීවර පොළේ තොග වෙළඳුන් බෝට්ටුවලට සෘජුවම හෝ ධීවරයන්ගේ නිවෙස්වලට යන අතර ඔවුන් එසේ මිල දී ගන්නා මසුන් පොළෙහි අලෙවි කරති. මෙයට අමතරව ව්‍යාපෘති බලපෑම් පෙදෙසේ මසුන් මාල දී ගන්නා වෙළෙඳුන් කොළඹ ඇතුලු දිවයිනේ අන් ප්‍රදේශවලට අලෙවිය සඳහා මසුන් යවති. මේ අතර කරවල නිෂ්පාදනය උතුර පුරා සිදු වන අතර පිට පළාත්වලට අලෙවිය සඳහා යැවීම ඇතුලු මෙය හා සම්බන්ධ කටයුතුවල වැඩියෙන් යෙදෙන්නේ ස්ත්‍රීන්ය. පෙදෙසේ මත්ස්‍යන් සුලබව ඇති නිසා රකවල පරිභෝජනය ඉතා අවමය.

### 4.8.7 නිවාස /සනීපාරක්ෂාව / ජල සැපයුම සහ කෘෂිකර්මාන්තය

381. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියට ආසන්නව සිටින බහුතරයක් පවුල් වාසය කරන්නේ ස්ථිර නිවාසවල වන අතර පැවති ගැටුම මෙන්ම 2004 සුනාමිය නිසා යාපනය හා පේදුරු තුඩුව ඇතුලු උතුරු පළාතේ බොහෝ ගෙවලට මෙන්ම යටිතල පහසුකම්වලට සෑහෙන පමණ හානියට ගොදුරු වු අතර පසුව සිය විදම්න්ද රජයේ සහ රාජ්‍ය නොවන සංවිධානවල ආධාරවලින් අළුත්වැඩියා කර ගන්නා ලදී.

382. විවිධ ආධාර වැඩසටහන් මගින් වැසිකිළිද අළුත්වැඩියා කර ගන්නා ලද හෙයින් එම පහසුකම් නොතිබුනු දුගී හා ආන්තික පවුල්වලටද සිය නිවෙස්වලම එම පහසුකම ලැබුනි. පුද්ගලිකව ඉදි කරන ලද නිවෙස්වලටය මෙමපහසුකම කලින්ම තිබුනි. පේදුරු තුඩුවේ පොදු මළාපවහන බැහැර කිරීමේ පද්ධතියක් නොමැති අතර මළාපවහන යවනු ලබන්නේ භූගත මුද්‍රා තබන ලද පුතික ටැංකිවලටය. මෙයට ක්ෂීරණ බැහැර කිරීමේ පහසුකම්ද තිබෙන අතර ටැංකි පිරුනු විට නාමික ගාස්තුවක් ගෙවා හිස් කර ගත හැකිය. ක්ෂීරණය මිරි දිය ජල මූලාශ්‍රවලට සෘජුවම යැවීම නිසා පෙදෙසේ ජලය දූෂිත වෙමින් තිබේ.

383. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිපරිශ්‍රය අවට ගංගා හෝ උල්පත් කිසිවක් නොමැත් වුවද ජලවහන මාර්ග කිහිපයක්ම දැකිය හැකි වු අතර වැසි කාලවල සෘජුවම මේවා මගින් පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිපරිශ්‍රය ඇතුලත ඇති වෙරළ කාලපයට ජලය බැහැර වෙයි. පේදුරු තුඩුවේ ජනයාට ප්‍රධාන ජල මුලාශ්‍රය වන්නේ භූ ගත ජලය වන අතර මෙය පොදු ළිං ඔස්සේ ලබා ගනු ලැබේ. එසේ වුවද පානීය අවශ්‍යතා සඳහා වැඩියෙන්ම භාවිත කරනු ලබන්නේ බෝතල් කළ ජලයයි.

### 4.8.8 මසුන් ඇල්ලීම සහ අනෙකුත් ආර්ථික ක්‍රියාකාරකම්

384. පේදුරු තුඩුව ඇතුලත්ව යාපනය දිස්ත්‍රික්කයේ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම විනනේ ධීවර කර්මාන්තය වන නමුත් ගැටුම් පැවති කාල පරිච්ජේදයෙහි මෙම කටයුතු දැඩි ලෙසින් අඩාල වී පසුව ගැටුම් අවසන් වු පසු නැවතත් වර්ධනය වෙමින් තිබෙන අතර එමගින් පෙදෙසට අහාර සුරක්ෂිත තාවය සහ ආදායම් උත්පාදනය වෙමින් පවතියි. දිස්ත්‍රික්කයේ මත්ස්‍ය අස්වැන්න දිවයිනේ කණ ඇතුලු පදෙසෙ ගණනාවකටම යවනු ලබන අතර කොටසක් විවිධ රටවල් කිහිපයකට අපනයද වෙයි. වෙරළබඩ පෙදෙසේ ග්‍රාම නිලධාරි වසම් 19 ක් තිබෙන අතර එහි ජැටියක් සහ නැංගුරම් පොළවල් 14 ක්ද ඇත. ව්‍යාපෘතිය යෝජනා වී ඇති වඩමරාච්චි උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය යාපනය දිස්ත්‍රික්කයේ ප්‍රධාන මත්ස්‍ය නිෂ්පාදන පෙදෙසක් වන අතර මෙහි ධීවර බෝට්ටු සම්ප්‍රාප්ත වන ස්ථාන කිහිපයක්ම ඇත. මෙහි වාර්ෂිකව ලැබෙන මත්ස්‍ය පහත වගුව 4.15 හි දක්වා ඇති පරිදි අස්වැන්න මෙ/ටොන් 6000 ක් පමණ වන අතර වසරකට නිෂ්පාදනය කරන කරවල ප්‍රමාණය මෙ/ටොන් 369 ක් වෙයි.

**රූපසටහන 4-15 වඩමරාච්චි උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ධීවර කටයුතු ප්‍රොෆයිලය**

| වර්ගය | වර්ෂය | | | |
|---|---|---|---|---|
| | **2015** | **2016** | **2017** | **2018** |
| 1. ධීවර පවුල්වල සංඛ්‍යාව | 3192 | 3036 | 3186 | 3041 |
| 2. ධීවර සමුහයාගේ සංඛ්‍යාව | 14313 | 14146 | 14313 | 13829 |
| 3. ඇතුලත එන්ජිම් ඇති ධීවර බෝට්ටුවල සංඛ්‍යාව | 55 | 55 | 56 | 54 |
| 4. පිටතින් එන්ජිම් ඇති ධීවර බෝට්ටුවල සංඛ්‍යාව | 830 | 855 | 1163 | 976 |
| 5. එන්ජිම් නොමැති ධීවර බෝට්ටුවල සංඛ්‍යාව | 952 | 916 | 750 | 271 |
| 6. ධීවර ගම්මානවල සංඛ්‍යාව | 13 | 13 | 13 | 13 |
| 7. ධීවර සමිතිවල සංඛ්‍යාව | 13 | 13 | 13 | 15 |
| 8. ධීවර සමිතිවල සාමාජික සංඛ්‍යාව | 4,923 | 4,719 | 4,818 | 4,798 |
| 9. විශාම ලත් ධීවරයන්ගේ සංඛ්‍යාව | 1,050 | 1 | - | _ |
| 10. මත්ස්‍ය නිෂ්පාදනය (මෙ/ටො) | 4,920 | - | 5,863 | 6,073 |
| 11. ධීවර වරාය සංඛ්‍යාව | 1 | 1 | 1 | 1 |
| 12. කරවල නිෂ්පාදනය (මෙ/ටො) | 365 | 365 | 368 | 369 |

**මුලාශ්‍රය: ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව**

385. ඉහත සඳහන් කළ පරිදි පැවති ගැටුම් තත්වය නිසා පෙදෙසේ ධීවර කර්මාන්තයෙහි දැඩි පසුබෑමක් ඇති වු නමුත් දැන් තතත්වය ධණාත්මකව වෙනස් වී දැනටපේදුරු තුඩුවේ විවිධ ස්ථානවල ධීවර බෝට්ටු 673 ක් මසුන් ඇල්ලීමේ කටයුතුවල යෙදී සිටියි. මෙයට IMUL බෝට්ටු 24 ක් IDAY බෝට්ටු 26 ක් OFRP බෝට්ටු 505 ක් MTRB බෝට්ටු 56 ක් සහ NRTB

බෝට්ටු 88 ක් ඇතුලත් වෙයි. මෙහි අල්ලන මසුන් අතර ගල් මාළු, දැල්ලන්, මෝරුන්, කකුළුවන් වැඩි වශයෙන් ඇතුලත් වෙයි. උතුරු පළාතේ ධීවර සමිති වැඩිම සංඛ්‍යාව එනම් 117 ක් තිබෙන්නේ යාපනය දිස්ත්‍රික්කයේය.

386. **ප්‍රජා මුල් සංවිධාන (CBO):** වඩමරාච්චි උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මනාව ස්ථාපිතවූ ප්‍රජා මුල සංවිධාන කිහිපයක්ම ඇති අතර එමගින් සංවර්ධන කටයුතුවලට ප්‍රජා සහභාගීත්වය ලබා දීම හරහා පේදුරු තුඩුව සහ අවට සිදුවන ආර්ථි ක ප්‍රවර්ධන ඇතුලු සංවර්ධන කටයුතු ශක්තිමත් වෙමින් පවතියි. මෙම සංවිධානවල විස්තර පහත වගුව 4.40 හි ලබා දී ඇත.

**රූපසටහන 4-16 වඩමරාච්චි උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රජා මුල සංවිධාන - 2014**

| සංවිධානයේ වර්ගය | සංවිධානවල සංඛ්‍යාව |
|---|---|
| ග්‍රාමීය සංවර්ධන සමිති | 21 |
| කාන්තා සංවර්ධන සමිති | 38 |
| කාන්තා සංවර්ධන මධ්‍යස්ථාන | 14 |
| ක්‍රීඩා සමාජ | 40 |
| ක්‍රීඩා පුහුණු මධ්‍යස්ථාන | 2 |
| **එකතුව** | 115 |

**මූලාශ්‍රය: උතුරු පළාත් සභාව 2015**

387. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය**පවතින වෙරළ ප්‍රවේශය:** පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිපරිශ්‍රය හරහා වෙරළට සෘජුවම ඇතුල් වීම තහනම් කරනු ඇති හෙයින් ව්‍යාපෘතියපරිශ්‍රයේ නැගෙනහිර අන්යේ ඇති රජයේ ඉඩම්වල පදිංචිව සිටින නිවාස 16 කට හිමි ධීවර බෝට්ටු 30 කට වෙරළේ මෙම කොටස භාවිත කිරීමේ නිදහස අහිමි වනු ඇත. එය වෙනුවට නැගෙනහිර දෙස ඇති කොට්ටඩි ධීවර තොට සහ එය හා බැඳි හා රජයේ සංවර්ධන සැලැස්මට යටතේ ඇති ආරක්ෂාකාරී මුනෙයි නැංගුරම් තොට භාවිත කරන්නට ඔවුන්ට හැකි වනු ඇත. මෙම නැංගුරම් තොටේ මසංවර්ධන කටයුතු කඩිනම් කිරීමට පියවර ගෙන ඇති අතර අළුත්වැඩියා කටයුතු අවසන් වන තෙක් ප්‍රමාද වන සෑම මාස තුනක් සඳහාම -ආදායම අහිසි වීම හෙමිතු කොට ගෙන- රු. 45000 ක වන්දියක් හෝ මාස තුනක ආදායමේ සාමාන්‍යය යන දෙකින් වැඩි ප්‍රමාණයක දීමනාවක් බෝට්ටු හිමියන්ට ලබා දෙන බවට රජය ප්‍රකාශ කර ඇත.

# පස්වන පරිච්ඡේදය

## 5. බලපෑම් තක්සේරුව සහ අවම කිරීමේ පියවර

### 5.1 බලපෑම්වල වැදගත්කම

388. භෞතික, ජීව විද්‍යාත්මක, සමාජ-ආර්ථික සහ භෞතීය සංස්කෘතික සම්පත් යන කරුනු මත ව්‍යාපෘථියේ සාධනීය බලපෑම් පිළිබද තක්සේරුවක් සහ වියහැකි පාරිසරික බලපෑම් වලක්වා ගැනීම හෝ පිළිගත හැකි මට්ටමකට පාලනයකිරීම / අවම කිරීම සහතික කිරීම සොයා බලීම සඳහා අවශ්‍ය අවම කිරීමෙ පියවර හඳුනා ගැනීම, පහත කොටසින් දැක්වේ. පාරිසරික බිලපෑම්, ප්‍රධාන(හෝ වැදගත්) හෝ සුළු බලපෑම් වේද, ඒ අනුව අවම කිරීමේ පියවර විස්තරාත්මක සඳහන් වන අතර, ඒවා වියාපෘථියේ පරිසර කළමනාකරණ සැලැස්ම) ඇතුලත් කර ව්‍යාපෘතියේ නිර්මාණ සහ ලංසු ලියකියවිලි වලට අනුගත කිරීම අවශ්‍ය වෙයි.

389. වියහැකි බලපෑම්වල ප්‍රතිඵලයෙන් ඇතිවන වෙසෙසිය මට්ටම, බලපෑම් ආවරණය මත රඳා පවතින අතර ඊට 1) ශූන්‍ය බලපෑම් 2) සුළු බලපෑම් 3) මධ්‍යම බලපෑම් 4) ප්‍රධාන බලපෑම් සහ 5) හඳුනා නොගත් බලපෑම් ආදිය ඇතුලත්ය. බලපෑම්වල කාලසීමාව රඳා පවතිනුයේ කර්තව්‍ය විෂයපථය සේම ව්‍යාපෘතිය පිහිටි භූමිවල භෞතික හා ජීව විද්‍යාත්මක පරිසරය අනුවයි. බලපෑම් අවම නොකළහොත් ඒවායේ ප්‍රමාණයවැඩි විය හැකිය හෝ සුළු, ආවස්ථික හෝ විශාල විය හැක. බලපෑම්වල පරිමානය නිර්ණය කිරීම රඳා පවතින්නේ ස) බලපෑම්වල අවකාශ පරිමානය (පිහිටි තැනරී දේශීය, ජාතික, අන්තර්ජාතිකරී බව)රී සස) බලපෑම් එල්ලවන කාලසීමාව. (දීර්ඝ කාලීන, මධ්‍යම කාලීන හෝ කෙටි කාලීන ව්‍යාපෘතියේ කාර්යසාධන හේතුවෙන් පාරිසරික සංරචකවල ඇති වන වෙනස්වීම්වල ප්‍රමාණය (සුළු, මධ්‍යම, විශාල) ජනතාවට දැනෙන බව අන්තර්ජාතික, ජාතික, පළාත් හෝ දිස්ත්‍රික්ක පාරිසරික සංරචක සුරැකීමේ නීතීන්, නියාමන සහ රෙගුලාසි සමග අනුකූලතාවය ශ්‍රී ලංකා රජයේ හා ආසියානු වර්ධන බැංකුවේ (මාර්ගසූචක, ප්‍රතිපත්තීන් හා රෙගුලාසි සමග අනුකූලතාවය.

390. ඍජු, ඍජු නොවු සහ සම්මුච්ත බලපෑම් තුලනය කර ඇති අතර, අවශ්‍ය විටදී අවම කිරීමේ පියවර යෝජනා කර ඇත.

### 5.2 කොන්ත්‍රාත්කරුවන් සේවයේ යෙදවීමේදී ඇති වන බලපෑම්

**එකී බලපෑම් පහත කාර්‍යයන්ට සීමා වේ.**

- ජේදුරු තුඩුවේ ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියට (ජේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය) අදාල භෞමික සීමා නිර්ණය කිරීම සඳහා කරන මැනීම් සහ සීමාංකනයේදී ශාක ඉවත් කිරීම ඇතුළුව භූමිය එළි පෙහෙළි කිරීමේ ක්‍රියාවලිය.
- ඉඩම් භුක්ති විඳීමේ තහංචි, ඉඩම් සෝදාපාළුව සහ කළහැකි පුරාවිද්‍යා කැනීම් සහ
- සමාජීය ව්‍යසන, පවතින ඉදිකිරීම් භූමිභාග හා ඉදිකිරීම් කඳවුරුවල සේවයේ යෙදෙන ප්‍රජාව හා කාර්යමණ්ඩලය සමග සේවකයන්ගේ අන්තර් ක්‍රියාවලිය

#### 5.2.1 භෞතික පරිසරය

**කාලගුණ විපර්යාස හා අනුවර්තනය නිසා ඇතිවන බලපෑම්**

391. වර්ෂාපතනය, අනපේක්ෂිත ලෙස භූගත ජලය හිඟවීම, මුහුදු රළවල සහ මුහුදු ජලයේ සංසරණයේ හා සමුද්‍රබාදනයට තුඩුදෙන ජල රටාවන් වල ඇතිවන වැදගත් වෙනස්වීම් හෝ තීරණාත්මක ලෙස කාබන් මුදා හරිම යන කරුනු ජේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියහි ක්‍රියාවලියෙන් පාලනය නොවන නිසා කාලගුණ විපර්යාස ඇතිවීමේ අවදානමට සහ කාලගුණ විපර්යාස වර්ධනයටද, හේතු විය හැක.

392. කාලගුණ විපර්යාසයකට අනුවර්තනය වීමේ පියවර ජේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියෙහි සැලසුම් නිර්මානයට අන්තර්ගත කර ඇත. වර්ෂාපතනය, සිදුවිය හැකි මුහුදු ජල මට්ටම ඉහල යාම හා ස්වාභාවික කුනාටු සංසිද්ධි (සුළි සුලං, සුනාමි හා නියග) උත්සන්න වීමේ ප්‍රවනතාවතය වැලක්වීම මෙකී සොශෝධන ඇතුලත් කිරීමේ විශේෂ පරමාර්ථයි. එවන්

ස්වාභාවික ආපදා හේතුවෙන් අනපේක්ෂිත ලෙස වාරිබන්ධනවලටද, යාබද ධීවර වරාය තොටවලටද, වරායේ පිහිටි රේගුවටද අලාභහානි විය හැක. එමෙන්ම ධීවර වරාය හා ඊට යාබදව පිහිටි වෙරළතීරය හා පෙරවෙරළ පරිසර පද්ධතිවල ඉහල සමුද්‍රබාදනයක්ද එයින් සිදුවිය හැක. කාලගුණ විපර්යාස වලට අනුවර්තනය වීමේ නිර්මාණ සැලසුමේ පියවර පහත පරිදි වේ :

- නිර්මාණ සැලසුමවලට අනුගත කල කාලගුණ විපර්යාස පාලනය කිරීමේ ක්‍රියාදාමය තුල සමුද්‍ර බාදනය පළාත්බදව ඉහළ නොයාමට වගබලා ගැනීම.
- සීමාන්තිකව සිදු වන කාලගුණ සංසිද්ධීන්වලට (මුහුදු ජල තරංග අක්‍රමවත්ව ඉහළ යාම, සුළි සුලං, සුනාමි තත්වයන්, වර්ෂාපතනය සහ සමුද්‍ර බාදනය) මුහුන දීම සඳහා සකසන ලද සැලසුම් පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියෙහි යටිතල පහසුකම් සමඟ ඍනාත්මකව ඝට්ටනය වීම වැලැක්වීම.
- භූමිය සම්බන්ධ සියලු පරිහරණයන්හීදී ගලා යන ජලය ක්‍රමවත් කිරීම (කොන්ක්‍රීට් කිරීම) සහ අපතේ යන ජලය රැස්කිරීම හා විධිමත් කිරීම තහවුරු කරන පියවර ක්‍රියාත්මක කිරීම.
- විකල්ප බලශක්තියක් ලෙස සූර්ය බලශක්තිය නිපදවීමට පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියට අනුබද්ධ කිරීම තුළින් එහි බලශක්ති ඉල්ලුම අඩු කර ගැනීම.

393. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියදී හා ධීවර යාත්‍රා භාවිතයේදී අවශ්‍යය වන බොර තෙල් ආස්රිත රසායනික බලයෙන් ක්‍රියා කරන යන්ත්‍රවල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම හා අපද්‍රව්‍ය මුදා හැරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම තහවුරු කිරීමේ පියවර ක්‍රියාත්මක කිරීම. (යල්පිනූ අළුත්වැඩියාවේදී ඒවා නඩත්තු කිරීම හා ප්‍රතිෂ්ඨාපනය කිරීම)

- පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියෙහි කාර්යමණ්ඩලය, සාමාජිකයන් සහ සාමාන්‍යය ප්‍රජාව කාලගුණ විපර්යාස අනුවර්තනය ගැන දැනුවත් කිරීමේ පියවර තුළින් ඇති කරනු ලබන හානිකර බලපෑම් අවම කිරීම.

## 5.2.2 ජීව විද්‍යාත්මක පරිසරය

**පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියට අදාල භෞමික සීමා නිර්ණය කිරීම සඳහා කරන මැනීම් සහ සීමාංකනයේදී ශාක ඉවත් කිරීම නිසා ඇතිවන බලපෑම්**

394. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිට මායිම් වන භූමි ප්‍රදේශය මාර්ග හා නාගරික යටිතල පහසුකම් සංවර්ධනය හේතුවෙන් ව්‍යාපෘතියට කලින් විශාල වශයෙන් එළි පෙහෙලි කර තිබුනි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ආවේනික ශාක හා සත්ව ගහන නැත්තටම නැති තරමය. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියට නැගෙනහිරෙන් පිහිටි දක්ෂිණ මායිමේ කුඩා බිම් තීරුවක් වේ. එහි විශාල ගෙවල් සංඛ්‍යාවක් ඉදි කර අතර නිවැසියන් විසින් භූමිය ආස්රිතව වැවෙන ආවේනික නොවූ ශාක සහ පඳුරු රෝපණය කර ඇත. නමුත් මේ බිම් කැබැල්ල පිහිටා තිබෙන්නේ පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියට අයත් වන භූමි ප්‍රදේශයෙන් ගිනිකොණ අන්තයෙහි වන අතර එය ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධන සැලසුම් දියත් කරන ප්‍රදේශවලට ඔබ්බෙන් පහිටා තිබේ.

395. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියට අදාල භූමි ප්‍රදේශයේ මායිම් මැනීම හා සීමාංකනය සහ පසුව සිදු කරන ඉදිකිරීම් අදියර හේතුවෙන් දේශීය පාරිස්ථික විද්‍යාව සුළු අවපාතයකට ලක්විය හැක. ඊට හේතු වන්නේ එකී භූමි ප්‍රදේශයේ පිහිටි කුඩා බිම් කොටස්වල ඇති ශාක ගහනය එළිකිරීම සහ ශාක රාශියක් කපා දැමීමය (බහුතරය පොල් ගස්ය - *Cocos nucifera*) (ශාකගහන ආවරණයේ සවිස්තර සතියම සඳහා ඇමුණුම් අංක 8 හි 14 වන රූපය බලන්න). මේ ක්‍රියාදාමවල ප්‍රතිඵලයක් ලෙස භූමියේ සත්වගහනයට නිගිණිය හැකි බලපෑමක් ඇති විය හැකි අතර එහි ශාකගහනයටද (ප්‍රමුකවම, ප්‍රජාව විසින් නැවත රෝපණය කරන ලද ශාක) ඉතා සුළු බලපෑමක් අපේක්ෂා කළ හැක. ගනණින් ඉතිරිව ඇති ශාක පිහිටි කලාප එළි කිරීම තවමත් තීන්දු කර නැත. කෙසේ නමුත් ගණනින් ශාක ඉවත් කිරීම සහ ඉන් පරිසරයට ඇති වන බලපෑම අඩු සහ අවම කිරීමට අවශ්‍ය සියළු පියවර ගනු ලබනු ඇත. දැනට ඉතිරිව ඇති ශාකගහන සලකා බලිමේදී, එම ශාක පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියට අයත් භූමි ප්‍රදේශවලට ඇතුලත් කිරීම හා අධිකව නාගරිකණය වූ ප්‍රදේශවල ඉතිරිව ඇති ශාකගහනය සුරැකීමේ සංකල්පය හෙවත් හරිත තීරුව (Green-Belt) ක්‍රියාත්මක කිරීම භාර ගනු ඇත.

396. තර්ජනයට ආසන්න පළෑටි ප්‍රභේද දෙකක් වන වන්කිරුවිලායි *(Sesuviumportulacastrum)* හා මහාසරණ *(Trianthemadecandra)* උක්ත ප්‍රදේශයෙන් හමුවුනත් එවා ව්‍යාපෘතියේ ක්‍රියා පථයට ඍජුවම බලපෑමක් ඇති නොකරයි. වාර්තාවලට අනුව මේ ප්‍රභේද යාපනය අවට ප්‍රදේශය තුල සමාන ස්වාභාවික පරිසරවල බහුලව ඇත. අදාල පැළෑටි බලපෑමට

ලක්වුනහොත්, ඒවා ඉවත් කර නැවත සිටුවීම කරනු ලබන නිසාවෙන් ඉන් අහිතකර බලපෑමක් ඇති නොවනු ඇත. ප්‍රදේශය තුල තිබෙන අනිකුත් සියළු ශාක සහ පැළෑටි විශේෂ හඳුන්වා දෙන ලද ප්‍රභේද හෝ සාර්වත්‍රික දේශීය ප්‍රභේද වන අතර ඒවා එල්ලවන තර්ජනවලට ඔරොත්තු දීමේ හැකියාවෙන් ඉහලය. සංරක්ෂණ වටිනාකමක්ම නැති කිසිදු ශාක ගහත්වයක් නැතිවාක් මෙන්ම එකී ශාකගහත්වය එහි ආවරණ කලාපයේ නියෝජනයකද නොවේ. වෘක්ෂලතා ආදිය ඉවත්කිරම නිසා ඇතිවන බලපෑම් අවම කිරීම තහවුරු කරනුවස් ව්‍යාපෘතියට ඇතුලත් කර ඇති පියවර අතරට පහත කරුණු ඇතුලත්ය :

- 'වෘක්ෂලතා ඉවත් කිරීමේ දී කරනු ලබන මැනීම් හා සීමාංකන කාර්යන් විස්තර වශයෙන් නිර්දේශ කිරීම
- කිසිදු අවස්ථාවකදී අවසරයකින් තොරව නොකපන ලෙස නිර්දේශ කර ඇති ගස් කැපීම හෝ ඉවත් නොකරන ලෙස නිර්දේශ කර ඇති පඳුරු ඉවත් කිරීම කොන්ත්‍රාත්කරුවන්ට ඉඩ නොදීම.
- අවම වශයෙන් ඉවත් කරන ගස් එකකට ගස් තුනක් මෙතෝදිස්ත බාලිකා විදුහල ඉදිරියෙහි පිහිටි ධීවර වරාය අවට කිසිදු ඉදිකිරීමක් නොකරන ප්‍රදේශය තුල යළි රෝපණය කිරීම.
- ඉදිකිරීම් සේවකයින් විසින් හැකි හැම අවස්ථාවකදීම අනවශ්‍ය ලෙස ගස් බිම හෙළීම වලක්වා ගැනීමට අදාල පරිසරය සුරැකීමට සමාන්‍යෙන් ගනු ලබන පියවර සම්බන්ධයෙන් දනුවත් කරීම.
- වෙරල තීරයේ සහ ප්‍රධාන මාර්ගය අවට ඇතිශාක සහ අනිකුත් ලඳු හා ලතා ව්‍යාපෘතියේ භෞමික සීමාවට හා හරිත තීරුවේ සීමාවට ඇතුලත් කිරීම.

### 5.2.3 ඉදිකිරීම් කඳවුරු හා වැඩ බිම් පිහිටුවීම නිසා ඇතිවන බලපෑම්

397. වැඩබිම් සඳහා භූමිය එළිපෙහෙලි කිරීම නිසා දැනට පවත්වාගෙන යන සහ/හෝ අළුතින් පහිටුවන ලද ඉදිකිරීම් කඳවුරු සහ වැඩබිම් හේතුවෙන් තාවකලික බලපෑම් ඇති විය හැක. එකී බලපෑම් වලට, සත්වගහනයේ, ශාකගහනයේ හා වාසස්ථානවල වෙනස්වීම් සහ/හෝ පුරදාවිද්‍ය කැනීම් තුලින් ඇතිවන පස් ඉවත් කිරීම් හා පස් ගොඩ දැමීම් (සීඝ්‍ර නාගරීකරණය හේතුවෙන් මෙය සිදු වීමේ ඉඩ අල්පය), ඇතුලත් වේ. ගම් වල වතු හිමියන්ගෙන් සහ වතු වල සේවයෙහි යෙදී සිටින්නන්ගෙන් අදහස් විමසීම තුලින් (ඒ සඳහාම සැකසුනු සංනිවේදන සලැස්මට අනුව), ඉදිකිරීම් කඳවුරු සහ/හෝ ව්‍යාපෘතියේ ගබඩා භූමි සුදුසු භූමිභාගවල පිහිටුවනු ඇත. අවශ්‍ය අවම කිරීමේ පියවර පරිසර කළමනාකරණ සැලැස්ම වගුවෙහි දක්වා ඇත.

### 5.2.4 කොන්ත්‍රාත්කරුවන් සේවයේ යෙදවීමේදී ඇති වන බලපෑම්

398. කොන්ත්‍රාත්කරුවන් සේවයේ යෙදවීම හා අභිනවයෙන් වැඩබිම් පිහිටුවීමේද අවශ්‍ය වනුයේ, වැඩබිමෙහි සේවයෙහි යෙදෙන ඉදිකිරීම් කාර්යමණ්ඩලයේ වාරතාකරණයත් පසුව ඔවුන් සහ ප්‍රදේශයේ වෙළඳ හා නේවාසික ප්‍රජාව අතර ඇති වන අන්තර සම්බන්ධතාවයි. කොන්ත්‍රාත්කරුවන් වඩබිමෙහි සේවයේ යෙදවීමට ප්‍රථමයෙන් ව්‍යාපෘතියේ සංනිවේදන සැලස්මට අනුව ව්‍යාපෘතියේ ප්‍රජා සංවර්ධන නිලධාරිවරයා (CDO) විසින් ව්‍යාපෘතිය හා ප ප්‍රජාව අතර සංනිවේදනයක්/කෙටුම්පතක් පිහිටවනු ඇත. ව්‍යාපෘතියේ සේවකයන් අන්තර සම්බන්ධය සහතික කරනු වස් ඒ වෙනුවෙන්ම සැකසුනු නිර්දේශක හා කෙටුම්පත් පිළිබඳ එකඟතාවයක් අවශ්‍යයි. ව්‍යාපෘතියේ බලපෑම්, පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය අවට ප්‍රදේශයේ ආසන්නම සීමාවේ පිහිටි මෙතෝදිස්ත උසස් බාලිකා විදුහලේ සිසුවියන්ට හා ආචාර්ය මණ්ඩලයට, අවම කිරීමේ ක්‍රියාවලියක් සැපයීමට ඉවහල් වනු ඇත. කොන්ත්‍රාත්කරුගේ නිසි සම් ප්‍රජනයතාව සහ ගෞරවය ඒ සඳහා අවශ්‍යයි.

399. කොන්ත්‍රාත්කරු විසින් සේවකයාට ප්‍රමාණවවත් ඉඩකඩ සහ සනීපාරක්ෂක, වැසිකිලි හා ජල පහසුකම් සැපයීම කල යුතුය.

400. ඉදිකිරීම් සේවා භූමි සහ ප්‍රදේශ නිසා හා ඉදිකිරීම් සේවකයින් නිසා අතිවන බාධක අවම කිරීමේ පියවර :

- සේවකයන් සමඟ සේවා පුහුණුවේ කොටසක් ලෙස ප්‍රජා කෙටුම්පත් සාකච්ඡා කිරීම.
- වැඩබිමෙන් පිටත සේවකයන්ගේ ක්‍රියාකාරකම් පාලනය, සහ ප්‍රජා ව්‍යාවස්ථා සංග්‍රහය හැසිරීමේ රීතිය සේවා නියුක්තියා විසින් සෑම අවසථාවකදීම සහතික කළ යුතුය.
- කොන්ත්‍රාත්කරුවා විසින් සේවකයින් අතරින් තෝරාගත් සාමාජිකයකු, ප්‍රජාව හා කොන්ත්‍රාත්කරු මෙන්ම කොන්ත්‍රාත්කරු හා ව්‍යාපෘතිය අතර සම්බන්ධකරුවකු ලෙස පත් කිරීම.
- වැඩබිම් කඳවුරුතුල ප්‍රමාණවත් සංකේත පුවරු සහ ආරක්ෂණ ක්‍රම සැපයීම සහ වැඩබිම් කඳවුරු හෝ කම්මල් ප්‍රදේශවලට (ඒවා වෙන්ව පිහිටියේ නම්) අනවසරයෙන් පුද්ගලයින් (ළමයින් ඇතුළුව) ඇතුල් වීම වළක්වීම.

- වැඩ ආරම්භය පිළිබිඳ පූර්ව දැනුම් දීම, මහජනතාවට අවශ්‍ය අනතුරු වලක්වන බාධක ස්ථාපනය කිරීම සහ වැඩබිම් ප්‍රදේශ වල සීමා ලකුනු කිරීම සහ සංකේත තුලින් දනුම් දීම ඇතුළුව වැඩබිමට ආසන්නව වෙසෙන සමාන්‍ය ජනතාවගේ ආරාක්ෂාව සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීම.
- අමතර ආලෝකකරණය හා ආරක්ෂාකාරී පියවර ඇතුළුව මෙතෝදිස්ත උසස් බාලිකා විද්‍යාලයට තදාසන්න ප්‍රදේශයේ දෘෂ්‍ය බාධක ඉදිකිරීම.
- මාර්ග අළුත්වැඩියා කිරීමේ කාර්යයන් හේතුවෙන් තාවකාලිකව ප්‍රවේශ මාර්ග අවහිර වුවන්ගේ ආරක්ෂාව සුරක්ෂිත කිරීමේ ප්‍රතිපාදන
- ඉදිකිරීමේ නිරතවන සේවකයින් ව්‍යාපෘතියේ සේවා වැඩබිම් සහ කඳවුරු පරිශ්‍රයේ තදාසන්න ප්‍රදේශයට පමනක් සීමා විය යුතුයි. එමෙන්ම සේවකයින් විසින් ඉඩම් හිමියන්ගේ හා ජනතාවගේ භූමි සීමා පිලිබඳ සැලකිලිමත් විය යුතු අතර, ප්‍රජා සම්මත රීති සහ සම්මත හැසිරීමේ ක්‍රියාපටිපාටිය (විශේෂයෙන් ස්ත්‍රීන් හා වැඩිහිටියන් ඇමතීමේදී) ගැන සැලකිලිමත් විය යුතුයි.
- සේවයේ යෙදීසිටින සේවකයින් සහ තදාසන්න ප්‍රදේශවල ජනතාව එස්ටීඅයි/එච්අයිවී/ ඒඩ්ස් පිළිබඳ දැනුවත් කිරීමේ සහ ඒවා නිවාරණය කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවිය යුතුයි.

## 5.3 ඉදිකිරීම් අවධියේදී අතිවන බලපෑම්

401. ඉදිකිරීමේදී ඇති විය හැකි සියළු බලපෑම් සහ ඒවාට සරිලන අවම කිරීමේ පියවර කළමනාකරණය, කොන්ත්‍රාත්කරු විසින් කළ යුතුය. ඉදිකිරීම් කටතයුතු නිසා ඇතිවන බලපෑම් වලට පහත ක්‍රියාමාර්ග අතුලත් වේ. :

- ඉදිකිරීමේදී ක්රියාත්මක කරනු ලබන යන්ත්‍රෝපකරණ සහ වාහන නිසා ඇතිවන දූවිලි, ශබ්දය සහ කම්පනය
- වැඩබිම් සහ ඒවා පිහිටි ස්ථාන එළිපෙහෙලි කිරීම, පස් ඉවත් කිරීම, කැනීම් කටයුතු (මඩ හැරීම හා පුපුරණ ද්‍රව්‍ය භාවිතය) සහ උපකරණ ගබඩාකරණය.
- ගල්කුළු සහිත/කුහර සහිත වැඩබිම් වල සමූහ වශයෙන්/ගල්කුලකින් ගල් කැට නිස්සාරණය.
- ඉදිකිරීමේදී අතිවන අපද්‍රව්‍ය බහැර කිරීම, අහිතකර ද්‍රව්‍ය නිසා අතිවන දූෂණය සහ අපතේ යන ජලය කළමනාකරණය.
- වැලි, බොරළු සහ සිමෙන්ති යන ඉදිකිරීම් ක්‍ෂේත්‍රයේ භාවිතා වන ද්‍රව්‍ය ගබඩාකරණය .
- වාරි බන්ධන, ධීවර වරාය තටාක හා ධීවර වරාය ඉදිකිරීම
- ගමනාගමන කතයුතු අඩාලවීම හා ඉඩම් භාවිතය
- ඉදිකිරීම් සේවකයන් සහ ඔවුන්ගේ කඳවුරු විද්‍යාමානව තිබීම.

### 5.3.1 භෞතික සම්පත්

**වෙරල සහ වෙරල තීරයට එල්ලවන බලපෑම්**

402. **වරායේ ව්‍යුහාත්මක ලක්ෂණ හේතුවෙන් ඇතිවන දියවැල්වල ජල තරංග ආයාමයේ මාන වල වෙනස්වීම නිසා තදාසන්න වෙරල හා ගොඩබිම් ප්‍රදේශවල සිදුවන සෝදාපාලුව.**

403. PPD වරායේ ඉදිකිරීම හේතුවෙන් ඇතිවන සෝදාපාලුව හා වර්ධනීය බලපෑම් ඉතා අල්පය. සංඛ්‍යාත්මක ආකෘති වල ආධාරයෙන් ප්‍රාදේශීය වශයෙන් ඇතිවන ඉහල බලපෑම් පහතින් දැක්වෙන පරිදි හඳුනා ගෙන ඇත.

404. ධීවර වරායක් නැත යන සංකල්පය මත පිහිටා, ඊසාන දිග මෝසම් කාලයේදී ගල්පරයේ පිටත පැත්ත වටා දිවෙන බටහිර දෙසට සංක්‍රමනය වන සැඩ ජල ප්‍රවාහයක් අති බව හඳුනා ගෙන ඇත. මේ සැඩ ජල ප්‍රවාහය නිසා අවසානයේදී ඉතිරි වන්නේ ගල්පරයේ මුහුදට මුහුණලා ඇති කොටසෙහි රැඳෙන වඩා විශාල රළු අංශු පමනකි. ධීවර වරාය ඉදිකිරීමත් සමගම, ගල්පරය ඔස්සේ දිවෙන ජල ප්‍රවාහය අක්වෙරළ දෙසට ඇදී යන්නේ ගල්පරය හා දියකඩන ජේදනය වන තැනිනි. ජේදන ලක්ෂ්‍යය හා ඒ අවට මේ නිසා සෝදා යාමකට ලක් විය හැක. කෙසේ වෙතත් සෝදායාම, මීටර් 1ත් 5ත් අතර ඝනකම වැලි තට්ටුව නිසා සීමා වේ.

405. ඊසාන දෙසින් පැමිනෙන දිය රැළ වලක්වීමට ඉදිකල ද්විතීය දියකඩනයේ ආවරණය නිසා වරායේ බටහිර සීමාවේ දිය සුලි තත්වයක් වර්ධනය විය හැක. දියසුලි වල ජල ප්‍රවාහයන් මගින් වැලි අක්වෙරල දෙසට ගමන් කිරීම නිසා ධීවර වරාය වියුහයේ බටහිර දෙසට වන්නට පිහිටි සුබ්බරමඩම් ගොඩබිම් ප්‍රදේශය සෝදාපළුවකට ලක් විය හැක. කෙසේ වෙතත් දිය සුලි පැතිරයාමේ අවකාශය කුඩා ප්‍රදේශයකට සීමා වේ. අක් වෙරළ දෙසට වැලි ගමන් කිරීමේ ක්‍රියාවලිය සිදු වන්නේ ධීවර වරායට ආසන්න බටහිරින් පිහිටි කුඩා ප්‍රදේශයේ පමනි. තවද, ගල්පරය සහ ඊට යටින් පිහිටි ඝන ස්ථරය නිසා තරමක් තුනිහි වැලි තට්ටුවට සෝදාපාළුවේ බලපෑම අවම වේ.

406. කෙසේ වුවත සුබ්බිරමඩම් ගොඩබිම් ප්‍රදේශයේ එළදායි වෙරළ තීරයේ පළලෙහි ස්ථිර අඩුවීමක් දැකිය හැක. කෙසේ නමුත් සමස්තයක් වශයෙන් වරායේ ඕනෑම පැත්තක සෝදාපාළුව පැතිරයාමේ කිසිදු බලපෑමක් නොමැත.

**ඉදිකිරීම් කාලය තුලදී මෙන්ම දීර්ඝකාලීනව වෙරළබඩ තීරයෙන් දෙපස සෝදාපාළුව නිසා ඇතිවන බලපෑම්**

**ඉදිකිරීමේ අදියර**

407. ද්විතීය දියකඩන ඉදිකිරීරීමට පෙර ප්‍රධාන වාරි බන්ධනය තරමක් දුරට හෝ ඉදිකිරීම ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. එමනිසා ධීවර වරාය, ප්‍රධාන වාරිබන්ධනය හා ඉවුරට සමාන්තරව පිහිටි ගල්පරය ඡේදනය වන ලක්ෂයේදී ඇතිවන සොදාපාළුවේ බලපෑම් ඉදිකිරීමේ අදියරේදීද ඇති විය හැක. තවද, ඊසාන දිග මෝසම් කාලයේදී ප්‍රධාන දියකඩනය තැනීමේදී දියකඩනයේ මුදුනෙන් ඇතිවන රළ විවර්තනය හේතුවෙන් බටහිරට දෙසට ගමන් කළ යුතු වැලි දියකඩනයෙන් නැගෙනහිර දෙසට සංක්‍රමනය වීම සිදුවිය හැක. කෙසේ වෙතත් මෙම වැලිවල ගමන් මග වෙනස්වීම සුබ්බරමඩම් ප්‍රදේශයට තර්ජනයක් නොවනු ඇත. මන්ද යත් ප්‍රධාන දියකඩනය පිහිටියේ එකී ප්‍රදේශයට ඉතා දුරින් බැවිනි.

408. ද්විතීය දියකඩනය ඉදිකිරීම අරම්භ කිරීමත් සමගම වැලි නැගෙනහිරට සංක්‍රමනය වීම සීමා විය හැක. මේ නිසා ඉහතින් පහදා දුන් සුළි තත්වයක් නිර්මාණය සහ වෙරළඉම ඇතිවන වෙනස්වීම් අඩාල විය හැක.

409. අවසාදිත අංශු ප ප්‍රවාහනය කිරීමේ සංඛ්‍යාත්මක ආදර්ශ නිර්මාණය කිරීමේදී (EML 2018), එවායේ බාහිර බලපෑම් සුළු කාලීනව පහත පරිදි ඇතිවිය හැකි බව අනාවරණය විය. :

නැගෙනහිර දියකඩනයට ආසන්නතම නැගෙනහිරින් පිහිටි වෙරළ ඉම (මීන් ඉදිරියට කාලපය 1) (එය පිහිටා ඇත්තේ එම දියකඩන දියකඩන නිසා බටහිර දෙසට සිදුවන ප්‍රවාහනය සම්පූර්ණයෙන්ම ඇණහිටින පරිදිය.). (ඉ) බටහිර දියකඩනයට බටහිරින් වන හැරුම් ලක්ෂය සීමාවේ පිහිටි වෙරළ ඉම (මීන් ඉදිරියට කලාපය 2). මේ ප්‍රදේශ දෙක පිහිටි ස්ථාන අතර පරමාමිතික සැසඳීමේදී (කලාපය 1 හා 2 හි ගල්පරයේ භෞමික අක්පාව අවම මුහුදු මට්ටමට වඩා පිලිවෙලින් දල වශයෙන් 1m yd 0'25m ට ඇති බව සලකා බැලීමේදී) හෙලිවන කරුන වනුයේ පළමු වසර තුල ආකෘති නිර්මානය කිරීමේදී කාලපය 1 හි වෙරළ තීරය මීටර් 5 ක උපරිමයකින් ඉදිරියට වර්ධනය (පුළුල්) වන අතර කලාපය 2 හි වෙරළ තීරය මීටර් 20ක උපරිමයකින් පටු (ඛාදනය) වනු ඇති බවයි. මේවා වෙරළබඩ ප්‍රදේශ කලමණාකරනයේදී ඇතිවන විශාල වෙනස්කම් නොවුනත් වැරදි ප්‍රචාරයන් නිසා ප්‍රදේශවාසීන් තුලින් ඇතිවන ඍණාත්මක ප්‍රතික්‍රියා වැලැක්වීම සඳහා ඔවුන් දැනුවත් කිරීම අවශ්‍ය වෙයි.

**දීර්ඝ කාලීන**

410. ප්‍රධාන දියකඩනය හා වෙරළට සමාන්තරව දිවෙන ගල්පරය ඡේදනය වන ස්ථානයේදී ගැඹුරු මුහුද දෙසට වැලි ගමන් කිරීම දීර්ඝ කාලීනව සිදුවන නිසා නොගැඹුරු මුහුදේදීම වැලි ක්ෂයවීම හේතුවෙන් එම ක්‍රියාවලිය ක්‍රමානුකූලව පහව යා හැකිය. (නැගෙනහිර දෙසින් අවසාදිත අංශු මුහුදු වෙරලේ එකතුවීම බොහෝ දුරට සීමා වේ)

411. වෙරළ තීරය දිශානුගත කිරීම නිම වූ පසු දිස්සුළි නිර්මාණය සමග පෙදෙසේ බටහාර දෙස වෙරළ තීර දිශාවද නිමවනු ඇත. (මෙයට වසරක් දෙකක් පමණ ගත විය හැකිය).

**පෙදෙසේ වරායේ දියකඩන දෙපස වෙරළේ පාංශු ඛාදනය / අධිවර්ධනය සහ අගාධමිති විපර්යාස**

412. මිම් 1-1.5 ක පමණ ඉතා තුනි වැලි ස්තරයක් (යටින් තිබෙන්නේ තද ගල්ය) තිබෙන හෙයින් අගාධමිති විපර්යාස සීමා වන්නේද මෙම මට්ටම්වලටය. මෙයට පෙර විස්තර කරන ලද අගාධමිති විපර්යාසට වඩා වෙනස් අගාධමිති විපර්යාස කිසිවක් තිබෙන්නේ නැත.

413. දිගු කාලීන බලපෑම් ඇගයීම පිණිස ඓතිහාසික වාර්තා විශ්ලේෂණයක් රොන්මඩ ප්‍රවාහන අධ්‍යයනය යන නමින් සිදු කරන ලදී. (EML, 2018).

414. පෙදෙසේ ඉතා කුඩා රොන්මඩ ප්‍රවාහන අනුපාතිකය නිසා සැලකිය යුතු වෙරළතීර විපර්යාසයක් බලාපොරොත්තු විය නොහැකි අතර මෙය චන්ද්‍රිකාවලින් ගත් ගෝලීය දත්ත පදනම ඇතුලත ලුජෙන්ඩික් සහ කණ්ඩායම (2018) විසින් මෑතකදී ඉදිරිපත් කරන ලද චන්ද්‍රිකාවලින් ගත් අධ්‍යයන පෙදෙසේ වෙරළතීරවලින් පැහැදිලි දක්වා ඇත. උපදේශකවරුන් විසින් ආදේශ කරන GIS තාක්ෂණ සහිතව හා වළාකුල් රහිතව ඇති ඡායාරූප කිහිපයක ක්‍රමයට වඩා මෙම SDS ප්‍රවේශය වෙරළතීර පිළිබඳ වඩාත් විශ්වාසනීය ඇස්තමේන්තු ලබා දෙයි. ශ්‍රී ලංකාව වැනි දත්ත අඩු පෙදෙස්වලට SDS ඇස්තමේන්තුවල විශ්වායසනීය බව සාපේක්ෂව ඉතා ඉහළය. ඡායාරූප ගණනාවක් ස්වයංක්‍රීයව විශ්ලේෂණය වන මත පදනම් වන ඇස්තමේන්තුවලට වඩා බැහැදිලි චායාරූප පමණක් ප්‍රවේශය වඩාත් ප්‍රයෝජනවත්ය.

415. ගෝලීය SDS දත්ත සංචිතය වෙතින් ලබා ගන්නා ලද වරළතීර තත්වයන් (1984-2017)**රූපසටහන 5.1** හි දක්වා ඇති අතර එමගින් දක්වන්නේ වසරකට/මීටර් 0.2ක අභිවර්ධනයක් පමණකි හා මෙය ස්ථාවර එමෙන්ම දිගු කාලීනව බලන කල අවශේෂ විපර්යාසයකි. (ලුජෙන්ඩික් සම කණ්ඩායම 2018). එසේ වුවද ඇතැම් වසරවල වෙරළතීර විපර්යාස දිගුකාලීන ප්‍රවණතවායට වඩා ඉහළ බව සැපලකිල්ලට ගත යුතුය. (උදා: 2011-2012 සාට මීටර් 30 ක අභිවර්ධනයක් සහ 2015-2016සිට මීටර් 20ක අභිවර්ධනයකි) මෙම තනි විපර්යාසය ලොව රේඛීය නොවන වෙරළතීර සඳහා වන දිගු කාලීන විපර්යාසය සඳහා වන පොදු ලක්ෂණයකි)

**රූපසටහන 5-1 චන්ද්‍රිකාවෙන් ගන්නා ලද වෙරළතීරවල ගෝලීය දත්ත සංචිතයෙන් ගන්නාලද යෝජිත ජේදුරු තුඩුව වරායේ සමීපතම නැගෙනහිර අන්තයේ වෙරළ තීර තත්වයන්**




ලුජන්ඩික් සහ කණ්ඩායම (2018) විසින් ඉදිරිබපත් කරන ලද චන්ද්‍රිකාවෙන් ගන්නා ලද වෙරළතීරවල ගෝලීය දත්ත සංචිතයෙන් ගන්නාලද යෝජිත ජේදුරු තුඩුව වරායේ සමීපතම නැගෙනහිර අන්තයේ වෙරළ තීර තත්වයන් (1984-2017)

ධණ හා ඍණ සලකුණුවලින් දක්වා ඇත්තේ පළමු චන්ද්‍රිකා රූපයට සාපේක්ෂ අභිවර්ධන/ඛාදනයයි (1988)

**ජලවහන රටාවල වෙනස් වීම්**

416. ධීවර වරාය ඉදිකිරීම හෝ එනිසා වෙනස්බ වන වෙරළ තීරය ව්‍යාපෘති පෙදෙසේ ස්වාභාවික ජලවහන රටාව වෙනස් නොකරයි.

417. පහත විස්තර කර ඇති පරිදි වත්මන් මාර්ග ජලවහන බැහැර කිරීමේ සැලසුම වෙනස්වීම්වලට ලක්වනු ඇත.

418. ව්‍යාපෘති හා අවට පෙදෙසේ වෙරළ පෙදෙස අර්ධ වශයෙන් ගල්පර සහිත පටු තීරයක් වන අතර සමීපයෙන්ම පිහටා ඇත්තේ යාපනය - පොන්නාලයි මාර්ගයයි. වෙරළ හා මාර්ගය අතර උසෙහි මීටර් 2-2.5 ක වෙනසක් ඇති අතර දැනට ඉදි කරන ලද බෝක්කු මගින් හරස් පාරවල් ඇතුලු මාර්ගයේ ජලවහනය මුහුදට බැහැර කරනු ලැබේ. වැසි ජලයද මුහුද දෙසටම ගලා

යයි. ධීවර වරාය ඉදි කරන විට වරායේ නැගෙනහිර මායිම ඔස්සේ එක් බොක්කුවක්ද මෙතෝදිස්ත බාලික පාසැල ඔස්සේ තවත් බොක්කුවක්ද ඉදි කෙරෙනු ඇත. මෙම බොක්කු දෙකම ධීවර වරාය මායිමෙන් පිටත ඇති බොක්කුවට හරවනු ඇත.

419. දැනට ඇති ජලවහනයට කිසිදු බාධාවක් ඇති වන්නේ නැත.

**ප්‍රවාහ සහ රළ රටා රළ උස සහ දිශා වෙරළාසන්න ප්‍රවාහ ප්‍රවේග ඒවායෙහි දිශා උදම් එළ වැනි ජලවිද්‍යාවේ ඇති වන විපර්යාස**

420. **රළ:**ව්‍යාපෘතිය අසල ඊසාන රළවල අභිබවනයක් ඇති හෙයින් බලපෑම් කිසිවක් ඇති වන්නේ මෙම රළවලිනි. ඊසාන රළ ප්‍රධාන (නැගෙනහිර)BW වටා හැරෙනු ඇති අතර එය ද්වීතීය (බටහිර)BW හි බටහිරෙන් ආවරණය වු පෙදෙසක් නිර්මාණය කරනු ඇත.

421. **උදම් රළ:**උදම් රළ ප්‍රවාහයේ ප්‍රවේගය එතරම් සැලකිය යුතු නොවුවද එය පසු කරන්නේ වරායේ පියසටහන් වන නමුත් මෙනිසා බලපෑම් කිසිවක් ඇත් වන්නේ නැත.

422. **ප්‍රවාහ:** පෙර සඳහන් කළ පරිදි සංඛ්‍යාමය නිරූපණයෙහි ගල්පරයේ පිත මුහුණතෙහි අධික ප්‍රවාහයක් නිරීක්ෂණය මෙම ප්‍රවාහ ඊසාන දිග මෝසම් සෘතුවෙහි නැගෙනහිර සිට බටහිර දෙසට ප්‍රධාන වශයෙන් ගලා යනු අතර නැගෙනහිර දියකඩනය හමු වු විට හැරී අක් වෙරළට ගලා යයි.

**දිගු හා කෙටි කාලීනව රොන්මඩ ප්‍රවාහන රටාවල ඇති වන වෙනස්කම්**

423. ඊසාන දිග මෝසම් සෘතුවෙහි සුළු ප්‍රමාණවලින් රොන්මඩ වැඩියෙන් ප්‍රවාහනය වන්නේ නැගෙනහිර සිට බටහිර දෙසට වන අතර ඊසාන දිග මෝසම් සෘතුවෙහි සැලකිය යුතු වැලි හැසිරීමක් දක්නට නොමැත. මෙය උද්ගත වන්නේ පෙදෙසින් උත්පාදනය වන කුඩා රළ මගින් වන හෙයින් ධීවර වරාය ඉදිකිරීම නිසා පෙදෙසේ ප්‍රධාන (නැගෙනහිර)BW ගල්පර අසල චලනයන් සහ ද්වීතීය (බටහිර)BW යෙන් බටහිරට ඇති වන චලනහැර රොන්මඩ රටාවල සැලකිය යුතු වෙනසක් ඇත් නොවනු ඇත.

**ගල් සහ ද්‍රව්‍ය ප්‍රවාහනය සහ එයට ඇතිවිය හැකි බලපෑම්**

**ගල් වළ**

424. භූවිද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්‍යාංශය, EPl සහ මධ්‍යම පරිසර අධිකාරිය වතින් කර්මාන්ත බලපත්‍ර ලබා ඇති ගල් වළවල් තුනක් හඳුනා ඇති අතර එම බලපත්‍ර මගින් පරිසරයට හානි ඇති නොවන ආකාරයෙන් ගල් වළේ කටයුතු කරන ආකාරය සඳහා මාර්ගෝපදේශ ලබා දී කොන්දේසිද පනවා ඇත. නිර්දේශ නොසලකා හරින ගල්කොරි ක්‍රියාකාකරකම් නිසා පරිසරයට මෙන්ම ශාක හා ජීවීන්ට හානි ඇති විය හැකි හෙයින් අදාල එම නිර්දේශ එම ගල්වළවල් අනුගමනය කරනු කොන්ත්‍රාත්කරු තහවුරු කර ගත යුතුය.

**පිරවීම් ද්‍රව්‍ය ගන්නා පෙදෙස්**

425. හෙක්ටෙයාර 6.3 ක් නැවත පිරවීම සඳහා 117,000 $m^3$ක පමණ පිරවීම් ද්‍රව්‍ය අවශ්‍ය වනු ඇති අතර මුහුදු පත්ල හැරීමෙන් ලැබෙන 18,000 $m^3$ ක පමණ ද්‍රව්‍ය ඒ සඳහා යොදා ගනු ඇත. පිරවීමේ ද්‍රව්‍ය ලබා ගත හැකි ස්ථාන යාපනය දිස්ත්‍රික්කයේ නොමැති හෙයින් ඉතිරි 99.000 $m^3$ පිටතින් ලබා ගනු ඇත. අනිසි අන්දමින් කැණීම් කටයුතු සිදු කිරීම ස්වාභාවික සදම්පත්වලට බපෑම් ඇති කළ හැකිය.

**මාර්ගවලට ඇති විය හැකි බලපෑම්**

426. සන්නාහ 327,500 $m^3$ සහ පිරවුම් ද්‍රව්‍ය 99,000 $m^3$ වෙනත් දිස්ත්‍රික්කවලින් ප්‍රවාහනය කළ යුතුය. අවශ්‍ය ඉදිකිරීම් ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා වාහන ගමන් වාර 945 ක් පමණ දිනකට අවශ්‍ය වනු ඇති බව ගණන් බලා ඇත. ගල්වලවලි හා ගල් කොරිවලින් ව්‍යාපෘති ප්‍රදේශයට ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ මාර්ගයෙහි ප්‍රධාන කොටස මාර්ග සංවර්ධන අධිකාරිය හෝ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය / උතුරු පළාත් DRD අධිකාරිවලට අයත් මාර්ග වේ. සන්නාහ සහ පිරවුම් ද්‍රව්‍ය ටොන් 6, ටොන් 9 සහ ටොන් 12 බර දැරිය හැකි ධාවන පථ භාවිතා කරමින් මුල්ලයිතිව්, වවුනියා හෝ අනුරාධපුර දිස්ත්‍රික්ක වලින් ප්‍රවාහනය කෙරේ. දැනට පවතින මෙම මාර්ගවලට ටොන් 12ප දක්වා වන බර දරා ගත හැකිය. එබැවින් මාර්ග වලට හානි ඇති වීම් අවදානමක් නොමැත. කෙසේ වෙතත්, ගල් කොරි සහ ගල් වළවල් පිළිබඳ නිගමනයට එළඹීමෙන් පසු ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු විසින් ප්‍රවාහන බලපෑම් තක්සේරුවක් සිදු කළ යුතුය.

427. කණින ලද ද්‍රව්‍ය 26,600 m$^3$ක් ව්‍යාපෘති පරිශ්‍රයේ සිට බැහැර කිරීම සඳහා කිමි 5 ක් පම ණ ඇතින් වඩමරාච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වල්ලිපුරම් ප්‍රදේශයට නැගෙනහිර වෙරළින් ගෙන යා යුතු අතර ඉහත සඳහන් හා මෙම කටයුත්ත සඳහා මාර්ගය භාවිත කරන විට වාහන තදබදයක් මෙන්ම පාරවලට හානිද ඇති විය හැකිය.

428. අභ්‍යන්තර පාරවලින් බහුතරයක් අදාල පළාත් පාලන ආයතනවලින් නඩත්තු කරන ලබන හා වැඩි බර දැරිය නොහැකි බොරළු හෝ තාර පාරවල් වන අතර මෙම මාර්ග භාවිත කිරීම නිසා ඒවාට හානි ඇති වී වළවල් ඇති විය හැකිය හා වැසි කාලවල එම වළවල ජලයි පිරී එම මාර්ග භාවිත කරන්නන්ට හිරිහැර ඇති විය හැකිය.

429. කණින ලද ද්‍රව්‍ය 26,600 m$^3$ක් ව්‍යාපෘති පරිශ්‍රයේ සිට බැහැර කිරීම සඳහා කිමි 5 ක් පමණ ඇතින් වඩමරාච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වල්ලිපුරම් ප්‍රදේශයට නැගෙනහිර වෙරළින් ගෙන යා යුතු අතර කැණීම් කටයුතු මාස 8 ක් පමණ පවතිනු ඇත. මෙම කටයුත්ත සඳහා මාර්ගය භාවිත කරන විට වාහනය පටු නිසා වාහන තදබදයක් මෙන්ම පාරට මෙන්ම අවට ගොඩනැගිලිවලටද හානිද ඇති විය හැකිය හා ධීවරයන් සමුහයා හා පදිකයන් ඇතුලු මාර්ග භාවිත කරන්නන්ට හිරිහැර ඇති විය හැකිය.

**මාර්ග භාවිත කරන්නන්ගේ ආරක්ෂාව**

430. පාසැල මග හරිමින් පේදුරු තුඩුව යාපනය මාර්ගය හරහා හෝ නැගෙනිහර වෙරළ පාර හරහා ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමට යෝජනා වී ඇති නමුත් මෙවැනි ජනාකීර්න පාරවල් භාවිත කරන විට හදිසි අනතුරු ඇති වීමේ අවදානම වැඩිය. සාපේක්ෂව යාපනය - පොන්නලායි - පේදුරුතුඩුව මාර්ගය පාසැල් ළමුන් අඩුවෙන් භාවිත කරන නමුත් අනතුරු වැළැක්වීමට මාර්ග නීති අනුගමනය කළ යුතුය. පරිශ්‍රයට ප්‍රවේශ වන මාර්ගවල විස්තර **රූපසටහන 5.2** හි දක්වා ඇත.

**රූපසටහන 5-2 ප්‍රවාහන මාර්ග**




**ප්‍රවාහනය නිසා ගොඩනැගිලිවලට ඇති විය හැකි බලපෑම්**

431. විශාල ගල්ප්‍රවාහනය කරනු ලබන්නේ අවශ්‍ය ධාරිතාවය ඇති මාර්ග සංවර්ධංන අධිකාරිය සහ පළාත් මාර්ග සංවර්ධන අධිකාරයේ පාරවලින් හෙයින් ගොඩනැගිලිවලට ඇති විය හැකි බලපෑම් අවම වන නමුත් නැගෙනහිර වෙරළ පාර සහ පොන්නලායි - යාපනය මාර්ගය ඔස්සේ නිවාස වැඩියෙන් පිහිටා ඇති අතර වාහන ගමනාගමනය නිසා ඇති වන දෙදරුම් හේතු කොට ගෙන පාර දෙපස ගොඩනැගිලිවලට හානි ඇති විය හැකිය.

**අනෙකුත් බලපෑම්**

432. අවශය කරන ගල් ලබා ගනු ඇත්තේ පාරිසරික නීතිනියාමනඅනුගමනය කරන A සහ B කාණ්ඩයේ කර්මාන්ත පතල් බලපත්‍ර, භූවිද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශබලපත්‍ර සහ පරිසර ආරක්ෂක බලපත්‍ර ඇති ගල් කොරිවලින් වන නමුත් රාත්‍රි කාලයෙහි ද්‍රව්‍ය පැටවීම හා බෑම අනිසි ලෙසින් සිදු කළහොත් එනිසා නැගෙන ශබ්ද හා දූවිලි නිසා අවට වාසය කරන්නන්ට හිරිහැර ඇති විය හැකිය. යෙන්

433. අවට භෞමික හා සාගර පරිසරයට රොන්මඩ බැහැර වීම වැළැක්වීමට සියලුම ගල් තබනු ඇත්තේ පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘති පරිශ්‍රය ඇතුලත හෙයින් මෙම අන්තයෙන් සැලකිය යුතු බලපෑම් කිසිවක් ඇති වන්නේ නැත.

**අළුත් ගල් කොරි කිසිවක් විවෘත කරන්නෙ නම් එහි බලපෑම් අවම කිරීම සඳහා වන පියවර**

- වෙරළ, අන්තර් උදම්, වගුරු බිම්, තෙත් බිම්, කඩොලාන වැනි පාරිසරික ඵලදායී හා සංවේදී ස්ථාන කැණීමට අවසර නොමැත.
- භූවිද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්‍යාංශය/මධ්‍යම පරිසර අධිකාරිය/ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ ඉඩම් හිමියන් මෙන්ම ප්‍රජාව සමග සාකච්ඡා කර පරිශ්‍ර හඳුනාගත යුතුය හා අවසන් තීරණ ගත යුතුය.
- සියලුම ද්‍රව්‍ය ලබා ගැනීම ප්‍රවාහනය කිරීම පැටවීම සහ ගබඩා කිරීමේ පෙරාතුකොළයට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය එකග වී පරිශ්‍රයට ගොඩනැගිලි ද්‍රව්‍ය ගෙනෙන විට සියලුම අදා ක්‍රමවේද අනුගමනය කරනු තහවුරු කළ යුතුය.
- දූවිලි නැගීම වැළැක්වීමට ද්‍රව්‍ය ප්‍රවාහනය කරන වාහන සියල්ල ටාපුලින් රෙදිවලින් ආවරණය කළ යුතුය.

ඉදිකිරීම් පරිසර කළමනාකරණ සැලැස්මේ අංගයක් ලෙසින් කොන්ත්‍රාත්කරු විසින් ද්‍රව්‍ය හා සුන්බුන් කළමනාකරණ සැලැස්මක් සම්පාදනය කරනු ඇති අතර මෙයට පහත කරුණු ඇතුලත් වනු ඇත:

- සුදුසු සැපයුම් මූලාශ්‍ර හඳුනා අවශ්‍ය හා අදාල සියලුම ගිවිසුම් සහ බලපත්‍ර ලබා ගැනීම
- අවශ්‍ය කරන ද්‍රව්‍ය විභව මූලාශ්‍ර ඇස්තමේන්තුගත ප්‍රමාණ ගල්කොරිවලින් ලබා ගැනීමට තිබීම
- කැණීම් තාක්ෂණ සහ ද්‍රව්‍ය නැවත භාවිත කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය කිරීම

භූවිද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්‍යාංශය / මධ්‍යම පරිසර අධිකාරියේ පිටසනෙහි අනුමැතිය අනුව සුන්බුන් ඉවත් කළ යුතුය.

කොංක්‍රීට් සඳහා අවශ්‍ය වැලි ගල් වැනි ඉදිකිරීම් ද්‍රව්‍ය ලබා ගත යුත්තේ භූවිද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්‍යාංශය/මධ්‍යම පරිසර අධිකාරියේ මාර්ගෝපදේශ අනුව කටයුතු කරන ගල්කොරි වලිනි.

ගල් කැබලි ව්‍යාපෘති පරිශ්‍රයට සීමා කළ යුතුය.

සියලුම ගල් සහ ගල් කැබලි තොගවලට රොන්මඩ පැතිරී යාම අවම කිරීම සඳහා වන මඩ රඳවන සහිතව අනුමත සහ එකගවූ රොන්මඩ සහ දූවිලි කළමනාකරණ පොරාතුකොළ ඇතුලත් කර තිබිය යුතුය.

මඩ රඳවන හෝ දැල්වල රැස්වන රොන්මඩ දෛනිකව/සතිපතා ඉවත් කර නිර්දේශිත ස්ථානවලට දැමිය යුතුය හා පහත ස්ථානවල නොදැමිය යුතුය:

- තෙත් බිම් කැලෑ පෙදෙස් වෙරළ සහ අනෙකුත් පරිසර සංවේදී ස්ථානවලට
- හිමිකරුගේ ලිඛිත අනුමතිය නොමැති නම් පුද්ගලික ඉඩම්වලට
- ජල මූලාශ්‍රවලට
- අවශ්‍ය නම් සුන්බුන් ආරක්ෂාකාරී ලෙසින් බැහැර කිරීමට කටයුතු සුදානම් කිරීම ස්ථාවර කිරීම, පාංශුකාදන පාලනය අවශ්‍ය නම් බැහැර කිරීමේ ස්ථානයේ කාණු සහ නැවත ශාක රෝපණය කිරීමේ ප්‍රතිපාදන සහිතව ආරක්ෂාකාරීව සුන්බුන් ඉවත් කිරීමට කටයුතු කිරීම.
- ආරක්ෂක වැසුම් සහ පිරවීමේ ද්‍රව්‍ය බලපත්‍ර ලත් ගල් කොරියකින් ලබා ගන්නා බව තහවුරු කර ගන්න.
- ව්‍යාපෘතියේ ප්‍රවාහන කටයුතු නිසා අවට ගොඩනැගිලිවලට ඇති විය හැකි හානිය ඇගයීමට කටයුතු ආරම්භ කිරීමට පෙර ඉරිතැලීම් සඳහා අධීක්ෂණයක් සිදු කළ යුතුය.
- ද්‍රව්‍ය ප්‍රවාහන සමයෙහි නිසි රථවාහන කළමනාකරණ සැලැස්මක් උපයෝගී කළ යුතුය. විශේෂයෙන් ව්‍යාපෘතිය පිහිටා ඇත්තේ මෙතෝදිස්ත් උසස් බාලිකා පාසැල අසලාහෙයින් පාසැල් වාර සමයෙහි පදිකයන් ගැන ආරක්ෂක නිලධාරීන් සැලකිලිමත් විය යුතුය.
- ජාතික පරිසර පනතේ නිර්දේශිත පරිදි ශබ්ද සහ දෙදරුම් මට්ටම් තිබීම තහවුරු කර ගත යුතුය.

**මළාපහන ජලාපහන ඝන බැහැර කිරීම්, පරණ තෙල් වැගිරීම, මතුපිට ගලනය ආදිය වෙරළ පරිසරයට හා ජලයට යෑම නිසා ඇති වන බලපෑම්**

**මළාපහන බැහැර කිරීම නිසා ඇති වන බලපෑම්**

434. සියලුම මළාපවහන සහ ජලාපවහන නිසියාකාරව ඉදි කරන ලද පූතික ටැංකි සහ පෙගවුම් වළවලින් කළමනාකරණය කරනු ඇති හෙයින් ඒවා පරිසරයට මුදා හැරෙන්නේ නැත.

- ප්‍රමාණවත් වැසිකිළි පහසුකම් කඳවුරට ලබා දිය යුතුය.

435. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ වෙරළේ සීමිත පෙදෙසක වුවද ඉදිකිරීම් සමයෙහි මතුපිට ගලනය නිසා මඩ සහ දුවිලි අංශු මුහුදට එනු ඇති නිසා ජලරෝධ මට්ටම් වැඩි වී ව්‍යාපෘති පෙදෙසේ මුහුදු පත්ලේ රොන්මඩ රැස් විය හැකිය. ඉදිකිරීම් අවසන් වන තුරු ධීවර වරාය බේසම කැණීමට ලක් වන හෙයින් මතුපිට ගලනය නිසා බේසමට ඇති වන බලපෑම් අවම වෙයි. එනිසා කොන්ත්‍රාත්කරු මුහුදට මඩ ඇතුල් වීම වැළැක්වීමට කාණුව ඔස්සේ මඩ පෙරන ලබා දිය යුතු අතර එම පෙරන නිසියාකාරව ක්‍රියාකරනු පිණිස විටින් විට ශුද්ධ කළ යුතුය.

**අනතුරුදායක ද්‍රව්‍ය භාවිත කිරීම ගබඩා කර තැබීම සහ වැගිරීම ආදිය නිසා පරිසරය දූෂණය වීම**

436. ඉදිකිරීම් සමයෙහි කණින යන්ත්‍ර ඇතුලු විශාල යන්ත්‍රලින්ද ගබඩා පරිශ්‍රයෙන්ද තෙල් මෙන්ම ප්‍රවාහන / පරිහරණය නිසාද තීන්ත හා රසායන ද්‍රව වැනි අනතුරුදායක ද්‍රව වැගිරීම නිසා සාගර ජලය දූෂිත විය හැකි හෙයින් මෙම බලපෑම් අවම කිරීමට කොන්ත්‍රාත්කරු පහත පියවර ගත යුතුය:

- පරිසර කළමනාකරණ සැලැස්මේ අංගයක් ලෙසින් අනතුරුදායක ද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක්ද (HSMP) ඇතුලත්ව විස්තරාත්මක හදිසි ප්‍රතිචාර සැලැස්ම (DERP) ද්‍රව්‍ය / තෙල් / ඉන්ධන ගබඩා කිරීම වැගිරීම සහ හදිසි අනතුරු ඇතිවීම ආවරණය කිරීම පිණිස කොන්ත්‍රාත්කරු සැලැස්මක් සම්පාදනය කළ යුතු අතර අනතුරුදායක ද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මට පහත කරුණු අන්තර්ගත විය යුතුය:
- දේශීය නීති හා නියාමන මෙන්ම ජාත්‍යන්තර යහ චර්යා නිර්දේශ
- අනතුරුදායක ද්‍රව්‍ය ඉන්වෙන්ටරිය
- අනතුරුදායක රසායන වර්ග සහ අනතුරුදායක ද්‍රව්‍ය හා බැඳි අවදානම් හඳුනා ගැනීම
- සියලුම ගොඩනැගිලි මාර්ග වැඩබිම් එළිමහන් රසායන ගබඩා මළාපවහන කාණු ළිං ජලමූලාශ්‍ර සහ යාබද ගම්මාන ආදිය දක්වන නිමාවල විස්තර සහ පරිශ්‍ර සැලැස්ම
- සියලුම අනතුරුදායක ද්‍රව්‍යවල ගබඩා පරිශ්‍ර හදිසි අවස්ථා උපකරණ සහ පිටවීම්, පෙදෙසින් ඉවත් වීමේ ස්ථාන හදිසි අවස්ථා නිලධාරීන්ව නිර්දේශිත නිපුණයන් හමු වන ස්ථාන සහ සියලුම ටැංකි, සම්ප සහ පයිපිං ආදිය දක්වන නිමාවේ ගබඩා සැලැස්ම
- අනපේක්ෂිත නිරාවරණ පියවර
- හදිසි අවස්ථා ප්‍රතිචාර (සෞඛ්‍ය හා ආරක්ෂක සැලැස්මෙහි දක්වා ඇති හදිසි අවස්ථා ප්‍රතිචර නිර්දේශ සමග සම්බන්ධ වීම) සහ
- සංසිද්ධි සටහන් කිරීම සහ වාර්තා කිරීම.
- සියලුම පෙට්‍රෝලියම් රසායන ද්‍රව්‍ය සඳහා වන ගබඩා පරිශ්‍ර වෙරලේ සිට යටත් පිරිසෙයින් මීටර් 100 ක් ඇතින් පිහිටුවීම.
- ඉන්ධන ඇතුලත්ව රසායන අගුල් දැමිය හැකි ආරක්ෂාකාරී ගබඩාවක තැන්පත් කළ යුතු අතර මෙය කාලගුණ විපර්යාසවලට ඔරොත්තු දෙන රසායන ද්‍රව්‍ය වැගිරීම් නිසා ඇති නොවන පෙදෙසක හා එවන් පොළොවක ශක්තිමත් බිත්ති සහිතව තිබිය යුතුය
- සියලුම අනතුරුදායක ද්‍රව්‍යයකම පැහැදිලිව ලේබල් අලවා තිබිය යුතුය.
- පාවිච්චි කළ තෙල් සහ අනෙකුත් විෂමය සහ අනතුරුදායක ද්‍රව්‍ය පරිශ්‍රයෙන් පිට නිර්දේශිත ස්ථානයකට බැහැර කළ යුතුය.
- ද්‍රවමය අප්‍රව්‍ය පළාත් බලධාරීන් විසින් නිර්දේශිත තැන්වලට බැහැර කළ යුතුය.

- අධික වැසි කාලවල කොංක්‍රීට් කිරීමේ වැඩකටයුතු නවතා දමන්න.
- තෙල්/ ලිහිසි තෙල්/ හයිඩ්‍රොකාබන් ආදිය මගින් ජලමූලාශ්‍ර සහ වෙරළාසන්න ජලය දූෂිත වීම වැළැක්වීමට අවශ්‍ය පියවර ගත යුතු අතර වැගිරීම් සියල්ල නොපමාව සහ ඉතා ප්‍රවේශමෙන් මෙන්ම සලකුණු ඉතිරි නොවන ආකාරයෙන් පවිත්‍ර කළ යුතුය.
- සියලුම වැගිරීම් හදිසි අවස්ථා සැලැස්මට අනුව හා නිර්දේශිත පවිත්‍ර කිරීමේ කට්ටල සහ පෙට්‍රෝලියම් රසායන සහ අනෙකුත් අනතුරුදායක ද්‍රව්‍ය සඳහා නිර්දේශිත ද්‍රව්‍ය යොද ශුද්ධ කළ යුතුය.
- නිර්දේශිත ශ්‍රමිකයන් වැගිරීම් පවිත්‍ර කිරීමේ උපකරණ පරිහරණයෙහි පුහුණුව ලබා ඇති බව නිශ්චය කරන ගන්න. .
- ව්‍යාපෘතියේ සියලුම වාහන හා යන්ත්‍ර හොඳින් නඩත්තු කරන බව සහ හදිසි අනතුරක් හට ගත් විට එය පැය 24 ක් ගත වන්නට පෙර පොලිසියට සහ MID හට වාර්තා කරන බව නිශ්චය කරන ගන්න.
- තෙල් සහ රසායන වර්ග පරිහරණය කරන සියලුම ශ්‍රමිකයන් එය පිළිබඳ සහ අදාල කළමනාකරණ ක්‍රමවේද ගැන දැනුවත් කර සුදුසු අධීක්ෂණ සිදු කරන්න.
- වාහනවල ඉන්ධන ටැංකි නිසි ලෙස සවි වී තිබෙනු හා එහි මුඩි හොඳින් වැසී තිබෙනු නිශ්චය කරන ගැනීම මගින් ඩීසල් තෙල් සහ ලිහිසි තෙල් වැගිරීම් පාලනය කරන්න. වැඩිපුර තෙල් භාවිතනොවන බව කිශ්චය කර ගන්න.
- ජලයේ වාහන නවතා තබා සර්විස් නොකර නිර්දේශිත පෙදෙස්වල පමණක් සිදු කළ යුතු අතර එම ස්ථාන කොංක්‍රීට් කර තෙල් වැගිරීම් සඳහා තෙල් පෙරන සවි කළ යුතුය. නඩත්තු කරන ස්ථානයේ වැගිරෙන තෙල් ලී කුඩු කපු රෙදි කැබලි ආදියෙන් වහා පිසදා පවිත්‍ර කළ යුතු අතර මෙම ද්‍රව්‍ය විශේෂිත අපද්‍රව්‍ය යැයි ජාතික පරිසර පනතේ නිර්වචනනය කර ඇති හෙයින් ඒවා වානේ හෝ ප්ලාස්ටික් බැරල්වල තබා පුත්තලමේ ඉන්සී සීමෙන්ති (මෙයට පෙර හොල්සිම් ලංකා) කම්හල වැනි බලපත්‍ර ලත් නිර්දේශිත බැහැර කිරීමේ අංගනවලට යැවිය යුතුය.
- ව්‍යාපෘති පෙදෙස ඇතුලත වාහන සර්විස් කිරීමට අවසර නොදෙන අතර එය කළ යුත්තේ බලපත්‍ර ලත් EPL සේවා ස්ථානවල පමණී.
- පැය 24 ක් ඇතුලත සියලුම හදිසි අනතුරු පොලිසියට සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට (PMU)සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයට (PIU) දන්වා සිටිය යුතුය.
- ගබඩා ටැංකි අසල වෙඩි බෙහෙත් / පුපුරන ද්‍රව්‍ය ගබඩා කර නොමැති බව තහවුරු කර ගත යුතුය.

**ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමට අදාලව මතු විය හැකි ගැටළු**

437. ඉදිකිරීම් සමයෙහි අපද්‍රව්‍ය නිසි ලෙස කළමනාකරණය නොකළහොත් මුහුදට සෝදා යැවීම ස්වාභාවික ජලවහනයට අවහිර ඇති වීම වැනි තත්වයන් උද්ගතවිය හැකි හෙයින් අපද්‍රව්‍ය නිසිලෙස රැස් කරන හා රැස් කර තබන විධි යෝජනා කරන අතර ඒවා අනුගමනය නොකිරීම දුගඳ හා සතුන් ඇද දැමීම නිසා අපද්‍රව්‍ය විසිරී යාම ඇතුලුව පරිසර දූෂණයට තුඩු දිය හැකිය. තවද ජලයට අපද්‍රව්‍ය මුසු වීම නිසා ජලය දූෂිත වී ජලජ භාක හා ජීවීන්ට හානි ඇති කළ හැකිය. ව්‍යාපෘතිය තිබෙනු ඇත්තේ කැලෑ පෙදෙස්වලින් ඈතින් නිසා වන ජීවීන්ට බලපෑම් ඇත් වන්නේ නැත.

438. සියලුම ඉදිකිරීම් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කළ හැකි හා ප්‍රතිචක්‍රීකරණය කළ නොහැකි ලෙසින් වෙන් කළ යුතුය. ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය පෙදෙසේ ප්‍රතිචක්‍රීකරණය කරන මධ්‍යස්ථානවලට අලෙවි කළ යුතු අතර කැඩුනු ටයිල් කැබලි, සුන්බුන්, කැඩුනු ගඩොල් සහ කොංක්‍රීට් කැබලි වැලි සමග මිශ්‍ර වුනු සිමෙන්ති වැනි ප්‍රතිචක්‍රීකරණ කළ නොහැකි අපද්‍රව්‍ය පිරවීම් අවශ්‍යතා සඳහා ගත යුතුය හා ඉතිරිය පළාත් පාලන ආයතනය මගින් නිර්දේශිත ස්ථානවලට බැහැර කළ යුතුය.

  - සියලුම ඉදිකිරීම් අපද්‍රව්‍යවලින් දූවිලි නොනැගෙනු පිණිස පොලිතීන්, ටාපුලින් හෝ ඝන රෙදිවලින් ආවරණය කර ගබඩා කළ යුතුය.
  - වියලි කාලවල අවශ්‍ය නම් නම් ජලය ඉසිය යුතුය හා අපද්‍රව්‍ය තෙත්ව තබා ගත යුතුය
    - අපද්‍රව්‍ය පිළිස්සීම නිසා අවට වාසය කරන්නන්ට හිරිහැර ඇතිවිය හැකි හෙයින් එයට කිසිසේත් අනුමැතිය නොමැති අතර අපද්‍රව්‍ය වෙන් කිරීම සඳහා ජාතික වර්ණ කේතයන් වන නිල් තැඹිලි රතු දුඹුරු කොළ ආදි වර්ණ වලින් යුත් බහාලු පොලිතින් කඩදාසි කාඩ්බෝඩ් ලෝහ බෝතල් සහ ජෛව

අපද්‍රව්‍ය සඳහා කොන්ත්‍රාත්කරු ලබා දිය යුතුය. සියලුම ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අපද්‍රව්‍ය වෙන් වශයෙන් රැස් කර ප්‍රතිචක්‍රීකරණය කරන මධ්‍යස්ථානවලට අලෙවි කළ යුතු අතර ජෛව වර්ගීකරණයේ අපද්‍රව්‍ය ජේදුරු තුඩුව නගර සභාව හරහා බැහැර කළ යුතුය.

- පිළිස්සුනු CFL බල්බ් ඇතුලු කැඩුනු සන්නිවේදන පරීක්ෂක උපකරණවල කැබලි ආදිය වෙනම රැස් කර මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි කර ඇති ප්‍රතිචක්‍රීකරණයන කරන මධ්‍යස්ථානවලට ලබා දිය යුතුය

**ජල ගුණාත්වයට ඇති වන බලපෑම්**

439. ඉදිකිරීම් අදියරෙහි ඇති ප්‍රධානතම ක්‍රියාකාරකම් වන කැණීම් සහ එම අපද්‍රව්‍ය බැහැර කිරීම හා ප්‍රතිසංස්කරණ කටයුතු නිසා ධීවර වරාය බේසම වටා හා ඇළ අවට ජලරෝධය ඉහළ යන අතර රොන්මඩ මුසු වීම මුහුදට තවත් බැලපෑම් ඇති කළ හැකිය. මුහුදු පත්ලේ රොන්මඩ කණින විට බුරුල් වුනු ද්‍රව්‍ය ඉහළට එන විට කණින යන්ත්‍රයෙන් එය පිටාර ගැලෙනු ඇත.

**රොන්මඩ රැස්වීම සහ ජලරෝද මට්ටම් ඉහළ යාම**

440. දුෂිත නොවුනු රොන්මඩ කණින විට සහ බැහැර කරන විට අවලම්බිත රොන්මඩ සහ ජලරෝධය උත්සන්න වීම ප්‍රධාන බලපෑම් වන අතර එවන් කැණීම් භාවිත කිරීම නිසා ජල කොලම්වලට ආලෝක කාවැදීම අඩුවීම හා භෞතික බාධා ඇති වී ජලජ ශාක හා ජීවීන් මත දරුණු බලපෑම් ඇති කළ හැකිය. කැණීම් කටයුතු අවසන් වී දින 10 ක් 15 ක් දක්වා මෙම තත්වය පැවතිය හැකිය.

441. අවලම්බිත රොන්මඩ වැඩි වී සිප්පි බෙල්ලන් හා කරමල්වල හිර වී මතශ්‍ය පැටවුන්ට හානි ඇති කළ හැකි අතර වැඩි අවරෝධය නිසා මතශ්‍ය පැටවුන් විශාල ලෙස විනාශ වනු හා වැඩුනු මතශ්‍යයන් පෙදෙසින් ඉවත් වනු නිරීක්ෂණය වී ඇත.

442. ජල රෝධය වැඩි වීම ජලයේ ගැඹුර අඩු වී ජලය කා වැදීම අඩු විය හැකි අතර එනිසා දියේ ගිලී ඇති ශාකවල ඵලදායීතාවය සහ වර්ධන ප්‍රතිශතය හීන වනු ඇති හෙයින් කොරල් වැනි නිතලවාසී ජීවීන් පෙදෙසෙහි වර්ධනය වන්නේ මඳ වශයෙන් වුවද මෙම අන්තයෙන් ඇතිවන බලපෑම් අවශේෂය.

**සාගර ජල ගුණාත්වයට ඇති වන බලපෑම්**

443. රොඩොක්ස් (eH) සහ pH යනු ජලයේ සහ රොන්මඩවල රසායනවල ලක්ෂණ පාලනය කරන විචල්‍ය දෙකක් වන අතර pH 8හි සහ eH< 150 mV හි තිබෙන තාක් කල් රසායන හා ලෝහවල බහුතරයක් අවට ජලයට මුදා නොහැරී ඝන මතුපිටෙහි තැන්පත්ව තිබෙනු ඇත. මෙම මට්ටමට වඩා eH අඩු කරනු ලබන්නේ ඇනොක්සික තත්වයන්වල පමණක් වන හෙයින් දියවුනු ඔක්සිජන් මට්ටම සාමාන්‍ය පරාසයෙහි තිබුනහොත් රසායන හෝ බර ලෝහ ක්ෂීරණය වීමක් අපේක්ෂා කරනු නොලැබේ.

444. දුෂිත කරන මූලාශ්‍ර නොමැති පරිසර පද්ධතියක ඕගනික දුෂන වැඩි වන විට හා වැඩි වන තෙක් ඇනොක්සික තත්වයන්හි දියවුනු ඔක්සිජන් මට්ටම් අඩු නොවන අතර අනාගතයෙහිද මෙය අපේක්ෂා කරනු නොලැබේ. මෙම තත්වයන් යටතේ රසායන ගහ් බර ලෝහ ජලය තුලට ක්ෂීරණය වීමක් සිදු විය නොහැක. එපමණක් නොව මෙම ස්ථාන සියල්ලෙන්ම රැස් කරන ලද රොන්මඩ නියැදි දුෂිත නොවූ ඒවාය. කරුණු එසේ හෙයින් කැණීම් නිසා ජලයේ හෝ රොන්මඩෙහි රසායනවල ලක්ෂණවලට දැඩි බලපෑම් ඇති වන්නේ නැත.

445. කැණීම් නිසා ඇති වන ජල ගුණාත්ව බලපෑම් පෙදෙසට සීමා වුනු හා තාවකාලික වනු ඇති අතර මෙම බලපෑම් වැළැක්වීමට අවම කිරීමට හෝ පාලනය කිරීමට පහත පියවර ගත යුතුය:

– කැණීම් කටයුතු සැලසුම් කරන්නට පෙර උදම් තත්වයන් සැලකිල්ලට ගත යුතුය හා හැකි විට අඩු උදම් කාලවලට එය සීමා කළ යුතුය. අඩු උදම් කාලවල කැණීම් සිදු කළහොත් සිහිනු රොන්මඩ ගාසා ගෙන යාමක් සිදු නොවේ.

– කැණීම් පෙදෙසේ පැහැදිලිව සලකුණු කිරීම

– පාරගම්‍ය හා පාරගම්‍ය නොවන ද්‍රව්‍යවල සංකලනයෙන් සාදන ලද මඩ තිර සවි කළ යුතු අතර ඉදිකිරීම් පරිශ්‍රයට රොන්මඩ සීමා කිරීමට කැණීම් පෙදෙස වටා තාප්පයක් ඉදි කළ යුතුය.

– බලපෑම් අවම කිරීමට වඩාත් සුදුසු කැණීම් උපකරණ තෝරාගත යුතු අතර පහත මගපෙන්වීම් අනුගමනය කළ යුතුය (a) ලුපුව උස්පහත් කරන විට රොන්මඩ රැස්වීමට ඇතිවිය හැකි අනවශ්‍ය බාධා අවම කළ යුතු (b) කාන්දු වීම්

වැළැක්වීමට පත්ලේ විවරයට තද මුද්‍රා තබන ලද බත්තල් භාවිත කළ යුතුය (c) අවට ජලයට කණින ලද ද්‍රව්‍ය විසී වනු වැළැක්වීමට නියමිත බර බත්තල්වලට පටවනු තහවුරු කර ගන්න (d) පටවන විට සහ ප්‍රවාහනය කරන විට ද්‍රව්‍ය හෝ අපත ජලය පිටාර ගැලීම වළක්වනු පිණිස බත්තල් සහ හොපර් නිශ්චිත මට්ටමකට පමණක් පුරවන්න. රළ මගින් බත්තල් තට්ටුව සේදී නොයනු පිණිස හිස් ඉඩක් පවත්වාගෙන යා යුතය (e) අර්ධ වශයෙන් වැසුනු උලුපු ඇති වන අහිමි වීම් අවම කිරීමට කරනු ලබන කැණීම්වලදී විශාල ද්‍රව්‍ය අතින් ඉවත් කරන්න

– කැණීම් නිසා රොන්මඩ රැස්වීම සහ ජලරෝදය උත්සන්න වීම

බලපෑම් අවම කිරීමට වඩාත් සුදුසු කැණීම් උපකරණ තෝරාගත යුතු අතර පහත මගපෙන්වීම් අනුගමනය කළ යුතුය

- o බලපෑම් අවම කිරීමට වඩාත් සුදුසු කැණීම් උපකරණ තෝරාගත යුතු අතර පහත මගපෙන්වීම් අනුගමනය කළ යුතුය
- o උලුපුව උස්පහත් කරන විට රොන්මඩ රැස්වීමට ඇතිවිය හැකි අනවශ්‍ය බාධා අවම කළ යුතය
- o කාන්දු වීම් වැළැක්වීමට පත්ලේ විවරයට තද මුද්‍රා තබන ලද බත්තල් භාවිත කළ යුතුය
- o අවට ජලයට කණින ලද ද්‍රව්‍ය විසී වනු වැළැක්වීමට නියමිත බර බත්තල්වලට පටවනු තහවුරු කර ගන්න
- o පටවන විට සහ ප්‍රවාහනය කරන විට ද්‍රව්‍ය හෝ අපත ජලය පිටාර ගැලීම වළක්වනු පිණිස බත්තල් සහ හොපර් නිශ්චිත මට්ටමකට පමණක් පුරවන්න. රළ මගින් බත්තල් තට්ටුව සේදී නොයනු පිණිස හිස් ඉඩක් පවත්වාගෙන යා යුතුය
- o අර්ධ වශයෙන් වැසුනු උලුපු ඇති වන අහිමි වීම් අවම කිරීමට කරනු ලබන කැණීම්වලදී විශාල ද්‍රව්‍ය අතින් ඉවත් කරන්න

- ජලරෝද ප්‍රශ්න පාලනය කිරීමට සැම විටම බත්තල් අවට රොන්මඩ මෙවලම් සවි කළ යුතු
- කැණීම් සහ දියකඩන සංවර්ධනය වැනි සියලු අන්තර් උදම් සහ උප උදම් ඉදිකිරීම් කටයුතු සිදු කරවන සමයන්හි විශේෂිත රොන්මඩ සහ දූෂක රැස්කිරීමද ඇතුලත්ව, අපත ජල රොන්මඩ නිසා උද්ගත වන ප්‍රශ්න අන්තර් උදම් සහ උප උදම් ඉදිකිරීම් කටයුතු (මඩ කැණීම් සහ දියකඩනය සෑදීම ආදිය) කළමනාකරණය හා නියාමනය කිරීම පිණිස රොන්මඩ පෙරන, මළු (වෙරළබඩ) දැල් ආදිය ඉදිකිරීම් පරිශ්‍රයේ සවි කළ යුතුය.
- ඉහත පියවර ක්‍රියාත්මක වනු තහවුරු කරනුවස් තියුණු ලෙසින් ඉදිකිරීම් අධීක්ෂණ සිදු කළ යුතුය
- කැණීම් කටයුතු සැලසුම් කරන විට උදම් සහ පෙදෙසේ රළ තත්වයන් සැලකිල්ලට ගත යුතුය. මේ සඳහා අඩු රළ කාල තෝරා ගත යුතුය.
- ආරුකුම් බැම්ම ඉදිකිරීමට (පියොටෙක් රෙදි ඇතුලත්ව) ගල්පර ප්‍රතිසංස්කරනය කළ යුතු අතර කනින ලද ද්‍රව්‍ය වලින් නැවත පිරවිය යුතුය.
- තද වැසි කාලවල ක්‍රියාකාරකම් නවතා දැමීමේ ප්‍රතිපාදන තිබිය යුතුය.
- රොන්මඩ කළමනාකරන චර්යා සහ වගකීම් ගැන ඉදිකිරීම් කාර්ය මණ්ඩලය දැනුවත්ව සිටිය යුතුය.
- මුහුදු ජලයේ ගුණාත්වය අධීක්ෂණය කළ යුතුය.

## 5.3.2 භෞමික හා සාගර පාරිසරික සම්පත්

### වෙරළබඩ අන්තර් උදම් සාගර වාසස්ථාන සහ සම්පත් ආරක්ෂා බලපෑම්

446. උදම් රළ ගල්පර මෙක් 6.4 ක් ප්‍රතිසංස්කරණය කිරීම, දියකඩන දෙකක්, තොටමළු සහ ගොඩනැගිලි ඉදිකිරීම ඇතුලු ඉදිකිරීම් කටයුතු නිසා පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියඅවට අන්තර් උදම් ගල්පර පරිසරයට හා එය සමග බැඳි සාගර සම්පත්වලට සැලකිය යුතු භෞතික බාධා ඇති වනු ඇත. වැලි හා ගල් වැනි ප්‍රතිසංස්කරණය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය කැණීම්වලින් එතැනින්ම ගනු ඇති අතර ධීවර වරාය බේසම තැනීමට ඉවත් කරන ගල්ද යොදා ගනු ඇත.

447. යෝජිත ධීවර වරාය ක්‍රියාකාරකම් නිසා පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියෙහි අන්තර් උදම් හා උප උදම් ඉදිකිරීම් පියසටහන් ඇතුලත පිහිටි සාගර නිතලවාසී සම්පත්වලට සෘජු සෘණාත්මක බලපෑම් ඇති වන නමුත් පෙදෙසෙහි ශාක හා ජීවීන් ඇත්තේ සුළු ප්‍රමාණවලින් හා අඩු ජීව විද්‍යාත්මක හා ජෛව විවිධත්වයකින් යුත් නිසා මෙන්ම අඩු පැවතුම් අගය නිසා බලපෑමේ දරුණු බවද අවමය. කණීන ලද රොන්මඩ ඉවත් කිරීම සහ උප උදම් අක් වෙරළ උප ස්තරයෙන් පතුල් ගල් ඉවත් කිරීම නිසාද වාසස්ථාන හා බැඳි සම්පත්වලට බලපෑම් ඇති වන්නේ නැත. (නිතලවාසී සම්පත් හමු වුයේ නැත).

448. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියපරිශ්‍රයේ අන්තර් උදම් හා උප උදම් සාගර පරිසරයෙහි කඩොලාන මුහුදු තෘණ වැනි අවධි ලෙසින් තර්ජනයට හෝ අනතුරට ලක් වුනු සාගර වාසස්ථාන දක්නට නොමැති හෙයින් වෙරළට හෝ සාගර ජෛව විවිධත්වයට පරිසර පද්ධති ක්‍රියාකාරකමට ආර්ථික හෝ සංස්කෘතික වැදගත්කම්වලට බලපෑම් කිසිවක් ඇති වන්නේ නැත.

449. යෝජිත දියකඩන ද්විත්වය සහ ධීවර වරාය යටිතල පහසුකම් ඉදි කර අවසන් වූ පසු ජංගම අපෘෂ්ඨවංශික හා පෘෂ්ඨවංශික ශාක හා ජීවීන්ට වාසය කිරීමට සුදුසු නිතලවාසී හා ජංගම යන වාසස්ථාන දෙකම ලැබෙනු ඇති අතර යෝජිත යටිතලපහසුකම්වල පුළුල් බව නිසා ව්‍යාපෘතියේ ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණ කටයුතු නිසා අහිමි වන නිතලවාසී වාසස්ථාවලට වඩා විශාල වාසස්ථාන නිර්මාණය වනු ඇත යැයි අනුමාන කර ඇත. එනිසා අත්‍යන්ත ප්‍රතිඵලය ධණාත්මකය.

450. කැණීම් ක්‍රියාකාරකම් නිසා අවලම්බිත රොන්මඩ සහ සුන්බුන් නිසා සම්පත්වලට බාධා ඇති වන නමුත් මෙම බලපෑම් මෙම කටයුතු පවතින කාලයට සීමා වන අතර රොන්මඩ තිර සහ සාගර බුම මගින් පාලනය කර ජලරෝධය අවම කර ජල කොලමයට රොන්මඩ පුළුල්ව පැතිරී යාම වළකා ගත හැකිය. කරුණු එසේ හෙයින් මෙම සාගර පරාස කටයුතු නිසා ඇතිවන බලපෑම් සුළු හා පෙදෙසට සීමා වු තාවකාලික ඒවාය හා සම්මිති ඉංජිනේරු චර්යා සහ යහපත් අවම කිරීමේ පියවර මගින් පාලනය කළ හැකි ඒවාය. තවද ව්‍යාපෘතියේ සාගර හා වෙරළබඩ පෙදෙසට තර්ජන කිසිවක් නොමැති හෙයින් සාගර පරිසරයේ සිදු කරන ක්‍රියාකාකරම් නිසා ඇති වන බලපෑම් සුළු තාවකාලික හා අවශේෂය.

451. **අවම කිරීමේ පියවර:** බලපෑම් අවම කිරීම සඳහා වන පියවරට පහත කරුණුද ඇතුලත් වෙයි:

MSMP ක්‍රියාත්මක කිරීම

- අන්තර් උදම් සහ උප උදම් ගල්පර ප්‍රතිසංස්කරණ සමයෙහි දැක්විය යුතු අවධානය - භෞතික ස්ථාන ගත වීම සහ එයිනික්බිති වන ද්‍රව්‍යමය ස්ථාන ගත වීම පාලනය කිරීමට ගල්පර තට්ටු මත හා (දියකඩනය) වැලි කැණීම සහ රොන්මඩ ඉවත් කිරීම (පිපිරවීම) මෙන්ම ඉදිකිරීම් අදියවරල සහ වෙරළබඩ නිතලවාසී උප ස්තරය නිශ්චිත ක්‍රියා පරාසයට ඉවත් කිරීම.
- සාගර ශාක හා ජීවීන්ට ඇති වන බලපෑම් අවම කිරීමට ගල්පරයට ගෙනෙන ඉදිකිරීම් ද්‍රව්‍ය නිර්දේශිත හා යාබදව ඇති නිශ්චිත ක්‍රියා පෙදෙස්වලට සීමා කළ යුතුය
- පොළොවේ සහ බත්තල්වල සිදු කරන සියලුම සාගර ඉදිකරීම් කටයුතු සඳහා යොදාගන්නා යන්ත්‍රෝපරකණ සියල්ල මනා ක්‍රියාකාරී තත්වයේ තිබෙනු හා නඩත්තු කෙරෙනු මෙන්ම පෙට්‍රෝලියම් රසායන කිසිවක් කාන්දු නොවනු තහවුරු කර ගත යුතුය
- පෙට්‍රෝලියම් රසායන වැගිරීම පාලනය කිරීමට සෑම වෑයමක්ම ගත යුතු අතර එය පාලනය කරන උපකරණ සූදානමින් තැබිය යුතුය
- යාන්ත්‍රික උපකරණ අවශ්‍ය වන ක්‍රියාකාරකම් හැකි සෑම විටම සම්බන්ධීකරණ සිදු කරමින් අඩු උදම් කාලවල සිදු කළ යුතුය.
- පුපුරන ද්‍රව්‍ය සහ රසායන භාවිතා වන ක්‍රියාකාරකම් දිවා කාලයේ පමණක් සිදු කළ යුතු අතර ඒවායෙහි වේලා පිළිබඳව මහජනයාට දැන්විය යුතුය හා සියලුම ශ්‍රමිකයන්ට අවශ්‍ය ආරක්ෂක පළඳනා සැපයිය යුතුය.
- යාබද පරිසර පද්ධතියට ඇති විය හැකි බලපෑම් අවම කිරීමට අවලම්බිතමඩ පෙරන තිර (ජියෝ රෙදි) සාගර බුම සහ දැල් ආදිය ප්‍රතිසංස්කරන පෙදෙස් වටා (කණීන යන්ත්‍ර ගල්පර සහ දියකඩනය) සවි කළ යුතුය.
- ඉදිකරීම් කටයුතු නිසා බාධාවට ලක් වුනු නිතලවාසී උප ස්තරය කළමනාකරණය කිරීමට සහ අඩු කිරීම ඉදිකිරීම් සමයෙහි දියකඩන සංවර්ධනය වටා මඩ තිර සවි කිරීම.
- ප්‍රකිසංස්කරණ හා රොන්මඩ/ගල් චලන සමයෙහි විහව අවලම්බිත රොන්මඩ අඩු කිරීමට සහ පාලනය කිරීමට ධීවර වරාය ප්‍රතිසංස්කරන පෙදෙස පුරා මඩ තිර සවි කිරීම.

- රැස් කරන ලද රොන්මඩ ජලයට නොවැටෙනු නිශ්චය කරගැනීමට තිර උස් කර රොන්මඩ ඉවත් කරන විට ප්‍රවේශම් විය යුතු අතර තිර ප්‍රවේශමෙන් කිමිදුම්කරුවන් එතිය යුතුය හා රැස් කළ රොන්මඩ නිර්දේශිත ස්ථානවලට බැහැර කළ යුතුය.
- සියලුම ඉදිකරීම් ගල් සහ ද්‍රව්‍ය ගබඩා කර තැබිය යුත්තේ පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘති පරිශ්‍රය ඇතුලත වන (දියකඩනය සහ ධීවර වරාය සීමා) අතර මඩ පෙරන සෑම විටම භාවිත කළ යුතුය.
- පරිශ්‍රයේ අවශ්‍ය නොවන කණින ලද සියලු ද්‍රව්‍ය (දියකඩනය සහ පසු පිරවීම්) එක්රැස් කර සාගර පරිසරයෙන් ඉවත් කර අනුමැතිය ලත් හා වෙරළේ සිට අවම වශයෙන් මීර් 100 ක් වත් ඈති පිහිටා ඇති නිර්දේශිත ස්ථානවලට බැහැර කළ යුතුය.

452. විභව බලපෑම්වල අවශේෂ බව නිසා ඉදිකිරීම් අදියර පුරා නිර්දේශිත අවම කිරීමේ පියවර ක්‍රියාත්මක කරනු තහවුරු කිරීම සඳහා වන තියුණු අධීක්ෂණයක් හැරෙන්නට විශේෂිත සාගර අධීක්ෂණ වැඩසටහනක් ව්‍යාපෘතියට අවශ්‍ය නොවනු ඇත.

**භෞමික වාසස්ථාන සහ සම්පත් බලපෑම්**

453. පොදුවේ යෝජිත ධීවර වරාය කටයුතු යාපනය - පොන්නලායි පේදුරුතුඩාව සහ පේදුරු තුඩුව නැගෙනහිර පාරවල් දෙසට ඇති සාගරික පරිසරයට සීමා වන හෙයින් භෞමික පරිසරයට සහ එය හා බැඳි ශාක ජීවී සම්පත්වලට ඇති වන බලපෑම්පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිපරිශ්‍රයේ නැගෙනහිර අන්තයට හා විනාසවලට හා වෙරළට සීමා වනු ඇත. භෞමික ශාකවලට ඇති වන සීමා අවම වන අතර වැඩියෙන්ම ඇත්තේ පොල් ගස් සහ කුඩා වගා බිම්ය. ව්‍යාපෘතියේ ක්‍රියාත්මක අදියරෙහි කැපිය යුතු ගස්වල නිශ්චිත සංඛ්‍යාව තීරණය කරනු ඇති නමුත් නිසි සැලසුම් කිරීම මගින් එම සංඛ්‍යාව අඩු කර ගත හැකිය හා වරායේ උද්‍යානාලංකාරයට ඒවා එක් කර ගත හැකිය.

454. එක දේශික හෝ අනතුරට ලක් වුනු ශාක කිසිවක් ව්‍යාපෘති පෙදෙසෙහි නොමැති නමුත් අනතුරාසන්න වුනු ශාක දෙකක් (*Sesuviumportulacastrum*සහ *Trianthemadecandra*) පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිපරිශ්‍රයේ නැගෙනහිර අන්තයේ හමු විය. මෙම ශාක ඉවත් කිරීමේ අවශ්‍යතා පැන නැගුනහොත් සප්‍රාණිකව ඒවා ඉවත්කර සුදුසු අන් ස්ථානයක සිටවීමට පියවර ගැනීම මගින් මෙම ශාක විශේෂවලට ඇති වන බලපෑම අවම කළ හැකිය හා ඒවායේ පාරිසරික අගයට හා ජනගහන ව්‍යුහයට ඇති වන සෘණාත්මක බලපෑම් අඩු කළ හැකිය.

455. ව්‍යාපෘති පෙදෙසේ ජීවී සංඛ්‍යාව අවම හෙයින් ව්‍යාපෘති නිසා ඇති විය හැකි හානිද අඩුය. එසේ වුවද අවධි ලෙසින් තර්ජනයට ලක්ව ඇති ගොළු බෙල්ලන් (*Trachiafallaciosa*) ගැන දෘශ්‍ය සෝදිසියක් පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියපරිශ්‍රයේ නැගෙනහිර අන්තයේ ඇති නිවෙස්වල ඉදිකිරීම් අදියරට පෙර දියත් කළ යුතුයබ හා ව්‍යාපෘති කටයුතු නිසා එම ජීවී විශේෂට හානි ඇති වෙයි නම් අතින් එක් රැස් කර අවට වාසස්ථිනයකට ගෙන ගොස දැමිය යුතුය. මෙවැනි පියවර මගින් එම ජීවී විශේෂයේ ජනගහන ව්‍යුහයට ඇති වන සෘණාත්මක බලපෑම අවම කරන පාරිසරික අගයට ඇති වන ඇති වන හානියද අඩු කළ හැකිය.

456. පරිසරයට හා ශාක සහ ජීවින්ට ඇති විය හැකි විභව බලපෑම්වලට අවධි ලෙසින් වන භෞමික වාසස්ථාන කිසිවක් අන්තර්ගත නොවන හෙයින් භෞමික විවිධත්වයට බලපෑම් ඇති නොකරන අතර හෙයින් පෙදෙසේ වෙරළට හෝ සාගර ජෛව විවිධත්වයට පරිසර පද්ධති ක්‍රියාකාරකමට ආර්ථික හෝ සංස්කෘතික වැදගත්කම්වලට බලපෑම් කිසිවක් ඇති වන්නේ නැත. මෙම සාගර පරාස කටයුතු නිසා ඇතිවන බලපෑම් සුළු හා පෙසෙදට සීමා වු තාවකාලික ඒවාය හා සම්මිති ඉංජිනේරු චර්යා සහ යහපත් අවම කිරීමේ පියවර මගින් පාලනය කළ හැකි ඒවාය. තවද ව්‍යාපෘතියේ සාගර හා වෙරළබඩ පෙදෙසට තර්ජන කිසිවක් නොමැති හෙයින් සාගර පරිසරයේ සිදු කරන ක්‍රියාකාකරම් නිසා ඇති වන බලපෑම් සුළු තාවකාලික හා සමස්තයක් වශයෙන් අවශේෂය. අනතුරාසන්න ශාක සහ අවධි ලෙසින් අනතුරට ලක්ව ඇති ගොළු බෙල්ලන් ඉහත විස්තර කළ පරිදි සහ ව්‍යාපෘතියේ පරිසර කළමනාකරණ සැලැස්මෙහි සඳහන් පරිදි කළමනාකරණය කරනු ලබන්නේ නම් මේවාට බලපෑම් කිසිවක් ඇති වන්නේ නැත.

457. **අවම කිරීමේ පියවර:** බලපෑම් අවම කිරීම සඳහා වන පියවරට පහත කරුණුද ඇතුලත් වෙයි:

- ව්‍යාපෘතියට අවශ්‍ය වන ගස් හැර අන් ගස් කැපීම සහ ජීවීන්ට හානි ඇති කිරීමට එරෙහිව ශ්‍රමිකයන් දැනුවත් කිරීම සහ තහනම් පැනවීම කොන්ත්‍රාත්කරුගේ වගකීමකි.
- ව්‍යාපෘතියට අවශ්‍ය වන ගස් කැපීම අඩු කර හැකි විට උද්‍යානාලංකර සැලසුම් සමයෙහි එම ගස් ඇතුලත් කළ යුතුය.
- තර්ජනාසන්න වී ඇති ශාක සහ ගොළු බෙල්ලන් භෞතිකව (සප්‍රාණිකව) ඉවත් කර වෙනත් වාසස්ථානවල ස්ථාන ගතකිරීම
- කණින හා ඉදිකිරීම් යන්ත්‍ර සහ ලොරි ඇතුලු වාහන මනා ක්‍රියාකාරී තත්වයේ සහ හොඳින් නඩත්තු කෙරෙනු නිශ්චය කර ගත යුතුය.
- පෙට්‍රෝලියම් රසායන වැගිරීම පාලනය කිරීමට සෑම වෑයමක්ම ගත යුතු අතර එය වැළැක්වීමේ උපකරණ සූදානම් හා මනා ක්‍රියාකාරී තත්වයේ තබා ගත යුතුය.
- ගලා යාම ආරම්භ විය හැකි ස්ථානවල රොන්මඩ සහ මඩ පෙරන සහ බැම් සවි කළ යුතුය.
- සියලුම අතිරික්ත සහ ගබඩා කරන ද්‍රව්‍ය MSMP ප්‍රතිපාදන අනුව පවත්වාගෙන යා යුතුය.
- වැඩ කරන සහ ඉන්ධන/ පුපුරන ද්‍රව්‍ය ගබඩා කරන ස්ථානය තිබිය යුත්තේ කණ්ඩි කරන ලද කොංක්‍රීට් පෑඩ් මත වන අතර සෝදන ස්ථාන සාගර පරිසරයට නිරාවරණය නොකර ඇළ මගින් හා මඩ/ග්‍රීස් පෙරන හා සම්බන්ධ කළ යුතුය.
- පරිශ්‍රයේ භාවිතා නොවන කණින ලද හා පරිශ්‍රයෙන් ඉවත් කරනු ලබන සියලුම ද්‍රව්‍ය එක් රැස් කර අවම වශයෙන් මීටර් 100 ක් වත් ඈතින් හා පරිසර හෝ ජෛව සංවේදී පෙදෙස්වලින් ඉවත් පිහිටා ඇති අනුමැතිය ලත් නිර්දේශිත ස්ථානවලට බැහැර කළ යුතුය.
- ඉවත් කරන ද්‍රව්‍ය අනුමැතිය ලත් හා වෙරළේ සිට අවම වශයෙන් මීටර් 100 ක් වත් ඈත් පිහිටා ඇති නිර්දේශිත ස්ථානවලට බැහැර කළ යුතුය
- අවශ්‍ය නම් ඉදිකිරීම් කටයුතු අවසන් වූ පසු ගස් සිටවීම සහ ශාක රෝපණය සිදු කළ යුතුය.
- හැකි විට ස්වාභාවික වෙරළ තීරයට සහ වැල්ලෙ ශාකවලට ඇති විය හැකි බලපෑම් අවම කළ යුතුය හා ස්වාභාවික බෑවුම් පවත්වා ගෙන යා යුතුය.

**ආරක්ෂිත පෙදෙස් සහ අනෙකුත් සංවේදී පරිසර පද්ධතිවලට ඇතිවිය හැකි බලපෑම්**

458. ව්‍යාපෘති පෙදෙසේ හෝ බලපෑම් පෙදෙසේ කිසිදු ආරක්ෂිත සාගර වෙරළබඩ හෝ භෞමික පෙදෙසක් නැති හෙයින් දේශීය වශයෙන් සංරක්ෂිත පෙදෙස්වලට හෝ එහි ශාක හෝ ජීවීන්ට බලපෑම් කිසිවක් ඇති වන්නේ නැත.

**ශබ්දය දෙදරුම සහ වාත දූෂකවලට අදාල බලපෑම්**

**ශබ්දය හා දෙදරුම**

459. ඉදිකිරීම් සමයෙහි ව්‍යාපෘතියේ යන්ත්‍රෝපකරණ නිසා මෙන්ම ධීවර වරාය පෙදෙස් සිදු කරන භූතාක්ෂණ පරීක්ෂා සහ දියකඩනය ධීවර වරාය හා තොටමළු බිත්ති අත්තිවාරම සහ ගොඩනැගිලි ආදිය ඉදිකිරීම ආදිය නිසා 57 dB(A) ටත් වඩා වැඩි ශබ්දයක් ඇති විය හැකි අතර විවිධාකාර විදීම් කටයුතු නිසා ඇති විය හැකි ධ්වනි මට්ටම් **වගුව 5.1** හි ලබා දී ඇත.

**වගුව 5-1විදින ක්‍රමවේද අනුව විදින උපකරණවල ධ්වනි මට්ටම් (dB(A)**

| විදින උපකරණයේ සිට දුර (මීටර්)(m) | HSA අවගාරය | මඩ රොටේරි කොර (වේදිකා රිග් ඇතුලත්ව) | එයාර් කොම්ප්‍රෙසර් සහිත ODEX | ධ්වණිය |
|---|---|---|---|---|
| 3 | 87-96 | 80-97 | 89-99 | 84-96 |
| 8 | 81-88 | 75-91 | 76-90 | 81-88 |
| 16 | <75 | <75 | <75 | <75 |

460. ඉහත වගුවේ දක්වා ඇති පරිදි මීටර් 16 කදී ධ්වණි මට්ටම 75 dB(A) ට වඩා පහත වැටෙනු ඇති හෙයින් භූතාක්ෂණික පරීක්ෂණ කටයුතු වැඩි ශබ්ද බලපෑමකට තුඩු දෙනු ඇති නමුත් මෙය අනුමැතිය ඇති ධ්වණි මට්ටමකි. එනිසා භූතාක්ෂණික පරීක්ෂණ කටයුතු නිසා ඇති වන ශබ්දය නිසා අවට වාසය කරන සමූහයාට බරපතල බලපෑම් කිසිවක් උද්ගත වන්නේ නැත.

461. ඉඩම එළිපෙහෙළි කිරීම සැකසීම කාර්යයාල ඉදිකිරීම කොන්ත්‍රාත්කරුගේ මඩුව ඇතුලු අනෙකුත් තාවකාලික ඉදිකිරීම් සහ යටිතලපහසුකම් සුපිරි ව්‍යුහය එකලස් කිරීම හා අනෙකුත් ද්වීතීය ව්‍යුහ නිර්මාණය කිරීම වැනි ක්‍රියාකාරකම් නිසා ශබ්ද දුෂණය හා දෙදරුම උද්ගත කරන ශබ්දයට සාපේෂව ඇති වන්නේ සුළු බලපෑමිය.

462. ඉඩම එළිපෙහෙළි කිරීම කැණීම ඇතිරීම කොංක්‍රීට් දැමීම ආදිය සඳහා මෙන්ම ඉදිකිරීම් සමයෙහි භාවිත කරන අනෙකුත් යන්ත්‍රෝපරණවලින් නැගෙන්නේ මධ්‍යම ප්‍රමාණයේ ශබ්දයක් පමණක් වන අතර මෙම ශබ්ද මට්ටම් **වගුව 5.2 හි** දක්වා ඇත.

**වගුව 5-2ඇතැම් පොදු මාදිලියේ බර ඉදිකිරීම් යන්ත්‍රවලින් නැගෙන ශබ්ද මට්ටමේ සාපේක්ෂ පරාසය**

| යන්ත්‍රය /උපකරණය | **මීටර් 16 ක් ඈ**තට ධ්වනි මට්ටම (dB(A) |
|---|---|
| කම්පැක්ටර් (රෝලර්) | 71-75 |
| ෆ්‍රන්ට් ලෝඩර් | 70-83 |
| බැක්හෝ / එක්ස්කැවේටර් | 70-85 |
| ට්‍රැක්ටර් | 78-95 |
| ට්‍රක් | 83-93 |
| කොංක්‍රීට් මික්ෂර් | 75-88 |
| ජැක් හැමර් සහ විදින | 82-98 |
| ක්‍රෝ බාර් | 115 |
| කම්ප්‍රෙසර් | 109 |
| පයිල් ඩ්‍රයිවර් (ඩ්‍රොප් හැමර් වර්ගයේ) | 110 |
| නියුමැටික් ඩ්‍රිල් | 85 |
| එක්ස්කැවේටර් | 112 |
| ලෝඩර් | 112 |

463. ඉදිකිරීම් හඬ නිසා පරිශ්‍රය අවට පාසැල් සහ නිවාස්වලට මෙන්ම ශ්‍රමිකයන්ට වැඩි බපලපෑමක් ඇති විය හැකි වුවද මෙම පරිච්ඡෙදයේ පහත විස්තර කර ඇති අවම කිරීමේ පියවර මගින් පාලනය කළ හැකිය.

464. ඉදිකිරීම සඳහා යොදා ගත ක්‍රම ගැන කොන්ත්‍රාත්කරුට නිර්දේශ කිරීමට නොහැකි නමුත් යොදා ගත යුතු යන්ත්‍රෝපරකණ නිර්දේශ ධවණි මට්ටම්වලට තිබිය යුතුය යැයි ටෙන්ඩර් / කොනත්‍රාත් ලියවිලිවල සඳහන් කළ හැකිය.

465. දහවල් (පාසැල්) කාලය සහ රාත්‍රි කාලයෙහි අනෙකුත් පසුබිම් ශබ්ද අඩු නිසා ව්‍යාපෘති කටයුතුවලින් නැගෙන හඬවලින් වැඩියෙන් හිරිහැර ඇති කරන වේලා වන නිසා ශබ්දය අධික ඉදිකිරීම් කටයුතු පාසැල් වේලාවලින් පසුව සැලසුම් කර ගත යුතු අතර රාත්‍රි කාලයෙහි ඉදිකිරීම් කටයුතු සිදු කරන්නේ නම් එය ශබ්දය අඩු වැඩවලට සීමා කර ගත යුතුය.

466. ඉදිකිරීම් අදියර නිසා වැඩියෙන් බලපෑමට ලක් වන්නේ අවට වාසය කරන්නන් වන අතර ඒ අනුව පහත අවම කිරීමේ පියවර යෝජනා කෙරේ:

– උපකරණවලට නිසි සයිලන්සර් තිබිය යුතු අතර අවශ්‍ය විට ඒවා භාවිත කළ යුතුය.

– අදාල තැන්වල අඩු ශබ්දය නගන උපකරණ හයිඩ්‍රොලික් ජැකිං පියල් සහ බෙස්ඩ් පයිල් වර්ගයේ දෙදරුම් උපකරණ භාවිත කළ යුතු අතර වැඩි ශබ්දය නගන එන්ජිම් නිසි ලෙස ආවරණය කර තැබිය යුතුය..

– නිෂ්පාදකගේ නිර්දේශ අනුව යන්ත්‍රෝපකරණ මනාව නඩත්තු කර හොඳ ක්‍රියාකාරී තත්වයේ තබා ගත යුතුය.

– පයිල් කරන යන්ත්‍ර විදින යන්ත්‍ර සහ කම්ප්‍රේෂර් ආදිය හැකි පමණ කෙටි වේලාවලට ක්‍රියාත්මක කළ යුතුය.

– හයිඩ්‍රොලික් ජැකිං පයිල් වර්ගයේ දෙදරුම් උපකරණ සහ බෙස්ඩ් වර්ගයේ පයිල් යන්ත්‍ර භාවිත කළ යුතුය.

– යන්ත්‍රෝපකරණ සඳහා නිෂ්පාදකගේ මෙහෙයුම් මැනුවලයට අනුව නඩත්තු කාල සටහනක් පවත්වා ගෙන යා යුතුය හා දෙදරුම් යන්ත්‍ර දිවා කාලයේ පමණක් කෙටි වේලාවලට පමණක් භාවිත කළ යුතුය. එම යන්ත්‍රෝපකරණ හැකි පමණ ධ්වනි සංවේදී ග්‍රාහකවලින් ඈත් කර තැබිය යුතුය හා ශ්‍රමිකයන්ට අවශ්‍ය ආරක්ෂාක පළඳනා ලබා දිය යුතය.

**දෙදරුම**

**ප්‍රවාහනය නිසා ඇති වන දෙදරුම**

467. මුහුදු පත්ලේ ගල් ඉවත්කිරීම නිසා ඇති වන ශබ්දය සහ දෙදරුමමධ්‍යම පරිසර අධිකාරියේ දෙදරුම් මත වන අන්තර් කාලීන සම්මිති අනුව වර්ගය 3 ගොඩනැගිලි සඳහා අනුමත උපරිම සීමාව වන්නේ 1-10 Hz හිදී උච්ච අංශු ප්‍රවේගය (PPV) තත්පරයට/මිමී 1 ක් සහ 50 Hz හිදී උච්ච අංශු ප්‍රවේගය (PPV) තත්පරයට/මිමී 8.0 කි. ඉදිකිරීම් සමයෙහි ගල් ප්‍රවාහන කරන වාහන නිසා මධ්‍යම ප්‍රමාණයේ දෙදරුම් ඇති වී ඉහත සීමා ඉක්මවා යා හැකි අතර ප්‍රවාහන මාර්ගය ඔස්සේ ඇති කාර්යයාලවලට ගොඩනැගිලිවලට හා දේපළවලට හානිද එහි වැඩ කරන්නන්ට දිවා කාලයේ අසීරුතාද එමෙන්ම විශේෂයෙන් ව්‍යාපෘතිය අවට වාසය කරන්නන්ට රාත්‍රි කාලයෙහි හිරිහැරද ඇති කළ හැකිය.

468. ශ්‍රී ලංකාවේ දෙදරුම් දූෂණ මත වන අන්තර් කාලීන සම්මිති මගින් ඉදිකිරීම් කටයුතු, වාහන ධාවනය යන්ත්‍රෝපකරණ ක්‍රියාත්මක කිරීමට අදාලව හා දෙදරුම් පවතින කාලය (නොකඩවා විටින් විට හා කලාතුරකින්) අනුව හා එයට මානව නිරාවරණය ඇති වන කාල පරාසය අනුව මාර්ගොපදේශ ලබා දී ඇත.

**මුහුදු පත්ලේ ගල් ඉවත්කිරීම නිසා ඇති වන ශබ්දය සහ දෙදරුම**

469. පතුල් හුණුගල් ඉවත් කිරීමට විකල්ප 3 ක් ඇත: A). ඩෙටොනේටර මගින් වෙඩි බෙහෙත් භාවිත කර ගල් පිපිරවීම B). රසායන පිපිරවීම C). බ්‍රේකර්ස් යොදා යාන්ත්‍රිකව ගල් ඉවත් කිරීම

470. ඩෙටොනේටර මගින් වෙඩි බෙහෙත් භාවිත කර ගල් පිපිරවීම අනෙක් ක්‍රම දෙකට වඩා ශබ්දය හා දෙදරුම අධික ක්‍රමයක් වන අතර බ්‍රේකර්ස් යොදා යාන්ත්‍රිකව ගල් ඉවත් කිරීම නිසා නොඩවා වැඩි වේලාවක් දෙදරුම පවතිනු ඇත. මේ අතර රසායන පිපිරවීම පිරිවැය අධික ක්‍රමයකි.

471. මධ්‍යම පරිසර අධිකාරියේ පිපිරීම් ක්‍රියාකාරකම් සඳහා වන වාත, පීඩන හා පොළොවේ දෙදරුම් මත වන අන්තර් කාලීන සම්මිති අනුව දෙදරුම සඳහා අනුමත උපරිම සීමාව වන්නේ උච්ච අංශු ප්‍රවේගය (PPV) තත්පරයට/මිමී 6.0 ක් සහ dB(L) 115 ක් සහ එක් බෝර් සිදුරකට වාත පිපිරවීම් පීඩනයේ උච්ච සීමාව උච්ච අංශු ප්‍රවේගය (PPV) තත්පරයට/මිමී 5 ක සහ dB(L) 120 කි.

472. ධීවර වරාය බේසම ඉදිකිරීමට ආසන්න වශයෙන් හුණුගල් 62,600 $m^3$ ක් ඉවත් කළ යුතු අතර ව්‍යාපෘතිය පිහිටා ඇත්තේ මිනිසුන් වැඩියෙන් වාසය කරන වාසස්ථාන පෙදෙසක හෙයින් අවට ගොඩනැගිලිවලට හානි ඇති කළ හැකිය. එනිසා පහත විස්තර කර ඇති අවම කිරීමේ පියවර ගැනීම අවශ්‍ය වෙයි. අවට නිවෙස් හා පාසැල්වලට ඇති විය හැකි දෙදරුම් මුල් කර ගත් බලපෑම් අවම කිරීමට පිපිරවීමේ රටා සහ භාවිත කරන පුපුරන ද්‍රව්‍ය ප්‍රමාණ නිශ්චය කරනුවස් පිපිරවීම් කටයුතු ආරම්භ කරන්නට පෙර මධ්‍යම පරිසර අධිකාරියෙහි ලියාපදිංචි කරන ලද හා භූවිද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයනිර්දේශ කර ඇති පරීක්ෂණාගාර මගින් අවශ්‍ය පිපිරවීම් පරීක්ෂා කොන්ත්‍රාත්කරු සිදු කළ යුතුය.

- මෙතෝදිස්ත උසස් බාලිකා පාසැල සමීපයෙහි සිදු කරන පිපිරවීම් කටයුතුවලට රසායන පිපිරීම් මෙහෙයුම් වැනි අඩු දෙදරුම් හුණුගල් පිපිරවීම් තෝරා ගත යුතුය.
- පිපිරවීම් හා විදීම් කටයුතු සිදු කරන විට හා පැමිණිලි ලැබුනු විට අවට ගොඩනැගිලිවලට ඇති වන දෙදරුම් මට්ටම හා -විශේෂයෙන් පූර්ව ඉරිතැලීම්- අධීක්ෂණය කළ යුතුය.
- ඉදිකිරීම් සමයෙහි දේපළ හානි කිසිවක් සිදු නොවන බව තහවුරු ගර ගැනීමට ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර පූර්ව ඉරිතැලීම්- අධීක්ෂණයක් ඡායාරූප සාධක සහිතව සිදුකළ යුතුයග

- මාගර්ය දෙපස දේපළවලට හානි ඇති නොවන ආකරයෙන් විශාල ගල් ප්‍රවාහනය කරනු නිශ්චය කර ගැනීමට විකල්ප මාර්ග නිර්දේශ කරන පිණිස මාර්ග සංවර්ධන අධිකාරියේ අධීක්ෂණ සහය ලබා ගත යුතුය.

– පුපුරවන විට කල් කැබලි විසි වෙනු පාලනය කිරීමට පුපුරන මතුපිටේ පිපිරුම් මැට්, පරණ ටයර් සහ වැලි ගෝනි තැන්පත් කර සිදු කරන පාලන පිපිරුම් ක්‍රමවේදය අනුගමනය කරන මෙන් යෝජනා කෙරේ.

**පුපුරන ද්‍රව්‍ය**

– පුපුරන ද්‍රව්‍ය වාතාශ්‍රය හා මුසුවන ආකාරයෙන් හෝ අභ්‍යන්තර බිත්තියට වැදෙන පරිදි ගබඩා නොකළ යුතු අතර මෙම බිත්ති ඉදිකරීම සඳහා ගිනිපුපුරු ඇති නොවන ලැටිස් හෝ එවැනි ද්‍රව්‍ය භාවිත කළ යුතුය.

– පුපුරන ද්‍රව්‍ය තබා ඇති බහාලු සලකුණු පැහැදිලිව පෙනෙන ආකාරයෙන් හා පහසුවෙන් ගණන් කළ හැකි හා සෝදිසි කළ හැකි ලෙසින් ගබඩා කළ යුතුය.

– ෆයිබර් බෝඩ් සහ අනෙකුත් ලෝහ නොවන බහාලු විෂයයෙහි හැරෙන්නට පුපුරන ද්‍රව්‍ය ඇසිරීම හෝ ඇසිරුම ඉවත් කිරීම ඇතුලත සිදු නොකල යුතුය හා අනෙකුත් පුපුරන ද්‍රව්‍ය අසලද ඇසිරීම හෝ ඇසිරුම ඉවත් කිරීම නොකළ යුතුය.

– ෆයිබර් බෝඩ් පුපුරන ද්‍රව්‍ය බහාලු විවරකිරීමට ලෝහමය අතකොළු භාවිත කළ හැකි වුවද අනෙකුත් පුපුරන ද්‍රව්‍ය බහාලු විවර කිරීම සඳහා භාවිත කරන මෙවලම් ගිනි පුපුරු පිට නොකරන එවා විය යුතුය. පුපුරන ද්‍රව්‍ය සහිත දැව බහාලු විවර කිරීමට සහ වැසීමට දැවමය කෙඳි හෝ රබර්වලින් තනන ලද කීල හෝ අතකොළු භාවිත කළ යුතු අතර ගිනිපුපුරු විසි නොවන හැර අන් ලෝහමය මෙවලම් 44 උසස් පුපුරන ද්‍රව්‍ය සහිත මැගසීන්වල ගබඩා නොකළ යුතුය.

– මිනිසුන් වාසය කරන පෙදෙස්වල පුපුරන ද්‍රව්‍ය ගබඩා ඉදි නොකළ යුතුය.

**වාත ගුණත්වයට ඇති වන බලපෑම්**

473. ඉදිකිරීම් අදියරෙහි පහත ක්‍රියාකාරකම් නිසා දූවිලි නැගිය හැකිය:

a. ධීවර වරාය ඉදිකරන විට ලෝඩිං පරීක්ෂා සඳහා භූතාක්ෂණ පරීක්ෂා සිදු කරන විට දූවිලි ඇති වෙයි.
b. ඉඩම එළිපෙහෙළි කරන විට හා සකසන විට මෙන්ම පයිල් කරන විටද ව්‍යාපෘතිය අවට දූවිලි නැගෙනු ඇත.
c. දියකඩනය ඉදිකිරීම සිදු වන්නේ මුහුදේ තෙත් පරසරයක හෙයින් එමගින් එතරම් දූවිලි නොනැගෙන නමුත් එය ආරම්භ වන්නේ වෙරළේ සිට හෙයින් එවිට මධ්‍යම ප්‍රමාණයෙන් දූවිලි නැගිය හැකිය.
d. කැණීම් කටයුතු සිදු වන්නේ මුහුදේ තෙත් පරිසරයක හෙයින් එමගින් එතරම් දූවිලි නොනැගෙන අතර කණින ලද ද්‍රව්‍ය නැවත භාවිත කිරීමට සංවර්ධන පරීශ්‍රයේම ගබඩා කර තැබිය හැකිය. එසේ වුවද දූවිලි නොනැගෙන පරිදි එය කළමනාකරණය කළ යුතුය.
e. සනීපාරක්ෂා පහසුකම් ඇතුලු ව්‍යාපෘති කාර්යයාලය කොන්ත්‍රාත්කරුගේ මඩුව සහ අනෙකුත් තාවකාලික ගොඩනැගිලි වැනි යටිතල පහසුකම් ඉදිකිරීම හා වාහන සැරිසැරීම ආදිය නිසාද දූවිලි ඇති විය හැකිය.
f. විශාල ගල්, ගල් කැබලි, වැලි, බොරළු වැනි ප්‍රධාන ඉදිකිරීම් ද්‍රව්‍ය අවට නොමැති හෙයින් එවා පිටතින් ගෙන එන විට මෙන්ම ඉදිකිරීම් සුන්බුන් සහ ඝන / නාගරික අපද්‍රව්‍ය බැහැර කරන විටද යන්ත්‍රෝපකරණවල සැරිසැරීම නිසාද දූවිලි නැගිය හැකිය.

474. ඉහත කටයුතු නිසා දූවිලි නැගීම අනුමාන කිරීම සඳහා වන ක්‍රමවේද ඍජු නොවන අතර දූවිලි නැගීම, එහි ප්‍රමාණය ආදිය රඳා පවතින්නේ අදාල ක්‍රියාවේ වර්ගය හා ස්වාභාවය මත මෙන්ම භාවිත කරන වාහන එවායෙහි පිරිසිදු බව පාරවල පවිත්‍ර තාවය කාලගුණ තත්වය මෙන්ම බලපෑම් අවම කිරීමට යොදා ගන්නා ක්‍රමවේදවල කාර්යක්ෂමතාවය ආදිය මතද බලපානු ඇත.

475. තත්පරයට/මීටර් 3 ට වැඩි සුළං වේගවලදී දූවිලි අංශු වී ඈතට ගමන් කරනු ඇති අතර 100 μm ට වඩා ලොකු අංශු තත්පරයට/මීටර් 5 ට වැඩි සුළං වේගවලදී මීටර් 100 දක්වා ගමන් කරන අතර වියවලි පෘෂ්ඨවලින් උත්පාදනය වන 10 μm ට වඩා කුඩා අංශු වාතාවරණ කැළඹීම්වලට අනුව මීටර් 500 දක්වා ඈත පෙදෙස්වලට පා වී යනු ඇත.

476. ඉඩම එළිපෙහෙලි කිරීම හා සැකසීම ද්‍රව්‍ය මෙන්ම යන්ත්‍රෝපකරණ ප්‍රවාහනය කරන බර වාහන හා සාමාන්‍ය වාහන, ඉදිකිරීම් වාහන සහ යන්ත්‍රෝපකරණවලින් නැගෙන දුමෙහි $SO_2$, NOx, $O_3$, CO, HC, CO ආදිය අඩංගු වෙයි. භූතාක්ෂණ උපකරණවලින්ද දුම නැගෙන නමුත් එය තාවකාලිකය. මෙම බලපෑම් පෙදෙසට පමණක් සීමා වන අතර සැලකිය යුතු ප්‍රමාණවලින් සිදු නොවේ. මෙය අවම කිරීමට වාහනවලට / යන්ත්‍රෝපකරණවලට මනාව ක්‍රියා කරන සයිලන්සර සවි කර තිබීම තහවුරු කර ගත යුතුය.

477. යෝජිත ව්‍යාපෘති ප්‍රදේශය තුළ වෙරළ තීරයක් නොමැත. රජයේ ඉඩම්වල පදිංචිව සිටින පවුල් 19 කට අඛණ්ඩ ධීවර කටයුතු සඳහා වෙරළ ප්‍රවේශය අහිමි වේ. ඔවුන් සතුව බෝට්ටු 22 ක් ඇති අතර දැනට යෝජිත ධීවර වරාය තුළ බෝට්ටු ගොඩබෑම සඳහා වෙරළ තීරය ඔවුන් භාවිතා කරති. ඉදිකිරීම් කාලය තුළ මෙම බෝට්ටු 22 සඳහා නවාතැන් ගැනීම සඳහා යෝජිත නැගෙනහිර දියකඩනය අසල තාවකාලික දියකඩන ව්‍යුහයක් ඉදිකිරීමට ව්‍යාපෘතිය විසින් දැනටමත් යෝජනා කර ඇත. යෝජිත ධීවර වරාය තුළ මෙම බෝට්ටු සඳහා වෙනම තොටුපළ පහසුකම් ලබා දී ඇත. ධීවර වරාය ඉදිකිරීම අවසන් වූ පසු මෙම බෝට්ටු මෙම යෝජිත ස්ථානයෙහි නැංගුරම් ලෑම කළ හැකිය.

- විවෘත ස්ථානවලට සහ ගබඩා කර ඇති හා ප්‍රවාහනය කරන ද්‍රව්‍යවලට විටින් විට ජල බවුසර්වලින් ගෙනෙන ජලය ජල ඉසින යොදා ජලය ඉසීම කළ යුතු නමුත් මෙයට අපත ජලය භාවිත නොකළ යුතුය.
- වැඩ කරන පෙදෙස් පොලිතින් ටාපුලින් හෝ ගෝනි රෙදි ආදිය යොදා ආවරණය කර තැබිය යුතුය.
- පුනලාය් පේදුරුතුඩුව මාර්ගය ඔස්සේ මීටර් 5 ක් උස නිත්‍ය/තාවකාලික තාප්පයක් ඉදි කළ යුතුය.
- නිරාවරණ පෙදෙස් සුදුසු ද්‍රව්‍යවලින් වැසීම ලිහිල් පස සම්පිණ්ඩනය කිරීම සහ විටින් විට ඉදිකිරීම් පරිශ්‍රය පිරිසිදු කිරීම ආදිය.
- දූවිලි පිට කරන ප්‍රවාහනය කරන වාහනවලට පමණට වඩා බර පටවා නැති බව තහවුරු කිරීමට ඒවායෙහි සයිඩ් බෝර්ඩ් සහ ටේල් බෝඩ් ඇලත්ව ටාපුලින්වලින් සම්පූර්ණයෙන්ම වසා තිබීම තහවුරු කිරීම. ව්‍යාපෘති පෙදෙස පිහිටා ඇත්තේ හොනිඅයිරා නාගරික පෙදෙසක හෙයින් සහ අවට ගම්මාන කිහිපයක්ම තිබෙන හෙයින් මෙන්ම යන්ත්‍රෝපකරණ පටවා ගත් වාහන ගණනාවක්මක මෙම පෙදෙස් පසු කර ගමන් කරනු ඇති හේයන් මෙය අතිශය වැදගත්ය.
- ගල් සහ සුන්බුන් බාන විට නිසි උස ප්‍රමාණවල සිට බාන බව තහවුරු කර ගත යුතුය.
- පරිශ්‍රයට ගෙනෙන සිමෙන්ති වැලි වැනි සියලුම ඉදිකිරීම් ද්‍රව්‍යවලින් දූවිලි පිට වීම පාලනය කරනු පිණිස හා තද වැස්ස ගංවතුරු හා සුළඟින් ආරක්ෂා කරනු වස් ප්‍රවේශමෙන් ගබඩා කර හොඳින් වසා තැන්පත් කළ යුතුය. එමෙන්ම වේගය පාලනය කිරීමද වාහනවලට ෂීට් දැමීමද දූවිලි පාලනය කිරීමේ පියවර වේ.
- ඉඩම් එළිපෙහෙලි කරන විට හා සකසන විට අඩුවෙන් දුම් හා දූවිලි පිටකරන යන්ත්‍රෝපකරණ භාවිත කරන මෙන් නිර්දේශ කරන අතර ඒවා නිසි පරිදි සර්විස් කර නඩත්තු කර ගැනීමද වැදගත්ය. සියලුම වාහන සහ යන්ත්‍රෝපකරණ ජාතික පාරිසරික වාත පිට කිරීමේ සහ ඉන්ධන සහ වාහන ගෙන්වීම පිළිබඳ අති විශේෂ ගැසට් අංක 1295/11 1 ජුනි 2003 මගින් ප්‍රකාශයට පත්කළ සම්මිතිවලටය අනුකූල විය යුතුය.
- වාහන සියල්ල අදාල දුම් පරීක්ෂාවලට ලක් කර යෝග්‍යතා සහතික ලබා ගත යුතුය.
- අවශ්‍ය විට ශ්‍රමිකයන්ට ආරක්ෂක පළඳනා ලබා දිය යුතුය.

**ඉඩම් භාවිතා වෙනස්වීම් නිසා ඇති වන බලපෑම්**

478. වෙරළබඩ පහසුකම් ඉදිකිරීමට නියමිත ඉඩමෙන් 90 % ක් පමණ ධීවර බෝට්ටු පැමිණෙන හා වැල්ල පෙදෙස් වන අතර ගෙවතු සහිත හරිතමය පෙදෙස් වන්නේ ඉතිරි 10 % යි. එසේ වුවද සම්පූර්ණ පෙදෙසම අවශ්‍ය පහසුකම් ඇති නවීන ධීවර වරායක් ලෙසින් සංවර්ධනය කරනු ඇති අතර එනිසා ගෙවතු කිහිපයක් අතුරුදහන් වනු ඇත. මෙහි විස්තර **නැවත පදිංචි කිරීමේ සැලැස්මේ 5.3.3 කොටසෙහි** සාකච්ඡා කර ඇත. අමතර හරිත පෙදෙස් ප්‍රතිස්ථාපනය කරනු ඇති හෙයින් අත්‍යන්තයෙහි ව්‍යාපෘතිය නිසා සමූහයාට හිමි වන්නේ වැඩිදුර වාසි සහ ධනාත්මක විපර්යාසය.

යෝජිත වරායේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර බලපෑමට ලක් වන මෙම පවුල් 13ට අයත් බෝට්ටු නවතා තැබීමට හැකි වන පරිදි තාවකාලික දියකඩනය ඉදි වනු තහවුරු කර ගත යුතුය

### 5.3.3 සමාජාර්ථික පැතිකඩ

**ධීවර කටයුතු සහ වැල්ලේ භාවිතයට ඇති වන බලපෑම්**

479. යෝජිත ව්‍යාපෘති පෙදෙසේ දැකුම්කළු වෙරළක් නොමැති අතර දැනට අවට රජයේ ඉඩම්වල වාසය කරන හා දැනට වෙරළ භාවිත කරන බෝට්ටු 30 ක් හිමි ධීවර පවුල් 16 කට සිය ජීවනෝපා කටයුතු සඳහා වැල්ලට ප්‍රවේශය අහිමි වනු ඇත. ඔවුන්ගේ බෝට්ටුවලට කොට්ටඩි සහ මුනෙයි පෙදෙස්වල වෙරළ භාවිත කළ හැකි හෙයින් බලපෑම අවමය. එසේ වුවද, අන් අරමුණු සඳහා වෙරළට පැමිණෙන සමූහයාට වෙනත් ආකාරයේ බාධා ඇති විය හැකිය. ව්‍යාපෘති කටයුතු නිසා පරිශ්‍රයේ සැරිසරන වාහන නිසා ආරක්ෂාව මුල් කරගත් අවදානම ඉහළ යා හැකි හෙයින් එසේ පැමිණීම තහනම් කළ යුතුය. මෙය සඳහා කොන්ත්‍රාත්කරු පහත පියවර ආදේශ කරගත යුතුය.

- තම බෝට්ටු නැංගුරම් ලෑම අහිමි වු ධීවර පවුල් 16 ට යාබද කොට්ටඩි ප්‍රදේශයේ එම පහසුකම ලැබෙනු තහවුරු කළ යුතුය.
- පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිපරිශ්‍රයේ නැගෙනහිර අන්තයේ විකල්ප බෝට්ටු ඇතුල් වීමේ සහ පිටවීමේ ද්වාර ලබා දී ඇත.
- ව්‍යාපෘති සමයෙහි ව්‍යාපෘතියේ ඇතුලත සහ ව්‍යාපෘතියේ බලපෑම් පෙදෙස්වල මෙන්ම යාබද සියලුම භෞමික හා සාගර පෙදෙස්වලට ඉදිකිරීම් සේවකයන් සහ ව්‍යාපෘතියේ සේවානියුක්තියන්ට පමණක් ප්‍රවේශ අනුමැතිය ලබා දිය යුතුය
- ඉදිකිරීම් සමයෙහි බැහැර කළ පෙදෙස් සම්පුර්ණයෙන්ම සංවර්ධනය කළ යුතු අතර ධීවරයන් සහ පොදු ජනතාව විසින් ව්‍යාපෘතියේ භෞමික සහ නොගැඹුරු ජල හා අන්තර් උදම් පෙදෙස් තහනම් පෙදෙස් බව වටහා ගැනීමට සැලැස්විය යුතුය.
- ව්‍යාපෘතියේ භෞමික සීමා සඳහා බාධක ඉදි කළ යුතු අතර තහනම් පෙදෙස් ගැන දැන්වීම් හා සංඥා පුවරු මෙන්ම මහජන දැනුවත්කිරීම්ද තොරතුරු සැපයීම්ද සිදු කළ යුතුය. එමෙන්ම මෙම විෂයයෙහි අන්තර් උදම් සඳහා වන බැහැර කළ පෙදෙස් සඳහා ජංගම සංඥා මෙන්ම ආරක්ෂක නිලධාරීන්ද පත් කළ යුතුය.
- ඉදිකිරීම් සමයෙහි ව්‍යාපෘති පෙදෙස ඇතුලත අන්තර් උදම් ගල්පර ඇඟිදීම් සහ වෙරළේ සිට මසුන් ඇල්ලීම් (කනු සහ කඹු) මෙන්ම වෙරළේ ගල්පර (ගල්පරවලින් පිටත) මසුන් ඇල්ලීම්ද තහනම් කළ යුතුය.
- ඉදිකිරීම් සමයෙහි ව්‍යාපෘති බලපෑම් පෙදෙස ඇතුලත ස්නෝකල් කිරීම වැනි ජල ක්‍රීඩා ස්කුබා කිමිදීම් ආදිය තහනම් කළ යුතුය.
- ව්‍යාපෘතිය සහ එහි දැන්වීම්වලට අනුකුලන වීමේ වැදගත්කම අවබෝධ කර දීමට අවට වාසය කරන්නන්ට වැඩමුලු පැවැත්විය යුතු අතර අත්පත්‍රිකාද බෙදිය යුතුය.
- වැඩකටයුතු සම්පුර්ණ වු පසු තාවකාලික බාධක සියල්ල ඉවත් කළ යුතු අතර අවසාන ධීවර වරාය සීමා ඇති කළ යුතුය.

**මෙතෝදිස්ත උසස් බාලිකා පාසැලට ඇති වන බලපෑම්**

480. මුල් සැලැස්ම අනුව සංස්කෘතික අගයක් ඇති නඩරාජර් වේදිකාව සහ නැගෙනහිර අන්තයේ පිහිටා ඇති කොට්ටඩි පෙදෙසින් කොටසක් සැලැස්මට එක් කරන ලද අතර වරායේ මායිම නඩරාජර් වේදිකා දක්වා සීමා කරන මෙන් කොට්ටඩි පෙදෙසේ ධීවරයන් සහ ධීවර සමිති ඉල්ලා සිටි පරිදි නඩරාජර් වේදිකාව අත් හැර සැලැස්ම නැවතත් සකසන ලදී. මෙම වෙනස නිසා බටහිර මෙතෝදිස්ත උසස් බාලිකා පාසැල දක්වා සැලසුම දීර්ඝ කරන ලදී. පාසැල පිහිටා ඇත්තේ යෝජිත පරිශ්‍රයේ සිට මීටර් 15 ක් පමණ ඈතින් වන හෙයින් ඉදිකිරීම් සමයෙහි ශබ්දය දුවිල්ල දෙදරුම ආදිය නිසා මෙන්ම මත්ස්‍ය වෙන්දේසිය නිසා අධික ඝෝෂාවද මසුන් ගොඩ ගසනු ඇති නිසා දුගඳ නිසාද පාසැලට අසීරුතා ඇති විය හැකිය.

481. මෙයට අමතරව වරායේ කටයුතුවල දසුන ළමුන්ගේ අවධානය ඒ අතට යොමු කරනු ඇත යැයි පාසැල් කළමනාරණයද කණස්සල්ල පළ කලේය. මෙම කරුණු සැලකිල්ලටය ගත් ව්‍යාපෘතියද පාසැල ඉදිරියේ සංවර්ධන කටයුතු කිසිවක් සිදු නොකරන

ආකෘරයෙන් සැලසුම් වින්‍යාශය වෙනස් කළේය එමෙන්ම අදාල අවම කිරීමේ පියවරද යෝජනා කර ඇත (**5.5 කොටසට යොමුවන්න)**

482. කොට්ටඩි පෙදෙසෙහි අවශය පමණ වැල්ල ප්‍රදේශයක් ඇති හෙයින් සැලකිය යුතු බලපෑම් ඇති වනු ඇත.

**වෙනත් ස්ථානවල පදිංචි කිරීම හා ජීවනෝපා අහිමි වීමේ බලපෑම්**

483. පේදුරුතුඩුව ප්‍රාදේශීය ලේකම්වරයාගේ විෂය පාත්‍රතාවය යටතේ අළුත් කරන බලපත්‍ර සහිතව රජයට අයත් හෙක්ටෙයාර් 0. 2011 ක ඉඩමක පවුල් 13 ක් පදිංචිව සිටින අතර පෙදෙසේ පැවති ගැටුම් තත්වය නිසා වාර්ෂිකව අළුත් කළ යුතු එම එම බලපත්‍ර බොහෝ කලක පටන් අළුත් කර නොමැති හෙයින් මෙම පවුල් දැනට අනවසර පදිංචිකරුවන් බවට පත්ව සිටිති. වරායේ ඉඩමේ මුල් සැලසුම් වින්‍යාශයට මෙම ඉඩම ඇතුලත් වන නමුත් ප්‍රජාව සමග සිදු කළ සාකච්ඡා සමයෙහි මෙම ඉඩම අත් හරින මෙන් ඔවුන් විසින් ඉල්ලීමක් කරන ලදුව එලෙසින් සැලැස්ම නැවත සකසන ලද හෙයින් මෙම අන්තයෙන් ගැටළු කිසිවක් පැන නගින්නේ නැත.

484. ප්‍රාරම්භක සැලැස්ම සහ සැලසුම් වින්‍යාසය අනුව යෝජිත වරායේ වෙරළේ පහසුකම් සඳහා හෙක් 4.5 ක භූමි ප්‍රමාණයක් අවශ්‍ය වනු ඇත යැයි ඇස්තමේන්තු කරන ලද අතර මෙම භූමි භාගය රජයට මෙන්ම පුද්ගලික් හිමිකරුවන් කිහිප දෙනෙකුට අයිත් වන්නකි. රජයේ භූමි කොටස වෙරළ සංරක්‍ෂණ සහ වෙරළබඩ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව (CCCRMD) සහ වඩමරාච්චි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යයාලයේ බලප්‍රදේශ යටතේ තිබෙන අතර පුද්ගලික භූමි කොටසට හිමිකරුවන් 13 දෙනෙකු සිටිති. වෙරළේ පහසුකම් ඉදිකිරීමට ඉඩම් අත්පත් කර ගැනීම නිසා ඇති වන බලපෑම් සහ හිමිකාරත්ව තත්වයන් පිළිබඳ විස්තර ව**ගුව 5. 3** හි දක්වා ඇත.

**වගුව 5-3 වෙරළේ පහසුකම් ඉදිකිරීමට ඉඩම් අත්පත් කර ගැනීම නිසා ඇති වන බලපෑම් සහ හිමිකාරත්ව තත්වයන්**

| ව්‍යාපෘති සංරචකය | ඉඩමේ හිමිකාරත්වය | ඉඩමේ වර්ගය | බලපෑමට ලක් පෙදෙස (හෙක්) | ඉඩම් කුට්ටි සංඛ්‍යාව | AHH සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| වෙරළේ පහසුකම් | පුද්ගලික ඉඩම | ගස් සහිත ඉඩම | 0.0552 | 13 | 13 |
| වෙරළේ පහසුකම් | පේදුරු තුඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යයාලය | විවෘත මුඩුබිම | 0.0133 | 1 | 0 |
| වෙරළේ පහසුකම් | වෙරළ සංරක්‍ෂණ දෙපාර්තමේන්තුව | හිස් මුඩුබිම | 0.4977 | 2 | 0 |
| PPD ජැටිය | දැනටම අයත්ය | බෝට්ටු නැවැත්වීමේ ජැටිය | 0.1148 | 1 | 0 |
| | | | 0.681 | 17 | 26 |

485. යෝජිත ධීවර වරාය ඉදිකිරීම සඳහා හෙක් 0.0552 භූමි භාගයක් අත් කරගත යුතු අතර සීමාංකනය අනුව පුද්ගලික ඉඩම්වලට බලපෑම් කිසිවක් ඇති නොවන නමුත් එක් පටු ඉඩම් තීරයක් සහ ගස් කිහිපයක් පමණක් අහිමි වනු ඇත. ධීවර වරාය ඉදිකරන විට හෝ එයින් පසුව පදිංචියෙන් ඉවත් කිරීම් හෝ ජීවනෝපා අහිමි වීම් කිසිවක් උද්ගත වන්නේ නැතිවා පමණක් නොව යෝජිත ධීවර වරාය පෙදෙස් වාසීන්ට අභිනව ආදායම් මාර්ගද නිර්මාණය කර දෙනු ඇත.

486. යෝජිත ධීවර වරාය මායිම යටතට එන ඉඩම්වල ඇති වන බලපෑම් **වගුව 5.4 හි විස්තර කර ඇත.**

**වගුව 5-4 යෝජිත ධීවර වරාය මායිම යටතට එන ඉඩම්වල ඇති වන බලපෑම්**

| **ව්‍යාපෘති සංරචකය** | **ඉඩමේ හිමිකාරත්වය** | **ඉඩම් භාවිතාව සහ වත්කම්** | **බලපෑමට ලක් පෙදෙස (හෙක්)** | **AH** | **APs** |
|---|---|---|---|---|---|
| වෙරළේ පහසුකම් | පුද්ගලික ඉඩම | හිස් | 0.0036 | 1 | 4 |
| වෙරළේ පහසුකම් | පුද්ගලික ඉඩම | හිස් | 0.0016 | 1 | 5 |
| වෙරළේ පහසුකම් | පුද්ගලික ඉඩම | වැසිකිළි 1 ක් | 0.0028 | 1 | 2 |

| | | | | | |
|---|---|---|---|---|---|
| වෙරළේ පහසුකම් | පුද්ගලික ඉඩම | පොල් ගසක් සහ මීටර 15 ක වැටක් | 0.0011 | 1 | 5 |
| වෙරළේ පහසුකම් | පුද්ගලික ඉඩම | මීටර 15 ක වැටක් | 0.0010 | 1 | 4 |
| වෙරළේ පහසුකම් | පුද්ගලික ඉඩම | මීටර 20 ක වැටක් | 0.0007 | 1 | 4 |
| වෙරළේ පහසුකම් | පුද්ගලික ඉඩම | මීටර 20 ක වැටක් | 0.0013 | 1 | 1 |
| වෙරළේ පහසුකම් | පුද්ගලික ඉඩම | හිස් | 0.0025 | 1 | 4 |
| වෙරළේ පහසුකම් | පුද්ගලික ඉඩම | වාඩි 2 ක් වැසිකිළියක් ළිඳක් සහ පොල් ගස් 5 ක් | 0.0127 | 1 | 4 |
| වෙරළේ පහසුකම් | පුද්ගලික ඉඩම | ළිඳක් සහ පොල් ගස් 2 ක් | 0.0076 | 1 | 5 |
| වෙරළේ පහසුකම් | පුද්ගලික ඉඩම | පොල් ගස් 2 ක් | 0.0064 | 1 | 8 |
| වෙරළේ පහසුකම් | පුද්ගලික ඉඩම | හිස් | 0.0106 | 1 | 2 |
| වෙරළේ පහසුකම් | පුද්ගලික ඉඩම | හිස් | 0.0033 | 1 | 3 |
| වෙරළේ පහසුකම් | රජයේ ඉඩමකි පේදුරු තුඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අත් හරින ලද ගෙයක් පාල් ගස් 5 ක් ඔප්පුවක් නැති AP | 0.0155 | 1 | 1 |
| වෙරළේ පහසුකම් | පේදුරු තුඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | හිස් | 0.0133 | 0 | 0 |
| වෙරළේ පහසුකම් | වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | හිස් හිස් | 0.4977 | 0 | 0 |
| PPD ජැටිය | ශ්‍රී ලංකා ධීවර වරාය අධිකාරිය වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව | බෝට්ටු නැවැත්වීමේ ජැටිය | 0.1148 | 0 | 0 |

486. ධීවර වරාය නිසා අත් හරින ලද නිවසකට බලපෑම් ඇති විය හැකිය. බලපෑම් ඇති විය හැකි අනෙකුත් ව්‍යුහයන් අතර අර්ධ නිත්‍ය ධීවර වාඩි දෙකක් ආරක්ෂිත ළිං දෙකක් වැසිකිළි දෙකක් මීටර 70 ක් දිග වැටක් කානුවක් සහ අභ්‍යන්තර මාර්යක් ආදිය ඇතුලත් වෙයි. එමෙන්ම අවට නිවෙස්වලට ආදායම ගෙන දෙන මේරුනු පොල් ගස් දහයක්ද බලපෑමට ලක් වනු ඇත

ව්‍යාපෘතියේ ඉදිකිරීම් අදියරෙහි වත්වමන් ධීවර කටයුතුවලට ඇති වන බලපෑම් හා එම කටයුතු විකල්ප තැන්වල සිදු කිරීම.

487. ධීවර බෝට්ටු ක්‍රියාකාරකම්වලට පහසුකම් සලසනු පිණිස ධීවර වරාය ඉදිකිරීමට පෙර මුනෙයි බෝට්ටු පළ වැඩි දියුණු කිරීමට ප්‍රමුඛත්වය දිය යුතු අතර මෙය සඳහා පේදුරුතුඩුව ධීවර වරාය හා මුනෙයි සඳහා එකම කොන්ත්‍රාත්තුවක් භාර දිය යුතුය හා මුනෙයි කටයුතු පළමුවෙන් අවසන් කළ යුතුය යැයි නිර්දේශ කළ යුතුය. එවිට බාධාවකින් තොරව මුනෙයි බෝට්ටු පළ යොදා ගනිමින් තම කටයුතු කිරීමට කොට්ටඩි ධීවරයන්ට හැකි වනු ඇත

### 5.3.4 වෘත්තීය සෞඛ්‍යය හා ආරක්ෂාව හා බැඳි අවදානම්

488. ඉදිකිරීම් සමයෙහි උස තැන්වලින් වැටීම නිසා තුවාල වීම්, ලනුවලට හෝ නෙරා තිබෙන දේවල පය පැටලී බිම වැටීම්, අනාරක්ෂිත යන්ත්‍ර හා එහා මෙහා යන උපකරණ නිසා හා සීමිත ඉඩකඩ හිරවීම නිසා අනතුරු ඇති වීම්, ශබ්දයට හා දෙදරුමට නිරාවරණය වීම නිසා හානි ඇති වීම් මෙන්ම වැඩි බර අනිසි ලෙසින් ඉසිලීම, තීන්ත පෙට්‍රෝලියම් තිනර් වැනි අනතුරුදායක රසායනවල වාෂ්ප ආග්‍රහනය කිරීම ස්පර්ශ කිරීම ආදිය නිසාද ශ්‍රමිකයන් විවිධ අනතුරුවල අවදානමට ලක් විය හැකිය. එහෙයින් එම අවදානම අවම කිරීමට පහත පියවර කොන්ත්‍රාත්කරු ගත යුතුය:

- ඉදිකිරීම් පරිසර කළමනාකරණ සැලැස්මෙහි අංගයක් ලෙසින් සෞඛ්‍ය හා ආරක්ෂා සැලැස්මක් කොන්ත්‍රාත්කරු සම්පාදනය කළයුතු අතර එයට මෙම කරුණු ඇතුලත් විය යුතුය: i) රාජකාරි / ක්‍රියාකාරකම් ආරක්ෂා ක්‍රමවේද සහ විධිය (ii) සෞඛ්‍ය හා ආරක්ෂා සැලැස්ම සඳහා වන සැලසුම සහ ශ්‍රමිකයන් සඳහා වන පුහුණු වැඩමුළු (iii) වැඩ බිමෙහි සඳහ වාහනවල

ප්‍රථමාධාර කට්ටල ආරක්ෂක පළඳනා සහ වෛද්‍යමය ඉවත් වීම් (iv) ආරක්ෂාව තහවුරු කරන හා අනතුරු මගහරවන පියවර (v) හදිසි අවස්ථා ප්‍රතිචාරය සහ සූදානම (vi) අනතුරුදායක රසායන ද්‍රව්‍ය වැගිරීම් නිසා ඇති වන විභව ශාරීරික හානි එහි බරපතලකම හා වර්ග ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය වන (පරිශ්‍රයේ සහ පිටත ඇති) සම්පත් (vii) අනතුරු හා ආසන්න අවස්ථා රෙජිස්තරයක් පවත්වාගෙන යාම අධීක්ෂණය සහ වාර්තා කිරීම.

- වෘත්තීමය සෞඛ්‍යය සහ ආරක්ෂාව සේවානියුක්තියන් මෙන්ම ප්‍රජාවද ආවරණය කරන අතර මෙවිට දේශීය නීති සහ නියාමන අනුව වන නිර්දේශිත ඉංජිනේරු යහ පැවතුම් සහ EHSG ආදිය  සැලකිල්ලට ගත යුතුය.
- ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට පෙර පාරිසරික ආරක්ෂාව සහා ස්වස්තථාව පිළිබඳ කොන්ත්‍රාත්කරු ශ්‍රමිකයන්ට පුහුණු ලබා දිය අතර HSP නිර්දේශ ගැන ඔවුන් දැනුවත් කළ යුතුය.
- මෙය සඳහා පූර්ණ කාලීන සෞඛ්‍ය හා ආරක්ෂක නිලධාරීවරයෙකුව කොන්ත්‍රාත්කරු පත් කළ යුතු අතර ඔහු/ඇය EMO සමග සමීපව කටයුතු කරනු ඇත
- සියලුම ශ්‍රමිකයන්ට බුට්ස් ගල් තොප්පි ගොගල්ස් අත්වැසුම් සහ කන් වැසුම් වැනි ආරක්ෂක පළඳනා (PPE) සහ ඒවා භාවිත කිරීමේ විධි ගැන පැහැදිලි කිරීම්ද ලබා දිය යුතුය.
- වැඩ බිමේ සීමා සනිටුහන් කරන කෝන් හා  බැරල් ආදියද තැබිය යුතු අතර දෘශ්‍ය අනතුරු ඇඟවීම් සහිතව සීමාව වටා වැටක්ද ඉදි කළ යුතුය.
- අදාල ස්ථානවල පානීය ජලය සහ ජංගම වැසිකිළි පහසුකම්ද ශ්‍රමිකයන්ට සැපයිය යුතුය.
- වැඩබිමෙහි සිටින සෑම විටම පැළඳිය යුතු පරාවර්ථන හා කැපී පෙනෙන වර්ණවලින් යුත් වස්ත්‍ර සහ උපකරණ ශ්‍රමිකයන්ට ලබා දිය යුතුය.
- රාජකාරි පරිසරයෙහි අනුගමනකය කළ යුතු යැයි දේශීය නීති නියාමන මගින් නිර්දේශිත සෞඛ්‍ය හා ආරක්ෂක කරුණු සැලසුම් කර අධීක්ෂණ කර පාලනය කළ යුතුය
- ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ ක්‍රියාත්මක කළ යුත්තේ දේශීය නීති රීතිවලට අනුව එය සඳහා පුහුණු ලත් නිපුණයන් විසින් පමණි.
- රියැදුරන් සහ යන්ත්‍රෝපකරණ ක්‍රියාකරවන්නන් මෙන්ම ද්‍රව්‍ය පරිහරණය කරන්නන් වෛද්‍යමය ලෙසින් යහපත් ශාරීරික තත්වයේ සහ රජයෙන් නිර්දේශිත වයස් සීමා ඇතුලත විය යුතුය හා සිය රාජකාරියට අදාල සියලු පුහුණු ලබා තිබිය යුතුය.
- වැඩ බිමෙහි අදාල සියලුම පාර්ශවයන්ට පැහැදිලිව පෙනෙන ස්ථානයක ආරක්ෂක උපදෙස් සහිත දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කළ යුතුය.
- සෞඛ්‍ය හා ආරක්ෂක ප්‍රතිපාදන පිළිබඳ උප කොන්ත්‍රාත්කරුවන් සිදු කළ යුතු ක්‍රියාකාකරම් සියල්ල අධීක්ෂණය කිරීම කොන්ත්‍රාත්කරුගේ වගකීමකි.
- ඩෙංගු ඇතුලු මදුරුවන් මගින් පැතිරෙන රෝග පාලනය කිරීමට අවශ්‍ය පියවර කොන්ත්‍රාත්කරු විසින් ගත යුතුය.
- වැඩබිමෙහි භාවිත කරන සියලුම වාහනවලට පසුපසට ධාවනය කරන විට හඬ නගන නළා සවි කර තිබිය යුතුය.
- වැඩ කරන ස්ථාන පැහිදිලිව වෙන් කර පෙන්විය යුතු අතර සිංහළ දමිළ හා ඉංග්‍රිසි බස්වලින් යුත් දැන්වීම් ප්‍රදර්ශනය කළ යුතුය.
- විදුලි උපකරණවලට සමීප වීම අනතුරුදායක විය හැකි ස්ථාන අසල අදාල අනතුරු ඇඟවීම් ප්‍රදර්ශනය කළ යුතුය
- විදුලි උපකරණ ක්‍රියාත්මක කරන්නන්ට අදාල ආරක්ෂා උපදෙස් ලබා දිය යුතු අතර එම විදුලි උපකරණ නිශ්චිත අරමුණ සඳහා භාවිත කිරීමට පෙර ඒවායෙහි තත්වය සෝදිසි කළ යුතුය.
- අදාල බලාධිකාරීවල නිරේදේශවලට අනුව ජලය ප්‍රවාහනය කරන ටැංකි, ගබඩා කර තබන ටැංකි සහ ජල සැපයුම් ටැංකි ආදිය නිසි පරිදි සැලසුම් කර තිබිය යුතුය හා නිශ්චිත කාලයකට වරක් පවිත්‍ර කර විෂානුහරණය කළ යුතුය.

- පානයට නුසුදුසු ජලය තිබෙන ස්ථානවල අදාල අවවාද ප්‍රදර්ශනය කර ශ්‍රමිකයන්ට එය පානය කිරීම තහනම් කළ යුතුය.
- ගෑස් සිලින්ඩර තීන්ත ටින් වැනි ගිනිගන්නා ද්‍රව ඝන සහ වායු සඳහා ආරක්ෂාකාරී ගබඩා පරිශ්‍ර වෙන් කළ යුතුය.
- දුම්බීම සම්පූර්ණයෙන්ම තහනම් කර ගිනිගන්නා ද්‍රව්‍ය ඇති අදාල ස්ථාන සියල්ලෙහිම අදාල දැන්වීම් ප්‍රදර්ශනය කළ යුතුය.
- ජංගම විදුලි පහන් ඇතුලු ආරක්ෂාකාරී විදුලි උපකරණ පමණක් භාවිත කළ යුතුය.
- තෙල් සහිත රෙදි කැබලි වැනි වහා ගිනි ගැනිය හැකි ද්‍රව්‍ය නොපමාව ආරක්ෂාරී තැනකට බැහැර කළ යුතුය.
- ගිනි ගැනිය හැකි ද්‍රව්‍ය ගබඩා කර ඇති ස්ථාන ඇතුලු එවන් අනතුරුදායක තැන්වලට ගිනි නිවන උපකරණ ලබා දිය යුතු අතර නිශ්චිත කාලයකට වරක් එම උපකරන නඩතත්තු කර ක්‍රියාකාරිත්වය සෝදිසි කළ යුතුය.

### 5.3.5 ව්‍යාපෘති වාහනවල සැරිසැරීම නිසා ඇති විය හැකි බලපෑම් සහ රථ වාහන කළමනාකරණ සැලැස්ම

489. ඉදිකිරීම් අදියරෙහි විශාල වාහන ප්‍රමාණයක සැරිසැරීම අපේක්ෂා කළ හැකි අතර විට ඇති විය හැකි අනතුරු හා අසීරුතා පාලනය කිරීමට පහත පියවර ගත යුතුය:

- කොන්ත්‍රාත්කරු රථවාහන පාලන සැලැස්මක් සම්පාදනය කළ යුතුය එහි ද්‍රව්‍ය මුලාශ්‍රවල සිට සමුහයාගේ වාසස්ථාන ඔස්සේ එම හා යාමේ ප්‍රවාහනයට ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.
- රථ වාහන තදබදය පවතිනු ඇති වේලා පිළිබඳ හා එය පාලනය කරනු ලබන ආකාරය අවට සමුහයාට දැනුම් දිය යුතුය
- ප්‍රවේශ බාධා ඇති වී තිබෙන පුද්ගලික ඉඩම්වලට අවශ්‍ය විකල්ප ලබා දිය යුතුය හා පොදුවේ ඇති වන අසීරුතා සම්බන්ධ ප්‍රජාව සමග සාකච්ඡා පැවැත්විය යුතුය.
- සාකච්ඡා මගින් ප්‍රවාමන වේලා සහ යොදා ගන්නා මාර්ග හඳුනා ගත යුතුය.
- වාහන හරවා යවන තැන්වල අදාල සලකුණු / දැන්වීම් ප්‍රදර්ශනය කළ යුතුය.
- පොදු ජන ආරක්ෂාව හා ඔවුන් PFHDP පෙදෙස්වලට ඇතුල්නොවනු තහවුරු කර ගත යුතුය.
- පාරවල් සෑම වේලාවකම සුන්බුන් ඇතුලු අපද්‍රව්‍යවලින් තොරව පවිත්‍රව තිබෙනු තහවුරු කර ගත යුතුය.

### 5.3.6 ව්‍යාපෘති සේවකයන්ගේ සැරිසැරීම මත වන බලපෑම්

490. ශ්‍රමිකයන් විවධ ප්‍රදේශ හා විවිධ සංස්කෘතිවලින් පැමිණිය හැකිය නිසා අදාල සමාජ බලපෑම් නොමනාප මතභේද මෙන්ම ගැටුම්ද ශ්‍රමිකයන් අතර මෙන්ම අවට සමුහයා සමගද ඇති විය හැකි අතර අනිසි ශාරීරික සබඳතා නිසා මෙන්ම එච්අයිවී/ඒඩ්ස් වැනි ආසාධනද ඇති විය හැකිය. විශේෂයෙන් ළමුන් අපයෝජනයට වැඩි වශයෙන්ම නිරාවරිත හෙයින් විශේෂ අවධානමක් ගත යුතුය. පොදු සෞඛ්‍යය හා ආරක්ෂාවද මෙවිට සැලකිල්ලට ගත යුතු කරුණු වේ. මෙම සෘණාත්මක තත්වයන් මග හැරීමට පහත පියවර යෝජනා කෙරේ:

- සේවකයන්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව පිළිබඳ කරුණු හැරෙන්නට ප්‍රජාවට ඇති විය හැකි බලපෑම් ගැනද කොන්ත්‍රාත්කරුගේHSP කටයුතු කරනු ඇත.
- මෙයට සාකච්ඡා සඳහා එකගතාවය ප්‍රජා ආරක්ෂාව සඳහා වන යාන්ත්‍රන පිහිටුවීම මැසිවිලි විමසීමේ යාන්ත්‍රනයට අනුව පැමිණිලි විමසා කළමනාකරණය කිරීම හදිසි අනතුරු සහ සුවිශේෂී සංසිද්ධි වාර්තා කිරීම ආදියද ඇතුලත් වෙයි. මෙම කටයුතු නිසියාකාරව සිදු වනු ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය (PIU) සහ SC තහවුරු කර ගත යුතුය.
- ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන්නට පෙර අවට ප්‍රජාව සමග අන්තර්කරණය කළ යුතු ආකාරය සම්බන්ධ අවවාද කොන්ත්‍රාත්කරු/වන් විසින් ශ්‍රමිකයන්ට ලබා දිය යුතු අතර ඒ සම්බන්ධ නීති නිර්දේශවලට (විශේෂයෙන් ස්ත්‍රීන් හා ළමුන්ට සහ සිසුන්ට අදාල) ගරු කළ යුතු බවද අවධාරණය කළ යුතුය.
- පෙළ ගැස්වීමේ ක්‍රියාදාමයට අදාලව ප්‍රජා පෙරාතුකොල සාකච්ඡා සිදු කළ යුතුය

- ශ්‍රමිකයන්ගේ ක්‍රියා පාලනය කරනු හා ප්‍රජා ආචාර ධර්ම අනුමගමනය කරනු කොන්ත්‍රාත්කරු තහවුරු කර ගත යුතුය.
- ආරක්ෂාව පිළිබඳ මෙන්ම අවසර නොමැති පුද්ගලයන් පරිශ්‍රයට ඇතුල්වීම තහනම් කරන දැන්වීම් (විශේෂයෙන් ළමුන්) පරිශ්‍රයේ කාර්යාලය ඉදිරිපිට සහ ඉදිකිරීමේ සිදුවන ස්ථාන ආදියෙහි සිංහල දමිළ හා ඉංග්‍රීසි බස්වලින් ප්‍රදර්ශනය කළ යුතුය
- ව්‍යාපාර ස්ථාන සහ නිවෙස්වල හිමිකාරත්ව මායිම්වලට ව්‍යාපෘතියේ ශ්‍රමිකයන් ගරු කළ යුතුය
- ශ්‍රමිකයන් සහ පෙදෙස් වාසීන් වෙනුවෙන් අනුමැතිය ලත් ආයතන මගින් ශාරීරික සබඳතාවය නිසා බෝවන රෝග එච්අයිවී/ ඒඩ්ස් වැනි ආසාධන සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විය යුතුය. (සමාජ ආරක්ෂා ලියවිල්ලට යොමුවන්න)
- පාර්ශවකරුවන්ට විසඳුම් ලබා දීමට සන්නිවේදන සහ පැමිණිලි යොදා ගනු ලැබේ
- කොන්ත්‍රාත්කරු ESO පත් කරනු ඇත.
- සම්පත් හෝ දේපළවලට කිසිදු හානියක් නොමැත
- ශ්‍රී ලංකාවේ අවම වැටුප් නිර්දේශ අනුගමනය කළ යුතුය.
- ව්‍යාපෘතියේ වැඩවලට ළමුන් සේවයේ යෙදවීම මෙන්ම නීති විරෝධී ලෙස සේවයේ යෙදවීම සම්පූර්ණයෙන්ම තහනම්ය.
- ව්‍යාපෘතියේ ශ්‍රමිකයන්ගේ කඳවුරුවලට නවාතැන් ස්ථානවලට ළමුන් ඇතුල්වීම හෝ එහි යන්ත්‍රෝපකරණ අතපත ගෑම ක්‍රීඩා කිරීම සම්පූර්ණයෙන්ම තහනම්ය.
- කොන්ත්‍රාත්කරු විසින් රථවාහන පාලන සැලැස්මක් සම්පාදනය කළ යුතු අතර එයට පදික ආරක්ෂාවද ඇතුලත් විය යුතුය.
- ව්‍යාපෘති පරිශ්‍රයේ අවට පොදු ජනයාගේ ආරක්ෂාව සහ ව්‍යපෘති පරිශ්‍රය හරහා ගමන් කරන්නන්ගේ ආරක්ෂාව
- ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය (PIU) සමග සාකච්ඡා කර ඉදිකිරීම් කලාපය ඇතුලත වන කටයුතු දැක බලා ගැනීමේ අටියෙන් පොදු ජනයා ඇතුල්වීම වැළැක්වීමට තහනම් පෙදෙස් වටා වැටක් ඉදි කළ යුතුය.
- පරිශ්‍රය වටා පිටත මායිම ඔස්සේ ඉලෙක්ට්‍රොනික ආරක්ෂාව සහ අමතර විදුලි බුබුලු සවි කළ යුතුය.

**පුරාවිද්‍යා සහ සංස්කෘතික ස්ථානවලට ඇති වන බලපෑම්**

491. යෝජිත ව්‍යාපෘති ප්‍රදේශයේ පුරාවිද්‍යා දෙපාර්තෙමේන්තුව විසින් පර්යේෂණ ව්‍යාපෘති සඳහා සිදු කරන ලද පුරාවිද්‍යාත්මක බලපෑම් තක්සේරු ලේඛන හයක් සාදනු ලැබීය. පෘතුගීසි, ලන්දේසි හා බ්‍රිතාන්‍ය යුගයට අයත් යටත් විජිත ව්‍යුහයන් සියල්ලම. පේදුරුතුඩුවේ ජැටිය ආසන්නයේ පිහිටා ඇත. දිය යටන බාර් 3 ක්ද නිරීක්ෂණය කර ඇත. පැරණි රේගු ගොඩනැඟිල්ල, කොටුවේ ඉතිරි, පැරණි බෙහෙත් ශාලාව, මෙතෙඩිස්ට් නෝනිස් විද්‍යාලයේ පැරණි ප්රවේශය, කාණ්ඩ B ලෙස වර්ගීකරණය කර ඇති අතර ප්‍රාථමික සන්දර්භය සටහන් කිරීම / ලේඛනගත කිරීමකින් පසු ද්විතීක සන්දර්භය තුළ ප්‍රතිස්ථාපනය කළ හැකිය. දිය යට සමීක්ෂණය තුළ වාර්තා කර ඇති බාර්ජ් තුන, පුරාවිද්‍යා වටිනාකමකින් තොර ස්ථානයක් ලෙස ඩී කාණ්ඩයේ ස්ථානගත කර ඇත. AIA වාර්තාව ඇමුණුම 9,

492. හඳුනාගත් පුරාවිද්‍යා ව්‍යුහයන්ට හානි කිරීමෙන් කිරීමෙන් යෝජිත වියාපෘතියට බලපෑම් ඇති විය හැකිය. එබැවින්, AIA හි සඳහන් නිර්දේශ ක්රියාවට නැංවීම සඳහා යෝජිතය.

493. පුරාවිද්‍යා ස්ථාන කිසිවක් ව්‍යාපෘය අවට නොමැත. හානියට පත්ව ඇති නඩරාජර් වේදිකාව, කුඩා කිතුනු පල්ලිය, හින්දු කෝවිල සහ පන්සල ආදිය පිහිටා ඇත්තේ ව්‍යාපෘති මායිමේ සිට මීටර් 50 ක් ඇතුලතය. පල්ලියට හා නැගෙනහිර අන්තයට ඇතිදුර මීටර් 20 ක් හෙයින් එහි දෛනික යාඥා කටයුතුවලට සහ උත්සවවලට ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නිසා බාධා ඇති විය හැකිය. පිපිරවීම් වැනි කටයුතු සිදු කිරීමට පෙර එය ගැන සමීපයේ ඇති ආගමික සිද්ධස්ථානවලට දැන්වීමට PIU සහ කොන්ත්‍රාත්කරු කටයුතු කරනු ඇති අතර හැකි පමණ එම සිද්ධස්ථානවල වතාවත්වලට බාධා ඇති නොවන අකාරයෙන් තම කටයුතු සැලසුම් කරගන්නට ව්‍යාපෘතිය උත්සාහ කරනු ඇත.

494. යා/මෙතෝදිස්ත උසස් බාලිකා පාසැල සහ යා/හාර්ට්ලි විද්‍යාලය යන වසර 180 ක් පමණ පැරණි විද්‍යා ආයතන දෙක පිහිටා ඇත්තේ ව්‍යාපතියට මීටර් 200 ක් පමණ ඈතින් වන අතර මෙම නැණසැල්වල කළමනාකරණය හා සාකච්ඡා පවත්වා එම අධ්‍යාපන කටයුතුවලට බාධා ඇති නොවන ලෙසින් ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට විශේෂ අවධානය යොදා ඇත.

**මෙහි සඳහන් කර නොමැති එහෙත් වැදගත් විය හැකි අනෙකුත් බලපෑම්**

**සමූහයාගේ ආරක්ෂාව**

**පාසැල්වලට ඇති විය හැකි බලපෑම්**

**494** බටහිර දියකඩනය ඉදිකිරීම හැර අනෙකුත් ක්‍රියාකාරකම් සිදු වනු ඇත්තේ යා/මෙතෝදිස්ත උසස් බාලිකා පාසැල් පරිශ්‍රයේ සීමාවෙන් පිටතය. යෝජිත පරිශ්‍රය හා පාසැලේ පිහිටීම රූපසටහන 5-3 හි දක්වා ඇත

**රූපසටහන 5-3 යා/මෙතෝදිස්ත උසස් බාලිකා පාසැලේ සිතියම**




**රූපසටහන 5-4 යා/මෙතෝදිස්ත උසස් බාලිකා පාසැලේ පිහිටීම**




495. ව්‍යාපෘතියේ ඉදිකිරීම් හා මෙහෙයුම් කටයුතුවල දැවැන්ත බව සැලකිල්ලට ගත් පාසැල් කළමනාරකණය, එනිසා පාසැලේ අධ්‍යාපන කටයුතුවල බාධා ඇති විය හැකිය යැයි තම කණස්සල්ල ප්‍රකාශ කළහ.

496. ඒ අනුව සුදුසු අවම කිරීමේ පියවර යෝජනා කරන ලදී.

**දෘශ්‍ය බලපෑම්**

497. එමෙන්ම වරායේ ගොඩනැගිලි ඉදිකිරීම නිසා සාගර දර්ශනය පාසැලට අහිමි වීමක් ගැනද මෙහෝදිස්ත පාසැල සිය මැසිවිල්ල කියා සිටි නමුත් වරායේ ප්‍රධාන ගොඩනැගිලි පිහිටනු ඇත්තේ බටහිර හා නැගෙනහිර අන්තවල හා ගොඩනැගිලි ඇත්තේ උතුරු දෙසට හෙයින් එය එසේ නොවන බව රිසර බලපෑම් ඇගයීම් (EIA) කණ්ඩායම පෙන්වා දුන්හ. ධීවර පහසුකම් නොමැති බැවින් මුහුදේ දෘශ්‍යතාවයට විශාල විරෝධයක් නොමැති බව පාරිසරික බලපෑම් තක්සේරුකරණ කණ්ඩායම හඳුනාගෙන තිබේ. තවද, ප්‍රධාන පාසල් ගොඩනැගිලිවල දිශානතිය බටහිර හා නැගෙනහිර දිශාවට පිහිටා ඇති නමුත් ගොඩනැගිල්ල උතුරු දිශාවට පිහිටා ඇත. එබැවින් දෘශ්‍ය බලපෑම සැලකිය යුතු නොවේ.

**රූපසටහන 5-5 පාසැල් ගොඩනැගිලිවල පිහිටීම් දිශාව**




498. ධීවරයන්ගේ කෑකෝ ගැසීම හා නොමනා හැසිරීම නිසා පාසැලේ දෛනික අධ්‍යාපන කටයුතුවල බාධා ඇති විය හැකිය යැයි තම කණස්සල්ල පාසැල් කළමනාරකණය ප්‍රකාශ කළ අතර මෙය ගැනද සාකච්ඡා පවත්වන ලදි. මෙම බලපෑම් ඇගයීමට

පාසැල් පරිශ්‍රයේ ආරක්‍ෂක කැමරා සවි කිරීමට ව්‍යාපෘතිය කටයුතු කරනු ඇත. මෙහෙයුම් නිසා ඇති විය හැකි බලපෑම් ගැන ඉදිරි කොටස්වල සාකච්ඡා කර ඇත.

499. ගොඩනැගිලි ඉදිකිරීම නිසා ඇති විය හැකි දෘශ්‍ය බලපෑම් පහත 5-6 වගුව දක්වා ඇත. පළමු මහලේ දසුන් වරායේ ධීවරයන්ගේ සැරිසැරීම් වසන්කර තොටමළු බිත්තියේ අන්තයට යොමු කර ඇති අතර පාසැලේ පිහිටීම සැලකිල්ලට ගන්නා කල ධීවර වරාය පිහිටා ඇත්තේ සැහෙන ඈතකිනි.

## අනුප්‍රතිපාදිත පුපුරන ද්‍රව්‍ය (IED)හෝ නොපිපිරුනු පුපුරන ද්‍රව්‍ය (UOX) හමු වීමේ ශාබ්‍යතාවය

500. දිගු කලක් පැවති ගැටුමෙන් මෙම පෙදෙසට හානි ඇති වු බව නොරහසකි. බිම්බෝම්බ ඉවත් කිරීමේ මෙහෙයුම් සිදු කර ඇති වුවද අනතුරුදායක දේ හමු වීමේ ශාබ්‍යතාවය සම්පුර්ණයෙන්ම බැහැර කළ නොහැකිය. මෙනිසා පළාතේ පොලිසිය හෝ බොම්බ නිශ්ක්‍රීය ඒකකයේ හෝ පුපුරන ද්‍රව්‍ය විශේෂඥයන්ගේ සහය සහිතව IED සහ UXO පිළිබඳ සංවේදිතා වැඩසටහන් සහ ආරක්‍ෂක පුහුණු වැඩවුළු කොන්ත්‍රාත්කරු පැවැත්විය යුතුය.

501. ඉදිකිරීම් කටයුතු කරන පෙදෙස්වල පාර අවට ශ්‍රමිකයන්ගේ තාවකාලික කඳවුරු ගල් කොරි අපද්‍රව්‍ය බැහැර කරන ස්ථාන ඇතුලු ව්‍යාපෘති පෙදෙසේ හෝ පිටත IED හෝ UXO යැයි සැක සිතෙන යමක් හමු වුවහොත් එය අතපත ගැසීමෙන් තිබෙන තැනින් එහා මෙහා කිරීමෙන් වැළකී සිටිය යුතු අතර කොන්ත්‍රාත්කරු වහාම ඉංජිනේරුවරයා හරහා හෝ සෘජුවම පොලිසියට දැන්විය යුතුය. එවිට පොලිසිය අදාල හමුදා විශේෂඥයන් මගින් සුදුසු පියවර ගනු ඇත. මේ අතර ශ්‍රමිකයන් සියල්ලන්වම එම පරිශ්‍රයෙන් වහාම ඉවත් කළ යුතුය හා සැක කටයුතු දෙය තිබෙන තැන වටා බාධක යෙදිය යුතුය හා කිසිවෙකුට එම තැනට ඇතුල් වීමට අවසර නොදිය යුතුය. ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදු කළ යුත්තේ හමුදා විශේෂඥයන්ගේ උපදෙස් අනුවය.

## 5.4 මෙහෙයුම් බලපෑම්

502. ගැල්පිත ධීවර වරාය කළමනාකරණය කරනු ඇත්තේ ශ්‍රී ලංකා ධීවර වරාය සංස්ථාව විසින් වන අතර ධීවර වරාය කළමනාකරුවෙකු හා සහකාර කළමනාකරුවෙකු පත් කරනු ලදුව අවශ්‍ය යටිතල පහසුකම් මෙම ව්‍යාපෘතිය යටතේ ලබා දෙනු ඇත.

### 5.4.1 භෞතික සම්පත්

**මළාපවහන බැහැර කිරීමේ බලපෑම්**

503. මෙහයුම් අදියරෙහි දිනකට 61.8 ඝන මීටර් අපත ජලය බැහැර වනු ඇති අතර එය දේශීය බැහැර කිරීම් සම්මිතිවලට හා ලෝක බැංකුවේ පාරිසරික සෞඛ්‍ය සම්මිති මාර්ගෝපදේශවලට අනුකූලව හා ප්‍රමාණවත් ලෙසින් දියාරු වනු පිණිස දියකඩනයේ නැගෙනහිර අන්තයේ වෙරළට මීටර 100 ක් පමණ ඈතින් නළයක් හරහා පරිසරයට මුදා හැරීමට පෙර පිරියම් කරනු ලැබේ. මෙනිසා බලපෑම් කිසිවක් ඇති වන්නේ නැත.

504. එසේ වුවද එය විපරීතව ක්‍රියා කිරීම හෝ නිසි ලෙස නඩත්තු නොකිරීම නිසා අපත ජල බැහැර කිරීමේ හා පිරියම් කිරීමේ පරිශ්‍රය දූෂිත විය හැකිය.

- දුගඟ පිට කළ හැකි අපත ජලය එක්රැස් නොවනු පිණිස වෙන්දේසි ශාලාව අලෙවි මධ්‍යස්ථානය සහ පැසිරුම් මධ්‍යස්ථානය නිතර සෝදා පවිත්‍ර කළ යුතුය. CHFC විසින් ධීවර වරාය කළමනාකරණයව කරනු ඇති අතර වෙන්දේසි ශාලාව වෙළඳපළ සහ පැසිරුම් මධ්‍යෂ්ථානය ඇතුලුව ධීවර වරාය පිරිසිදු කිරීම හා ධීවර වරාය නඩත්තු කිරීමට සුදුසුකම් ඇත් ශ්‍රමිකයන්ව CFHC බඳවා ගනු ඇත.
- මධ්‍යම පරිසැර අධිකාරියේ නිර්දේශ අනුව වන දේශීය බැහැර කිරීමේ සම්මිතිවලට අනුකූලව ධීවර වරායේ අපත ජලය පිරියම් කිරීමෙන් පසුව බැහැර කළ යුතුය.
- පිරියම් පද්ධතිය මනා ක්‍රියාකාරී තත්වයේ තිබෙනු තහවුරු කර ගත යුතුය.
- අපත ජලය බැහැර කිරීම නිසා මුහුදු ජලය දූෂිත නොවනු තහවුරු කිරීමට එහි ගුණත්වය අවම වශයෙන් තෙමසකට වරක් හෝ පරීක්ෂා කළ යුතුය.
- අපත ජලය බැහැර කිරීම නිසා රොන්මඩ දූෂිත නොවී ඇත යැයි තහවුරු කිරීමට එහි ගුණත්වය අවම වශයෙන් වසරකට වරක් හෝ පරීක්ෂා කළ යුතුය..

**පරණ තෙල් වැගිරීම**

505. 2022 වන විට බෝට්ටු 225ක් පමණ මෙහි ධීවර කටයුතුවල යෙදෙනු ඇත යැයි ගණන් බලා ඇති අතර තෙල් ප්‍රතිචක්‍රීකරණය කරන්නන්ගෙන් පරණ එංජිම් තෙල්වලට හොඳ ඉල්ලුමක් ඇති නමුත් බෝට්ටු සංඛ්‍යාව වැඩි වන විට අනතුරු සංඛ්‍යාවද තෙල් වැගිරීමද වැඩි වනු ඇත. එමෙන්ම ඉදිකිරීම් අවසන් වූ පසු ජලය සංසරණයද සීමිත වනු ඇති හෙයින් එම තෙල් නිසා ජලය දූෂිත වී ධීවර වරාය ඇතුලත තෙල් රැස් වී රැඳී සිටිය හැකිය.

506. මෙම ඍණාත්මක පාරිසරික බලපෑම අවම කිරීමට ධීවර වරාය කළමනාකරු පහත පියවර ගත යුතුය:

- තෙල් / රසායන වර්ග පරිහරණය කළමනාකරණ ක්‍රමවේද පිළිබඳව සියලුම ශ්‍රමිකයන් දැනුවත් කර අනුකූලතාවය නිශ්චය කර ගැනීමට සුදුසු අධීක්ෂණයක් පවත්වන්න
- වාහනවල ඉන්ධන ටැංකි නිසි ලෙස සවි වී තිබෙනු හා එහි මුඩි හොඳින් වැසී තිබෙනු නිශ්චය කරන ගැනීම මගින් ඩීසල් තෙල් සහ ලිහිසි තෙල් වැගිරීම් සහ කාන්දු වීම් පාලනය කරන්න හා වැඩිපුර තෙල් පාවිච්චි නොවනු තහවුරු කර ගන්න'
- ජලයේ වාහන නවතා තබා සර්විස් නොකර නිර්දේශිත පෙදෙස්වල පමණක් සිදු කළ යුතු අතර එම ස්ථාන කොංක්‍රීට් කර තෙල් වැගිරීම් සඳහා තෙල් පෙරන සවි කළ යුතුය. නඩත්තු කරන ස්ථානයේ වැගිරෙන තෙල් ලී කුඩු කපු රෙදි කැබලි ආදියෙන් වහා පිසදා පවිත්‍ර කළ යුතු අතර  මෙම ද්‍රව්‍ය විශේෂිත අපද්‍රව්‍ය යැයි ජාතික පරිසර පනතේ නිර්වචනනය කර ඇති හෙයින් ඒවා වානේ හෝ ප්ලාස්ටික් බැරල්වල තබා පුත්තලමේ ඉන්සී සිමෙන්ති කම්හල (මෙයට පෙර සීමාසහිත හොල්සිම් ලංකා සමාගම) වැනි බලපත්‍ර ලත් නිර්දේශිත බැහැර කිරීමේ අංගනවලට යැවිය යුතුය.

- දැනට අනතුරුදායක අපද්‍රව්‍ය පරිශ්‍රය ක්‍රියාත්මක වන්නෙ නැති හෙයින් එතෙක් එම අපද්‍රව්‍ය ප්ලාස්ටික් බැරල්වල රැස් කර තැබිය යුතුය.
- ව්‍යාපෘති පෙදෙස ඇතුලත වාහන සර්විස් කිරීමට අවසර නොදෙන අතර එය කළ යුත්තේ පරිසැර සංරක්ෂණ බලපත්‍ර ලත් සේවා ස්ථානවල පමණි

**ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම**

507. නිසි ලෙස රැස් කර වෙන් කර හා නිසි ස්ථානවල ගබඩා කර අදාල පළාත් පාලන ආයතනය මගින් ඝන අපද්‍රව්‍ය බැහැර කළ යුතු අතර මෙහෙයුම් අදියරෙහි මේ සඳහා වන ක්‍රමවේද ගැන යෝජනා කර ඇත. අනිසි ලෙස රැස් කර වෙන් කර හා අනිසි ලෙසින් ගබඩා කර බැහැර කිරීම නිසා පරිසරය දූෂිත විය හැකිය. නිසි ලෙස කළමනාකරණය හා නඩත්තු නොකරන්නේ නම් අපද්‍රව්‍ය මුහුදට සේදී යාම ස්වාභාවික ජලවහන මාර්ග අවහිර වීම දුවිලි පැතිරී යාම ආදිය නිසා දුගඳ පැතිරීම වැනි පරිසර දූෂන උද්ගත විය හැකිය. එසේම මත්ස්‍ය අපද්‍රව්‍ය ඇතුලු ඝන අපද්‍රව්‍ය නිසි ලෙස කළමනාකරණය නොකරන්නේ නම් ඒවා සතුන් ඇද දැමීම නිසා එයින්ද අහිතකර බලපෑම් ඇති විය හැකිය. අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම සඳහා ඇමුණුම 04

- ඝන අපද්‍රව්‍ය සතුන් ඇද දැමීම වළක්වනු පිණිස ඒවා අපද්‍රව්‍ය බාල්දිවල දමා මුඩිය තදින් වසා තැබිය යුතුය.
- සියලු අපද්‍රව්‍ය පේදුරු තුඩුව නගර සභාවේ සහය සහිතව නිශ්චිත දින ගණනකට වරක් බැහැර කළ යුතුය.
- දුගඟ වහනය වීම වැළැක්වීමට මත්ස්‍ය අපද්‍රව්‍ය දිනපතා බැහැර කළ යුතුය.
- අපද්‍රව්‍ය කිසිවක් මුහුද හෝ වෙරළාසන්නව බැහැර නොකරනු වරායේ කළමනාකාරීත්වය තහවුරු කර ගත යුතුය.

**වාත මෝචනය**

508. මෙහෙයුම් සමයෙහි දුවිලි පිටවන්නේ මාළු පටවන වාහනවලින් පමණි.
ප්‍රධාන වශයෙන් දුම පිට වන්නේ වාහන හා ජෙනරේටර්වලින් වන අතර මෙහෙයුම් සමයෙහි දුවිලි හා දුම් පිටවීම අවමය. දැනට මත්ස්‍යන් මිලදී ගැනීමට වාහන 10 ක් පමණ එන නමුත් මෙය යතාකාලයෙහි පස් ගුණයකින් වැඩි වී වාහන තදබදය වැඩි විය හැකිය. EnAවිසින් සිදු කරන ලද සුලික රේඛා ඇගයීමට මගින් පරිමණ්ඩිත වාතයේ ගුණත්වය මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශිත මට්ටම්වලට වඩා ඉතා පහළ බව පෙනී ගිය හෙයින් වාහනවලින් $No_2$, So2, $CO_2$සහ අංශුමය ද්‍රව්‍ය මෝචනය නිසා සැලකිය යුතු බලපෑම් ඇති වන්නේ නැත.

**ධීවර වරායේ මෙහෙයුම් නිසා නික්මෙන දුගඳ**

509. යෝජිත වරායේ තිබෙනු ඇති වෙන්දේසි ශාලාව, අලෙවි මධ්‍යස්ථානය, මාලු කපන හා ශුද්ධ කරන පැසිරුම් මධ්‍යස්ථානය ආදිය නිසා දුගඳ මෙන්ම මත්ස්‍ය අපද්‍රව්‍ය විශාල වශයෙන් පිටවන අතර අනිසි ලෙසින් අපත ජලය බැහැර කළහොත් විවෘත පෙදෙස්වල එම ජලය රැඳී දුගඳ පැතිරිය හැකිය. එමෙන්ම මත්ස්‍ය අපද්‍රව්‍ය සතුන් ඇද දැමීම නිසාද දුගඳ ඇතුලු පරිසර දූෂණ සිදු විය හැකිය. පාසැල පිහිටා ඇත්තේ වරායේ වෙන්දේසි ශාලාව අලෙවි මධ්‍යස්ථානය හා මාලු කපන හා ශුද්ධ කරන පැසිරුම් මධ්‍යස්ථානයට මීටර් 200 ක් පමණ ඈතින් හෙයින් මෙම තත්වයෙන් පාසැලට එතරම් බලපෑම් ඇති නොවන්නේ වුවද මෙමගින් අවට වාසය කරන සමූහයාට හිරිහැර ඇති නොවනු තහවුරු කිරීමට පහත පියවර ගත යුතුය:

- ඝන අපද්‍රව්‍ය සතුන් ඇද දැමීම වළක්වනු පිණිස ඒවා අපද්‍රව්‍ය බාල්දිවල දමා මුඩිය තදින් වසා තැබිය යුතුය.
- සියලු අපද්‍රව්‍ය පේදුරු තුඩුව නගර සභාවේ සහය සහිතව නිශ්චිත දින ගණනකට වරක් බැහැර කළ යුතුය.
- දුගඟ වහනය වීම වැළැක්වීමට මත්ස්‍ය අපද්‍රව්‍ය දිනපතා බැහැර කළ යුතුය.
- අපද්‍රව්‍ය කිසිවක් මුහුද හෝ වෙරළාසන්නව බැහැර නොකරනු වරායේ කළමනාකාරීත්වය තහවුරු කර ගත යුතුය.
- වෙන්දේසි ශාලාව සහ ධීවර වෙළඳපල පිරිසිදුව තබා ගත යුතුය හා අපත ජලය නොරැඳෙනු නිශ්චය කර ගත යුතුය.

510. **ශබ්දය:** ප්‍රධාන ශබ්ද මූලාශ්‍ර වන්නේ වාහන සැරිසැරීම මත්ස්‍ය අලෙවිය නිසා ඇති වන ඝෝෂා සහ ජෙනරේටරයයි.

511. **වාහන සැරිසැරීම**: වාහන විශාල සංඛ්‍යාවක් ධීවර වරායට එනු හා යනු ඇති නමුත් පිවිසුම් ද්වාරය ඇත්තේ නැගෙනහිර අන්තයේ හෙයින් මෙම ශබ්ද නිසා පාසැලට ඇති වන බලපෑම් අවමය.

512. **කෑ ගැසීම**: පුන්නලයි - පේදුරුතුඩුව මාර්ගය ඔස්සේ ඉදි කරන තාප්පය නිසා වෙළඳපළ ඇතුලත ඝෝෂාව පිටතට යාම පාලනය වන අතර පාසැල පිහිටා ඇත්තේ මීටර් 200 ක් ඈතින් නිසා මෙමගින් පාසැලට ඇති වන බලපෑම් අවමය.

513. **බෝට්ටුවල ශබ්දය**: බෝට්ටුවලින් නොකඩවා ශබ්දය ඇති වන අතර මෙමගින් ඇතිවන බලපෑම දිගු කාලීනව ගත් කල මධ්‍යම වනු ඇති නමුත් අවම කිරීමේ පියවර ගත යුතුය.

514. **ජෙනරේටරයේ ශබ්දය:** සුදානමින් තබා ඇති ජෙනරේටරයෙන් නැගෙන හඬ නිසා විශේෂයෙන් රාත්‍රී කාලවලට අවට සමුහයාට හිරිහැර ඇති විය හැකි හෙයින් අවශ්‍ය අවම කිරීමේ පියවර ගත යුතුය.

515. ඉහත ශබ්ද හා ඝෝෂා සියල්ල ධීවර වරායට සීමිත හෙයින් සමස්ත බලපෑම අවම වනු ඇත.

- ධීවර වරාය මායිමේ නිශා කාල ධ්වණීය 50 dB(A) සහ 45 d(B) මට්ටම්වල රඳවා ගත යුතු අතර මායිම වටා හරිත වැටක් ඉදි කිරීම මගින් මෙය පාලනය කර ගත හැකිය.
- ජෙනරේටරය සවි කළ යුත්තේ වාසස්ථානවලට හැකි පමණ ඈතින් වන අතර සාපේක්ෂ නිහඬ ක්‍රියාකාරීත්වය සඳහා නිසි ලෙසින් නඩත්තු කළ යුතුය.

516. **මෙහෙයුම් සමයෙහි සෞඛ්‍යය හා ආරක්ෂාව:** බෝට්ටු නැංගුරම් ලෑම, මතශ්‍යන් බෑම, වෙන්දේසි ශාලාවට ගෙන යාම, මසුන් කපා පිරිසිදු කිරීම, වාහන සැරිසැරීම සහ පදිකයන් දැකිය හැකිය. වරායේ පිහි භාවිතාව නිසා මෙන්ම රුධිරය නිසා හදිසි අනතුරු ඇති විය හැකිය හෙයින් පහත අවම කිරීමේ පියවර ගත යුතුය.

- පහත කරුණු ඇතුලත්ව ධීවර වරාය මෙහෙයුම්වල මැනුවලයටවෘතිමය සෞඛ්‍යය හා ආරක්ෂා නිර්දේශ ඇතුලත් කිරීම
- ආරක්ෂක පරීක්ෂා සම්බන්ධ වගකීම් කාර්ය මණ්ඩලයට නොකඩවා ලබා දී ධීවරයන් දැනුවත් කිරීම
- ආරක්ෂක පුර්ව සුදානම සහ හදිසි අවස්ථා ක්‍රමවේද ක්‍රියාත්මක කිරීම පිළිබඳ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම
- ශ්‍රමිකයන්ට සුදුසු පරිදි ආරක්ෂක පළඳනා ලබා දීම
- වාහන රියැදුරන් සහ යන්ත්‍රෝපකරන ක්‍රියාකරවන්නන් සුදුසු ලෙස පුහුණු හා බලපත්‍ර ලබා තිබීම තහවුරු කිරීම
- ප්‍රථමාධාර ප්‍රතිපාදන සුදානම් කිරීම
- මිනිස් ක්‍රියාකාරකම් නිසා මෙන්ම ස්වාභාවිකව ඇතිවන ආපදා තත්වයන්හි පෙදෙසින් ඉවත් වීම ඇතුලු හදිසි තත්ව ප්‍රතිචාර (තෙල් කාන්දු වීම කුණාටු සුනාමි වැනි)
- වාහන සහ ද්‍රව්‍ය නිශ්චිත කාල පරතර සහිතව පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රතිපාදන
- සියලුම ඉදිකිරීම් ස්ථානවල අනතුරු ඇගවීමේ සංඥා සඳහා වන ප්‍රතිපාදන
- හදිසි අනතුරු සිදු වුනු දිනය වාතාවරණය බරපතලකම ගත් පියවර හා ප්‍රතිදාන ඇතුලු විස්තර පවත්වාගෙන යන මෙන් වරායේ පරිපාලනයට නිර්දේශ කිරීම
- මෙහෙයුම් අදිරයෙහි -විශේෂයෙන් වරායේ උපකරණවල සහ යටිතල පහසුකම්වල නඩත්තුව සහ අනාගත අළුත්වැඩියා කටයුතු ඇතුලත්ව- නිසියාකාර වෘතිමය සෞඛ්‍යය හා ආරක්ෂා ක්‍රමවේද සම්පානය කරනු හා ක්‍රියාත්මක කරනු තහවුරු ගර ගැනීම
- මෙහෙයුම් අදියරට පෙර නඩත්තු කාලසටහන සහ පිරිවැය නිශ්චය කර ගත යුතු අතර එම කාල සටහන අවම වශයෙන් උපකරණවල මෙහෙයුම් ආයුකාලය හෝ ආවරණය කර තිබියු යතුය.

### 5.4.2 ආපදා / හදිසි අවස්ථා ප්‍රතිචාර පියවර

517. 2004 සුනාමිය නිසා ධීවර වරාය අවට පෙදෙස් දැඩි හානියට ලක් වුනු අතර ව්‍යාපෘතිය අවටද නිවාස දේපළ හා ජීවිත හානි ගණනාවක්ම සිදු විය. පසුව කොටස B 1 හි දක්වා ඇති පරිදි 2008 වසරෙහි නිශා කුණාටුව හේතුවෙන් පෙදෙසේ ගල්පර කැඩී විසිරී ගොස් තොටුපළට ළඟා වීම පවා අසීරු විය. මෙය හැරෙන්නට මෑත කාලයෙහි කිසිදු එවන් ආපදාවක් පෙදෙසට ඇති නොවුනු නමුත් පරිශ්‍රය මුහුදුබඩ හෙයින් කුණාටු, චණ්ඩමාරු, සුනාමි වැනි එවන් ආපදාවල ශාක්‍යතාවය මුළුමනින් බැහැර කළ නොහැක. එසේ වුවද, ගංවතුරු සංසිද්ධි මෙම පෙදෙසට ඇති වී නැත.

518. ආපදා කළමනාකරණය මතවන දේශීය ප්‍රතිපත්තියට අනුව ආපදා අවදානම්, ඒවා කළමනාකරණය කිරීම හා අවම කිරීමේ පියවර ආදිය ව්‍යාපෘතියේ පරිසර ඇගයීමට ඇතුලත් විය යුතු අතර මෙම කරුණු සැලසුම් ක්‍රියාදාමයෙහි මූලික පදනම් වෙයි. මෙවන් සංසිද්ධි වරායේ කටයුතු බාධාවලින් තොරව සිදුවීමට අවහිරයක් විය හැකි අතර ජීවිත හානි හා දේපළ හානි මෙන්ම පරිසර පද්ධතියටද යටිතල පහසුකම්වලටද දරුණු බලපෑම් ඇති කළ හැකිය. එනිසා ආදා කලින්ම හඳුනාගන්නා ඇගයීම් සිදු කරනා හා අවම කරනා නවීන තාක්ෂණ සැලසුමට අන්තර්ගත කළ යුතුය.

519. ඉදිකිරීම් හා මෙහෙයුම් අදියරවල කුණාටු, සුනාමි, ගිනිගැනීම් වැනි ආපදා ඇති විය හැකිය (ඉදිකිරීම් සමයෙහි ද්‍රව්‍ය ප්‍රවාහනය ගබඩා කිරීම ආදිය)

520. මෙම ව්‍යසනවලින් ඇති වන බලපෑම් නිසි සැලසුම් සහ යහපත් චර්යා ආදේශ කිරීම මගින් අවම කර ගත හැකිය.

521. ව්‍යාපෘති පෙදෙස කුණාටු හා සුනාමි වැනි අපදාවලට ගොදුරු විය හැකි එකක් නමුත් 2004 වැනි දැවැන්ත සුනාමි ඇති වීමේ වියහැකියාව බොහෝ සෙයින් දුරස්ය. ව්‍යුහ සැලසුම් කරන විට සියවස් ගණනාවකට වරක් පමණක් ඇති විය හැකි දැවැන්ත සුනාමි වැනි ආපදා මුල්කරගෙන සැලසුම් කිරීම මූල්‍යමය අතින් නැණවත් නොවන හෙයින් නිතර ඇති විය හැකි කුණාටු වැනි ව්‍යසනවලින් ආරක්ෂා වීමේ ඉලක්කයෙන් ව්‍යුහ සැලසුම් කිරීම උචිතය.

522. කුණාටු හා සුනාමි වැනි ව්‍යසන ගැන ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මෙන්ම කාලගුණ දෙපර්තමේන්තුවද කලින්ම අනතුරු අඟවයි. දිවයිනට ළඟා විය හැකි සුනාමි ඇති වන්නේ සුන්දා බොක්කුවේ ඇති වන භූචලන හේතු කොට හෙයින් ශ්‍රී ලංකාවට උපරිමයෙන් මිනිත්තු 90 ක අනතුරු ඇඟවීම් ලැබෙනු ඇත. මෙනිසා මෙය පෙදෙසින් ඉවත් වීමට ප්‍රමාණවත් කාලයකි. එසේම කුණාටු අනතුරු ඇඟවීම්ද සෑහෙන වේලාවකට කලින්ම නිකුත් කළ හැකිය. ගොඩනැගිලි අවශ්‍ය පරිදි සැලසුම් කිරීම මෙන්ම පුහුණුලත් ගිනි නිවන්නන් මෙන්ම නවීන උපකරණ සූදානමින් තබා ගැනීම මගින් බලපෑම් අවම කර ගත හැකිය.

### 5.4.3 රාශිභූත බලපෑම් හා අවම කිරීමේ පියවර

523. ප්‍රාරම්භ ලෙසින් ඇගයීම් සිදු කරන විට පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධනව්‍යාපෘතිය නිසා උද්ගත විය හැකි රාශිභූත පාරිසරික බලපෑම් පරිසර කළමනාකරණ සැලැස්මෙහි නිර්දේශිත අවම කිරීමේ පියවර ක්‍රියාත්මක කරන්නේ නම් පොදුවේ සුළු හා දීර්ඝ කාලීන බලපෑම් නොමැති ඒවා බව පෙනී යයි. විභව රාශිභූත බලපෑම් සහ අදාල අවම කිරීමේ පියවර පහත පරිදි වෙයි:

524. පරිශ්‍රයේ නැගෙනහිර හා බටහිර අන්තවල ගල්පර හා වෙරළබඩ දෛනික උදම් ප්‍රවාහ සාගර ජල සංසරණය සහ රළ ආදිය අතීතයේ සිදුකරන ලද වෙරළාසන්න මාර්ගය, බැම්ම, නැංගුරම්පළ, බෝට්ටු තොටුපළ ඉදිකිරීම හා වෙරල ප්‍රතිසංස්කරණය වැලි ඉවත් කිරීම, කැණීම හා වාප්පුව ප්‍රතිසංස්කරණය කිරීම ආදිය නිසා සැලකිය යුතු ලෙසින් වෙනස් වී ඇත.

525. මෙම ව්‍යුහ නිසා මෙම ගල්පර පෙදෙසෙහි ජලයේ ස්වාභාවික සංසරණය හා විශේෂයෙන් අන්තර් උදම් ගල්පර පත්ල දශක ගණනාවක් තිස්සේ වෙනස් වී ඇත. ව්‍යාපෘතියේ දියකඩනය සහ අන්තර් උදම් යටිතල පහසුකම් සංරචක තවත් එය වෙනස් කරනු ඇත. එසේ වුවද, ජල සංසරණයේ ශුද්ධ ගලනය (නැගෙනහිර සිට බටහිරට) නොවෙනස්ව පවතිනු ඇත.

526. දියකඩනයේ නැගෙනහිර කොටසෙහි වෙරළ ඔස්සේ රොන්මඩ තැන්පත්වීම වෙනස් වනු ඇති අතර ස්වාභාවික පද්ධතිය ව්‍යාපෘතියේ යටිතල පහසුකම්වලට අනුකූලන වනු ඇත. දියකඩනය නිසා කාලායාගේ අවැමෙන් වැලි රැස් වීම හා අධිවර්ධන රටා ඇති වන බව හා එයින් ඇතැමක් දියකඩනයේ නැගෙනහිරට ඇති වන ප්‍රාරම්භක රොන්මඩ ප්‍රවාහන අධ්‍යයනය මගින් නිරීක්ෂණය වු අතර මෙම එක්රැස්වීම් මගින් වෙරළේ මුල් තත්වය ප්‍රතිස්ථාපනය වනු ඇති බවද පෙනී ගියේය. එමෙන්ම ධීවර වරාය ඇතුලත සහ බටහිර දියකඩනයේ බටහිර දෙස වෙරළේ සහ වැල්ලේ ඇති වන්නේ සුළු වෙනස්වීම් බවද තහවුරු විය.

527. පවතින වෙරළ පද්ධතිය අතිශය ප්‍රවේගකාරී වන අතැර වැලි සහ සුන්බුන් සැමවිටම රළ නිසා එහා මෙහා යමින් පවතියි. එමෙන්ම වෙරළ ඔස්සේ අන්තර් උදම් ගල්පර හරහා ජලය හුවමාරු වීම දෛනික ක්‍රියාවලියක් වන අතර එය නොකඩවා සිදු වනු ඇත.

528. ධීවර වරායට ආසන්නව උප උදම් ගල්පර පද්ධතියෙන් වැලි හා ගල් කැණීම හරහා අන්තර් උදම්ගල්පර වේදිකා ප්‍රතිසංස්කරණය කිරීම ධීවර වරාය බේසම ඇතුලත තොටවළ දියකඩන දෙක ඉදිකිරීම ආදිය වෙරළට බාධා ඇති කරන ක්‍රියාකාරකම් අතර වෙයි.

529. ව්‍යාපෘතියට අදාලව අන්තර් උදම් සහ සාගර සම්පත් අහිමි වීම් සුළු හා පෙදෙසට සීමා වන අතර දරුණු රාශිභූත පාරිසරික බලපෑම් ඇති නොකරයි. එමෙන්ම පරිසර කළමනාකරණ සැලැස්මෙහි යෝජිත පියවර මගින් මෙය තවත් අවම කළ හැකිය. තවද අන්තර් උදම් ගලපර වේදිකාවෙන් ධීවර වරාය හා දියකඩන දෙක මෙන්ම ජල ව්‍යුහවල ධීවර වරාය බේසම නිර්මාණය වීම මගින් රළු කොරල් වැනි ජංගම සාගර සම්පත් තැන්පත් වීම සඳහා ආරක්ෂිත අන්තර් හා උප උදම් ගල්පර වාසස්ථාන ලබා දෙනු ඇත. තවද පවතින ගල්පර පද්ධතියේ සහ පරිසර පද්ධතියේ සංකීර්ණ බව මෙන්ම ගල්පරවල සාගර ජෛව විවිධත්වයද වැඩි කර එය පවත්වාගෙන යාමටද මෙම ව්‍යුහ ඉවහල් වෙයි. ඉදිකිරීම් කටයුතු අවසන් වූ පසු දියකඩන හා ධීවර වරාය බේසමේ අනෙකුත් ව්‍යුහ ඇතුලත රළු කොරල් වැනි සාගර නිතලවාසී සම්පත් ස්වාභාවික ලෙසින් තැන්පත් වනු ඇත යැයි අපේක්ෂා කරනු ලැබේ.

530. පේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතියෙහි අපතජලය, මතශ්‍ය අපද්‍රව්‍ය, පොට්රෝලියම් රසායන වැගිරීම් හෝ මළාපවහනය හා බැඳි වැඩි වීමක් හෝ රාශිභූත බලපෑම් කිසිවක් නොමැත. සුදුසු හා ප්‍රායෝගික සහ පාරිසරික හිතකාමීව සැලසුම් කරන ලද උපකරණවල ප්‍රතිපාදනද මෙම අයිතම පාලනයකර කළමනාකරණය කිරීම වත්මන් මට්ටම්වල විභව භෞමික හා ජල දූෂණ ය අවම වනු ඇත. ඒ අනුව ව්‍යාපෘතිය නිසා අත්‍යන්තයෙහි හිමි වන ධණාත්මක බලපෑම් සාපෙක්ෂව වැඩිය.

**සමාජාර්ථික බලපෑම්**

531. පවුල් හා සමූහ මට්ටමින් ගත් කල ඉඩම් හෝ ජීවනෝපා, ආදායම් මාර්ග අහිමි වීම් අවතැන්වීම් කිසිවක් ව්‍යාපෘතිය නිසා උද්ගත වන්නේ නැත. ඉදිකිරීම් කලාපවලට සිදු කරන සුළු පරිමානයේ සීමා පැනවීම් නැගෙනහිර සහ බටහිර පෙදෙස්වල සංවර්ධනය කරන ලද විකල්ප බෝට්ටු පළවල් ලබා දීම මගින් විසඳනු ලැබේ (සමාන්තර ව්‍යාපෘතියක් MFAR විසින් ක්‍රියාත්මක කරනු ලැබේ)

532. ව්‍යාපෘතිය නිසා සංස්කෘතික හෝ ජාතික උරුම හා බැඳි දරුණු බලපෑම් කිසිවක් උද්ගත නොවන අතර පුද්ගලික හෝ සාම්ප්‍රදායිකව හිමි ඉඩම් අත්පත් කර ගැනීමක්ද අවශ්‍ය නොවේ. මේ අනුව ව්‍යාපෘතිය නිසා බරපතල රාශිභූත සමාජීය බලපෑම් කිසිවක් ඇති වන්නේ නැත.

# හයවන පරිච්ඡේදය

## 6. පරිසර කළමනාකරණය සැලැස්ම :පරිසර කළමනාකරණ සැලැස්ම–

533. මෙම වාර්තාවේ පසුගිය කොටස්වලින් හඳුනා ගත් ව්‍යාපෘතියේ කටයුතු නිසා ඇති විය හැකි බලපෑම් වැළැක්වීමට, අඩු කිරීමට, අවම කිරීමට හෝ හානිපූර්ණ ලබා දීමට අවශ්‍ය පියවර කළමනාකරණය කිරීම ගැන මෙම කොටසෙහි සාකච්ඡා කරනු ලැබේ. පරිසර කළමනාකරණ සැලැස්මයැයි හඳුන්වනු ලබන මෙම ක්‍රියාවලියෙහි ඉදිකිරීම් හා මෙහෙයුම් අදියරවලට පෙර හා පසුව ඇති විය හැකි ගැටළු ක්‍රමානුකූලව සැලකිල්ලට ලක් කර ඇති අතර සාරාංශය වගුව 7.2 හි ලබා දී ඇත.

534. යෝජිත පේදුරු තුඩුව ධීවර වරාය ව්‍යාපෘතියට අදාල වෙරළබඩ යටිතල පහසුකම් ඉදි කරන විට ඇති විය හැකි මෙම බලපෑම් පරිසර කළමනාකරණ සැලැස්ම ආවරණය කරන අතර මෙය පරිශ්‍රයට සුවිශේෂ වන්නක් මෙන්ම පරිසරයට බලපෑම් ඇති කළ හැක්කකි (3.1 ව්‍යාපෘති විස්තර කොටසට යොමු වන්න)

## 6.1 ආයතනික සූදානම

### 6.1.1 ශ්‍රී ලංකා රජය

535. ව්‍යාපෘති ක්‍රියාකාරකම් සියල්ලෙහිම වගකීම් දරන ආයතනය වන්නේ ධීවර ජලජ සම්පත් සංවර්ධන හා ග්‍රාමීය ආර්ථික අමාත්‍යාංශයයි. මෙයට අමාත්‍යාංශ අතර සිදු කරන සම්බන්ධීකරණයද ඇතුලත් වන අතර තම ව්‍යාපෘති කළමනාකරණ ඒකකය අදාල ක්‍රියාකාරකම් ධීවර ජලජ සම්පත් සංවර්ධන හා ග්‍රාමීය ආර්ථික අමාත්‍යාංශය විසින් සිදු කරනු ඇති අතර දෛනික ප්‍රසම්පාදන හා ධීවර වරාය ඉදිකිරීම් කටයුතු සිදු කරනු ඇත්තේ මෙම ඒකකයි. මෙම ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට යාපනයේ පිහිටනු ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය සහය ලබා දෙනු ඇත. මෙම ඒකකයට පරිසර නිලධාරීන් තිදෙනෙකුගේ සහය ලැබෙනු ඇත. මෙහි ආරක්ෂක කළමනාකරුවෙකු සිටිනු ඇති අතර ධීවර වරාය ඉදිකිරීමද ඇතුලත්ව සමස්ත ව්‍යාපෘතියම මොහු අධීක්ෂණය කරනු ඇත. එමෙන්ම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයට ඉදිකිරීම් අධීක්ෂණ කළමනාකරණයට සහ පරිපාලනයට සහය ලබා දෙන උපදේශන කණ්ඩායමක සහයද ලැබෙනු ඇති අතර මෙයට පූර්ණ කාලීන පාරිසරික විශේෂඥයෙකුද (ES) ඇතුලත් වනු ඇත. මෙම කණ්ඩායම ධීවර වරායවල්, නැංගුරම් තොටවල්, ගොඩබාන ස්ථාන කළමනාකරනය සහ පරිපාලනයට සහ එදිනෙදා ඉදිකිරීම් කටයුතු අධීක්ෂණය සඳහාද සහය ලබා දෙනු ඇත. තවද පාරිසරික විශේෂඥයා පාරිසරික කළමානකරණ සැලැස්ම ක්‍රියාත්මක වනු අධීක්ෂණය කරනු ඇති අතර ආසියා සංවර්ධන බැංකුවට සහ රජයට ඉදිරිපත් කළ යුතු අර්ධ වාර්ෂික පාරිසරික අධීක්ෂණ වාර්තාව සම්පාදනය කිරීමටද ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට සහය වනු ඇත.

536. කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙර වෙරළ සංරක්ෂණ සහ වෙරළාසන්න සම්පත් කළමනාකරණ පනතට අනුව මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය හරහා රජයේ සංවර්ධන එකගතා නිෂ්කාසන ලබා ගැනීමේ වගකීම ධීවර ජලජ සම්පත් සංවර්ධන හා ග්‍රාමීය ආර්ථික අමාත්‍යාංශයට අයත් වෙයි. මෙයට ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සහය වනු ඇත.

537. ව්‍යාපෘතියේ පරිසර කළමනාකරණ සැලැස්ම ලංසු ලියවිලිවලට ඇතුලත් වන අතර එය ගිවිසුමේ අංගයක් උත්පාදනය කරන්නකි. තවද පරිසර කළමනාකරණ සැලැස්මෙහි අවධාරණය කර ඇති අවම කිරීමේ පියවර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්පත් ඇතුලත් කිරීම කොන්ත්‍රාත්කරුගේ ලංසු ලියවිලිවලට ඇතුලත් කර තිබෙනු ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන විට පරිසර බලපෑම් නිශ්චය බව පෙනී යන විට පරිසර විශේෂඥයන් විසින් ප්‍රාරම්භක පාරිසරික පරීක්ෂණ වාර්තාවඇතුලත්ව පරිසර කළමනාකරණ සැලැස්ම යාවත්කාල කරනු ඇත. පසුව ඒ සියල්ල පුනරීක්ෂණය සඳහා ආසියා සංවර්ධන බැංකුවට ඉදිරිපත් කරනු ඇත.

538. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ඒකකය හරහා සහ පරිසර විශේෂඥයන්ගේ හා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට අනුයුක්ත ආරක්ෂක නිලධාරීන්ගේද සහය සහිතව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන අයතනය පහත කරුණු සඳහා වන වගකීම දරනු ඇත:

i) ව්‍යාපෘතියේ පාරිසරික කළමානකරණ පැතිකඩවලින් වන වැරදීම් දන්වා කොන්ත්‍රාත්කරුවන් විසින් පරිසර කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කරනු තහවුරු කිරීම

ii) කොන්ත්‍රාත්කරුවන් රජයේ නීති නිර්දේශවලට අනුකූල වනු නිශ්චය කර ගනිමින් හා එයට සහය දක්වමින් අවශ්‍ය කරන අනුමැති ලබා ගැනීමටද සහය දැක්වීම

iii) කොන්ත්‍රාත්කරුවන් පරිසර කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කරනු තහවුරු කිරීම සහ අධීක්ෂණය කිරීම

iv) පරිසර කළමනාකරණ සැලැස්මේ ඵලදායීතාවය පුනරීක්ෂණය හා අධීක්ෂණය කර ඇගයීමට ලක් කර අවශ්‍ය කරන නිවැරදි කිරීමේ උපදෙස් ලබා දීම

v) අනුමැතිය ලබා දෙන රජයේ ආයතන සහ ආසියා සංවර්ධන බැංකුවට අර්ධ වාර්ෂික අධීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීම

vi) මහජනයාට ප්‍රවේශය තිබෙනා ලෙසින් ප්‍රාරම්භක පාරිසරික පරීක්ෂණ වාර්තාවකාලීනව අනාවරණය කරනු තහවුරු කර ගැනීම

vii) අනපේක්ෂිත හා සෘණාත්මසක පාරිසරික බලපෑම් ඇති වන අවස්ථාවල අවශ්‍ය නිවැරදි කිරීමේ පියවර ගැනීම

viii) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන විට පෙදෙස්වාසීන් සමග අදහස් විමසීමේ සංවාද පැවැත්වීම

ix) මැසිවිලිවලට සවන් දීමේ යාන්ත්‍රනයක් පිහිටුවා එය බාධාක රහිතව සහ සෑහීමට පත් විය හැකි ආකාරයෙන් පැවැත්වෙනු තහවුරු කිරීම

539. මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය සහ රජයේ ආයතනවල අනුමැති ලැබෙන තෙක් ඉදිකිරීම් කටයුතු කිසිවක් කොන්ත්‍රාත්කරුවන් ආරම්භ නොකරනු තහවුරු කිරීම ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයේ වගකීමකි.

540. අධීක්ෂණ උපදේශකවරුන් විසින් රජයට සහ ආසියා සංවර්ධන බැංකුවට කාර්තුමය ප්‍රගති වාර්තා ඉදිරිපත් කරනු ඇති අතර මෙයට කොන්ත්‍රාත්කරුගේ මාසික වාර්තාවල ලේඛන ගත කර ඇති කරුණු සහ කොන්ත්‍රාත්කරු සහ සැලසුම් සහ අධීක්ෂණ උපදේශක (DSC) විසින් සම්පාදනය කරනු ලබන පාරිසරික අධීක්ෂණ වාර්තාද ඇතුලත්ව ව්‍යාපෘතියේ සියලුම පැතිකඩ අන්තර්ගත වනු ඇත. මෙයට අමතරව නිශ්චිත කාල පරතර සහිතව සිදු කරනු ලබන පුනරීක්ෂණ හා අධීක්ෂණවලදී පරිසර කළමනාකරණ සැලැස්මේ ප්‍රගතිය ආසියා සංවර්ධන බැංකුව පුනරීක්ෂණය කර ආසියා සංවර්ධන බැංකුවේ අධීක්ෂණ වාර්තා සහ ප්‍රාරම්භක පාරිසරික පරීක්ෂණ වාර්තාව සිය නිල වෙබ් අඩවියෙහි ප්‍රකාශයට පත් කරනු ඇත.

ඉදිකිරීම් කටයුතු අවසන් වූ පසු සියලුම වත්කම්වල මෙහෙයුම් කටයුතු සහ නඩත්තුව පැවරෙනුයේ ධීවර ජලජ සම්පත් සංවර්ධන හා ග්‍රාමීය ආර්ථික අමාත්‍යාංශයටය.

### 6.1.2 කොන්ත්‍රාත්කරු

541. කොන්ත්‍රාත්තුව පිරිනැමුනු පසු ඉදිකිරීම් පරිසර කළමනාකරණ සැලැස්ම නිර්වචනය කරමින් පරිසර කළමනාකරණ සැලැස්ම සම්පාදනය කිරීම කොන්ත්‍රාත්කරු සතු වගකීමකි. වෙනස් කිරීම් හෝ අමතර ඉංජිනේරු තොරතුරු ඇති විට මෙය ඉදිකිරීම් පරිසර කළමනාකරණ සැලැස්මෙහි සැලකිල්ලට ගනු ලැබේ. භෞතික කටයුතු කිසිවක් ආරම්භ කරන්නට පෙර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ ආසියා සංවර්ධන බැංකුව ඇතුලත අධීක්ෂණ ඉංජිනේරුවරයා ලෙස කටයුතු කරන කොන්ත්‍රාත්කරුගේ පරිශ්‍ර නියෝජිතයා, පරිසර නිලධාරිවරයාගේ උපදෙස් අනුව ඉදිකිරීම් හා පරිසර කළමනාකරණ සැලැස්ම සඳහා වන අනුමැති ලබා දෙනු ඇත. ඉදිකිරීම් පරිසර කළමනාකරණ සැලැස්මට පහත කරුණු ඇතුලත් විය යුතුය:

ඉදිකිරීම් පරිසර කළමනාකරණ සැලැස්ම පහත දේ ලබා දෙනු ඇත:

i. ප්‍රධාන නිලධාරින්ගේ වගකීම් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සහ වාර්තාව ආදිය දක්වන කාන්ත්‍රාත්කරුගේ සංවිධානමය ව්‍යුහය

ii. ව්‍යාපෘති වැඩසටහන සහ ක්‍රියාකාරකම්

iii. පහත පරිදි කොන්ත්‍රාත්කරු විශේෂිත සැලසුම්

1. ජල, විදුලි පහසුකම් ප්‍රතිස්ථාපනය කිරීම (සේවා බිඳ වැටීම් අවම කිරීම පිණිස)

2. විවිධ පහසුකම් මෙහෙයුම් නිසා ඇති වන බලපෑම් පාලනය කිරීම සඳහා වන පහසුකම් කළමනාකරණ සැලැස්ම (ප්‍රවේශ මාර්ග, කම්කරු නවාතැන්, ගබඩා පෙදෙස් සහ උපකරණ නඩත්තු පෙදෙස්වල විස්තරාත්මක සැලැසුම්, ක්‍රමෝපා සහ

පෙදෙස් මෙන්ම කාණු පද්ධති රැඳවුම් ටැංකි / පොකුණු, පූතික ටැංකි, තාවකාලික ශබ්ද බාධක වැනි දූෂක පාලන පහසුකම් ආදිය)

3. වාත දූෂණ පාලන සැලැස්ම (දූවිලි සහ දුම් පිටවීම)

4. ශබ්දය සහ දෙදරුම් පාලන සැලැස්ම

5. අප ද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම (ඝන ද්‍රව සහ ආනතුරාදායක අපද්‍රව්‍ය)

6. සුන්බුන් බැහැර කිරීමේ සැලැස්ම

7. ජලාපවහන  කළමනාකරණ සැලැස්ම

8. කාදන හා රොන්මඩ පාලන සැලැස්ම

9. රථවාහන කළමනාකරණ සැලැස්ම

10. රසායන සහ අනතුරුදාක ද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම

11. සේවක හා මහජන ආරක්ෂා සැලැස්ම

12. හදිසි අවස්ථා ප්‍රතිචාර  සැලැස්ම

13. ගල් කැණීම සහ පුනරුත්තාපන සැලැස්ම

v. පරිසර කළමනාකරණ සැලැස්මෙහි සඳහන් කර ඇති විවිධ අවම කිරීමේ පියවර ක්‍රියාත්මක කිරීම සඳහා වන ප්‍රවේශය සහ වැඩසටහන

v. පරිසර කළමනාකරණ සැලැස්ම / ඉදිකිරීම් පරිසර කළමනාකරණ සැලැස්ම සමග අනුකූල වීම තහවුරු කිරීම සඳහා වන ස්ව අධීක්ෂණ සහ වාර්තාකරණ සැලැස්ම

542. පහත කරුණු සඳහා කොන්ත්‍රාත්කරුට වගකිව යුතු පාරිසරික ආරක්ෂා නිලධාරිවරයෙකු ්ඪ- පත් කරන මෙන් කොන්ත්‍රාත්කරුගෙන් ඉල්ලා සිටිනු ඇත:

- අවශ්‍ය විට ඉදිකිරීම් පරිසර කළමනාකරණ සැලැස්ම යාවත්කාල කිරීමට පරිසර නිලධාරිවරයා සහ/හෝ සැලසුම් සහ අධීක්ෂණ උපදේශකසමග ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය සමග සම්බන්ධීකරණය කිරීම.
- කොන්ත්‍රාත්කරුගේ සේවකයන් අතර කායික ඇසුරෙන් බෝවන ආසාධන / එච්අයිවී / ඒඩ්ස් සංවේදිතා වැඩසටහන් සඳහා සුදුසු සංවිධානයක් කොන්ත්‍රාත්කරු පත් කිරීම තහවුරු කිරීම.
- පරිසර සහ වෘතිමය සෞඛ්‍යය හා ආරක්ෂාව හා බැඳි කරුණුවලට අදාලව ගිවිසුමේ සහ ලංසු ලියවිලිවල ඇති නිර්දේශවලට කොන්ත්‍රාත්කරු අනුකූල වන බව තහවුරු කිරීම.
- ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය සමග සහ/හෝ ධීවර  ජලජ සම්පත් සංවර්ධන හා ග්‍රාමීය ආර්ථික අමාත්‍යාංශය නොකඩවා සිදුකරන මහජන සංවාද සඳහා සම්බන්ධීකරණය කිරීම.
- නිර්දේශිත පරිදි පාරිසරික කළමනාකරණ කටයුතු වාර්තා කරනු ලැබීම තහවුරු කිරීම පිණිස PIMU සහ සැලසුම් සහ අධීක්ෂණ උපදේශකසමග අධීක්ෂණ සහ සම්බන්ධීකරණවලට සහභාගී වීම.
- මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය සහ ආදාල අනෙකුත් රජයේ ආයතනවල අනුමැති ලැබීමට  පෙර කිසිදු ඉදිකිරීම් කටයුත්තක් කොන්ත්‍රාත්කරු ආරම්භ නොකරනු තහවුරු කිරීම.
- ලැබෙන්නාවූ මැසිවිලි සඳහා සටහන් පොතක් පවත්වා ගෙන යාම සහ එම මැසිවිලි විෂයයෙහි නිසි පියවර ගනු ලැබීම තහවුරු කර ගැනීම.

542. බලපෑම්ට ලක් වු සමුහයා සහ පොදු ජනයා රජයේ සහ පුද්ගලික් ආයතන වැනි විවිධ පාර්ශවකරුවන් සමග සාකච්ඡා පැවැත්වීම සඳහා කොන්ත්‍රාත්කරුගේ ප්‍රජා සම්බන්ධීකාරක (CLO) සමග සම්බන්ධීකරණය සහ සන්නිවේදන පැවැත්වීම.

543. ව්‍යාපෘතියේ ඉදිකිරීම් අදියරවල විවිධ පැතිකඩ ක්‍රියාත්මක කිරීම සඳහා, පරිසර කළමනාකරණ සැලැස්මෙහි හඳුනා ගත්පරිදි, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය (PIU) සමග සහ/හෝ MFARD වගකීම් දැරිය හැකිය. විෂණන සහ මාසික පරීශ්‍ර නිරීක්ෂණ මගින් කොන්ත්‍රාත්කරුගේ පරීශ්‍ර නියෝජිතයා භාර ගත් අධීක්ෂණ සහ සුපරීක්ෂා සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය හරහා ධීවර ජලජ සම්පත් සංවර්ධන හා ග්‍රාමීය ආර්ථික අමාත්‍යාංශයවගකීම් දැරිය යුතුය.

544. ධීවර ජලජ සම්පත් සංවර්ධන හා ග්‍රාමීය ආර්ථික අමාත්‍යාංශය සහ ආසියා සංවර්ධන බැංකුවට සැලසුම් සහ අධීක්ෂණ උපදේශක විසින් ඉදිරිපත් කළ යුතු මාසික හා කාර්තුමය ප්‍රගති වාර්තාවල අධීක්ෂණයේ ප්‍රතිපල ඇතුලත් කරනු ඇත. මෙම තොරතුරු ඒකාබද්ධ කර සමසකට වරක්යන පදනම අනුව පුනරීක්ෂණය සඳහා ආසියා සංවර්ධන බැංකුවට ඉදිරිපත් කරනු ඇත.

### 6.1.3 මැසිවිලි නිරාකරණය කිරීමේ යාන්ත්‍රනය(GRM)

545. ව්‍යාපෘති සමයෙහිමෙන්ම මෙහෙයුම් හා ඉදිකිරීම් අදියරවලද පරිසර කළමනාකරණය සහ පරිසර කළමනාකරණ සැලැස්ම සම්බන්ධව ප්‍රජවාගෙන් මැසිවිලි ඇති විය හැකි අතර මෙම මැසිවිලි සඳහා මැසිවිලි නගන්නන් සමග ද්වේෂ සහගතව කටයුතු නොකර නොපමාව සහ විනිවාද ලෙසින් විසඳුම් ලබා දිය යුතුය.

546. ජේදුරුතුඩුව ධීවර වරාය සංවර්ධන ව්‍යාපෘතිය හා සම්බන්ධ පාරිසරික මැසිවිලි නිරාකරය කිරීමේ යාන්ත්‍රනයක් (GRM) පිහිටුවා ගත යුතු අතර එය පහත සඳහන් පරිදි විවිධාකාර කාල සීමා සහ සෑම මට්ටමකම වගකීම් දරන්නන් සහ උපදෙස් ලබා ගත යුත්තන් හඳුනා ගත් ප්‍රවේශවලින් සමන්විත විය යුතුය. මෙම යාන්ත්‍රනයේ අරමුණ වන්නේ අදාල පාර්ශව සමගඑක්ව අව්‍යාජව මැසිවිලි නගන්නන්ට අන්‍යෝන්‍ය වැටහීම හා එකගතාවය මත පදනම්ව විසඳුම් ලබා දීමය. මෙය ගැටළු නිරාකරණය කිරීම සඳහා තිබෙන්නාවු නෛතික ආයතනවලට පරිබාහිර ව්‍යුහයක් වන අතර මැසිවිලි නිරාකරය කිරීමේ යාන්ත්‍රනය හරහා කටයුතු සිදුවන විට වුවද එවන් ආයතනවල පිහිට පැතීමේ අයිතිය බලපෑමට ලක් වුවන්ට නිරන්තරවම තිබෙනු ඇත. විස්තරාත්මක සැලසුම් අදියරේ පළමු භාගයෙහි මැසිවිලි නිරාකරනය කිරීමේ කමිටුවක් පිහිටුවා එය නොකඩවා ක්‍රියාත්මක වන අතර ක්‍රියාත්මක කිරීමේ අදියරෙහි පහත **රූපසටහන 6.1 හි** විස්තර කර ඇති පරිදි එහි සාමාජික සංඛ්‍යාව වැඩි කරනු ඇත:

රූපසටහන 6-1මැසිවිලි නිරාකරය කිරීමේ යාන්ත්‍රනයක්




547. බලපෑමට ලක් වුනු තැනැත්තා සිය මැසිවිල්ල නිසි පරිදි සැලකිල්ලට නොගෙන ඇත යැයි විශ්වාස කර ව්‍යාපෘති පරිශ්‍රයේ ඉංජිනේරුවන් හෝ / සහ සැලසුම් සහ අධීක්ෂණ උපදේශක පරිශ්‍ර නියෝජිතයන් හමුවී මැසිවිලිල් නැගූ පසු පළමු පියවර ලෙසින් අදාල ස්ථානයෙහි සෘජුවම නගන ලද මැසිවිල්ල නිරාකරය කිරීමට මැසිවිලි නිරාකරණය කිරීමේ කමිටුව මගින් වෑයම් කරනු ඇති අතර ගෙන ඇති පියවර පසුව බලපෑමට ලක් වු තැනැත්තාට ව්‍යාපෘති කාර්ය මණ්ඩලය දින 7 ක් ඇතුලත පැහැදිලි කළ යුතුය. එය නිරාකරණය නොවුවහොත් පෙදෙස් හෝ කොට්ඨාශ මට්ටමේ මැසිවිලි නිරාකරය කිරීමේ කමිටුවට බලපෑමට ලක් වු තැනැත්තාට යා හැකි හා එම ආයතනය සති දෙකක් ඇතුලත විසඳුමක් ලබා දෙනු ඇත. මැසිවිල්ල තිබෙනුයේ මැසිවිලි

නිරාකරණය කිරීමේ කමිටුවේ සීමාව ඇතුලත නම් එය විභාග කර නිසි පියවර ගැනීම සඳහා අවශ්‍ය ආයතනයට එම කමිටුව යොමු කරනු ඇත. විභාගය සහ ලබා දුන් විසඳුම ගැන බලපෑම්ට ලක් වු තැනැත්තා සෑහීමකට පත් නොවෙයි නම් එය ජාතික මට්ටමේ මැසිවිලි නිරාකරණය කිරීමේ කමිටුවකට යොමු කළ හැකිය. එයිනුත් අදාල තැනැත්තා සෑහීමට පත් නොවෙයි නම් අදාල බලපෑම සිදුව ඇත්තේආසියා සංවර්ධන බැංකුවේ නිර්දේශවලට අනුකූල නොවීම නිසා යැයි එම තැනැත්තා විශ්වාස කරයි නම් හා ව්‍යාපෘති කණ්ඩායම සමග කළ හැකි සියලු වෑයම් තමා විසින් කර ඇති බවත් හෙතෙම විශ්වාස කරයි නම් එවිට සිය මැසිවිල්ල ආසියා සංවර්ධන බැංකුවේ විශේෂ ව්‍යාපෘති නිලාධාරීවරයාගේ කාර්යයාලයට හෝ ආසියා සංවර්ධන බැංකුවේ වගවීමේ යාන්ත්‍රනයට අනුව අනුකූලතා පුනරීක්ෂණ කාර්යයාලයට යොමු කළ හැකිය. ඉහත ප්‍රයත්න කිසිවකින් තමාට සාධාරණයක් ඉටු නොවුනේ යැයි බලපෑමට ලක් වු තැනැත්තා විශ්වාස කරන්නේ නම් ඔහුට/ඇයට ඇති අවසාන විසඳුම වන්නේ අධිකරණයේ පිහිට පැතීම වන අතර අධිකරණයේ තීරණය අවසාන තීරණය වනු ඇත. මැසිවිලි නිරාකරණය කිරීමේ යාන්ත්‍රනයේ විවිධ මට්ටම්වල පුද්ගලයන් සහ ආයතන පිළිබඳ විස්තරය පහත 6. 1 වගුවේ ලබා දී ඇත:

**වගුව 6-1 මැසිවිලි නගන්නන් සම්බන්ධ වියි හැකි මැසිවිලි නිරාකරණය කිරීමේ යාන්ත්‍රනයේ විවිධ මට්ටම්වල පුද්ගලයන් සහ ආයතන**

| මැසිවිලි මට්ටම්වල | | පුද්ගලයන් සහ ආයතන |
|---|---|---|
| අදියර 1 | **ව්‍යාපෘති / පරිශ්‍ර මට්ටම** | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය (PMIU) පරිශ්‍ර ඉංජිනේරුවරයා;<br>කොන්ත්‍රාත්කරුගේ පරිශ්‍ර නියෝජිත (DSC);<br>අධීක්ෂණ උපදේශකගේ නියෝජිත |
| අදියර 2 | **කොට්ඨාශ මට්ටමේ මැසිවිලි නිරාකරණය කිරීමේ කමිටුව** | පෙදෙසේ ප්‍රාදේශීය ලේකම් (සභාපති)<br>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකයේ නියෝජිත (ලේකම්)<br>පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජිත<br>සහකාර අධ්‍යක්ෂ / ධීවර රීක්ෂක (ධීවර දෙපාර්තමේන්තුව)<br>ග්‍රාම නිලධාරි<br>අධීක්ෂණ උපදේශකගේ නියෝජිත<br>කොන්ත්‍රාත්කරුගේ නියෝජිත<br>ධීවර සමුපකාර සමිතියේ නියෝජිත<br>ග්‍රාමීය කාන්තා සංවර්ධන සමිතියේ නියෝජිත<br>මෙතෝදිස්ත උසස් බාලිකා පාසැලේ නියෝජිත සහ<br>බලපෑමට ලක්වු පුද්ගලයාගේ නියෝජිත / ආයතනයේ සාමාජික (ඡන්ද අයිතිය නැති) |
| අදියර 3 | **ජාතික මට්ටමේ මැසිවිලි නිරාකරණය කිරීමේ කමිටුව** | ලේකම්, ධීවර ජලජ සම්පත් සංවර්ධන හා ග්‍රාමීය ආර්ථික අමාත්‍යාංශය<br>ව්‍යාපෘති අධ්‍යක්ෂ<br>MPRRRHRA නියෝජිත<br>ජාතික ධීවර සම්මේලනයේ නියෝජිත<br>බලපෑමට ලක්වු පුද්ගලයාගේ නියෝජිත / ආයතනයේ සාමාජික (ඡන්ද අයිතිය නැති) සහ ගැටළුවට අදාලව අවශ්‍ය යැයි සිතන වෙනත් නියෝජිතයන් |

## 6.1.4 අදහස් විමසීම සහ අනාවරණය කිරීම

**අදහස් විමසීමේ ක්‍රියාදාමය**

548. අවසාන ව්‍යාපෘති සුදානමේ තාක්ෂණික සහය සමයෙහි සහ විස්තරාත්මක සැලසුම් අදියරවල අදාල පාර්ශවකරුවන් සමග නොකඩවා සිදු කරන අදහස් විමසීම් පවත්වන ලද අතර ක්‍රියාත්මක අදියරෙහිද මෙය නොකඩවා පැවැත්වෙනු ඇත. විස්රත පහත පදිරිදිය:

අවසාන ව්‍යාපෘති සුදානමේ තාක්ෂණික සහය

549. අවසාන ව්‍යාපෘති සුදානමේ තාක්ෂණික සහය සමයෙහි සිදු කරන ලද අදහස් විමසීමේ ක්‍රියාකාරකම්: සුවිශේෂි ගැටළු සඳහා සහ තොරතුරු රැස් කිරීමට අදාල රජයේ බලධාරීන් හමු වීම සහ යෝජිත ව්‍යාපෘතිය වෙනුවෙන්විවිධ පාර්ශවකරුවන් සමග පුළුල් මහජන රැස්වීම්.

**රජයේ බලධාරීන් සමග පවත්වන ලද සාකච්ඡා**

550. අදාල රජයේ බලධාරීන් සමග සිදු කරන ලද සාකච්ඡා වගුව 6.2 හි සාරාංශගත කර ඇත

**වගුව 6-2 අදාල රජයේ බලධාරීන් සමග සිදු කරන ලද සාකච්ඡා**

| රජයේ බලධරයා | සාකච්ඡාව පවත්වන ලද දිනය |
|---|---|
| උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම් කාර්යාලය යාපනය | 01 අගෝස්තු 2016 |
| දිස්ත්‍රික්ක ලේකම්තුමා, යාපනය දිස්ත්‍රික්ක | 01 අගෝස්තු 2016 |
| දිස්ත්‍රික්ක ලේකම්තුමා, කිළිනොච්චිදිස්ත්‍රික්ක | 02 අගෝස්තු 2016 |
| CCD සහ මහැවලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශයකොළඹ | 02 අගෝස්තු 2016 |
| කාලගුණ විපර්යාස ලේකම් කාර්යයාලය කොළඹ | 02 අගෝස්තු 2016 |
| මධ්‍යම පරිසර අධිකාරියකොළඹ | 02 අගෝස්තු 2016 |
| ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයකොළඹ | 02 අගෝස්තු2016 |
| දිස්ත්‍රික්ක ලේකම්තුමා, දිස්ත්‍රික්ක | 03 අගෝස්තු 2016 |
| දිස්ත්‍රික්ක ලේකම්තුමා, මන්නාරම්දිස්ත්‍රික්ක | 04 අගෝස්තු 2016 |
| ශ්‍රී ලංකා ධීවර වරාය සංස්ථාවකොළඹ | 08 අගෝස්තු 2016 |
| CCD, යාපනය | 31 ඔක්තෝම්බර් 2016 |
| ප්‍රාදේශීය ලේකම්තුමා සහදිස්ත්‍රික්ක ලේකම්තුමා මන්නාරම | 30 නොවැම්බර් 2016 |
| NARA, කොළඹ | 14 දෙසැම්බර් 2016 |
| DWC, කොළඹ | 14 දෙසැම්බර් 2016 |
| කාලගුණ විපර්යාසලේකම් කාර්යයාලය, කොළඹ | 14 දෙසැම්බර් 2016 |
| MFARD, කොළඹ | 16 දෙසැම්බර් 2016 |

මූලාශ්‍රය: අවසාන ව්‍යාපෘති සුදානමේ තාක්‍ෂණික සහය

551. පේදුරු තුඩුවෙහි මහජන සාකච්ඡාවක් පවත්වන ලද අතර එයට වඩමරාච්චි උතුර ප්‍රාදේශීය ලේකම්වරයා මුලසුන දැරීය. උපදේශකවරුන් ඉඩම් හිමියන් සහ ධීවරයන් කිහිප දෙනෙකුම මෙයට සහභාගී වූහ.

**වගුව 6-3 යෝජිත ධීවර වරායවල්සඳහා පවත්වන ලද සාකච්ඡා**

| උප ව්‍යාපෘති | සාකච්ඡාව පවත්වන ලද ස්ථානය | සාකච්ඡාව පවත්වන ලද දිනය |
|---|---|---|
| පේදුරු තුඩුව ධීවර වරාය | සුබ්බර්මඩම් ප්‍රජා ශාලාව | 29 නොවැම්බර් 2016 |
| පේදුරු තුඩුව ධීවර වරාය | කොට්ටඩි වෙරළ | 28 දෙසැම්බර් 2016 |
| පේදුරු තුඩුව ධීවර වරාය | ප්‍රාදේශීය ලකම් කාර්යයාලය පේදුරු තුඩුව | 30 මාර්තු 2017 |

මූලාශ්‍රය: අවසාන ව්‍යාපෘති සුදානමේ තාක්‍ෂණික සහය

552. රැස්වීම්වලට පෙර අවසාන ව්‍යාපෘති සුදානමේ තාක්‍ෂණික සහය උපදේශන ආයතනය විසින් යෝජිත ආයෝජනය පිළිබඳ කෙටි විස්තරයක් සහිතව අත්පත්‍රිකා බෙදා හරින ලද අතර සෑම සාකච්ඡාවක් ආරම්භයෙහිම සහභාගීවන්නන්ට සමස්ත ව්‍යාපෘතිය පිළිබඳ කෙටි හැඳින්වීමක් ලබා දී තාක්‍ෂණ පැතිකඩ විස්තර කර සමාජ පාරිසරික සහ නැවත පදිංචි කිරීමේ පැතිකඩ ඉස්මතු කර පෙන්වන ලදී.

553. ඕනෑම යටිතල පහසුකම්, ව්‍යාපෘතියකට ආවේණික ඍණාත්මක සහ ධණාත්මක බලපෑම් ගැන පාර්ශවකරුවන් සමග සාකච්ඡා කරන ලද අතර එවිට තමන්ගේ අදහස් කියා පාන්නට මෙන්ම ව්‍යාපෘතිය ගැන දැන ගන්නට සහභාගී වූවන් උනන්දුවක් දැක්වූහ. සාකච්ඡාව ඉංග්‍රීසි බසින් හා අවශ්‍ය විට දමිළ බසින් පරිවර්තනද ලබා දෙමින් සිදු කරන ලද අතර සංවාදයෙන් පසුව ක්‍ෂේත්‍ර චාරිකාවක් සඳහා සහභාගීවන්නන්ට ආරාධනා කරන ලදී.

554. මෙවිට ඉදිරිපත් කරන ලද ප්‍රධාන කරුණු පහත **වගුව 6.4** හි ලබා දී ඇත.

**වගුව 6-4 ගැටළු සහ ප්‍රතිචාර - ධීවර වරායන් උපදේශන**

| ප්‍රධාන ගැටළු | ප්‍රතිචාර |
|---|---|
| රළවලින් ආරක්‍ෂා කරන්නට ගල්පර නොමැති හෙයින් පරිශ්‍රය පාංශු ඛාදනයට ගොදුරු විය හැකිය යැයි පේදුරු තුඩු සහභාගීවන්නන් පෙන්වා දුන්හ | සියලුම පැතිකඩ සැලකිල්ලට ගන්නා ලද බව අවසාන ව්‍යාපෘති සුදානමේ තාක්‍ෂණික සහයඋපදේශකවරුන් පෙන්වා දුන් අතර විස්තාරාත්මක සැලසුම් අදියරෙහි වැඩිදුර අධ්‍යයන සිදුකරන බවද අවධාරණය කළහ. ව්‍යාපෘතිය අනුමැති අදියරට ළඟා වන විට පාංශු ඛාදනය වැළැක්වීමට අවශ්‍ය පියවර ගන්නා බව DCC නියෝජිතයන්ද සහතික වූහ. |

| | |
|---|---|
| යෝජිත වරායේ තම බෝට්ටු නැංගුරම්ලන්නට නොහැකි විය හැකිය හා එනිසා තම ජීවනෝපා අහිමි විය හැකිය යැයි කුඩා බෝට්ටු මගින් මසුන් අල්ලන ධීවරයන් සිය කණස්සල්ල ප්‍රකාශ කළහ. | කුඩා බෝට්ටු නැංගුරම් දමන හා නවතා තබන තොටවල් යෝජිත ආයෝජනයට ඇතුල් වනු ඇත යැයිද එනිසා කුඩා බෝට්ටු හිමියන් සිය ජීවනෝපා කටයුතු දිගටම කරගෙන යන්නට හැකිය යැයි අවසාන ව්‍යාපෘති සුදානමේ තාක්ෂණික සහයඋපදේශකවරුන් දැන්වූහ |
| දිවයිනේ අනෙක් පෙදෙසේ ධීවරයන් මෙම ධීවර වරාය භාවිතා කරනු ඇත යැයිද එනිසා ගැටුම් ඇති විය හැකිය යැයි සැකයක් මතු කරන ලදී. | ධීවරයන්ගේ ක්‍රියාකාරකම් පාලනය කිරීමට සහ ගැටුම් මග හැරීමට නියාමන ආයතනය ලෙසින් CFHC ක්‍රියාකරනු ඇති අතර ධීවර වරායන් ජාතික දේපළ වන හෙයින් බලපත්‍ර හිමියන්ට ඕනෑම ධීවර වරායක සේවය ලැබීමට බාධාවක් නැත යැයිද අවධාරණය කරන ලදී |
| තම එක් දින යාත්‍රා නැංගුරම්ලෑමට යෝජිත ජේදුරුතුඩුව වරායේ වෙනම තීරයක් වෙන් කර දෙන මෙන් කොඩ්ඩාඩි ගම්මානයේ ධීවරයන් ඉල්ලීමක් කළහ | කොඩ්ඩාඩිහි ප්‍රමාණවත් ඉඩකඩ ඇත |
| ධීවර වරාය ඉදිකරන අදියරෙහි තම ජීවනෝපා කටයුතු සීමා වනු ඇත යැයි ධීවරයන් සිය කණස්සල්ල පළ කළහ | කොඩ්ඩාඩි පෙදෙසේ ධීවර කටයුතු කර ගෙන යා හැකි බැවින් ජීවනෝපා ක්‍රියාකාරකම්වලට බාධා ඇති නොවනු ඇත |
| නවීන ධීවර වරායක මෙහෙයුම් කටයුතු දැක බලා ගැනීමට බොහෝ සහභාගීවන්නන් උනන්දුවෙන් සිටිති | නවීන ධීවර වරායක මෙහෙයුම් ගැන පෙන්වා දීමට විස්තරාත්මක සැලසුම් අදියරෙහි දික්කෝවිට ධීවර වරාය වැනි දිවයිනේ ඇති නවීන ධීවර වරායකට අධ්‍යයන චාරිකාවක් සංවිධානය කළ යුතුය යැයි GM සහ CFHC විසින් යෝජනා කරන ලදී. |
| ජීවනෝපා සංවර්ධන යෝජනා ධීවරයන් පැසසුමට ලක් කළ අතර බහුදින යාත්‍රා මිල දී ගැනීම සඳහා ණය පහසුකම් සලසා දෙන මෙන්ද ඉල්ලා සිටියහ | විස්තරාත්මක සැලසුම් අදියරෙහි මෙය ගැන වැඩිදුරටත් සාකච්ඡා කරනු ලැබේ |

මූලාශ්‍රය: අවසාන ව්‍යාපෘති සුදානමේ තාක්ෂණික සහය කන්සල්ටන්ට්ස්

### විස්තරාත්මක සැලසුම් කාලවකවානුව

555. සැලසුම් කිරීමේ ආරම්භ වකවානුවෙහි යෝජිත ව්‍යාපෘති පරිශ්‍රයේ එක් එක් ක්‍රියාකාරකම්වල ස්ථාන පැහැදිලි කිරීම පිණිස සහ පැහැදිලි දසුන් පෙනේවීමේ හා ක්‍රියාකාකරම් විස්තර කිරීමේ පාර්ශවකරුවන්ගේ බහුතරයක් රැස්වීම් පවත්වන ලද්දේ කෙටිම්පත් සැලසුම් වින්‍යාශ, ත්‍රිමාණ සංකල්පමය ආදර්ශ, පවර් පොයින්ට් ප්‍රදාන වැනි විවිධ මෙවලම් උපයෝගී කර ගෙනය. එක් සාකච්ඡා වාරයක් උතුරු පළාතේ මහ ඇමතිවරයා සමගද සිදු කරන ලද අතර එවිට අපේක්ෂිත ප්‍රධාන බලපෑම් සහ යෝජිත අවම කිරීමේ පියවර පවර් පොයින්ට් ප්‍රදානයක් හරහා විස්තර කරන ලදී. සාකච්ඡා සියල්ල ඉංග්‍රීසියෙන් සහ අවශ්‍ය විට දමිළ පරිවර්තන සහිතව පවත්වන ලදී. පෙදෙසේ සියලුම පරිසර, සමාජ සහ නැවත පදිංචි කිරීමේ විශේෂඥයින් දමිළ කථා කරන්නන් වූ හෙයින් සාකච්ඡා ප්‍රයෝජනවත් විය. මෙවිට ව්‍යාපෘතියේ තාක්ෂණික සමාජීය පාරිසරික සහ නැවත පදිංචි කිරීමේ පැතිකඩ හැකි පමණ ඉස්මතු කරන ලදී.

**වගුව 6-5 පාර්ශවකරු සාකච්ඡා**

| අංකය | විෂය | ස්ථානය | දිනය |
|---|---|---|---|
| 1 | ආසියා සංවර්ධන බැංකුව ප්‍රාදේශීය මට්ටමේ රැස්වීම් | ප්‍රගතිය විස්තර කිරීම | 02.11.2018 |
| 2. | මෙතෝදිස්ත උසස් බාලිකා පාසැලේ ප්‍රශ්න සම්බන්ධ සාකච්ඡා | මෙතෝදිස්ත උසස් බාලිකා පාසැල් පරිශ්‍රය | 11.12.2017 |
| 3. | මෙතෝදිස්ත උසස් බාලිකා පාසැලේ විදුහල්පති ඇතුලත්ව අධ්‍යාපන අමාත්‍යාංශය සමග සිදු කරන ලද සාකච්ඡා | උතුරු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය | 24.11.2018 |
| 4. | යාපන දිසාපති සහ සැලසුම්රකණ නිලධාරීන් දිස්ත්‍රික්කයේ ප්‍රගතිය සහ ගැටලු යාවත්කාල කළහ | දිසාපති කාර්යාලය යාපනය | 6.03.2018 |
| 5. | උතුරු පළාතේ මහ ඇමතිවරයා සහ මෙතෝදිස්ත උසස් බාලිකා පාසැලේ නියෝජිතයන් ඇතුලුපාර්ශවකරුවන් ජ සංවේදිතා හමුව | උතුරු පළාතේ මහ ඇමතිවරයාගේ කාර්යයාලය | 7.03.2018 |

556. මෙයට අමතරව ක්ෂේත්‍ර චාරිකා කිහිපයක්ද පුද්ගලික හමුද උපදේශකවරුන් විසින් සිදු කරන ලදී.

557. මෙවිට නගන ලද ප්‍රශ්න සහ ඉදිරිපත් කරන ලද යෝජනා පහත වගුව 6.6 හි ලබා දී ඇත.

**වගුව 6-6 සමුහයා සමග සිදු කරන ලද සාකච්ඡාවලදී ඉදිරිපත්වුනු කරුණු**

| ප්‍රධාන කරුණු සහ යෝජනා | ප්‍රතිචාර |
|---|---|
| සැලසුම් කරන විට වරායේ සීමාව නඩරාජර් වේදාකවට සීමා කිරීම ගැන සලකා බලන මෙන් කොඩ්ඩාඩි ධීවර ප්‍රජාව ඉල්ලීමක් කළහ | සැලසුම බටහිර අන්තයට ගෙන යන ලදී |
| ඉදිකිරීම් සමයෙහි ඇති විය හැකි ශබ්දය දූවිල්ල මෙන්ම වරායෙන් පිට වැයි හැකි දුගඳ සහ ධීවරයන් ඝෝෂාකාරී ලෙසින් හැසිරුනහොත් එයින් තම ආයතනයේ දෛනික අධ්‍යාපන කටයුතුවලට බාධා ඇති විය හැකිය යැයි මෙතෝදිස්ත උසස් බාලිකා පාසලේ කළමනාකරණය සිය කණස්සල්ල පළ කර සිටියේය. | ව්‍යාපෘතිය වැඩකටයුතු වැඩි ප්‍රමාණයක් මෙතෝදිස්ත උසස් බාලිකා පාසැල් පරිශ්‍රයෙන් ඈත්ව සිදු කෙරෙන ලෙසින් සැලැස්ම වෙනස් කර එය නැගෙනහිර අන්තයට ගෙන යන ලදී. ඉදිකිරීම් සහ මෙහෙයුම් අදියරවල ඇති විය හැකි හිරිහැර අවම කිරීමට සුදුසු පියවර යෝජනා කරන ලදී. |
| වත්මන් නවාතැන් ස්ථාන නැගෙනහිරට ගෙන යන මෙන් පාසැලේ කළමනාකරණය ඉල්ලා සිටියේය. | නවාතැන් ස්ථාන නැගෙනහිරට ගෙන යන ලදී |
| අවබෝධතා ගිවිසුම් හරහා අනාගතයේදී වැඩි දුර සංවර්ධන වැඩ කටයුතු මෙහි සිදු නොකරන බවට සහ ධීවර වරාය කළමනාකරණ කමිටු රැස්වීම්වල පාසැලේ කළමනාකරණයට විටින් විට සහභාගී වීමට අවසර දෙන බවට පොරොන්දු වන මෙන් පාසැලේ කළමනාකරණය ඉල්ලා සිටියේය | පාසැල් කළමනාකරණය සමග අවබෝධතා ගිවිසුම් ඇති කිරීමට නෛතික ප්‍රතිපාදන නොමැති නමුත් මැසිවිලි විසඳන කමිටුවට පාසැලේ කළමනාකරණය ඇතුලත් කර ගන්නා ලදී |
